# බයිබලීය

# කළමණාකරන

# ප්‍රතිපත්ති

## අස්වැන්න සෘතුව ජාත්‍යන්තර ආයතනය

මෙම පාඩම් මාලාව අස්වැන්න සෘතුව ජාත්‍යන්තර ආයතනයේ කොටසක් වන අතර, එය ඇදහිලිවතුන් හට ප්‍රබල ආත්මික අස්වැන්නක් නෙලා ගැනිම සඳහා ඔවුන් සන්නද්ධ කිරිමට සැලසුම් කර ඇත.

පුහුණුවේ මූලික තේමාව වන්නේ යේසුස් වහන්සේ ඉගැන්වුවාවූ දේ ඉගැන්වීමය. එනම්, මසුන් මරන්නන්, බදු අයකරන්නන් වැනි වූ මනුෂ්‍යයන් ගෙන ඔවුන් ඔවුන්ගේ ලෝකය වෙත සුභාරංචිය ගෙන යන්නාවූ තමා වැනි වූ මනුෂ්‍යයන් බිහි කරන්නාවූ බලය විදහා පාමින් ක්‍රියාකරන්නාවූ කිතුණුවන් ලෙසට වෙනස් කිරීමය.

මෙය ඇදහිලිවතුන් ශුභාරංචිකාර්යයේ ඉලක්ක සපුරා ගැනිම සඳහා කැඳවා පුහුණු කිරිම, ඔවුන් සංවිධානය කිරිම, වැඩිකිරිම, ඔවුන් නියෝජනය කිරිම ආදිය තුලින් දර්ශණයක් කරා ගමන්ගන්නාවූ, අධ්‍යයන පටිපාටියක ආදර්ශ කිහිපයක් සහිත ඒකීය පාඩම්මාලාවක අත් පොතකි.

පටුන

මෙම අත්පොත භාවිතා කරන ආකාරය

කණ්ඩායම් අධ්‍යනය සඳහා වන යෝජනා

හැඳින්වීම

පාඩම් මාලාවේ ඉලක්කය

1. කළමණාකරන සේවය

2. නායකත්වයේ අවස්ථා

3. මගපෙන්වීම සඳහා ආලේප කිරීම

4. නායකයෙකු වීමට අවශ්‍ය සුදුසුකම්

5. සේවකයෙකු ලෙස මගපෙන්වීම

6. එඬේරෙකු ලෙස මගපෙන්වීම

7. නායකයෙකුගේ අවදානම

8. තීරණ ගැනීම

9. ගැටුම් සහ විනය

10. නායකයින් සහ අනුගාමිකයින් පුහුනු කිරීම

11. පරාජයට මුහුණ දීම

12. සාර්ථක මුලධර්ම

13. මිල ගණනය කිරීම

ප්‍රස්ථාවනාව

ස්ව පරීක්ෂණ වලට පිළිතුරු

# මෙම අත්පොත භාවිතා කරන්නේ කෙසේද?

## අත් පොතෙහි සැකිල්ල

සෑම පාඩමක මේවා අඩංගු වේ:

**අරමුණු**: පරිච්ජේදය අධ්‍යනය කිරිමෙන් ඔබ ලබාගත යුතු ඉලක්ක මේවාය. පාඩම පටන් ගැනිමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පද**: පරිච්ජේදයේ ප්‍රධාන සංකල්පයන් මෙම පදයෙන් අවධාරණය කෙරේ. එම පදය කටපාඩම් කරන්න.

**පරිච්ජේදයෙහි අඩංගු දේ**: සෑම කොටසක්ම අධ්‍යනය කරන්න. අත් පොතෙහි මුද්‍රණය කොට නොමැති යොමුකිරීම් ඔබගේ බයිබලයෙන් කියවන්න.

**ස්ව පරීක්ෂණ**: ඔබ පරිච්ජේදය අධ්‍යනය කිරිමෙන් පසු ඔබට දි ඇති පරික්ෂන කරන්න. ඔබගේ බයිබලය හෝ මෙම අත්පොත නොබලා ඒවා කිරිමට උත්සහ කරන්න. ඔබට දි ඇති පරික්ෂණ කර අවසාන වු විට මෙම පොතෙහි අවසානයෙහි දී ඇති පිළිතුරු සමග ඒවා සසදා බලන්න.

**වැඩි දුර අධ්‍යනය සඳහා**: මෙම කොටසට දේව වචනය දිගටම අධ්‍යනය කිරිමට උපකාර කරනු ඇත. ඔබගේ අධ්‍යනය දක්ෂතා වැඩිදියුණු කරගන්න. ඔබ ඉගෙනගත් දේ ඔබගේ ජිවිතයට සහ සේවයට අදාල කරගන්න.

**අවසාන විභාගය**: ඔබ මෙම පාඩම් මාලාවට සම්මාන ලබාගන්නේ නම් මෙම පාඩම් මාලාවේ අවසාන විභාගයට පෙනි සිටිමට ඔබට හැකිවනු ඇත. මෙම පැඩම් මාලාව අවසාන කිරිමෙන් පසු උපදෙස් දි ඇති පරිදි මෙම විභාගය අවසන් කොට ලකුණු ලබා දිම ආපසු භාරදිය යුතුයි.

## අවශ්‍ය අතිරේඛ මුද්‍රිත ලියවිලි

ඔබට ජේම්ස් රජුගේ අනුවාදය සහිත බයිබලයක් අවශ්‍යය වේ.

## කණ්ඩායම් අධ්‍යනය සඳහා යෝජිත
## පළමු රැස්වීම

**ආරම්භය**: යාච්ඤාවෙන් සහ හැඳින්වීමෙන් ආරම්භ කරන්න. සිසුන් ලියාපදිංචි කර ඔවුන් හඳුනාගන්න.

**කණ්ඩායම් හැසිරවිය යුතු ආකාරය පිළිබඳව ප්‍රකාශයට පත් කරන්න.** කණ්ඩායම් මගපෙන්වන්නේ කවුදැයි තීරණය කරන්න. රැස්වීම් වාරයන් පැවැත්වීමට දිනය, වේලාව, සහ ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසාව සහ නමස්කාරය:-** ශුද්ධාත්මයාණන්ගේ අභිමුඛය රැස්වීම් වරුව තුල පවත්වන ලෙසට ආරාධනා කරන්න.

**අත් පොත් සිසුන් අතරේ බෙදා හරින්න:-** අත්පොතේ මාතෘකාව, සැකිල්ල සහ මුල් පිටු කිහිපයෙහි දක්වා ඇති පරිදි පාඩම් මාලාවේ අරමුණ හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම කරන්න :-** සිසුන්ට පවරා දි ඇති පරිච්ඡේදය කියවා ඊලඟ රැස්වීම් වාරයට පෙර එම පරික්ෂණ කරනු ඇත. ඔබ කරනු ලබන පරිච්ඡේද ගණන තීරණය කරනුයේ එය දිගහැරී ඇති ප්‍රමාණය එහි අන්තර්ගතය සහ ඔබගේ කණ්ඩායමේ හැකියාව මතය.

### දෙවන සහ ඉන්පසුව වන රැස්වීම් වාරයන්

**ආරම්භය :-** යාච්ඤාව, පිලිගැනිම සහ අලුත් සිසුන් පැමින ඇත්නම් ඔවුන් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ට අත්පොත බැගින් දිම. පැමිණීම ලකුනු කරන්න. ප්‍රශංසාවේ සහ නමස්කාරයේ කාලයක් ගත කරන්න.

**නිරික්ෂණය :-** පසුගිය රැස්වීම් වාරයේ ඔබ කලාවු දේ ගැන කෙටි සමාලෝචනයක් කරන්න.

**පාඩම :-** කළු පාටින් මුද්‍රිත අකුරු සහිත මාතෘකා සැලකිල්ලට ගෙන පරිච්ඡේදයෙහි දැක්වෙන මාතෘකා ඉගැන්වීමේ සැකිල්ලක් සේ ගෙන සාකච්ඡා කරන්න. ඔවුන් ඉගෙනගත් දේ පිලිබඳව ප්‍රශ්ණ සහ ගුණ දොස් විචාරන්න. පාඩම සිසුන්ගේ ජිවිතයට සහ සේවයට අදාල කරවාගන්න.

**ස්ව පරික්ෂන :-** සිසුන් සම්පූර්ණ කර ඇති ස්ව පරික්ෂන නැවත නිරික්ෂණය කරන්න. (සටහන :- සිසුන් මෙම අත්පොත අවසානයෙහි දි ඇති පිළිතුරු දෙස බැලිම අනවශ්‍යයැයි ඔබ සිතන්නේ නම් සෑම අත්පොතකම ඇති පිළිතුරු සඳහාන් පිටු ගලවා අයින් කරන්න.)

**වැඩිදුර අධ්‍යනය සඳහා :** ඔබට මේ ව්‍යාපෘති කණ්ඩායම් හෝ එකිනෙකා වෙන වෙනම යන පදනම් මත හෝ කළ හැකිය.

**අවසාන විභාගය :** ඔබ මේ පාඩම් මාලාවට සම්මාන ලබන්නේනම් මෙම පාඩම් මාලාවේ අවසාන විභාගයට පෙනි සිටිමට ඔබට හැකිවනු ඇත. මෙම අත්පොතේ පිටපත් නැවත සිසුන්ට ඉදිරිපත් කර මෙම පාඩම් මාලාව අවසානය දක්වා ඔවුන්ව පරිපාලනය කරන්න.

**ආදර්ශය : සංවිධානය කිරීම**

**පාඩම් මාලාව : බයිබලීය කළමණාකරණය මුලදර්ම**

**හැඳින්වීම**

මෙම පාඩම දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය වන බයිබලයේ එළිදරව් කර ඇති කළමාණාකරන මුලධර්ම ඉදිරිපත් කරයි. “කළමාණාකරනය” යනු “ගබඩාකාරීත්වය” යන්නට වෙනත් වචනයකි.

“ගබඩාකරුවන්” එනම් “කළමාණාකරුවන්” තවත් අයෙකු විසින් තමා වෙත පවරා ඇති යම් දෙයක් කෙරෙහි වගකිවයුතු වන්නෝ වෙති. ඇදහිලිවතුන් වශයෙන් දෙවියන්වහන්සේ විසින් අප වෙත පවරා ඇති ආත්මික සම්පත් කෙරෙහි කළමණාකරුවන් වෙති.

බොහෝ කිතුනු නායකයන්ට ඇති බැරැරුම් ප්‍රශ්නය වන්නේ මෙම ආත්මික සම්පත් සංවිධානය සහ කළමණාකරනය කිරීමයි. බයිබලය පෙන්වා දෙන ආකාරයට අස්වැන්න බොහෝය. ගොවියෝ ස්වල්පයකි. එබැවින් ඔවුන් නිසිආකාරව සංවිධානය වී එක්රැස්කොට පුහුණු කළ යුතුය. මනුෂ්‍යයාගේ ශාරීරික වර්ධනය සිදුවන්නේ ජිවමාන සෛල වැඩිමක් වී ඇට සැකිල්ලක් තුල වර්ධනය වීමෙනි. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වැඩිමටත් සැලැස්මක් අවශ්‍යවී ඇත. ආත්මික ජිවිතය වර්ධනය වන්නේ ද අප එයට උපකාර කිරීමට සූදානම් වීමෙනි.

“සංවිධානය කිරීමේ ආදර්ශ” පුහුනු කිරීම සඳහා මෙම පාඩම් මාලාව අස්වැන්න සෑතුව ජත්‍යන්තර ජාලය විසින් ඉදිරිපත් කරනු ලබන පාඩම් මාලා තුනකින් වන පළමුවැන්නයි. මෙම අධ්‍යනය “පරිසර විශ්ලේෂණය කිරීම” සහ “ඉලක්ක මගින් කළමාණාකරනය කිරීම” යන පාඩම් මාලා සමග එකට දිවෙන ආත්මික සම්පත් කළමාණාකරනය කිරීමේදි ඔබට හොද ගබඩාකරුවෙකු කිරීමට උපකාරීවේ. නායකත්වය පිළිබඳව නිවැරදි තේරුම් ගැනිමට, සැලසුම් කිරීමට, සහ ප්‍රහල සේවයකට අවශ්‍ය සංවිධානය කිරීම සඳහා මෙම පාඩම් මාලාවන් උචිත බවට අපි ඔබට අනුමත කරමු.

මෙම පාඩම් මාලාව කළමණාකරනය යන විෂය හඳුන්වා දිම, නායකත්වයේ අවස්ථා හඳුන්වා දිම, නායකත්වයට පත්කිරීම සඳහා ආලේප කිරීමේ වැදගත්කමේ පීඩනය ආදිය හඳුන්වා දේ සේවකයකු ලෙස සහ එඬේරෙකු වශයෙන් මගපෙන්වීම සහ නායකයන් විමට ඇති සුදුසුකම් යනාදිය පිළිබඳව බයිබලීය මුලධර්ම යනුත් මෙහිදි සාකච්ජාවට ගැනේ.

නායකයෙකුට ඇති ප්‍රධාන දුෂ්කර කටයුතු වන තිරණ ගැනිම සහ ගැටුම් හැසිරවිම යන කාරනා අවධාරණය කරමින් නිරික්ෂණය කෙරේ. නායකයින් සහ අනුගාමිකයින් පුහුනු කිරීමට මගපෙන්විමේ පෙළගැසුම් සහ සාර්ථකත්වයේ මුලධර්ම සහ පරාජය විම් පරික්ෂාවට භාජනය කරනු ලැබේ.

මෙම පාඩම් මාලාවේ පරිච්ජේදය බයිබලයේ එන විශිෂ්ඨ නායකයන්ගේ උදාහරණ අධ්‍යනය කිරීමෙන් අතිරේඛ මුලධර්ම පිළිබඳව ඉගෙනිමට අවස්තාවක් සපයයි.

## පාඩම් මාලාවේ ඉලක්කය

මෙම පාඩම සම්පූර්ණ කල විට ඔබට පහත දැක්වෙන දේ පිළිබඳව උගත හැකිය

- කලමණාකරනය විග්‍රහ කිරීම
- ඇදහිලිවතුන් විසින් කළමනාකරනය කරන ආත්මික සම්පත්
- ගබඩාකරුවෙකු වීමට අවශ්‍ය ප්‍රධාන අවශ්‍යතා හඳුනා ගැනිම
- ආත්මික නායකයාගේ ප්‍රධානතම උදාහරණය හඳුනාගැනිමට හැකි වීම
- කළමණාකරන සේවයෙහි අන්තර්ගත දෑ සමාලෝචනය කිරීම
- නායකත්වයේ බයිබලිය අවස්ථා හඳුනා ගැනිම
- සේවය සඳහා ආත්මික දිමනා භාවිතා කරන්නේ කෙසේදැයි විස්තර කිරීම
- සේවයෙහි නායකයින් එකට වැඩකරන්නේ කෙසේදැයි විස්තර කිරීම
- ආත්මික නායකත්වයට ආලේප කිරීමේ වැදගත්කම හඳුනාගැනිම
- ආත්මික නායකත්වයට අවශ්‍ය සුදුසුකම් ලැයිස්තුගත කිරීම
- සේවකයෙකු ලෙස මගපෙන්වන්නේ කෙසේදැයි විස්තර කිරීම
- එඬේරෙකු ලෙස මගපෙන්වන්නේ කෙසේදැයි විස්තර කිරීම
- නායකයන්ට ඇති දුෂ්කරතාවයන් කැටිකොට දැක්වීම
- තිරණ ගැනිමෙදි බයිබලිය මගපෙන්වීම් සිමාවන් භාවිතයට ගැනිම.
- විනය සහ ගැටුම් හැසිරවීමේදි බයිබලිය මුලධර්මයන් මගපෙන්වීමේ සිමාවන් ලෙස භාවිතයට ගැනිම.
- අනුගාමිකයන් සහ නායකයින් පුහුණු කිරීම
- පරාජයන් ජයග්‍රහනයන් බවට හරවා ගැනිම
- සාර්ථකත්වයට බයිබලිය මුලධර්ම අදාල කර ගැනිම
- නායකත්වයේ මිලය හඳුනා ගැනිම
- ආත්මික නායකත්වයේ සැබෑ සෝදිසිකිරීම් විස්තර කිරීම

# පළමු පරිච්ඡේදය

## කළමණාකරනයේ සේවය

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අවසානයේ ඔබට :

- ප්‍රධාන බයිබල් පදයන් මතකයෙන් ලිවීමට හැකිවනු ඇත.
- කළමාණාකරනය යනු විග්‍රහ කල හැක.
- ඇදහිලිවතුන් කළමණාකරුවන් වන ආත්මික සම්පත් මොනවාදැයි හදුනා ගත හැක.
- භාරකාරත්වයේ ප්‍රධාන අවශ්‍යතා හදුනා ගත හැකි වීම
- නායකත්වය විශිෂ්ඨතම උදාහරණ හදුනාගත හැකි වීම
- කළමාණාකරනයේ සේවයෙහි අන්තර්ගතය සමාලෝචනය කල හැකි වීම.

**ප්‍රධාන බයිබල් පදය :**

> **යමෙක් සභාවේ නායක තනතුර ලබන්නට අගාවන්නේ නම් (1 තිමෝති 3 : 11) ඔහු යහපත් වැඩකට ආශාවන්නේය.**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය කළමණාකරණයේ සේවය යන්න හදුන්වා දේ. අප කළමණාකරනය යනුවෙන් කථා කරන්නේ ලෞකික වාසයේ ලෝකය සකච්ජා කරන්නාවු කළමණාකරණය යන්න නොවේ. අප කතා කරනුයේ සේවයෙහිදි අවශ්‍යවන ආත්මික කළමණාකරනය යන්න ගැනය.

ඔබ කළමණාකරනය කිරීමේ සේවය ගැන ඉගෙන ගන්නෙහි නම්, දෙවියන්වහන්සේ විසින් ඔබට දි ඇති ශුභාරංචි සේවයෙහි ඔබ හොද භාරකරුවකු බවට පත්වනු ඇත.

## කළමණාකරනය යන්න විග්‍රහ කිරීම

කළමණාකරනය යනු ගබඩා භාරකාරත්වය යන්නට වෙනත් වචනයකි. භාරකරුවන් "කළමණාකරුවන්" ඔවුන් වෙනත් අයකු විසින් පවරනු ලැබූ යම් කාර්‍යයක් කෙරෙහි වගකිව යුතු අය වෙති. කළමනාකරනය යනු දෙවියන්වහන්සේගේ කාර්‍යය අරමුණු සහ සැලසුම් ඉෂ්ඨකරගැනිම සදහා මානව සම්පත් භෞතික සම්පත් සහ ආත්මික සම්පත් මනාලෙස හැසිරවීමේ ක්‍රියා පිළිවෙලයි. කළමණාකරනය යන්නෙහි තත්වය මනිනු ලබන්නේ ඉහත කී සැලසුම් සහ කාර්‍යයන් ඉටුවී ඇත්ද නැද්ද යන්න මතය. බයිබලය කියා සිටින්නේ :

> **අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළාවී, එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව.. (යෙසායා 53:6)**

බැටළුවන් එක මාර්ගයක් ඔස්සේ මගපෙන්විය යුතුවා සේම මනුෂ්‍යයාට ඔවුන්ගේ වැයම් සහ ශක්තින් දෙවියන්වහන්සේගේ කර්තව්‍යය සහ සැලසුම් උදෙසා යෙදවීමටද මගපෙන්විය යුතුව ඇත.

## ආත්මක සම්පත්

සෑම ඇදහිලිවන්තයෙකුම දෙවියන්වහන්සේ විසින් ඔවුනට දෙනු ලැබූ සමහර ආත්මික සම්පත් කෙරෙහි බාරකරුවෝ වෙති. මෙය මේ පාඩම " වැඩිදුර අධ්‍යනයට " යන්නෙහි විස්තර කර ඇත. මෙම සම්පත් වලට අතිරේඛව නායකයින් විශේෂ සම්පත් කෙරෙහිද භාරකරුවන් වනු ඇත. එනම්

**ශුභාරංචිය :** අප අන් අය සමග එහි පණිවිඩය බෙදාගත යුතුව ඇත.

**මුල්‍ය ( මුදල් ) :** සෑම ඇදහිලිවන්තයෙකුම ඔවුන්ගේ මුදල් සම්බන්ධයෙන් භාරකරුවන් වෙති. එසේ වුවද කිතුණු ආයතන හෝ දේවස්ථාන වල මුදල් පාලනය කරන නායකයින්ද එම අරමුදල් සම්බන්ධයෙන් බාරකරුවෝ වෙති.

**සේවයෙහි ද්‍රව්‍යාත්මක සම්පත් :** සභාවට අයත් ගොඩනැගිලි, දේපල සහ බඩු භාන්ඩ මීට ඇතුලත්වේ.

**ආත්මික දිමනා :** සෑම ඇදහිලිවතෙකුට ආත්මික භාරකරුවකු ලෙස වගකීමට සිදුවන ආත්මික දිමනා අඩුගනනේ එකක් හෝ ඇත. අනිකුත් අයගේ ආත්මික දිමනා වැඩි දියුණුකර ගැනිමට උපකාරිවිමට නායකයින් වගකිමට බැදෙනු ඇත.

**අනිකුත් ඇදහිලිවතුන් :** ඔබ නායකයකු නම් අනිකුත් මනුෂ්‍යයන් සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ඔබ පරිනත ආත්මික තත්වයෙන් යුතුව අනිකුත් අයට සේවයෙහි වැඩෙහි යෙදවිමට උපකාර කළ යුතුය තිබේ. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ රාජ්‍යය ගොඩ නැගිමට යොදා ගන්නේ මනුෂ්‍යයින් මිස වැඩසටහන් නොවේ. කළමණාකරනය අදාල වන්නේ දෙවියන්වහන්සේ උදෙසා මනුෂ්‍යයින්ගෙන් වැඩ ගැනිමයි.

## කළමණාකරනය යන්න ගැන මත පළමු පණිවුඩය

දෙවියන් වහන්සේගෙන් මනුෂ්‍යයා වෙත පැමිණි පළමු පණිවුඩය වුයේ කළමණාකරනයයි. දෙවියන්වහන්සේ ආදම් සහ ඒවාට පැවසුවේ

**නුඹලා බෝ වී වැඩෙමින් පොළව පුර්ණ කොට එහි මත හැසිරෙන සියලුම ජිවමාන දේ කෙරෙහි අදිපති කරන්න යනුවෙනි. (උත්පත්ති 1:28)**

**මෙම පදයෙහි වැදගත් කළමණාකරන ඉලක්ක 3ක් අන්තර්ගත වේ.**

දෙවියන්වහන්සේගේ සැලසුම සහ කාර්යය ඉෂ්ඩ කිරිමට අවශ්‍ය සම්පත් උපරිම අයුරින් "වැඩිකර ගැනිම"
"අඩුවෙන් කිරිමෙන්" අපිළිවෙල අවම කිරිම
"පාලනය" මගින් පිළිවෙල නඩත්තු කිරිම (අධිපතිකම් කිරිම)

### විශිෂ්ඨතම උදාහරණය

නායකත්වයේ විශිෂ්ඨතම උදාහරණය වන්නේ ස්වාමිවු යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. සෑම කිතුණු නායකයෙකුගේම ආදර්ශය වන්නේ උන්වහන්සේය. උන්වහන්සේ නායකත්වය දිමෙන් දුන් ආදර්ශය මෙම පාඩම් මාලාවෙහි පසුව ඉගෙන ගන්නවා ඇත. මෙම පාඩමෙහි ඉගැන්වෙන සියලුම මුලධර්ම පෙන්නුම් කරනුයේ උන්වහන්සේ කල සහ ඉගැන්වු දේවල්ය. සෑම නායකයකුගේම අත්‍යවශ්‍ය ගුනාංග ක්‍රිස්තුස් වහන්සේගේ ජිවිතයේ වු සාක්ෂි වේ. නායකයකු විසින් පෙන්නුම් කල යුතු සෑම නායකයෙකුම පෙන්නුම් කල

යුතු වන්නේ උන්වහන්සේ පෙන්නුම් කල ආදර්ශයන්ය. උන්වහන්සේ නායකයන් සහ අනුගාමිකයින් පුහුණු කිරිමේ උදාහරණ අප වෙත සපයා දි ඇත.

## ප්‍රධානතම අවශ්‍යතා

දෙවියන්වහන්සේ භාරකාරත්වයෙහි සාර්ථකත්වය මිනිසුයේ ඔවුන්ගේ අධ්‍යාපනයෙන් ස්වාභාවික හැකියා සහ පෞරුෂත්වය තුලින් මනින්නේ නැත. භාරකරුවෙකුගෙන් මුලිකවම බලාපොරොත්තු වන්නේ විශ්වාසවන්ත භාවයයි. **"ඇරත් මෙහිදි ගබඩාකාරයන්ගෙන් ඕනැ කරන්නේ එක එක මනුෂ්‍යයා විශ්වාසව සිටිමය. "** (1 කොරින්ති 4:2)

යේසුස් වහන්සේ මතෙව් 25:14-30 දක්වා උපමා කතාවක් ගෙන හැර දක්වමින් " තලෙන්ත "නම් වු මුදල් ලෙස හැඳින් වු සම්පත් විශේශයක් තම සේවකයන්ට භාරකාරත්වය පැවරු ස්වාමියෙකු ගැන කථා කරයි. ඔවුන් තම අරමුදල් නුවනක්කාර ලෙස භාවිතා කල බැවින් යහපත් ගබඩා කාරයන් ලෙස හැඳින්වීනි. එසේ කල අය විශ්වාසවන්ත ලෙස ගණන් ගනු ලැබු අතර ත්‍යගද ප්‍රධානය කරන ලදි. නමුත් අසාර්ථක වුවන්ට විනිශ්චය සහ වගකිමටද බැඳිමට සිදුවිය.

## කළමණාකරනයේ සේවය

කළමණාකරනයේ සේවය අදාල වන්නේ දෙවියන්වහන්සේ උදෙසා මහත් වු දේ කිරිමට අන්‍යන්ට මගපෙන්විම සම්බන්ධයෙනි මෙම පාඩම් මාලාවෙහි ඔබ ඉගෙන ගන්න කළමණාකරන ප්‍රදේශ පහත දැක්වේ.

**මගපෙන්විම සඳහා ආලේපලත් බව හඳුනාගැනිමේ වැදගත්කම:** නායකත්වය සඳහා අධ්‍යපන, හැකියාවන් සහ අද්දැකිම් වලට වඩා දෙවියන්වහන්සේ විසින් ආලේප කර ඇති බව වඩා වැදගත්වේ.

**නායකත්වයට අවශ්‍ය බයිබලිය සුදුසුකම් සපුරා ගැනිම:** කළමණාකරනයේ සේවය පටන් ගන්නේ තමාව කළමණාකරණය කර ගැනිමෙනි.

**සේවකයකු ලෙස මගපෙන්විමට ඉගෙන ගැනිම:** බයිබලිය නායකත්වය දිප්තිමත් මහජන සම්බන්ධතාවයන් පෙන්නුම් කෙරෙන පුද්ගලිකත්වයට වේදිකාවක් සපයන්නාවු එකක් නොවේ. එය ඔබ නායකත්වය සපයන්නාවු අයව නිහතමානි ලෙස මගපෙන්විමේ සේවයකි. කිතුණු නායකත්වය ලෝකයේ නායකත්වයෙන් වෙනස් වු සේවයකි.

**එඬේරෙකු ලෙස මගපෙන්විමට ඉගෙන ගැනිම:** යේසුස් වහන්සේ ආත්මික නායකත්වය ලෙස විස්තර කරන්නාවු සේවය ස්වාභාවික ලෝකයේ විස්තර කෙරෙන එඬේරෙකුගේ සේවයේ ගුනාංගයන්ට සමානය.

**නායකයකුගේ මුලික කාර්‍ය තේරුම් ගැනිම:** මිට තිරණ ගැනිම, ගැටුම් නිරාකරණය, විනය සම්බන්ධ ප්‍රශ්ණ වල ඇති අමාරු ප්‍රදේශ අදාල වේ.

**නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කිරිම : අප සැවොම මගපෙන්වන්නන් වන නමුත් විටෙක අනුගාමිකයන් වමු. නායකයින්ට අනුගාමිකයින් සිටිය යුතුය. නායකයින් සහ අනුගාමිකයින් යන දෙකොටසම පුහුණුව ලැබිය යුතුය.**

**දේව වචනයේ පෙන්වා ඇති සාර්ථකත්වයේ මුලධර්ම අදාලකර ගැනීම:** මෙම මුලධර්ම ආත්මික සම්පත් සාර්ථක ලෙස කළමාණාකරනය කිරීම සහතික කරයි.

**නායකත්වය අසාර්ථක කරන්නාවූ උල්ලංඝනය කිරීමේ පිටු දැකීම :** නායකත්වයේ සහ අනුගාමිකත්වයේ අසාර්ථකත්වයට හේතුවන්නේ බයිබලිය මුලධර්ම උල්ලංඝනය කිරීමය

**බයිබලිය සංවිධානයක මුලධර්ම තේරුම් ගැනීම :** මීට අදාල වන්නේ දෙවියන්වහන්සේ විසින් ප්‍රකාශයට පත්කර ඇත්තාවූ නායකත්වයේ තත්වයන් සහ සබාවේ ප්‍රායෝගික අවශ්‍යතා සදහා ඒවා සංවර්ධනය කිරීම්ය.

## බයිබලිය සංවිධානයක පදනම

සේවයේ සංවිධාන ස්තිර දැඩි හෝ ලෝකයේ මෝස්තරයට පදනම් වුවක් නොවේ. සංවිධාන ශුද්ධාත්මයාණන් වහන්සේගේ මගපෙන්වීමට නම්‍යතාවයක් දැක්වීමට ඉඩ සපයන්නාවූ එකකි. කළමනාකරන සේවයේ පැවැත්ම රදා පවතින්නේ දෙවියන්වහන්සේ දුන් සැලසුම් සහ කාර්‍යයන් ලගාකරගන්නවා මිස දැඩි සංවිධානාත්මක අයතනික සැකිල්ලක් ගොඩනගා ගැනීමක් තුල නොවේ. සභාවේ සංවිධානය ජීවමාන අංගෝපාංගයකට වඩා සමාන වෙයි. බයිබලය සභාව සමාන කරන්නේ සෑම අංගයක්ම එකට වැඩකරන්නාවූ මනුෂ්‍යය ශරිරයටය. දෙවියන්වහන්සේගේ සංවිධානයන්ට ඔබව තෝරා පත්කරනු ලැබිය නොහැකිය. මනුෂ්‍යයෙකු විසින් ඔබව යම් ධුරයකට පත් කරනු ලැබිය හැකිය. නමුත් නායකයකු කිසි විටෙක පත්කිරීමකින් හෝ තෝරාගැනීමකින් බිහි නොවේ. දෙවියන්වහන්සේ විසින් ඔබව කැදවා රාජ්‍යයේ වැඩ උදෙසා ඔබව සන්නද්ධ කර තිබිය යුතුය. නායකත්වයට තත්වය අදාල වේ. උදාරහරණයක් ලෙස අපෝස්තලුක, දිවැසිවර, එවැන්ජලිස්ත, පාස්ටර් යන ඉගැන්වීමේ සේවය වශයෙනි. නායකත්වයද ක්‍රියාවේ යෙදවිය යුතුය.එහි ප්‍රධාන කාර්‍යය වන්නේ අන්‍යයන්ට සේවය සදහා සන්නද්ධ කිරීමයි. නායකත්වය නායකයන් සහ අනුගාමිකයන් අතර සම්බන්ධතාවය ගැනද සැලකිල්ලක් දක්වයි.

නායකයකු ලෙස තෝරා ගැනීම සහ උසස් කිරීම පැමිනෙන්නේ දෙවියන්වහන්සේගෙන්ය.

> **මක්නිසාද උසස්කම නැගෙනහිරෙන්වත් බස්නාහිරෙන්වත් දකුණෙන්වත් නොවෙන්නේය.**
>
> **නමුත් දෙවියන්වහන්සේ විනිශ්චයනාරයාණෝය. උන්වහන්සේ එකෙකු පහත් කරන සේක. අනෙකෙකු උසස් කරන සේක. (ගීතාවලිය 75 : 6 - 7)**

## කළමණාකරනයේ අනිකුත් ප්‍රදේශ

කළමණාකරණය ඔබගේ සේවයෙහි කාර්‍ය සහ සැලසුම් ක්‍රියාවේ යෙදවීම් විග්‍රහ කිරීම් වලටද අදාල වේ. ඔබට අස්වැන්න සෘතුව අන්තර් ජාතික ආයතනයේ " පාරිසරික විග්‍රහය " යන පාඩම් මාලාවෙන් එවැනි අධ්‍යනයක් පවත්වාගෙන යන්නේ කෙසේදැයි උගත හැකිය. අස්වැන්න සෘතුව ජාත්‍යන්තර ආයතනයේ ඉලක්ක තුලින් කළමනාකරණය" යන ඔබ ඉගෙන ගන්නට යන්නාවූ පාඩම් මාලා පහත දැක්වෙන කළමනාකරණ ප්‍රදේශද ඇතුලත් වේ

දෙවියන්වහන්සේ සමග සමගිකමින් යුතුව සේවයේ කර්තව්‍යය ක්‍රමවත්ව දැක්වීම ඔබ ඔබගේ කර්තව්‍යය සහ දර්ශනය නොදන්නේ නම් ඔබට අනයයන්ව මග පෙන්වීමට නොහැක.

කාර්යය ඉටු කර ගැනිම සඳහා සැලසුම් සකස් කිරීම ඔබට සැලැස්මක් නොමැතිනම් ඔබ ඔබගේ කර්තව්‍යය ඉටුකර නොගනු ඇත.

සැලසුම් ක්‍රියාත්මක කිරීමට මනුෂ්‍යයන් සහ කාර්ය පටිපාටියන් සංවිධානය කිරීම දවියන්වහන්සේගේ සැලසුම් සහ කාර්යයෙහි කොටසක් වශයෙන් ඉලක්ක සපුරා ගැනිමේදි පෙළඹවීම සහ අධික්ෂණය යන්නද කළමණාකරනය යන්නට අදාල වේ.

ඇගයිම මගින් සැලසුම් සම්පුර්ණ කිරීම දෙවියන්වහන්සේගේ කාර්යය උපරිම විශිෂ්ඨත්වයෙන් යුතුව කල යුතුය

## යහපත් කළමණාකරනයක වැදගත්කම

නියම සේවයේ කළමණාකරනයක වැදගත්කමට හේතු කිපයක් පහත දැක්වේ.

**කාර්ය සහ දිශාව පෙන්නුම් කරයි.**

ඔබ සේවයේ සාර්ථක වන්නට නම් ඔබට කාර්යයක් සහ සැලසුමක් තිබිය යුතු අතර, ඒවා ගැන දෙවියන්වහන්සේ සමග එකගවීමක්ද ඒවා අන්‍යයන් වෙත ගෙන යාමට හැකියාවක්ද තිබිය යුතුය. ඔබගේ සේවයේ නිශ්චිත කාර්යය ගැන ඔබ දැනගෙන සිටින විට සහ එම කාර්ය ඉටුකර ගැනිමට සැලසුම් කරන විට ඔබට අන් අයට මගපෙන්වීමට පෙරතුව නායකයින් තමන් යන්නේ කොහිදැයි දැනගත යුතුය. ඒකත්වය සහ මගපෙන්වීම සේවයේ පොදු කාර්යක් සහ දිසාවක් පෙන්නුම් කරයි.

**වියවුල් ඉවත් කිරීම**

නිශ්චිත දිශාවක් ඇතිවිට වියවුල් ඉවත්වි යනු ඇත.

මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල්කමේ නොව සමාදානයේ දෙවියන්වහන්සේය (1 කොරින්ති 14 : 33)

දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් වියවුල්කමේ පෙන්නුම් නොකරන්නේ නම් උන්වහන්සේගේ ස්වකයන්ගේ ක්‍රියා ද එසේම වනු ඇත.

**නිවැරදි තිරණ ගැනිමට අවසරදිම**

තිරණ ඔබගේ ඉරනම තිරණය කරනු ඇත. මෙය ගැලවීම ගැන වුවද සත්‍යයකි. ඔබ ශුභාරංචිය පිළිගැනිම හෝ නොපිළිගැනිම මත ඔබගේ සදාකාල ඉරනම තීරණය කරගනු ඇත. ඔබගේ වර්තමාන ජිවිතය සහ සේවය තිරණය කරන්නේ ඔබ විසින් අතිතයේ ගනු ලැබු තිරණ මතය. ඔබ තිරණ ගන්නේ සිතාමතා හෝ ඒ මොහොතට ඇතිවන්නාවු හැගිම් මත විය හැකිය. යහපත් කලමණාකරනය දෙවියන්වහන්සේගේ මගපෙන්වීමට අනුව නිවැරදි තිරණ ගැනිමට අවසර දේ

**සේවයේ ප්‍රමුඛතා ව්‍යාජත කිරීම**

ප්‍රමුඛතා යනු අන් ඒවාට වඩා ප්‍රමුඛතාවයක් ලැබිය යුතු දේවල්ය. ඒවා ඔබගේ කාලයෙහි යන අවධානයෙහි පළමු ස්තානය ලැබිය යුතු දේ බවයි. ඔබ සිහි ඇතිව තිරණය කලත් නොකළත් ඔබගේ ජිවිතයේ ප්‍රමුඛතා

තිබිය හැකිය. ඔබ ප්‍රමුඛතාවයක් දක්වන්නේ ජිවිතයේ පුරුද්දක් වශයෙන් හෝ ඔබ වටා ඇති මිනිසුන් විසින් ඔබවෙත ඉදිරිපත් කරන පීඩනය හෝ වතාවරණය අනුව හෝ දෙවියන්වහන්සේගේ කාර්යයෙහි නිශ්චිත තිරණ පදනම් කරගෙන විය හැකිය.

**ප්‍රතික්‍රියාවකට වඩා ක්‍රියාවකට අවසර දිම**

බොහෝ සේවකයන් අනාගතය ගැන සැලසුම් කරනවාට වඩා වර්ථමාන හදිසි තත්වයන් සඳහා ප්‍රතිචාර දැක්වීමට නිර්මාණය වු ඒවාය. මෙය නායකයින්ට නුවනින් සහ කාර්ය උදෙසා ක්‍රියාකරනවාට වඩා ප්‍රතිචාර දැක්වීමට හේතු උපදවයි.

ක්‍රම සම්පාදනයක් හෝ සැලසුමක් නොමැතිව ඔබ සේවයෙහි කුමක්, කෙසේ, කුමන, හේතුවත් මත කරන්නේද යන්න ගැන නොදනි. මක්නිසාද ඔබට සංවිධානයක් හෝ දිශාවක් නොමැතිනම් ඔබට කැපවීමට දෙයක් නැත. ඔබට දෙවියන්වහන්සේ වෙනුවෙන් ඇගයීමට ලක්වීමට ප්‍රඟලතායවයක්ද නැත. ඔබ පහසුවෙන්ම ප්‍රතිචාර දැක්වීමට සහ අර්බුදකාරි අවස්ථාවලදි අත්හැර යෑමටද පෙළඹෙනු ඇත.

යහපත් කළමණාකරණය අගාවන් යථාර්තවාදි දර්ශණ බවට සහ ප්‍රදර්ශණය කිරීම් බවට පරිවර්ථනය කරයි. එය ඔබ කළ යුත්තේ කුමක්ද සහ එය දෙවියන්වහන්සේගේ කාර්ය ඉටුකිරීමෙහි කලයුත්තේ කෙසේද යන්න තිරණය කිරිමට ඔබට උපකාරි වේ.

**වගකීම් ප්‍රදර්ශණය කිරිම**

මතෙව් 25 : 14-30 දක්වා වු තලෙන්ත උපමාවේ සඳහන් පරිදි සේවකයන් ඔවුන් වෙත පැමිණෙන්නාවු වගකීම් සම්බන්ධයෙන් වගකිව යුතු වුහ. ඔවුන්ගේ ස්වාමියා වෙත සැලසුමක් විය. එය සේවකයන් වෙත සම්ප්‍රේශණය වු අතර, ඔවුන් වෙත ලැබුනු අරමුදල් ඒ කි සැලසුම් සඳහා ආයෝජනය කල යුතු විය.

ඔබ වගකිව යුතු වන්නේ දෙවියන්වහන්සේ ඔබගේ ජිවිතයට සහ සේවයට තබා ඇති සැලසුම ගැන දැනගැනිම පමණක් නොව එය කිරිම ගැන පවා ඔබට වගකිමට සිදුවේ.

> **තමාගේ ස්වාමියාගේ කැමැත්ත දැනගෙනත් සුදානම් නොකලාවු, ඔහුගේ කැමැත්ත ලෙස නොකලාවු දාසයා බොහෝ පහර ලබන්නේය. (ලුක් 12:47)**

ඔබට පවරා ඇති සේවය නුවනක්කාර ලෙස කළමණාකරණය කරගැනිම නොකරන්නේනම් ඔබ වගකිමට යටත්වනු ඇත.

**ඇගයීමට අවසර දිම**

දෙවියන්වහන්සේගේ කාර්ය සහ සැලසුම් ඉෂ්ඨකිරීමේදි ඇගයීමට ලක්වීමද කළමණාකරණය යන්නට අදාලවේ. සාර්ථකත්වයේ බයිබලිය මුලධර්ම සහ අසාර්ථකත්වයට හේතු තේරුම් ගැනිම, ඒවැනි ඇගයීමකට අවසර ලබා දේ.

**ආත්මික සම්පත් නුවනක්කාර ලෙස ප්‍රයෝජනයට ගැනිමට අවසර දිම.**

යහපත් කළමාණාකරනය ඔබට ආත්මික සම්පත් නිසිලෙස කළමණාකරනය කිරීමට සහ දෙවියන්වහන්සේගේ රාජ්‍යය උදෙසා අරමුදල්, ද්‍රව්‍ය, තනතුරු, මිනිසුන් සහ ආත්මික දිමනා කෙරෙහි නිසි භාරකාරත්වයක් දැරීමට හැකියාව ඇති කරයි.

**විවෘත දොරවල් තුලින් ඇතුල් වීමට ඔබව සුදානම් කිරීම**

මක්නිසාද මහත්වූ බලවත් වූ දොරක් මට ඇර තිබේ. බොහෝ විරුද්ධකාරයෝද සිටිති. (1 කොරින්ති 16:9)

දෙවියන්වහන්සේ දොරවල් විවෘත කරන විට ඔබ ඒ තුලින් ඇතුලුව අලුත් අභියෝග වලට මුහුණ දිමට සුදානම් විය යුතුය. නිසි සුදානමකින් තොරව මෙය කල නොහැකිය. මතෙව් 25:1-13 දක්වා සඳහන් නුවණ ඇති සහ නුවණ නැති කන්‍යාවන් පිලිබඳ උපමා කථාව කියවන්න.

දෙවියන්වහන්සේ දොරවල් විවෘත කරන අතර, ඒවා සදහටම විවෘතව තැබෙන්නේ නැත. ඒවා විවෘතව ඔබ ඒවාට ඇතුලත්වනවාද යන්න බලාසිටී. පසුව ඒවා වැසියනු ඇත. සමහරවිට ඒවා නැවත කිසි විටක විවෘත නොවනු ඇත.

## දෙවියන්වහන්සේගේ කැමැත්ත සමග සේවය සමගි කිරීම

අපෝස්තුලු පාවුල්තුමා හැරීමෙන් පසුව ඔහු විසින් අසනලද පළමු ප්‍රශ්ණය වන්නේ ඔබ මට කරන්නට පවරන්නේ කුමක්ද? යන්නයි. ඔහු දෙවියන්වහන්සේගෙන් අසමින් සිටියේ මාගේ ජිවිතයට සහ සේවයට ඔබවහන්සේගේ සැලසුම කුමක්ද? යන්නයි. නුවනැති ගබඩාකාරිත්වය ඔබගේ ජිවිතය සහ සේවය සමග දෙවියන්වහන්සේගේ කාර්‍යය සහ සැලැස්ම සමගිකරවන්නේය.

## දෙවියන්වහන්සේ නායකයන් සොයන්නේය

දෙවියන්වහන්සේ සාවුල් රජතුමාට මෙසේ කිවේය. :

> **නුමුත් දැන් නුඹේ රජකම පවතින්නේ නැත. ස්වාමින්වහන්සේ නුඹට අණ කල දේ නුඹ රක්ෂා නාකල බැවින් උන්හන්සේ තමන්ගේ සිතට එකග වු මනුෂ්‍යයෙකු සොයාගෙන තමන්ගේ සෙනග කෙරෙහි අධිපතියා වෙන්ට ඔහු නියමකර තිබේ යැයි කිවේය. (1 සාමුවෙල් 13:14)**

දෙවියන්වහන්සේ තවමත් නායකයන් ලෙස පාවිච්චි කළ හැකි මිනිසුන් සොයමින් සිටී :

> **මා විසින් දේශය නාස්ති නොකරණ පිණිස පවුරක් ගොඩනගා දේශය උදෙසා මා බදිරිපිට ඩුල්ලෙහි සිටිමට ඔවුන් අතරේ මනුෂ්‍යයෙකු සෙව්මි. නමුත් කිසිවෙකු මට සම්බනුනේය. (එසකියෙල් 22:30)**
>
> **මක්නිසාද ස්වාමින්වහන්සේ කෙරෙහි සම්පූර්ණ සිත් ඇත්තන්ට පිහිට වන පිණිස උන්වහන්සේගේ බලය පාමින්, උන්වහන්සේගේ ඇස් පොළොව මුලුල්ලෙහි ඔබ මොබ දුවන්නේය. මේ ගැන නුඹ අනුවන ලෙස ක්‍රියා කලෙහිය. මෙතැන් පටන් නුඹට විරුද්ධව යුද්ධ ඇති වන්නේ යැයි කීවේය. (2 ලේකම් 16:9)**

යහපත් කළමණාකරුවෙකු වීමට කාළය සහ උත්සහය අවශ්‍යවේ.

**එක් එක්කෙනාගේ කාර්මාන්තය ප්‍රකාශ වන්නේය. මක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය. එක් එක්කෙනාගේ කාර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පුවන්නේය.** (1 කොරින්ති 3:13)

ලී තෘණ පිදුරු සියල්ල වැඩෙන්නේ පොළව මතය. එය ලෙහෙසියෙන් නිෂ්පාදනය කළ හැකි අතර මිනිසාට එය දැකිමටද හැකිය. එමෙන්ම එය ඉක්මනින් විනාශවී යයි. රන් සහ රිදී ලෝහවන අතර, ඒවා පොළව යට නිෂ්පාදනය වේ. ඒවා මිනිසුන්ට නොපෙනෙන නමුත් ඒවා වඩා කල්පවත්නේය.

දීප්තිමත්, ප්‍රසිද්ධ, ලෞකික නායකත්වයද ලී තෘණ සහ පිදුරු මෙන්ය. එය මිනිසා තුලින් පෙනෙන අතර පහසුවෙන් ස්වාභාවික තලෙන්ත සහ හැකියාවන් තුලින් නිෂ්පාදනය කල හැක. දේව නායකත්වය රන් සහ රිදී මෙන්ය. එය නිශ්පාදනය වන්නේ ශුද්ධාත්මයාණන්ගේ අනුහසින් අභ්‍යාන්තරව මිනිසා තුල සැගවීය. නමුත් එය ඒකාන්තයෙන්ම වටිනා සහ කල්පවත්නේය.

# පුද්ගලික පරීක්ෂණය

1. ප්‍රධාන පද මතකයෙන් ලියන්න

2. "කළමණාකරනය" යන්න විස්තර කරන්න

3. ඇදහිලිවතුන් කළමාණාකරුවන් වන ආත්මික සම්පත් ලැයිස්තුවක් සාදන්න

4. භාරකරුවන් විමට අවශ්‍යය ප්‍රධානම සුදුසුකම කුමක්ද ?

5. නායකත්වයේ විශිෂ්ඨතම උදාහරණය වන්නේ කවුරුද ?

6. මෙම පාඩමෙහි සාකච්ජා වු දෙය මත පදනම් වි සිට " සේවය කළමණාකරනය කිරීම " ගැන සංක්ශිප්ත විස්තරයක් ලියන්න.

7. යහපත් කළමණාකරනයක් වැදගත් වන්නේ ඇයි ?

(මෙම සංග්‍රහයේ අවසානයේ පරීක්ෂණ වල පිලිතුරු අන්තර්ගතව ඇත.)

## වැඩිදුර අධ්‍යනය සඳහා

1. යේසුස් වහන්සේ ස්වර්ගය, නරකාදිය සහ ගැලවීම යන දේවල් වලට වඩා නිලතලවල භාරකාරත්වය ගැන වඩා වැඩියෙන් ඉගැන්වූ සේක.

2. ඔබ අනිත් අයට බලපෑම්කරන නිසා නායකත්වයට වැඩි වගකීමක් ඇත්තේය. උදාහරණයක් ලෙස පේදුරු තුමා “මම මාළු අල්ලන්ට යමියි” කී විට විගස ඔහු සමග සිටි අනිත් අයද “අපිත් ඔබ සමග එන්නෙමුයි” කිවෝය. නායකත්වය වැදගත් වන්නේ නායකයා දෙවියන්වහන්සේගේ පනිවිඩකාරයෙකු වන බැවිනි. (මලාකි 2 : 7)

3. මෙම ලෝකයේ සහ ආත්මික කළමණාකරනය පිළිබඳ සැසඳීම අධ්‍යයනය කරන්න.

- ලෝකයේ කළමණාකරනයේදි බලය තිරනය වන්නේ දක්ෂතා, හැකියාවන් සහ දැනුම මතය.

- ආත්මික කළමණාකරණයේදි බලය තිරණය වන්නේ ආලේපය සහ දෙවියන්වහන්සේගේ අධිකාරිත්වය මතය.

- ලෝකයේ කළමණාකරනයේදි නායකයින් තෝරාගන්නේ දක්ෂතා සහ අධ්‍යනය වැනි කරුණු මත පිහිටාය.

- ආත්මික කළමණාකරනයේදි නායකයින් තෝරාපත්කරගන්නේ ආලේපය, කැදවීම, සහ දෙවියන්වහන්සේගේ කැමැත්ත එලිදරව් වීම යන කරුණු මත පිහිටා සිටය.

- ලෝකයේ කළමණාකරනයේදි පුහුණුව ලබා දෙන්නේ දක්ෂතා සහ දැනුම යන කරුණු සඳහාය.

- ආත්මික කළමණාකරනයේදි පුහුණුව ලබාදිය යුත්තේ දෙවියන්වහන්සේගේ වචනයට අනුකූලව ජීවිතය හැඩගස්වා ගැනිමට අවශ්‍ය දක්ෂතා ඔප්නංවා ගැනිමටයි.

4. දෙවියන් වහන්සේ සේවය කළමණාකරන්නන් සමග සහභාගිකම් දරන සේක. පාවුල් තුමා පැවසුවේ:

**ඉදින් අපොල්ලොස් කවුද? පාවුල් කවුද? ස්වාමින්වහන්සේ එකිනෙකාට දුන් ලෙස නුඹලා ඇදහිමට පැමිණෙවු සේවකයෝය. මම පිහිටෙවුවෙමි අපොල්ලොස් වතුර වත්කලේය. නුමුත් වර්ධනය දුන්නේ දෙවියන්වහන්සේය.**

**එබැවින් වර්ධනය දෙන දෙවියන්වහන්සේ මිස, හිටවන තැනැත්තේද වතුර වත්කරන තැනැත්තේද කිසිත් නැත. (1 කොරින්ති 3 : 5 - 6)**

4. ලෝකයේ කළමණාකරනය අවධාරනය කරන්නේ

| | |
|---|---|
| මුදල් | සේවය |
| නිශ්පාදනය | යාච්ඤාව |
| කරුණු | ඇදහිල්ල |
| වෘතියමහාවය | ආලේපය |
| රීති | ප්‍රේමය |
| දක්ෂතා | දේව වචනය |
| පෞරුෂත්වය | චරිතය |
| බුද්ධිමත්භාවය | ආත්මික තත්වය |
| විධානය දිම | මගපෙන්වීම |
| අවධානම් | සම්බන්ධතා |
| තම කැමැත්ත | කීකරුකම |
| තරගය | සහයෝගිතාව |

ආත්මික කළමණාකරනය අවධාරනය කරන්නේ (right column above)

5. සෑම ඇදහිලිවන්තයෙකුම කළමණාකරන වගකීම් පැවරෙන මෙම ලැයිස්තුව අධ්‍යනය කරන්න. අප වගකිව යුතු වන්නේ

| | |
|---|---|
| දෙවියන්වහන්සේගේ මැවිල්ල | උත්පත්ති 1 : 26 - 28 |
| දෙවියන්වහන්සේගේ රහස් | 1 කොරින්ති 4 : 1 |
| සුභාරංචි පනිවුඩය | 1 තෙසලොනික 2 : 4 |
| ආත්මික දිමනා | 1 පේත්‍රුස් 4 : 10 |
| සමාව දිම | මතෙව් 6 : 12, 18 : 21 - 22 |
| ප්‍රේමය | 1 යොහාන් 4 : 7 - 8 |
| මනස | පිලිප්පි 4 : 8 |
| බලය | ක්‍රියා 1 : 8 |
| වේලාව | එපිස 5 : 15 - 16 |
| දෘෂ්ඨිය | 1 සාමුවෙල් 16 : 7 |
| ආකල්ප | පිලිප්පි 2 : 2 |
| ඇදහිල්ල | යාකොබ් 2 : 14 - 17 |
| මුදල් | 2 කොරින්ති 9 : 6 - 11 |
| ප්‍රශංසාව | හෙබ්‍රෙව් 12 : 15 - 16 |
| සේවය | ගලාති 6 : 2 |
| ශරීරය | රෝම 12 : 1 |
| චරිතය | තිතස් 1 : 7 - 9 |
| පවුල | 1 තිමෝති 3 : 4 - 5, - 12 : 5 ජ් 8 |

## දෙවන පරිච්ජේදය

### නායකත්වයේ තනතුරු

**අරමුණ :**

මෙම පරිච්ජේදය සම්පුර්ණ කලවිට ඔබට, පහත දේ උගත හැකිය :

- ප්‍රධාන පද මතකයෙන් ලිවිමට
- දෙවියන්වහන්සේ විසින් ඇතිකොට ඇති දෙවස්ථානයේ ඇති විශේෂ තනතුරු මොනවාදැයි හඳුනා ගැනිමට
- මෙම නායකයන් සේවයේදි එක්ව වැඩකරන ආකාරය හඳුනා විස්තර කිරිම
- ආත්මික නායකත්වය තුල ආත්මික දිමනා භාවිතා කරන්නේ කෙසේද, කියා විස්තර කිරිම.
- අනිකුත් බයිබලිය තනතුරු හඳුනා ගැනිම.

**ප්‍රධාන පදය :**

> **උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගත වක්තෘවරුන්ද, සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද, සමහරුන් සභාපාලකයන්ද, සමහරුන් ගුරුවරුන්ද, කොට දුන් සේක. (එපිස 4:11)**

### හැදින්විම

සභාය යනු දෙවියන්වහන්සේ පුද්ගලිකව තමාව ලෝකයට හෙලිදරව්කිරිම සඳහා භාවිතා කරන භාජනයයි. මෙම පාඩමෙන් ඔබ දෙවියන්වහන්සේ විසින් සභාව තුල නිර්මාණය කර ඇති නායකයින් පිළිබඳව ඉගෙන ගන්නවා ඇත. දේශිය සභාවේ ප්‍රායෝගික ප්‍රයෝජනය සඳහා නිර්මාණය වි ඇති අනිකුත් කියකත්ව තනතුරු ගැනද ඔබ ඉගෙන ගන්නවා ඇත.

පාඩමේ විස්තර කෙරෙන නායකත්වයේ තනතුරු පිරවිමේදි ඊට අවශ්‍යය නිශ්චිත සුදුසුකම් බයිබලය ගෙනහැර දක්වයි. ඔබගේ සුදුසුකම් ගැන 4 වන පරිච්ජේදයේදි අධ්‍යනය කරනු ඇත.

### විශේෂ නායකත්ව තනතුරු

**තනතුරු :**

දෙවියන්වහන්සේ විසින් සබාව තුල නිර්මාණය කර ඇති විශේෂ නායකත්ව තනතුරු 5 ක් ගැන බයිබලය හඳුන්වා දේ.

> **උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගතවක්තෘ වරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද, සමහරුන් සභාපාලකයන්ද, සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. (එපිස 4:1)**

මේ නායකත්වයේ තනතුරු සභාව තුල දෙවියන්වහන්සේ විසින් ව්‍යාප්ත කොට ඇත. මීට විශේෂ වු දෙවියන්වහන්සේගේ කැඳවීමක්ද, විශේෂ ආත්මික දිමනාද ඇත. ඔබ මෙම තනතුරු සඳහා ඇලුම් වු නිසාවෙන් හෝ යමකු ඔබට ඒවා දැරීමට කියන්නාවු නිසාවෙන් හෝ මේ කී තනතුරු නොදැරිය යුතුය. ඔබට දෙවියන්වහන්සේගෙන් ලද කැඳවීමක් සහ නිසි ආත්මික දීමනාවලින්ද ඔබ සන්නද්ධ විය යුතුය.

**ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය**

මේ කී පස් වැදෑරුම් නායකත්ව තනතුරු වල දක්නට තිබිය යුතු ක්‍රියාකාරිත්වය පිළිබඳ කෙටි විස්තරයක් මෙන්න.

***අපෝස්තුලු :***
අපෝස්තුලුවරයෙකු යනු විවිධ ස්ථානවල අලුතෙන් සභා සංවර්ධනය කිරීමට විශේෂ හැකියාවක් ඇති පරික්ෂකවරයෙකු ලෙස සභා ගණනාවක් බලාගත හැකි පුද්ගලයෙක්ය. "අපෝස්තුලු" යන්නෙහි තේරුම තවත් අයෙකු කෙරෙහි ක්‍රියා කිරීමට පූර්ණ බලතල සහ අධිකාරිත්වය සහිතව එවන ලද නියෝජිතයෙකි. අපෝස්තුලුවරයා යනු විශේෂ අධිකාරිත්වයක් හෝ හැකියාවක් ඇති ලෝකය තුල ශුභාරංචිය ව්‍යාප්ත කලහැකි සංවර්ධිත ඇදහිලිවතුන්ගේ කණ්ඩායම් සංවිදානය කරන්නෙකි. වර්ථමානයේ අපෝස්තුලු යන්නෙහි තේරුම "මිෂනාරිවරයෙකු" හෝ "සභා බිහිකරන්නෙකු " යන්නෙන් අදහස් වේ. අපෝස්තුලු පාවුල් තුමා අපෝස්තුලු වරයෙකු යන්නට බයිබලය දි ඇති හොඳම උදාහරණයයි.

***අනාගතවක්තෘ :***
අනාගතවක්තෘවරයෙකු දෙවියන්වහන්සේගේ කෙලින්ම බලපෑම යටතේ කථා කරන්නාවු සභාවේ අධිකාරිත්වයෙන් යුත් නිලයක් දරන්නෙකි. දිව්‍යමය ලෙස ආලේපය ලැබීමකින් කථා කරන්නාවු දෙවියන්වහන්සේගේ ඉක්මන් පණිවුඩ ලැබ ඒවා මනුෂ්‍යයින්ට ප්‍රකාශ කරන්නාවු අයෙකි. අගබස් යනු අපෝස්තුලු වරයෙකු යන්නට නව ගිවිසුමේ එන උදාහරණයකි.

***එවැන්ජලිස්තවරු :***
එවැන්ජලිස්තවරයෙකු යනු ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ වගකිවයුතු සාමාජිකයින් වන පිනිස නොඇදහිලිවතුන් වන මිනිසුන් සහ ගැහැනුන් සමග ශුභාරංචිය බෙදා ගැනිමට විශේෂ හැකියාවක් එවැන්ජලිස්තවරයෙකු සතුය. එවැන්ජලිස්තවරයා යන්නෙහි තේරුම " ශුභාරංචිය ගෙනෙන්නාවු පුද්ගලයා " යන්නයි. පිලිප් එවැන්ජලිස්තවරයා යන්නට හොඳ උදාහරණයකි. (ක්‍රියා 21 : 8 සහ 8 වන පරිච්ඡේදය බලන්න.

***සභාපාලකයා :***
"සභාපාලකයා" යන වචනයේ තේරුම "එඬේරා" යන්නයි. සභාපාලකයා යනු ඇදහිලිවතුන් කණ්ඩායමකගේ ආත්මික සුභසාධනය පිණිස දිගුකාලිනව පුද්ගලිකව වගකිම දැරීමට සහතික වන්නෙකි.

***ගුරුවරයා :***
ගුරුවරයා යනු දේව වචනය ප්‍රබල ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇති සහ එමෙන්ම ඉගැන්වු දේ අදාලකරගත හැකි අයුරින් අන්‍යයන්ට ඉගැන්විය හැකි අයෙකි.

**අනිකුත් කාර්යය :**
මෙම විශේෂ තනතුරු ඇතිකර ඇත්තේ පහත සඳහාන් කාර්ය ඉටුකර ගැනිමටය.

එසේ දුන්නේ ඇදහිමේද, දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැන්මේද, එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂ කමටත්, ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණ උස මහතේ ප්‍රමණයටත් අප සියල්ලන්ම පැමිණෙන තෙක් ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණවීම සඳහා, සේවය කිරීමේ වැඩය පිණිසත්, ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිනිසත්ය.

> **තවද අපි තවත් මනුෂ්‍යයින්ගේ වංචාවෙන්, ප්‍රයෝගයෙන්ද, රැවටිල් සහිත උපායෙන්ද හට ගන්නා සියලු ආකාර ඉගැන්වීම් නැමැති සුළඟින් ඈත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථා කරමින් හිසව සිටින ක්‍රිස්තුස් වහන්සේ උදෙසා සියලු දේ වලදි වැඩෙන පිනිසත්ය. (එපිස 4 : 12 - 15)**

පහත සඳහන් රූප සටහන මෙම කාර්‍යයන් විස්තර කරයි.

දෙවියන්වහන්සේ

දෙනු ලැබේ

අපෝස්තුලු | අනාගතවක්තෘ | එවැන්ජලිස්ත | සභාපාලක | ගුරුවර

සඳහා

සම්පූර්ණත්වයට / ශාන්තුවරයින් සන්නද්ධ කිරිම

කරනු ලබන්නාවූ

සේවය | සංස්කරණය

ප්‍රතිඵල ගෙන දිමට

ඒකත්වය | දැනුම | සම්පූර්ණත්වය

ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය මෙසේ වන පිනිස

තවත් කුඩා ළමුන් නොවන පිනිස (වැරදි ඉගැන්වීම) | උන්වහන්සේ තුල වර්ධනය වන පිනිස (සත්‍යය)

**අවසාන ප්‍රතිඵලය : ශරිරයේ සියලු අවයව ප්‍රේමයෙන් ප්‍රභල ලෙස වර්ධනය වන පිනිස.**

**ඒවා එකට වැඩ කරන්නේ කෙසේද :**

සභාවේ සෙවයෙහි පස්වැදෑරුම් විශේෂ තනතුරු එකට ක්‍රියා කරයි.

**අපෝස්තුලු** : නව සභා බිහිවන පිණිස නව ප්‍රදේශ වල ශුභාරංචිය පතුරුවා හැරීම

**එවැන්ජලිස්තවරයා** : නොඇදහිලිවතුන් ප්‍රතිචාර දක්වමින් සභාවට ගත හැකිවන අයුරින් ශුභාරංචිය සන්නිවේදනය කිරීම.

**අනාගතවක්තෘ** : ශුද්ධාත්මයාණන් වහන්සේගේ පෙළඹවීමෙන් දෙවියන්වහන්සේගෙන් ලැබෙන විශේෂ පනිවුඩය සභාවට දෙන්නාවු අයෙක්

**ගුරුවරු** : එවැන්ජලිස්තවරුන් විසින් ප්‍රකාශිත ශුභාරංචිය ඉක්මවා යමින් උපදෙස් දිම මොවුන් විසින් කරනු ලැබේ. ඔවුන් නව ඇදහිලිවතුන් ආත්මික පරිනතභාවයෙහි පිහිටුවීම සහ අනිත් අයට ඉගැන්වීමේ හැකියාව ඇති අයවලුන් පුහුණු කිරීම කරයි.

**සභාපාලකවරු** : සභාව රැකබලා ගනිමින් දිගුකාලිනව නායකත්වය සැපයිම.

**නායකත්වය තුල ඇති ආත්මික දිමනා**

සභාව තුල ඇති තනතුරුවන්නේ ඉහත කී පස්වැදෑරුම් තනතුරු පමණක් නොවේ. සෑම ඇදහිලිවන්තයෙකුටම සභාව තුල කිරීමට කාර්යයක් ඇත.

> **නුමුත් දෙවියන්වහන්සේ තමන්ගේ කැමැත්ත ලෙස ඒ සියලු අවයවයන් වෙන වෙනම ශරීරයේ තැබූ සේක. (1 කොරින්ති 12 : 18)**

සෑම ඇදහිලිවන්තයෙකුටම අඩුතරමින් එක ආත්මික දිමාවක් හෝ ඇත. එතුමා ආත්මික දිමනාව දි ඇත්තේ එම පුද්ගලයාට සබාව නැමැති ශරීරය තුල තමාට නියමිත ක්‍රියාව කරන පිනිසය.

> **නුමුත් ඒ එකමවූ ආත්මයාණන්වහන්සේ තම් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදාදෙමින් මෙ සියල්ල කරවනසේක. (1 කොරින්ති 12 : 11)**

අප දැනටමත් විශේෂ ආත්මික දිමනා වන අපෝස්තුලු, අනාගතවක්තෘ, එවැන්ජලිස්ත, සභාපාලක, සහ ගුරුවර, යන ඒවා ගැන සඳහන් කර ඇත.

ඇදහිලිවතුන්ට ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් දෙනු ලබන ආත්මික දිමනා සමහරක ලැයිස්තුව මෙසේය:

කථාකිරීමේ දිමනා : අනාගතවාක්‍ය, ඉගැන්වීම, අනුශාශනය, ඥානයේ වචනය, සහ දැනුමේ වචනය.

සංග්‍රහකිරීමේ දිමනා : සංග්‍රහකිරීම, උපකාර කිරිම, නායකත්වය, පරිපාලනයදිම, කරුණාව පෙන්වීම, ආත්මවිමසීමේ දිමනාව, ඇදහිල්ල සහ ආගන්තුක සත්කාරය

සංඥා දිමනා : අන්‍යභාෂාව, අන්‍යභාෂාව පරිවර්ථනය කිරීමේ දිමනාව, හාස්කම්, සහ සුව කිරීම.

**මේ කී දිමනා සඳහා අදාල බයිබල් පද :**

- රෝම 12 : 1 - 8
- 1 කොරින්ති 12 : 1 - 31
- එපීස 4 : 1 - 16
- 1 පේතෘස් 4 : 7 - 11

(අස්වැන්න සෘතුව ජාත්‍යන්තර ආයතනයේ “ ශුද්ධාත්මයාණන්ගේ සේවය ” නැමැති පාඩම් මාලාවේ මේ කී දීමනා ගැන සවිස්තරව උගන්වනු ඇත. එයත් මේ ආකාරයෙන්ම ඔබගේ ආත්මික දීමනා සොයා ගැනිමට මාර්ගෝපදේශකත්වය සපයයි.)

## කළමණාකරුවන්ට වැදගත්වන දීමනා

මෙම ආත්මික දීමනා වලින් නායකත්වයට පරිපාලනයට අදාල දීමනා දෙකක් විශේෂයෙන්ම කළමණාකරුවන්ට වැදගත්ය. (රෝම 12:8) නායකත්වයේ දීමනා විස්තර කර ඇත්තේ “පාලනය” කරන්නන් මගපෙන්වන්නන් ලෙසය. නායකයන්ගේ දීමනා ඇති පුද්ගලයාට දෙවියන්වහන්සේගේ කාර්ය සමග සමගිකමින් යුත් සැලසුම් නිර්මාණය කිරීමටද, එම ඉලක්කය අන්‍යයන් වෙත සන්නිවේදනය කිරීමේ හැකියාවද ඇත. ඔහු දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා මෙම ඉලක්ක ඉටුකිරීමට අන්‍යයන් පොළඹවයි.

1 කොරින්ති 12 : 28 පරිපාලනය කිරීමේ දීමනාව හදුන්වා ඇත්තේ “ අන්ඩු ” කියාය. මෙම දීමනාව ඇති අයවලුන්ට අන්‍යයන් වෙනුවෙන් දීමනාව පෙන්වීමේ, සංවිධානය කිරීමේ, තීරණ ගැනීමේ හැකියාව ඇත. “ ආණ්ඩු ” හෝ “ පරිපාලනය ” යන වචනය නැවත සුක්කානම පදවන නියමුවෙකුට සමාන අරුත් දේ. මෙම දීමනාව ඇති පුද්ගලයා දිශාව පෙන්වීම සහ තීරණ ගැනීම සම්බන්ධයෙන් වගකිවයුතුවේ. නැවක නියමුවෙකු ලෙස දිනුමේ අයිතිකරු නොවිය හැක. නමුත් ඔහුට මුහුදු ගමන සදහා වගකීම පවරී දී ඇත. පරිපාලනය කිරීමේ දීමනාව සතු පුද්ගලයෙකුට බයිබලයේ ඇති උදාහරනය තීතස්ය. අපෝස්තුලු පාවුල් තුමා ක්‍රිතයේ සභාවක් ආරම්භ කළේය. ඔහු වෙනුවෙන් එය සංවිධානය කිරීම සහ අධ්‍යක්ෂණය කිරීම කරන ලද්දේ තීතස් විසිනි.

> **පොදු ඇදහිල්ලේ හැටියට මාගේ සැබෑවූ දරුවාවූ තීතස්ට ලියා එවන වගනම්, පියවූ දෙවියන්වහන්සේගෙන්ද අපගේ ගැලවුම්කරුවූ ක්‍රිස්තුස් යේසුස් වහන්සේගෙන්ද කරුණාවත් සමාදානයත් වේවා. මා එන විට නුඹ ක්‍රිතයේ නැවැත්වූ කාරණය නම් අඩුව තිබුනු දෙවල් නුඹ විසින් පිළිවෙලට ගෙනෙන පිනිසත් මා නුඹට ආඥා කල ලෙස නුවරක් පාසා වැඩිමහල්ලන් පත්කරන පිනිසත්ය. (තීතස් 1:4-5)**

නායකත්වයේ සහ පරිපාලනයේ දීමනාව හොඳින් එකට ක්‍රියා කරයි. පරිපාලනයේ දීමනාව ඇති පුද්ගලයාට අධ්‍යක්ෂනය, සංවිධානය සහ තීරණ ගැනීමේ හැකියාව ඇත. නායකත්වයේ දීමනාව ඇති පුද්ගලයාට මෙම ඉලක්ක ලගාකරගැනීමට මිනිසුන් පෙළඹවීම සහ එකට වැඩ කරන හැකියාව ඇත.

## සෑම දෙනෙකුටම සේවය කළ හැක.

නායකත්වය මේ කී පස්වැදෑරුම් විශේෂ තනතුරු දරන්නන්ට සහ ඉහත කී දීමනා දෙක පමණක් ඇති අයවලුන්ට පමණක් සීමා නොවේ. සභා නායකයන් විසින් අනෙකුත් ආත්මික දීමනා ඇති ඇදහිලිවතුන්ද විවිධ නායකත්ව තනතුරු වලට පත්කළ හැකිය. උදාහරණයන් වශයෙන් දීමේ දීමනාව ඇති පුද්ගලයෙකුට සභාවේ මූල්‍ය කමිටුව මගපෙන්වීමට ආරාධනා කරනු ලැබිය හැකිය.

සුවකිරීමේ දිමනාව ඇති පුද්ගලයෙකුට ප්‍රදේශයේ ආරෝග්‍යශාලා වල රෝගීන්ට සේවය කිරීමට ඇදහිලිවතුන් කණ්ඩායමකට මගපෙන්වීමට පැවරෙනු ඇත. ආත්මික දිමනා සහිත සේවය නායකත්වයට බොහෝ අවස්ථාවන්ට මගපාදයි. ඇදහිලිවන්තයෙකුට නායකත්වයේ දිමනා කිසිවක් නැතත් ඔහුට ඇති ආත්මික දිමනා නිසිලෙස වර්ධනය කර ගැනීමෙන් නායකයකු විය හැකිය.

## අනෙකුත් බයිබලිය තනතුරු

ආත්මික දිමනා රහිත තනතුරු ද බයිබලයේ සදහන්ව ඇත. ඒවා සභාවේ ප්‍රායෝගික අවශ්‍යතා උදෙසා ඇති වු “ ධුරයන් ” ය. උපස්ථායකයින් වැඩිහිටියන් සහ බිෂෝප්වරු ගැන නව ගිවිසුමේ සදහන්වේ. (සමහරු බිෂෝප් යන්න සභාපාලක යන්නට සමාන වචනයක් ලෙස සලකන අතර, සමහරු එය වෙනම ධුරයක් ලෙසද සලකයි)

පුරාණ සභාව ගැන වාර්ථා සංරක්ෂණය කර ඇත්තේ සභා සැකිල්ල තුල අප හට අනුගමනය කිරීමටය. මෙම ධුරයන්ද වර්ථමාන සභාව තුල ක්‍රියාත්මක විය යුතුය. මෙම ධුරයන්ගේ කාර්‍යය වනුයේ අපෝස්තුලු අනාගතවක්තෘවරු, එවැන්ජලිස්තවරු, සභාපාලකවරු, ගුරුවරු සහ නායකත්වයේ දිමනාව සහ පරිපාලනයේ දිමනාව සහිත අයවලුන්ට සහාය වීමයි. මෙම තනතුරු අධ්‍යනය කිරීමට පහත සදහන් කටු සටහන භාවිතා කරන්න.

| මාතෘකාව | යොමුව | කාර්‍යයන් |
|---|---|---|
| බිෂෝප් | 1 තිමෝති 3 : 1 - 7<br>පිලිප්පි 1 : 1<br>තිතස් 1 : 5 - 9<br>1 පේත්‍රුස් 5 : 2 - 3 | බොහෝ අය සදහන් කරන්නේ බිෂෝප් යන්න සභාපාලක යන්නට සමාන බවයි. ඔහු ඇදහිලිවතුන් කණ්ඩායමක් දිගුකාලිනව රැකබලා ගැනිම කරයි. |
| උපස්තායකයන් | 1 තිමෝති 3 : 8 - 13<br>පිලිප්පි 1 : 1<br>ක්‍රියා 6 : 1 - 7 | මෙම පද වලින් උපස්ථායකවරුන්ට සංග්‍රහ කිරීමේ සහ උපකාර කිරීමේ සේවයක් ඇති බව දැක්වේ. |
| උපස්තායකවරියන් | 1 තිමෝති 3 : 11<br>රෝම 16 : 1 - 2 | බයිබලයේ උපස්තායකවරියන් ගැන විශේෂයෙන් සදහන් නොවේ. සමහර සභාවන් මෙම පදය උපුටාගෙන ඇත්තේ සංග්‍රහකිරීමේ සහ උපකාර කිරීමේ යෙදි සිටින උපස්ථායකවරුන්ගේ බිරින්දෑවරු හෝ ඒ කි සේවයේ යෙදි සිටින අනෙකුත් ස්ත්‍රීන් ගැනය. |
| වැඩිමහල්ලන් | ක්‍රියා 20 : 17, 28, 32<br>ක්‍රියා 14 : 23, 15<br>ක්‍රියා 16 : 4, 11 - 30<br>1 තිමෝති 5 : 17<br>1 පේත්‍රුස් 5 : 1 - 4<br>තිතස් 1 : 5<br>යාකොබ් 5 : 14 | වැඩිමහල්ලන් සභාවේ තීරණ ගැනිම් වලදි නායකත්වය, ඇදහිලිවතුන්ගේ අවශ්‍යතා සහ ප්‍රාදේශියව ඇදහිලිවතුන් කණ්ඩායම්වල වර්ධනය සදහා සහාය වේ. |

(වැඩිමහල්ලන් ගැන සටහන : බයිබලයේ වැඩිමහල්ලන් ගැන පළමුවෙන්ම සඳහන් වන්නේ නික්මයාම 3 : 16 හි ඊශ්‍රායෙල් නායකයන් ගැන සඳහන් කිරීමේදිය. බයිබලය පුරාම ඊශ්‍රායෙල් වැඩිමහල්ලන් ගැන සඳහන් වේ. මෙම වැඩිමහල්ලන් සභාවෙහි සඳහන් වෙන වැඩිමහල්ලන් යන තනතුරට වඩා වෙනස්ය. මෙම පද සඳහන් කොට ඇත්තේ ඊශ්‍රායෙල් නායකයින්ට වඩා සභාවේ වැඩිමහල්ලන් සම්බන්ධයෙනි.)

වැඩිමහල්ලන්, උපස්ථායකවරු සහ බිෂෝප්වරු යන අය විශේෂ නායකත්වය (අපෝස්තුලු, අනාගතවක්තෘ, එවැන්ජලිස්ත, සභාපාලකවරු සහ ගුරුවරු) යෙන් නිදහස්ව සභාව ගෙනයන්නෝ නොවෙති. වැඩිමහල්ලන්, උපස්ථායකවරු, සහ බිෂෝප්වරු මනුෂ්‍යයා විසින් තෝරනු ලැබුවන් වුවත් විශේෂ නායකත්ව දිමනා සහිත නායකත්වය සමග සභාව සඳහා දෙවියන්වහන්සේ විසින් නිර්මාණය කර ඇත.

## ප්‍රායෝගික නායකත්ව තනතුරු

සභාවේ ප්‍රායෝගික සහ සංවිධානාත්මක අවශ්‍යතා සඳහා බොහෝ නායකත්ව තනතුරු අවුරුදු ගණනාවක් තිස්සේ බිහිවී ඇත. මෙම තනතුරු බයිබලයේ සඳහාන් නොවන නමුත් සේවයේ ප්‍රාදේශිය සහභාගිකම උදෙසා වැදගත්වේ. "වැඩිදුර අධ්‍යනය සඳහා" යන කොටසෙහි තනතුරු පිළිබඳ ලැයිස්තුවක් සඳහාන්වේ.

## සභාවේ සැකිල්ල

සභාවේ සැකිල්ල තුල ඔබ අධ්‍යනය කල නායකත්වයේ දිමනාව එකිනෙකට සම්බන්ධ වන ආකාරය පහත සඳහාන් රූප සටහනෙන් පෙන්නුම් කෙරේ.

**සභාව**
|
විශේෂ නායකත්ව දිමනා
|
**අපෝස්තුළු**
**අනාගතවක්තෘ**
**එවැන්ජලිස්තවරු**
**සභාපාලකවරු**
ගුරුවරු
|
**සභායවේ පරිපාලනය, නායකත්වය, බිෂෝප්වරු, උපස්තායකයින් සහ සභාවේ සෑම සාමාජිකයෙකුම ඔවුන්ගේ ආත්මික දිමනා භාවිතා කරමින් දෙවියන්වහන්සේ විසින් ඔවුන් පිහිට වු තැන සිටි.**
|
**පදනම දමා ඇත්තේ අපෝස්තුළු සහ ප්‍රොපේතවරු විසිනි. එපිස 2 : 20**
|
✞ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැමැති පර්වතය මත ගොඩ නගා ඇත. ✞
**මතෙව් 16 : 18, 1 කොරින්ති 3 : 11, එපිස 2 : 20**

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන පද මතකයෙන් ලියන්න

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

2. පළමු ලැයිස්තුවේ ඇති තනතුරු දෙස බලන්න. දෙවන ලැයිස්තුවේ ඇති අරුත් දැක්වීම කියවන්න. නායකත්ව තනතුරු වඩාත්ම හොඳින් අරුත් දක්වා ඇති අරුත්දැක්වීම් වලට අදාල අංකය සපයා ඇති හිස්තැනෙහි ලියන්න. පළමුවැන්න උදාහරණයක් ලෙස ඔබට ගෙන හැර දක්වා ඇත.

**පළමු ලැයිස්තුව** | **දෙවන ලැයිස්තුව**

——— අනාගතවක්තෘ — 1. අලුත් සභාවර්ධනයට හා ඒවා අධීක්ෂණය සඳහා අනෙකෙකු කෙරේ අධිකාරී බලය සහිතව එවන ලද්දෙකි.

——— අපෝස්තුළු — 2. විශේෂ චේතනාවෙන් යුතුව කථාකරන දෙවියන් වහන්සේගේ ඉක්මන් පණිවුඩ උන්වහන්සේගේ සෙනග වෙත සන්නිවේදනය කරන්නාවූද නායකත්වයේ තනතුරකි.

——— සභාපාලකවරු — 3. ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ වගකිව යුතු පංගුකාරයන් වීමට හැකිවන ආකාරයෙන් නොඇදහිලිවන්තයන් සමග ශුභාරංචිය බෙදාගන්නෙක් "ශුභාරංචිය ගෙනෙන්නාවූ අයෙක්"

——— එවැන්ජලිස්ත — 4. ඇදහිලිවතුන්ගේ ආත්මික ශුභසාධනය දිගුකාලීනව සහතිකකර දෙන්නාවූ අයෙකි. " එඩේරා " යන්න වචනයේ තේරුමයි.

——— ගුරුවරයා — 5. දෙවියන්වහන්සේගේ වචනය අන්‍යයන් විසින් ගෙන, ඉගෙනගන්නාවූ අයුරින් උගන්වන්නෙකි. මෙයද නායකත්ව ධුරයකි.

——— නායකත්වය — 6. ඉලක්ක කරා යාමට මිනිසුන් පොළඹවන්නෙක්

——— පරිපාලනය — 7. නැවක කපිතාන්වරයෙකු මෙනි. දිශාව පෙන්නුම් කරන්නෙකි.

3. පාඩමෙහි පෙන්වා දි ඇති අනිකුත් නායකත්ව ධුර තුනක් නම් කරන්න.

-----------------------  -------------------------------------  ---------------------------------

(මෙම සංග්‍රහයේ අවසාන පරිච්ඡේදය අවසානයෙහි මෙම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයා ඇත.)

## වැඩිදුර අධ්‍යනය සඳහා

ප්‍රාදේශයව සභාවේ ඇති වෙනත් තනතුරු පිළිබඳව ලැයිස්තුවක් පහත දැක්වේ.

**යාච්ඤාවේ සහ සුවකිරීමේ සේවය :**

- ☞ මැදහත්කාර කමේ යාච්ඤාව.
- ☞ තෙල් වලින් ආලේප කිරීම.
- ☞ උදෑසන යාච්ඤාව.
- ☞ යාච්ඤා කණ්ඩායම්.
- ☞ ආරෝග්‍යශාලා දුරකථන ඇමතුම්.
- ☞ දුරකථනයෙන් යාච්ඤා කිරීම.
- ☞ යාච්ඤා දම්වැල්.
- ☞ නිරාහාරව සිටීම.
- ☞ යාච්ඤා උපදේශණය.

**ප්‍රායෝගික සේවයන්**

- ☞ කාර්‍යාලිය උපකාර.
- ☞ සභා ලේකම්වරු.
- ☞ ලිපි සැකසීම.
- ☞ සභාවේ මුළුතැන්ගෙට උපකාර කිරීම.
- ☞ සාත්තු සප්පායම් කිරීමේ වැඩ.
- ☞ භාරකාර වැඩ.
- ☞ අලුත් වැඩියා කිරීම්.
- ☞ ලිපි ලිවීම.
- ☞ ශුද්ධ වූ සහභාගිකම සූදානම් කිරීම.
- ☞ ළමා රැකවරණය.
- ☞ මූල්‍යමය උපකාර.
- ☞ පටිගත කිරීමේ සේවය.
- ☞ දුරකථන ඇමතුම්.
- ☞ ලියාපදිංචි කිරීම් මෙහෙයවීම
- ☞ ප්‍රචාරනය.
- ☞ ත්‍යාග සූදානම් කිරීම.
- ☞ ක්‍රීඩා වැඩසටහන්.
- ☞ උපස්ථායක සේවය.
- ☞ මංගල්‍යයන්.
- ☞ ගීතිකා කණ්ඩායම් ඇඳුම් සැකසීම.
- ☞ ආගන්තුක සත්කාරය.
- ☞ භාණ්ඩාගාරික.
- ☞ වැඩ කණ්ඩායම්.
- ☞ නැවත නිර්මාණය කිරීමේ වැඩ සටහන්
- ☞ ප්‍රවෘති නිදහස් කිරීම් සූදානම් කිරීම.

**අධ්‍යාපනික සේවය**

- ☞ බයිබලය උගන්වන ගුරුවරු.
- ☞ වැඩමුළු නායකයින්.
- ☞ තරුණ සේවය.
- ☞ උපවාසයේදි කථාපවත්වන්නාවූ අය.
- ☞ පර්යේෂණ.
- ☞ සභා පුස්තකාලය.
- ☞ සමූළු නායකයින්.
- ☞ වැඩිහිටි පංති පැවැත්වීම.
- ☞ ළමා සේවය.
- ☞ විනය.
- ☞ පාසැල් ගුරුවරු.
- ☞ බයිබල් විද්‍යාලීය උපදේශකයින්.
- ☞ උපකාරක පංති.
- ☞ අලුත් ඇදහිලිවන්තයින්ට ඉගැන්වීම.

**උපදේශකත්ව සේවය**

- ☞ යාච්ඤා උපදේශකත්වය.
- ☞ විවාහයට උපදේශනය.
- ☞ තරුණ උපදේශනය.
- ☞ මාතෘත්ව උපදේශනය.
- ☞ අන් අයව ධෛර්මත් කිරීම.
- ☞ නිවෙස් බැහැදැකීම්.
- ☞ ආරෝග්‍යශාලා බැහැදැකීම්.
- ☞ ප්‍රශ්ණ විසදිම.
- ☞ මුල් උපදෙස් දිමේ දුරකථන සංවාද.
- ☞ ආපදා මධ්‍යස්ථාන.
- ☞ දුරකථන උපදේශනය

**පිටස්තර සේවාවන්**

- ☞ ළමා ශුභාරංචිය සේවය
- ☞ බස්රථ සේවා
- ☞ නාට්‍ය
- ☞ උසස් පාසැල් සේවය
- ☞ දේශපාලන හේතූන්
- ☞ දූත්‍යය
- ☞ එලිමහන් රැස්වීම්
- ☞ රූපවාහිනි / විඩියෝ දර්ශන වැඩසටහන්
- ☞ මාර්ගවල සාක්ෂි දැරීම්
- ☞ විද්‍යාල සේවාවන්

- කෝපි කඩ
- පිරිමි සහ ගැහැණු සේවාවන්
- නිවසින් නිවසට සාක්ෂි දැරීම
- නිවාඩු කාලීන බයිබල් පාසැල්

**නායකත්ව සේවාවන්**

- සංවිධායක
- සබත් පාසැල් පරීක්ෂකවරු සහ දෙපාර්තමේන්තු පරීක්ෂකවරු
- සැලසුම්කරු
- නිවෙස් කණ්ඩායම් නායකයින්
- දූතන සම්බන්ධිකරු
- නායකයා
- කෙවිට් සභාපතිවරු
- කිතුණු අධ්‍යාපනික අධ්‍යක්ෂක
- සභා පරිපාලකයින්

**රැකබලා ගැනිමේ සේවය**

- ආගන්තුක සත්කාරය
- ආහාර කැවිමේ වැඩසටහන්
- ආරෝග්‍යශාලා බැහැදැකිම්
- රාත්‍රි අමුත්තන්
- අවශ්‍යය අයට ඇඳුම් සැපයිම
- කුඩා ආරෝග්‍යශාලා
- සංග්‍රහකිරීම් හෝ විනෝදය ඇති කිරීම්
- සිරගෙවල් බැහැදැකිම්
- වැඩිහිටියන්ට උපකාර කිරීම
- ප්‍රවාහනය සැපයිම
- ළදරුවන් බලාගැනිම
- දුරකථන සේවාවන්
- දූතනය
- විදි සේවයන්
- අර්බුද විසඳුම් මධ්‍යස්ථාන
- පැකිලෙන්නවුන්ට සහය විම
- අපචාරයට, දූෂණයට, ලක්වුවන්ට සහාය විම
- අංගවිකල වුවන්ට උපකාර කිරීම
- අවශ්‍යතාවය ඇති අයවලුන්ට උපකාර කිරීම
- අවිවාහක මව්වරුන්ට උපකාර කිරීම.

## අනිකුත් සේවාවන්

- ☞ සංගීතය
- ☞ ගීතිකා කණ්ඩායම්
- ☞ පියානෝ වාදනය
- ☞ නාට්‍යම ස්වරූපයේ කියවීම්
- ☞ සංගීත කන්ඩායම්
- ☞ පරිවර්ථන සේවාවන්
- ☞ නාට්‍ය
- ☞ නමස්කාර මගපෙන්වීම
- ☞ ඕගනය වාදනය කිරීම
- ☞ රූකඩකරණය
- ☞ පරිවර්තනය කිරීම
- ☞ දැන්වීම් පුවරු
- ☞ කිතුණු ලියවිලි ලිවීම සහ සංස්කරණය
- ☞ ගීතිකා ලිවීම
- ☞ සභා වාදක මණ්ඩලය
- ☞ සභා තූර්යවාදනය
- ☞ විශේෂ අවස්ථාවල සභාව සැරසීම
- ☞ චිත්‍ර ( කළාව )

# තුන්වන පරිච්ජේදය

## මගපෙන්වීම පිණිස ආලේපය

**අරමුණ :**

මෙම පරිච්ජේදය අවසානයේ ඔබට :

- ප්‍රධාන බයිබල් පදයන් මතකයෙන් ලිවීමට හැකිවනු ඇත.
- " ආලේප කිරීම " යන්න විග්‍රහ කල හැක.
- ආලේප කිරීම් වර්ග 3ක් හදුනා ගැනීම
- ඒ කී සෑම ආලේපකිරීමකම අරමුණ
- ආත්මික ආලේපයේ මූලාශ්‍ර හදුනා ගැනීම.
- ආලේපයේ කාර්ය්‍ය සාකච්ජා කිරීම
- දෙවියන්වහන්සේගේ ආලේපයේ පදනම හදුනා ගැනීම
- දෙවියන්වහන්සේගේ ආලේප ලද්දවුනට එරෙහි බලයන් පිළිබඳ සාකච්ජා කිරීම.
- ඔබව ආලේප කොට ඇති තනතුරෙහි පමණක් සේවය කිරීමේ වැදගත්කම
- දෙවියන්වහන්සේගේ අලුත් ආලේපයක් නඩත්තු කරන්නේ කෙසේද ?

**ප්‍රධාන බයිබල් පදය :**

> **නුමුත් ඔබ කුළුගොනාගේ අග මෙන් මාගේ අග උසස්කල සේක. මම අලුත් තෙලින් ගැගෙන සිටිමි. (ගීතාවලිය 92 : 10)**

### හැදින්වීම

දේව රාජ්‍යය උදෙසා ලෝකයට බලපෑමක් වන පිණිස නායකයන් සාර්ථකවනු දැකීමට දෙවියන්වහන්සේට වුවමනාය. ඔබ එවැනි නායකයකු වන්නේ කෙසේද ? නායකයන්නට නියමිත සාමන්‍ය වැඩ සහ ප්‍රායෝගිකව එම ප්‍රදේශ පිළිබඳව දැනගෙන සිටිමි. ඔබට සාර්ථක නායකයෙකු වීමට උපකාර කරනු ඇත. නායකයන්ට අවශ්‍ය බයිබලිය සුදුසුකම්ද ඇත. ආත්මික දිමනා, සහ අධ්‍යපනය සහ අත්දැකීම් ද වැදගත්ය. ඔබ මේවා පිලිබඳ පසුව අධ්‍යනය කරනු ඇත.

නමුත් නායකයන්ට වඩාත්ම වැදගත් වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සෙගේන් ආලේප වීමයි. දෙවියන්වහන්සේගේ ආලේපය නොමැතිව ඔබට ප්‍රබල ලෙස මගපෙන්වීමට, සංවිධානය කිරීමට, රැස්කොට පුහුණු කිරීමට හෝ එවැන්ජලිස්ත සේවය කල නොහැකිය. මෙම පරිච්ජේද දෙවියන්වහන්සේ විසින් නායකත්වයට කැදවුනු ලැබූවන්ට අවශ්‍ය ශුද්ධාත්මයාණන්ගේ ආලේපය වෙත මෙම පරිච්ජේදය ඔබගේ අවධානය යොමු කරවයි.

### ආලේපය

යනු තෙල් අලේප කිරීමෙන් යම් අයෙකු හෝ යම් දෙයක් කැප කිරීම හෝ පුජා කිරීමයි. "තෙල්" ශුද්ධාත්මයාණන් වහන්සේට අඩයාලමකි.

## ආලේපලත් තැනැත්තා

ක්‍රිස්තුස් යන වචනයේ ග්‍රීක් තේරුම වන්නේ “ආලේපලත් තැනැත්තා” යනුයි. යේසුස් වහන්සේ මිහිමත උන්වහන්සේගේ සේවය පිළිබඳ ප්‍රකාශකර සිටියේ

> **ස්වාමින්ගේ ආත්මය මා කෙරෙහිය. මක්නිසාද දිලිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්නට මා ආලේප කල සේක. (ලූක් 4 : 18)**

උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් ලත් ආලේපය තුලින් උන්වහන්සේට එසේ කල හැකි බව පැහැදිලි කළ සේක.

> **දිලිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්නට උන්වහන්සේ මා ආලේප කල සේක. වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශ කරන්නටද මඩනලද්දවුන් නිදහස්කර හරින්නටද ස්වාමිවහන්සේගේ පිළිගත යුතු අවුරුද්ද ප්‍රකාශ කරන්නටද උන්වහන්සේ මා එවුසේකැයි තිබෙන (ලූක් 4 : 18 - 19)**

උන්වහන්සේට සේවය කිරීම සදහා දෙවියන්වහන්සේ ආලේපය අවශ්‍ය වුයේ නම් අපටද සේවය සදහා ආලේපය අවශ්‍යවේ.

## තුන් ආකාර ආලේපය

පරණ ගිවිසුමේ එකිනෙකට වෙනස් ආලේප ලැබීම් තුනක් ගැන සඳහන් වේ. ඒවා නායකයින්ට තිබිය යුතු ස්වාභාවික උදාහරණ හෝ ආත්මික අත්දැකීම් විධි ලෙස දෙවිය්නවහන්සේ වසින් සලකනු ලැබේ.

**ලාදුරු රෝගියාගේ ආලේපය: සම්බන්ධතාවය**

ලාදුරු රෝගය එයට ගොදුරුවුවන්ගේ මාංශය සෙමෙන් ක්ෂය කරන මාරාන්තික රෝගයකි. මහපටැගිලි ඇගිලි සහ අනිකුත් සියලුම අවයව කුණු වී පසුව හැලී යයි.

පරණ ගිවිසුම් කාලයේ ලාදුරුරෝගයෙන් පෙලෙන්නා ලාදුරුවකු ලෙස හැදින්විය. රෝගය ස්පර්ශයෙන් බෝවන බැවින් ලාදුරුවෙකුට තම ප්‍රජාව තුල වාසය තහනම්ය. ඔහු සමග අනිකුත් අය සම්බන්ධ වීම වැලැක්වීම සදහා ඔහු කොතැන ගියත් “ අපිරිසිදු ” යැයි කෑ ගැසීමට අණ ලැබුවේය. ලාදුරු රෝගය ක්‍රමයෙන් සෙමෙන් ඔහුගේ ශරීරය කා දමා වේදනාත්මක මරණයක් උරුමකර දේ.

දෙවියන්වහන්සේ ආත්මික සත්‍යයන් විග්‍රහ කිරීම සදහා ස්වාභාවික උදාහරණ බයිබලයේ ගෙන හැර දක්වා ඇත. ලාදුරු රෝගය පාපයට උදාහරණයකි. ලාදුරු රෝගය ශරීරය විනාශ කරන්නාසේම පාපය ඔබේ ආත්මිකත්වය සහ සේවය විනාශ කරනු ඇත.

පුරාණ ගිවිසුමේ නීතියේ දෙවියන්වහන්සේ ලාදුරු රෝගියෙකුට පවිත්‍රවිය යුතු ආකාරය පිලිබද නිශ්චිත උපදෙස් සපයා ඇත. මෙම පරිච්ඡේදය කරගෙන යාමට පෙර බයිබලයේ ලෙවී කථාව 14 වන පරිච්ඡේදය කියවන්න. මේ සෑම උපදෙසක්ම ඔබ ආත්මිකව පිරිසිදු විය හැකි ආකාරය පිලිබද අඩයාලම්ය.

**පක්ෂියෙකු විසින් පාපයේ බර ඉවතලීම:** මෙය ඔබගේ පාප ඉවත්කර හැරීමට යෙසුස් වහන්සේගේ රුධිරය වැගිරීමට අඩයාලමකි.

**ගලායන ජලය:** මෙය වතුර බෞතිස්මයට අඩයාලමකි.

**තෙලින් ආලේප කිරීම:** මෙය ඔබගේ ජීවිතය තුල ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වයට උදාහරණයකි. ලාදුරුවෙකුගේ තෙල් ලාදුරුවෙකුගේ කණෙහි අතේ මහපට ඇඟිල්ලේ සහ පයේ මහපට ඇඟිල්ලේ ආලේප කිරීමට නියමිත විය. මෙය නායකත්වයට අදාල කරගත් විට අප එවැනිම ආලේපයක්...

**කණෙහි:** දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට

**අතෙහි:** උන්වහන්සේට සේවය කිරීමට හැකිවන පිණිස

**පයෙහි මහපට ඇඟිල්ලේ:** උන්වහන්සේ සමග නිසි සම්බන්ධතාවයකින් යුතුව ගමන් කිරීමට හැකිවන පිණිස.

නායකයන්ට වඩා වැදගත් වන්නේ මේ “ ලාදුරුවෙකු ” ගේ ආලේපයයි. මක්නිසාද එය පුද්ගලික සම්බන්ධතාවයට අඩයාලමකි. අනිකුත් අයට නායකත්වය දීමට නම් ඔබගේ දෙවියන්වහන්සේ සමග ඇති පුද්ගලික සම්බන්ධතාවය නිවැරදි විය යුතුය. ඔබ නැවත උත්පාදනය විය යුතුය. දෙවිය්වහන්සේගේ හඬ ඇසීමට හැකි අයෙකුවිය යුතුය. උන්වහන්සේට සේවය කරන උන්වහන්සේ සමග නිසි සම්බන්ධතාවයෙන් යුතුව ගමන් කරන්නෙකු විය යුතුය.

**පුජකයාගේ ආලේපය: ශුද්ධකම**

නායකයන් පුජකයකුගේ ආලේපයද අත්දැකිය යුතුය. මෙම පාඩම කරගෙන යාමට පෙර නික්මයාම 29 වන පරිච්ඡේදය සහ 39, ලෙවී කථාව 8 වන පරිච්ඡේදය කියවන්න. පුජකයෙකුගේ ආලේපය ශුද්ධකම වන ආලේපයක් වන අතර, දෙවියන්වහන්සේගේ සේවයට වෙන්ව නිවැරදි ජීවන පෙවෙතක් සහ හැසිරීමක් ඇතිව සිටිය යුතුය.

පුරාණ ගිවිසුමේ පුජකයා ඔහුගේ තනතුරේ ඇති ශුද්ධකම හේතු කොට ගෙන ඔහුට කල නොහැකි බොහෝ දේවල් විය. නායකත්වයට ඇති විශේෂ ආලේපය හේතු කොට ගෙන ඊශ්‍රායෙල් හි සභාවේ අනිකුත් සාමාජිකයන් සීමා නොවන පිණිස පුජකයා සීමා විය යුතුය.

නායකයෙකු වශයෙන් දෙවියන්වහන්සේගේ සේවයට වෙන්වු ශුද්ධකමේ පුජක ආලේපයක් ඔබ විසින් අත්දැකිය යුතුව ඇත. ඔබ දේව වචනය සමග සමගියෙන් විසිය යුතුය. ඔබගේ ධුරයේ ශුද්ධකම හේතුකොට ගෙන නොකරහැරිය යුතු දේ බොහෝමයක් ඇත. අන් අයට නායකත්වය දීමට විශේෂ කොට ඔබට ඇති කැඳවීම හේතුකොට ගෙන ඔබ අන් අයව සීමා නොකරන ලෙස ඔබ විසින් සීමා විය යුතු දෙවල් ඇත.

**නායකයාගේ ආලේපය: තනතුරු සහ බලය**

පුරාණ ගිවිසුමේ සඳහන් වන තෙවන ආකාරයේ ආලේපය වන්නේ නායකයෙකුගේ ආලේපයයි. එය දෙවියන්වහන්සේ සෙනග නායකයින් වශයෙන්, රජවරු, අනාගතවක්තෘවරු, කපිතාන්වරු වැනි අයවලුන්ට

නායකත්වය දිම සඳහා ලත් ආලේපයකි. නායකත්වයේ ආලේපය දෙවියන්වහන්සේ විසින් දුන් තනතුර සහ එය ඉටුකිරීමට දෙන ලද බලයට අදාල වන්නාවූ එකකි.

උදාහරණයක් ලෙස: සාවුල් ආලේප ලද්දේ දෙවියන්වහන්සේගේ සෙනග කෙරෙහි කපිතාන්වරයෙකු ලෙසය.

> **එවිට සාමුවෙල් තෙල් කුලාව රැගෙන සාවුල්ගේ හිසෙහි වත්කොට ඔහු සිඹ ස්වාමින්වහන්සේ තමන්ගේ උරුමය කෙරෙහි අධිපතියා කොට ආලේප කල සේක් නොවේදැයි කීය. (1 සාමුවෙල් 10:1)**

දාවිත්ගේ ආලේප කිරීම 1 සාමුවෙල් 16 හි දැක්වේ. එම පරිච්ඡේදයෙහි දාවිත් කෙරෙහි දෙවියන්වහන්සේගේ බලය පැමිණියේ ඔහු ආලේප කිරීමෙන් බව පැහැදිලිව දැක්වේ.

> **එවිට හෙතෙම කෙනෙකු යවා ඔහු ගෙන්විය. ඔහු රතු පාටය, සොභමාන පෙනීමක් ඇතිව රූප සම්පන්නව සිටියේය. ස්වාමින්වහන්සේ නැගිට මොහු ආලේප කරන්න. මොහු ඒ තැනැත්තා යැයි කී සේක. එවිට සාමුලේ තෙල් කුලාව රැගෙන ඔහුගේ සහෝදරයන් මැදදි ඔහු ආලේප කලේය. එදින පටන් ස්වාමින්වහන්සේගේ ආත්මය ආනුභාවසම්පන්නව දාවිත් කෙරෙහි පැමිණියේය. (1 සාමුවෙල් 16 : 12-13)**

නායකයා ආලේපය ලබන්නේ තම තනතුරෙහි සේවය, බලය සහ අධිකාරිත්වය අන්‍යයන් සමග බෙදා ගැනීමටයි. මෙම ආලේපයත් සමග දෙවියන්වහන්සේගේ සෙනග නිසිලෙස මගපෙන්වීමට පුද්ගලයෙකු කෙරෙහි ශුද්ධාත්මයාණන් පහලවනු ඇත. නව ගිවිසුමේ ක්‍රියා 1:8 හි බලය සඳහා වන මෙම ආලේපය පිලිබඳ පොරොන්දුව සඳහාන් වී තිබේ.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක. (ක්‍රියා 1:8)**

මෙම පොරොන්දුවෙහි ඉෂ්ඨවීම ක්‍රියා 2 වන පරිච්ඡේදයෙහි සඳහාන් වේ. අලුත් ගිවිසුමෙහි සඳහන්වන ශුද්ධාත්මයාණන් වහන්සේගේ බෞතිස්මය නායකයාට අවශ්‍ය බලය සඳහා වන ආලේපයෙහි පොරොන්දුව ඉෂ්ඨවීම පෙන්නුම් කරයි.

අලුත් ගිවිසුමේ තනතුරු සම්බන්ධයෙන් වන ආලේපය එපිස පෙතෙහි දක්වා ඇත.

> **උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගතවක්තෘවරුන්ද, සමහරුන් ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද, සමහරුන් සභාපාලකයන්ද, සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. (එපිස 4:11)**

දෙවියන්වහන්සේ සභාවේ සමහර පුද්ගලයන් නායකත්ව තනතුරු සඳහා ආලේප කොට ඔවුන්ගේ කැඳවීම ඉටුකිරීමට අවශ්‍ය බලයේ ආලේපයද ලබා දේ.

## ආලේපය දෙවියන් වහන්සේගෙනි

මෙම දෙවියන් වහන්සේගෙන් එන නායකත්වයේ තුන් ආකාර අඩයාලම නායකයින් විසින් අත්දැකිය යුතුව තිබේ. සාමුවෙල් සාවුල් ආලේප කරද්දි ඔහු පැවසුවේ " දෙවියන්වහන්සේ විසින් නුඹ ආලේප කොට තිබේ යනුයි. (1 සාමුවෙල් 10 : 1, 15 : 17) යේසුස් වහන්සේ තමන් වහන්සේගේ ආලේපය පිළිබඳව කියා සිටියේ ස්වාමින් වහන්සේ මා ආලේප කල සේක. (ලූක් 4 : 18 සහ ක්‍රියා 10 : 38) බලන්න.

> **මාගේ සිතේ ද මාගේ කල්පනාවේද හැටියට කරන්නාවූ විශ්වාස වූ පූජකයෙකු මම නැගුටුවාගෙන, ඔහුට ස්ථිර වූ වශයෙන් උපදවා දෙන්නෙමි. ඔහු මාගේ අභිෂේකලත් තැනැත්තා ඉදිරියෙහි සැම කල්හිම හැසිරෙන්නේය.** (1 සාමුවෙල් 2 : 35)

ඔබ ආලේප කිරීම අත්දකින්නේ ආයතනයක් හෝ සංවිධානයක් විසින් අභිෂේක කරනු ලැබීමෙන් නොවේ. (එසේ කිරීමේ කිසි වරදක් නැත.) නායකත්වයට ආලේප කිරීම පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන්ය.

> **නුඹලා ගැන වනාහි නුඹලා උන්වහන්සේගේ ලැබූ ආලේපය නුඹලා තුල පවතින්නේය.** (1 යොහාන් 2:27)

ස්තේපන් උපස්ථායකයෙකු ලෙස ආලේප කරනු ලැබුයේ මනුෂ්‍යයින් විසින්ය. දෙවියන්වහන්සේ විසින් ඔහු එවැන්ජලිස්තවරයෙකු වශයෙන් ආලේප කරනු ලැබූ සේක. (ක්‍රියා 6) එය දෙවියන්වහන්සේගේ ආලේපයයි. මනුෂ්‍යයාගෙන් නොවේ වැදගත් වන්නේ එයයි.

## ආලේප කිරීමේ පදනම

මෙම ආලේපය දෙවියන්වහන්සේ විසින් දෙනු ලබන්නේ කුමන පදනමකින්ද ? දෙවියන්වහන්සේ ආලේප කරනු ලබන්නේ බුද්ධිය, අධ්‍යාපනය, අත්දැකීමෙන් හෝ හඅ හැකියාවන් මත නොවේ. ආලේපය පදනම් වන්නේ පිටත පෙනෙන්නාවූ දෙය මත නොවේ. එය පදනම් වන්නේ හදවතේ ආකල්ප මතය.

සාමුවෙල් නව රජෙකු ආලේප කිරීම සඳහා යෙස්සේගේ නිවසට ගිය පසු ඔහු සෙව්වේ විශිෂ්ඨ පෙනිමක් ඇති අයෙකි.

> **ඔවුන් ආ කල ඔහු එලියාබ් දෙස බලා සැබැවටම ස්වාමින්වහන්සේගේ අභිෂෙකලත් තැනැත්තේ උන්වහන්සේ ඉදිරියෙහි සිටියැයි කියාගත්තේය. නුමුත් ස්වාමින්වහන්සේ සාමුවෙල්ට කථා කොට, ඔහුගේ පෙනිම ගැනවත් ශරීරයේ උස දෙසවත් නොබලන්න. මක්නිසාද මම ඔහු එපා කලෙමි. ස්වාමින්වහන්සේ මනුෂ්‍යයා බලාන්නාක්මෙන් නොබලන සේක. මනුෂ්‍යය තෙමේ පිටස්තර පෙනිම බලන්නේය. නුමුත් ස්වාමින්වහන්සේ සිත බලනසේකැයි කී සේක.** (1 සාමුවෙල් 16 : 6 - 7)
>
> **දෙවියන්වහන්සේ දාවිත් ආලේප කලේ සිතේ ආකල්ප සහ සිතේ තත්වය මතය. උන්වහන්සේ ඔබගේ ඇතුලාන්තය බලන සේක.**

## ආලේප කිරීමේ අරමුණ

ආලේප කිරීමේ අරමුණු සමහරක් පහත දැක්වේ.

**දෙවියන්වහන්සේගේ අරමුණ ඉෂ්ඨ කිරීම :**

නායකයින් ආලේප කරනුයේ ඔවුන් විසින් දෙවියන්වහන්සේ අරමුණ ඉෂ්ඨ කරනු ලැබීමටය. යේසුස් වහන්සේ මෙය පැහැදිලිව දක්වා ඇත.

> **ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහිය. මක්නිසාද දිලිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්නට උන්වහන්සේ මා ආලේප කල සේක. වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශ කරන්ටද මඩනලද්දවුන් නිදහස්කර හරින්ටද (ලූක් 4 : 18)**

**නායකත්වයට අවශය නුවණ ලබා දිමට:**

ඔබට මගපෙන්වනු ලැබීම වෙනුවට ආලේපය ඔබට අන්‍යයන්ට මගපෙන්වීමට අවශ්‍ය නුවණ ලබා දේ.

> **නුඹලා ගැන වනාහි නුඹලා උන්වහන්සේගෙන් ලැබූ ආලේපය නුඹලා තුල පවතින්නේය. යමකු විසින් නුඹලාට ඉගැන්වීම ඕනෑ කරන්නේ නැත. එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද එයින් නුඹලාට ඉගැන්වූ ප්‍රකාරයටද උන්වහන්සේ තුල පැවතියල්ලා. (1 යොහාන් 2 : 27)**

**වියගහ විනාශ කිරීම**

එය ඔබ විසින් සේවය කරන මිනිසුන් සහ ගැහැණුන්ගේ ආත්මික වියගස් විනාශ කිරීමට බලය ලැබෙන්නාවූ ආලේපයකි. තුන් ආකර වියගස් ගැන බයිබලය කථා කරයි.

1. පාපයේ වියගහ

> **නුඹලා මාගේ සෙනගවන්නහුය. මම වනාහි නුඹලා මිසරවරුන්ගේ වහලුන්ව නොසිටින පිණිස, මිසර දේශයෙන් නුඹලා පිටතට ගෙනාවාවූ නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේය. මම නුඹලාගේ වියගහේ බැඳුම් බිඳ, නුඹලාට කෙලින් යන්ට සැලැස්වීමි. (ලෙවී කථාව 26 : 13)**

2. මනුෂ්‍යයාගේ පරණ පාපිෂ්ඨ ස්භාවය වන මංශයේ සහ මමත්වයේ අගාවන් නිසා හට ගන්නා පාපයේ බැඳිම් වන වියගහ

> **මක්නිසාද මා කරන දේ මම නොදනිමි. මා කරන්නේ මා කැමති දෙය නොව, මා දිවේෂ කරන දේය (රෝම 7:15)**

3. අනිකුත් පුද්ගලයන් විසින් ඔබට දමන්නාවූ බැඳිම්ද ඇත. මෙම වියගහ වරදකාරී හවේ හැගිම් සම්ප්‍රදායකත්වය හෝ අන්‍යයන් විසින් ඔබ වෙත පනවා ඇති කල නොහැකි කර්තව්‍ය පවත්වා ගැනිමේ හැසිරීම් රටාවන්හි වියගහ

**එසේය, ඔවුහු උසුලන්ට අමාරු මහත් බර බැඳ මනුෂ්‍යයන්ගේ කරේ තබති. නමුත් තමුන්ගේ ඇඟිල්ලක්වත් ඒවාට තබන්ට කැමති නොවෙති. (මතෙව් 23 : 4)**

**ආලේපය මේ සියලු වියගස් කඩා බිඳ දමයි : තවද, ඒ දවසේදී ඔහුගේ බර නුඹේ කරෙන්ද, ඔහුගේ වියගහ නුඹේ බෙල්ලෙන්ද පහවන්නේය. නුඹේ තරකම නිසා වියගහද කැඩෙන්නේයැයි කියන සේක. (යෙසායා 10:27)**

මෙම වියගස් ගැඹුරු ඉගැන්වීම් තුලින් නොකැඩෙනු ඇත. මෙම වියගස් අධ්‍යාපනය උපදේශණය හෝ ආයතනයක් මගින්ද විනාශ නොවේ. එවා විනාශ වන්නේ බැදීම් වලට හසු වී සිටින්නවුන් මුදන පිණිස අවැසි පණිවිඩය ගෙන යාමට ආලේපලත් ආත්මික නායකයන් විසිනි.

**තනතුරු තීරණය කිරීම :**

දෙවියන්වහන්සේ නිශ්චිත ආත්මික ධුරයන් තනතුරු හා කැදවීම් වලට මිනිසුන්ව ආලේප කරනු ලබයි. උදාහරණ ලෙස පුජකයෙකුගේ තනතුර තිරනය කෙරුනේ " ආලේප කිරීමට හේතුව මතය" (ගණන් කථාව 18 : 8)

නව ගිවිසුම ඇදහිලිවතුන්ට දෙවියන්වහන්සේ විවිධ ආත්මික දිමනා සහ කැදවීම් කරන බව පැහැදිලිව දක්වා තිබේ. ශුද්ධාත්මයාණන්ගේ ආලේපය තුල ගමන් කිරීමට දෙවිය්නවහන්සේගේන් ඔබට ඇති පුද්ගලික කැදවීම ඔබගේ ආත්මික දිමනා සහ ඔබ දෙවියන්වහන්සේ විසින් සුදානම් කල සැලැස්ම දැන සිටිය යුතුයි. ඔබව කැදවනු නොලැබු හෝ ආලේප නොලත් සේවයක් කිරීමට ඔබ උත්සහ දරයි නම්, ඔබ අසීරුතා අත්දකිනු ඇත.

මෙය ආලේපය පිලිබද තවත් වැදගත් කරුණක් අපට පෙන්නුම් කරයි.

**ඔබ ආලේප කරනු ලැබීම තුල ගමන් කිරීම**

දෙවියන් වහන්සේ නිශ්චිත ආත්මික ධුරයන් කැදවීම් සදහා මනුෂ්‍යයින්ව ආලේප කරනු ලබයි. බොහෝ නායකයින් අසාර්ථක වන්නේ ඔවුන් මේ කාරණය හදුනානොගත් නිසාවෙනි. ඔවුන් ඉදිරිපත් කිරීමට උත්සහ කරන්නේ ඔවුන් කැදවනු නොලත් හෝ ආලේප නොලත් සේවයන්ය.

- ගණන් කථාව 16 කියවන්න. මෝසස් ලැබූ ආලේපයම ලැබූ බව කෝරා සහ ඔහුගේ මිනිසුන් විසින් කියා සිටි විට දෙවියන්වහන්සේ එය වෙනස් බව ඔප්පු කර පෙන්වීම

- ගණන් කථාව 17 කියවන්න. අරොන් මත හෙළු දෙවියන්වහන්සේගේ ආලේපය උන්වහන්සේ පෙන්වා සිටියේ විශේෂ ආකරයකටය

- 1 සාමුවෙල් 13 : 8 - 14 කියවන්න. ආලේප නොලත් ධුරයක සේවය කිරීමට සාවුල් රජතුමා උත්සහ කල අවස්තාවේ ඔහු විනිශ්චය කරනු ලැබ දෙවියන්වහන්සේ විසින් එපා කරනු ලැබිය.

- ක්‍රියා 19 : 13 - 16 දක්වා කියවන්න. "ස්කෙවා" නමැති පුජකයාගේ ලමයින් සත් දෙනෙකු ඔවුනට අයත් නොවු ආලේපයක සේවය කරනු ලැබු විට ඔවුන් අසීරුතා අත්දැක්කෝය.

## විරෝධතා බලාපොරොත්තු වීම

ඔබ දෙවියන්වහන්සේගේ ආලේපය ලත් විට සාතන්ගේ, ඔහුගේ හමුදාවේ සහ අදේවවාදි මිනිසුන්ගේ විරුද්ධතා බලාපොරොත්තු විය හැකිය.

> **ස්වාමින්ටද, උන්වහන්සේගේ අභිෂේකලත් තැනැත්තාටද එරෙහිව පොලවේ රජවරු සැරසෙති. අධිපතියෝද එක්ව මන්ත්‍රණය කෙරෙති.** (ගීතාවලිය 2 : 2)

> **ස්වාමිනි, ඔබගේ සතුරෝ නින්දා කළෝය. ඔබගේ අභිෂේකලත් තැනැත්තාගේ පා සලකුණුවලට නින්දා කළෝය.** (ගීතාවලිය 89 : 52)

ආලේපලත් සේවය දෙවියන්වහන්සේගේ අරමුණ ඉෂ්ඨකරන බව දන්නා අදේවවාදි බලයන්ට යටපත්කර දැමීමට වුවමනාවනු ඇත.

## නැවුම් ආලේපය

දාවිත් නැවුම් ආලේපය ගැන කථාකරයි. නැවුම් නොනවතින දෙවියන්වහන්සේගේ ආලේපය යන්නට එය අඩයාලමකි.

> **නුමුත් ඔබ කුළුගොනාගේ අග මෙන් මාගේ අග උසස් කළ සේක. මම අලුත් තෙලින් ගාගෙන සිටිමි.** (ගීතාවලිය 92 : 10)

ඔබ පෙර අධ්‍යපනය කරන ලද තුන් ආකාර ආලේපය නොනවති අද්දකිනවිට දෙවියන්වහන්සේගේ බලයේ නැවුම් ආලේපය පවත්වාගෙන යනු ඇත.

**ලාදුරු රෝගියෙකුගේ ආලේපය : සම්බන්ධතාවය**

ඔබ දෙවියන්වහන්සේ සමග ඔබගේ පුද්ගලික සම්බන්ධතාවය පවත්වාගෙන නොයන්නේ නම්, ඔබගේ ආලේපය නැවුම් නොවනු ඇත. ඔබට උන්වහන්සේට ඇහුම්කන් දීමට, උන්වහන්සේට සේවය කිරීමට සහ උන්වහන්සේගේ මාර්ගයෙහි ගමන් කිරීමට අවශ්‍ය නම් යාච්ඤාවෙන් සහ බයිබල් අධ්‍යනය තුලින් උන්වහන්සේ සමග සම්බන්ධතාවය පවත්වාගෙන යා යුතුය.

දෙවියන්වහන්සේ සමග සම්බන්ධතාවයකින් තොරව තනතුරු සහ බලයෙහි සේවය කිරීමට යාම ඔබගේ අද්දැකිම්නැතිකර ගැනිමටත් ඉවත දමනු ලැබීමටත් යටත්වනු ඇත.

> **නුමුත් මාගේ ශරීරය දමනය කර වහල්කමට පමුණුවමි. එසේ කරන්නේ අනුන්ට දේශනා කළාට පසු කොයි ලෙසකින්වත් මාව එපා කරනු නොලබන පිණිසය.** (1 කොරින්ති 9 : 27)

> **ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත කරන්නා මිස, මට ස්වාමිනි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නේය.**

**ඒ දවසේදි බොහෝ දෙනෙක් ස්වාමිනි, ස්වාමිනි ඔබගේ නාමයෙන් අනාගත වන නොකියෙමුද ? ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු නොකලෙමුද ? ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකලෙමුදැයි මට කියනවා ඇත.**

**එවිට මම  කිසි කලෙකත් නුඹලා නොහැඳින්නෙමි. අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව යන්නැයි ඔවුන්ට කියන්නෙමි. (මතෙව් 7 : 21 - 23)**

**පුජකයෙකුගේ ආලේපය : ශුද්ධකම**

ඔබගේ සේවය මත දෙවියන්වහන්සේගේ නැවුම් ආලේපය ලැබීමට අවශ්‍යය නම්, ඔබ ශුද්ධ වු ජිවිතයක් ගතකිරීමට අවශ්‍යව ඇත. එමෙන්ම ආත්මික බලය තහවුරු කරන්නාවු දිගටම පවත්නා ශුද්ධාත්මයෙන් පුර්ණ විමක් අද්දැකිමද, ඔබට දෙවියන්වහන්සේ විසින් පවරා ඇති අමාරු කාර්‍ය සම්පුර්ණ කිරිමට අවශ්‍යවි ඇත.

**මේවා එකට ක්‍රියා කරන්නේ කෙසේද ?**

- සම්බන්ධතාවයක් නොමැතිව ඔබට බලය අද්දැකිමටත් ශුද්ධ ජිවිතයක් ගත කිරිමටත් නොහැකිවනු ඇත.

- බලය නොමැතිව ශුද්ධකමට වෙහෙසවිම් ප්‍රතිඵලය නෛතිකකරනණයයි.

- ශුද්ධ ජිවිතයක් ගත නොකට බලයෙහි සහ තනතුරුවල සේවය කිරිම ඔබ ඉවත දමනු ලැබිමට යටත් කරනු ඇත.

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන පද මතකයෙන් ලියන්න

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

2. "ආලේපය" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ?

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

3. තෙල් යනු කුමකට අඩයාලමක්ද ?

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

4. තෙවැදෑරුම් ආලේපයන් හි තේරුම මෙම පාඩමෙහි සඳහන් වී ඇති ආකාරයට විස්තර කරන්න.

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

5. සේවයට ආලේප කිරීමේ මුලාශ්‍රය කවුද ?

-----------------------------------------------------------------------------------------------

6. ආලේප කිරීමේ අරමුණ කුමක්ද?

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

7. දෙවියන්වහන්සේ ආලේප කරන්නනේ කුමන පදනමක සිටද ? එය අධ්‍යාපනය, අද්දැකිම, බුද්ධිය ආදි දේ මතද ?

---------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------

8. අදේවවාදි බලයන් දෙවියන්වහන්සේගේ ආලේපය ලත් අයවලුන්ට විරුද්ධ වන්නේ ඇයි ?

---------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------

9. දෙවිය්නවහන්සේ විසින් ආලේප ධුරයක පමණක් සේවයෙහි යෙදිම වැදගත් වන්නේ ඇයි ?

---------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------

10. ඔබ ඔබගේ සේවයෙහි සහ ජිවිතයෙහි දෙවියන්වහන්සේගේ නැවුම් ආලේපය ලැබීම පවත්වා ගන්නේ කෙසේද ?

---------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------

(මෙම අත් පොතෙහි අවසානයේ පරීක්ෂණ සඳහා පිළිතුරු අඩංගු වේ.)

## වැඩිදුර අධ්‍යනය සඳහා

1. දෙවියන්වහන්සේගේ ආලේපලත් අයවලුන් පිලිබඳව අධ්‍යයනය කරන්න.

දෙවියන්වහන්සේ අන්වහන්සේ විසින් ආලේප කල වුවන්ට කරුනාව සහ නිදහස ලබාදෙයි. (ගිතාවලිය 18:50)

- උන්වහන්සේ ආලේපලත් තැනැත්තා මුදාලයි. ඔහුට ඇහුම්කන් දෙයි. (ගිතාවලිය 20:6)

- උන්වහන්සේ ආලේපලත් තැනැත්තාගේ මුහුණ බලයි. (ගිතාවලිය 84:9)

- උන්වහන්සේ ආලේපලත් තැනැත්තාගේ ගැලවීමේ ශක්තියයි. (ගිතාවලිය 28:8)

- උන්වහන්සේ ආලේපලත් තැනැත්තාට එළිදරව් කිරීම් කරයි. ආලේපයේ පහණ (ගිතාවලිය 132:17)

- දෙවියන්වහන්සේ සතුරාව පරාජය කිරීමට ආලේප කරයි. (2 කොරින්ති 22:7)

2. තවදුරටත් ආලේපය පිලිබඳ සාමනය කරුණු අධ්‍යනය කිරීම.

- පළමු වරට ආලේපය ගැන බයිබලයේ සඳහන් කර ඇත්තේ (උත්පත්ති 31:13)

- ආලේපය සතුට සහ ධර්මිෂ්ඨකමට අදාල වේ. (ගිතාවලිය 45 : 7, හෙබ්‍රෙව් 1:9)

- ස්වාභාවික දුර්වලකම් දෙවියන්වහන්සේගේ ආලේපය ලැබීම නොවලක්වයි. (2 සාමුවෙල් 3:39)

- ආලේපය රෝගින් සුව කිරීමට ප්‍රයෝජනයට ගනි. (මාර්ක් 6:13 සහ යාකොබ් 5:14, යොහාන් 9:6, 11) හි සඳහන් අන්ධයා සහ ආත්මික අන්ධවුවන් (එළිදරව් 3:8)

- ශුද්ධවු තෛලය පුරාණ ගිවිසුම් කාලයේ භාවිතාකොට ඇත. (නික්මයාම 30:31)

- ඒකත්වය ආලේපයට සන්සන්ධනය කොට ඇත. (ගිතාවලිය 133:2)

- ආලේපය ශුද්ධකමට අදාල වේ. (නික්මයාම 29 : 29)

- දේව වචනය ආලේපලත් එකකි. (ලෙවී කථාව 7 : 36)

3. ඔබ දැනටමත් පුරාණ ගිවිසුම් කාලයේ ආලේපය ලාදුරු රෝගින් උදෙසා භාවිතා කල අයුරු ඉගෙන ගෙන ඇත.

- එය පුජාවක් (නික්මයාම 29:36)
- කූඩාරමේ අන්තර්ගතයන් : (ලෙවී කථාව 8, ගණන් කථාව 40)
- පුජාසන හෝ කණු (උත්පත්ති 31:13)

4. නායකයින් දෙවියන්වහන්සේ විසින් ආලේප කොට ඇති අයවලුන් බැවින් ඔවුන්ට විරුද්ධ නොවීමට අප බලාගත යුතුය. (ගණන් කථාව 16, 1 සාමුවෙල් 24 සහ 26, 2 සාමුවෙල් , 1 ලේකම් 16:22, ගිතාවලිය 105:15)

5. මනුෂ්‍යයාගෙන් ලැබෙන ආලේපය දෙවියන්වහන්සේගෙන් ලැබෙන්නාවූ ආලේපය මෙන් නොවේ. (2 සාමුවෙල් 19:10) අබ්සොලොම්ගේ ශෝකාණුකූල වු කථාව බලන්න. ඔහු ආලේප ලැබුයේ නුෂ්‍යයාගෙනි. (2 සාමුවෙල් 18:20)

6. පහත ආලේපයන් පිලිබඳව කියවන්න.

- ජෝෂුවා ද්විතිය කථාව 34:9 සහ ගණන් කථාව 27:18, 22
- සාවුල් 1 සාමුවෙල් 10:15-27
- දාවිත් 1 සාමුවෙල් 16:1-13
- යේසුස් ලුක් 4:18

7. ක්‍රියා 7:25 සහ නික්මයාම 2:1-15 අධ්‍යනය කරන්න. මෝසෙස්ට නිවැරදි කැඳවීම තිබෙන නමුත් වැරදි අධිකාරිත්වය පළමුව පැමිණියේය. ඔහු දෙවියන් වහන්සේගේ බලයෙන් ක්‍රියා නොකට තමාගේ බලයෙන් යුක්තව ක්‍රියා කළේය.

8. ආමොස් 7:14-15 කියවන්න. ආමොස් සේවකයකු නොවේ. ඔහු එඬේරෙකි. අත්තික්කා ගස් වන්නෙකි. නුමුත් දෙවියන්වහන්සේ ඔහු ආලේප කල විට ඔහු ප්‍රොපේතවරයෙකු විය.

## හතරවන පරිච්ඡේදය

### නායකත්වය අවශ්‍ය සුදුසුකම්

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අවසානයේ ඔබට :

- ප්‍රධාන බයිබල් පදයන් මතකයෙන් ලිව්මට හැකිවනු ඇත.
- "සුදුසුකම " යන්න විග්‍රහ කල හැක.
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ භාහිර ඵල විස්තර කිරීම.
- නායකත්වය තිබිය යුතු ගුනාංග පිළිබඳ ලැයිස්තුව සහිත ප්‍රධාන බයිබල් පද දෙක හඳුනා ගැනිම
- සෑම ආත්මික නායකයකු තුලම තිබිය යුතු ප්‍රධාන සුදුසුකම් ලැයිස්තුගත කිරීම.

ප්‍රධාන බයිබල් පදය :

> **මක්නිසාද අපි වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුල මවනු ලැබ දෙවියන්වහන්සේගේ කාර්මාන්තයව සිටිමුව. ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින් සුදානම් කළ සේක. (එපීස 2:10)**

### හැඳින්වීම

දෙවියන්වහන්සේ ඇදහිලිවන්තයෙකු නායකත්වයට කැඳවනු පසු උන්වහන්සේට ඔහුව සේවය සඳහා නිසි ලෙස සන්නද්ධ කිරීමට අවශ්‍යව ඇත. විවිධ ඉටුකල යුතු අමාරු කාර්යයන් සහ කැඳවීම් ඇති නිසා ක්‍රිස්තුස් වහන්සේගේ ශරිරයේ විවිධ තනතුරුවලට ආවේනික වු විවිධ සුදුසුකම් ඇත. සෑම නායකයෙකුම විවිධ ලෙස දෙවියන්වහන්සේ විසින් සන්නද්ධ කරනු ලබයි. දෙවියන්වහන්සේ ආත්මික නායකයින්ට තමාගේ කැඳවිමට අවශ්‍ය නිශ්චිත (ගුනාංග) සුදුසුකම් දෙන අතර, සෑම ආත්මික නායකයෙකුටම තිබිය යුතු විශේෂ සුදුසුකම්ද ඇත. දෙවියන්වහන්සේ සෑම නායකයෙකුම විවිධ මාර්ග වලින් සන්නද්ධ කරයි.

දෙවියන්වහන්සේ නායකයන් ඔවුන්ගේ කැඳවීමට අවශ්‍ය නිශ්චිත සුදුසුකම් දෙන අතර, සෑම ආත්මික නායකයෙකුටම තිබිය යුතු සාමාන්‍ය සුදුසුකම් ද ඇත. මෙම මුලික අවශ්‍යතා වන සාමාන්‍ය සුදුසුකම් ආත්මික නායකත්වය අවශ්‍ය නිශ්චිත සහ සාමන්‍ය සුදුසුකම් මෙම පාඩමෙහි විෂය වෙයි.

### බයිබලිය සුදුසුකම්

සුදුසුකම් යනු ස්වාභාවික හැකියාවන් නොවේ. ඒවා චරිතයේ සහ පැවැත්මේ ගුනාංග වෙති. නායකත්වයට අවශ්‍ය බයිබලිය සුදුසුකම් වන්නේ දේව වචනයේ නායකයන් සඳහා විස්තර කර ඇති චරිතයේ සහ පැවැත්මේ ගුනාංග (සුදුසුකම්) යන්ය. ඒවා දෙවියන්ට අනුකුල වු ජිවන පැවැත්මකට වන සාක්ෂිය.

මනුෂ්‍යයින් නිතරම වඩා වැදගත් ලෙස සලකා බලන්නේ නායකයාගේ හැකියාවන් වන අතර, නායකත්වයට ඔවුන්ගේ ඇති සුදුසුකම් නෙසලකා හරී. උදාහරණ වශයෙන් මනුෂ්‍යයන් දේවගැතිවරයෙකු (පාස්ටර්) ඔහුගේ හොඳ දේශනාවකින් විනිශ්චය කරයි. තම කථාවේ හැකියාවෙන් ඔහු මනුෂ්‍යයින්ගේ සිත් බැඳගන්නා නමුත් නායකයකු වශයෙන් දෙවානුකුල ජිවන පැවැත්මකට හිමි බයිබලිය සුදුසුකම් අතින් හිඟ කෙනෙක් විය හැකිය.

බයිබලිය පදනමේ සිට බයිබලිය තත්වයට සරිලන ලෙස ආත්මික නායකත්වය සංවර්ධනය කල යුතු සහ ඇගයීමට ලක්විය යුතුය. ඕනෑම සේවයක් පරීක්ෂාකර බලන්නේ ආත්මික දීමනා, බලය හෝ ස්වභාවික හැකියාවන් මත නොවේ. සේවයක් අගය කල යුත්තේ “ ආත්මික ඵල ” ලෙස නම් කෙරෙන දේවානුකූල ජිවන පැවැත්ම මතය.

**එබැවින් ඔවුන්ගේ ඵල වලින් නුඹලා ඔවුන් ඇඳිනගන්නහුය. (මතෙව් 7:20)**

පුද්ගලයෙකුගේ ඇතුලාන්තයෙන් ඵල හෝ ආත්මික ගුනාංග අනාවරණය වේ.

**මක්නිසාද නරක ඵල දරන හොඳ ගහක්වත්, හොඳ ඵල දරන නරක ගහක්වත් ඇත්තේ නැත. මක්නිසාද එක එක ගහ එහිම ඵලයෙන් දැනගනු ලැබේ.**

**මනුෂ්‍යයාගේ කටුගස් වලින් අත්තික්කා ඵල නෙලා නොගනිති. ගොකටු පඳුරකින් මුද්‍රික ඵල කඩා නොගනිති.**

**යහපත් මනුෂයයා තමාගේ සිතෙහි වූ යහපත් දේද නපුරු මනුෂ්‍යයා නපුරු සම්පතෙන් නපුරුදේද පිටතට ගෙනෙන්නේය. මක්නිසාද මුඛය කථා කරන්නේ සිතේ පූර්ණ කමින්ය. (ලුක් 6:3-45)**

මනුෂ්‍යයෙකුට ආත්මික බලය වැරිදියට සිතිය හැක. මනුෂ්‍යයෙකුගේ පෞද්ගලිකත්වයේ කැපිපෙනිම් මත ඒකරාශි වූ බලයද ආත්මිකජලය ලෙස වැරදියට සිතිය හැකිය. ඔහු ස්වාමින්වහන්සේගේ නාමයෙන් හාස්කම්ද කළ හැකිය. නමුත් යේසුස් වහන්සේ මෙසේ කී සේක.

**ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස ස්වාමිනි, ස්වාමිනියි, කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නෝය.**

**ඒ දවසේදි බොහෝ දෙනෙක් ස්වාමිනි, ස්වාමිනි ඔබගේ නාමයෙන් අනාගත වචන නොකියෙමුද? ඔබගේ නාමයෙන් යක්ෂයයන් දුරු නොකෙලෙමුද? ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකෙලෙමුද? මම කියනවා ඇත.**

**එවිට මම කිසි කලෙකත් නුඹලා නොහැඳින්නෙමි. අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව යන්නැයි ඔවුන්ට කියන්නෙමි. (මතෙව් 7:21-23)**

යුද් සහාව “තුලට රිංගා” වැරදි ඉගැන්වීම් කරන්නවුන් ගැන අවවාධ කර ඇත. ඔවුන් හඳුනාගත හැකි මාර්ගය ලෙස යුද් පැවසුවේ ඔවුන්ගේ ජිවිත තුල ආත්මික ඵල හිනවිමයි.

**මොවුහු නම් නුඹලා සමග මංගල්‍ය කෑම කන විට නුඹලාගේ ප්‍රේම මංගල්‍ය වල නෙපෙනි තිබෙන්නාවූ පර්වතයෝද, නිර්භිතව තමුන්ම පෝෂනයකර ගන්න එඬේරුය. හුළඟින් ගහගෙන යන වතුර නැති වළාකුල්ය. ඵල නැත්තාවූ දෙවරක් මළා වූ මුලින් උදුරන ලද්දාවූ ගස්ය. (යුද් 12)**

ඕනෑම සේවයක වැදගත් වන්නේ ඵලයි. මක්නිසාද “ඔවුන්ගේ ඵල වලින් ඔවුන් හඳුනා ගනු” ලැබේ.

## මූලිකවම අවශ්‍ය දේ

සෑම නායකයෙකුටම තිබිය යුතු මූලිකව අවශ්‍ය දේවල් ඇත. : කිතුණු නායකයා

1. **නැවත උත්පාදනය විය යුතුය :** ඔහු යොහාන් 3 වන පරිච්ඡේදයේ සදහන් කර ඇති ආකාරයට ක්‍රිස්තුස් වහන්සේගේ සැබෑ ඇදහිලිවන්තයෙකු විය යුතුය.

2. **ශුද්ධාත්ම බෞතිස්මය ලබා දිය යුතුය :** ක්‍රියා 1:8 හි විස්තර කර ඇති ආකාරයට බලවත් සාක්ෂිකාරයෙකුගේ සාක්ෂි ඔහුට තිබිය යුතුය.

3. **ඔහු නායකයෙකු ලෙසට කැදවා ආලේප ලබා දිය යුතුය :** මනුෂ්‍යයින් සභාවේ නායකත්ව තනතුරු සදහා කැදවා දෙවියන්වහන්සේගේ ආලේපය ලබා දිය යුතුය.

4. **ආත්මික පරිනතභාවය :** නායකයා මාංශික ඇදහිලිවන්තයකු (1 කොරින්ති 3:1) හෝ නව කිතුණුවෙකු නොවිය යුතුය. (1 තිමෝති 3:6) ඔහු (හෙබ්‍රෙව් 6:1-3) මෙම පරිච්ඡේදයේ මගපෙන්වා ඇති පරිදි ආත්මික පරිනතභාවයට ලගාවුවෙකු විය යුතුය.

ආත්මික පරිනතභාවයට හොද යාච්ඤාවක් සහ බයිබල් අධ්‍යනය පුරුද්දකින් යුත් දෙවියන්වහන්සේ සමග හොද සම්බන්ධතාවයක් පවත්වා ගැනිමක් අදාල වේ. දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි අන්‍යයන්ව මගපෙන්විමට නම් ඔබ දෙවියන් වහන්සේ සමග සන්නිවේදනය කරන්නාවු උන්වහන්සේගේ වචනය දන්නාවු අයෙකු විය යුතුය. ඔබ නායකත්ව සමුළු, බයිබල් විද්‍යාල සහ බොහෝ නායකත්වය පිළිබද පොත් කියවන්නෙකු විය හැකි නමුත් ඔබ දිගටම දෙවියන්වහන්සේ නොසයන්නෙකු නම් ඔබගේ සේවය අසාර්ථක වනු ඇත.

## ශුද්ධාත්මයාණන්ගේ ඵල

ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵල පෙන්නුම් කරන්නේ ඇදහිලිවන්තයන්ගේ ජීවිතය තුල ආත්මයාණන්වහන්සේ අන්ධකාරය වි ඇති ආකාරයයි. ඒවා කිතුණුවන්ගේ ජිවිතය තුල විශේෂයෙන්ම ආත්මික නායකයන්ගේ ජිවිත තුල සාක්ෂින් විය යුතු ආත්මික ගුනාංග වේ.

ශුද්ධාත්මයාණන්ගේ දිමනා බලය සදහා වේ. ශුද්ධාත්මයාණන්ගේ ඵල චරිතය සදහා වේ. ආත්මික ඵල ආත්මික පරිනතභාවයේ සාක්ෂියක් වේ. ස්වාභාවික ලෝකයේ ඵල දැරීම සදහා කාලයක් ගන්නාසේම ආත්මික ඵලද වර්ධනය විමට කාලය ගතවේ.

බයිබලය දෙයාකාරයක ආත්මික දිමනා ගැන කථා කරයි. භාහිරව ශුභාරංචිය ප්‍රකාශ කිරිම අභ්‍යන්තර ඵල ලෙස ආත්මික දේව ගුනාංගයන් ගැනය. ආත්මික නායකයින් ශුභාරංචි පණිවුඩයේ බලවත් සාක්ෂිකාරයන් ලෙස ඵල දැරිය යුතුය.

> **නුඹලා මා තෝරා ගත්තා නොව මම නුඹලා තෝරාගෙන පත් කලෙමි. එසේ කලේ නුඹලා ගොස් ඵල දරන පිනිසත් නුඹලාලේ ඵල පවතින පිනිසත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිනිසත්ය.** (යොහාන් 15:16)

යේසුස් වහන්සේ ස්වර්ගයට නැගී යාමට පෙර කරන ලද අවසාන ආඥාව වුයේ :

**උන්වහන්සේ ඔවුන්ට කියන සේක්, නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. (මාර්ක් 16:15)**

උන්වහන්සේ සිය ගෝලයන්ට බලවත් ආත්මික අස්වැන්නක දර්ශණයක් ඇතුව අභියෝග කලේය.

**තව සාරමසක් ගිය කළ ගොයම් කපන කාලය පැමැණෙන්නේ යැයි නුඹලා කියනවා නොවේද ? මම නුඹලාට කියම් නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලාපල්ලා. වපුරන්නාත් කපන්නාත් එක්ව සන්තෝෂ වන පිනිස කපන්නා කැලි ලැබ සදාකාල ජීවනයට ඇස්වැන්න එකතුකර ගන්නේය. (යොහාන් 4:35-36)**

සාලමොන් පැවසුවේ :

**ධර්මිෂ්ඨයාගේ ඵලය ජීවන වෘක්ෂයක්ය. ආත්ම දිනාගන්නා ඥානවන්තයෙක්ය. (හිතෝපදේශ 11:30)**

ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය ඇදහිලිවතුන් ශුභාරංචිය ප්‍රකාශ කිරීම මගින් ඵලදරන්නවුන් බවට පත් කරයි.

**නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමේද මුළු යුදයෙහිද සමාරියෙහිද සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයැයි කී සේක. (ක්‍රියා 1:8)**

ආත්මික පුජාසනයේ ක්‍රමය 2 තිමෝති 2:2 හි දක්වා ඇත.

**බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමාර්ථ වූ විශ්වාස වූ මනුෂ්‍යයන්ට භාරදීපන්න යනුයි. (2 තිමෝති 2:2)**

ශුභාරංචිය නමැති ඵලයේ වැදගත්කම හේතුවෙන්ට අස්වැන්න සෘතුව ජාත්‍යන්තර ආයතනය විසින් මෙම මාතෘකාව යටතේ “මුහුන් වැනි ශුභාරංචිය” නමින් පාඩම් මාලාවක් ඉදිරිපත් කර තිබේ.

ශුභාරංචිකරණයේ ඵලයට අමතරව නායකයින් විසින් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට සමානවීමේ ඵලයද වර්ධනය කරගත යුතුය.

නුමුත් ආත්මයාණන්ගේ ඵල නම්, ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, හපත්කම, විශ්වාසකම, මෘදුකම, පමන දැන ක්‍රියා කිරීම, යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යාවස්ථාවක් නැත. (ගලාති 5:22-23)

මේ නායකයෙකුගේ ඇතුලාන්ත ජීවනයේ වර්ධනය වනු දැකීමට ශුද්ධාත්මයාණන් වහන්සේට වුවමනාය. ඒවා ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ සාක්ෂියක්ව තිබූ ගුනාංගයෝය. අප ඒවාට “ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට සමාන ගුනාංග” යැයි කියන්නේ එබැවිනි.

ඇදහිලිවතුන් විසින් කරනු ලබන සෑම යහපත්, ධර්මිෂ්ඨ, සහ සත්‍යගරුක ක්‍රියාවන්හි ශුද්ධාත්මයාණන් වහන්සේගේ සම්භාවනාව ඇත.

**ආලෝකයේ ඵල නම්, සියලු ආකාර යහපත්කමත්, ධර්මිෂ්ඨකමත්, සැබෑකමත්ය. (එපීස 5:9)**

ශුද්ධාත්මයාණන්ගේ ඵල වල පහත දැක්වෙන නිශ්චිත ගුනාංග ඇතුලත්ය.

**ප්‍රේමය :**

ගැමුරු සෙනෙහසේ, රැකවරණයේ සහ සැලකිල්ලේ හැගිමකි. එය මනුෂ්‍යයින් ගැන සැලකීම, මිතුරු විමට, අනුකම්පා කිරිමට, තේරුම් ගැනිම, සැනසිම, ධෛර්මත් කිරිම, ඇහුම්කන් දිම, ඊට අදාලය.

නායකයා දෙවියන්වහන්සේට ආදේශ කල යුතුය. (මාර්ක් 12:30) ප්‍රේමය නායකයා විසින් තමාව අනුගමනය කරන්වුන්ට, සියලු ඇදහිලිවතුන්ට සහ ගැලවිම නොලැබුවා වු අයට පෙන්විය යුතුය. (1 පේත්‍රුස් 1:22, ලුක් 6:27, 32, 35, මතෙව් 5:43-44, 19:19, යොහාන් 13:34-35, 15:9, 12, 17:26, 1 යොහාන් 2:9-10)

දෙවියන්වහන්සේ උදෙසා ප්‍රේමයේ සේවකයකු විම නායකයෙකු සතු කාර්යයි. (1තෙසලොනික 1:3) ඇදහිල්ල ක්‍රියාත්මක වන්නේ ප්‍රේමයයි. ආත්මික දිමනා ක්‍රියාත්මක වන්නේ පෙර්මය තුලිනි. (1කොරින්ති 13) සෑම සේවකයකුම සාර්ථකත්වයට හේතුව ප්‍රේමයයි. (1 කොරින්ති 13)

ප්‍රේමයට උපායශිලි විම අදාලය. ප්‍රායෝගික ස්වරූපයෙන් විය හැකි ආකාරයට අන්‍යයන් සමග මිතුරු විමටත් සම්බන්ධතා පැවැත්විමටත් එය අදාලය. අන්‍යයන්ට වරදක් නොවන ආකාරයට අවශ්‍ය දේ අමාරු වුවත් කිමට සහ කිරිමට හැකියාව ප්‍රේමය විසින් ලබා දේ.

**ප්‍රිතිය :**

සතුට, සොම්නස, ප්‍රිති ප්‍රමෝදය ප්‍රිතියේ ගුණාංග වේ. ඔබට ප්‍රිතිය තිබිම දෙවියන්වහන්සේගේ ආශාවයි. එය දෙවියන්වහන්සේ තුල ඇත. (ගිතාවලිය 16:11) සත්‍ය ප්‍රිතිය ආත්මිකය. එය බාහිර වාතාවරණය මත රැඳි නොපවති. නායකයාට පරික්ෂා සහ සෝදිසි කිරිම් වලදි ද ප්‍රිතිමත් විය හැකිය. ඔහුට ප්‍රිතියෙන් දුක්විදිමට හැකිය. (කොලොස්සි 1:11)

**සාමය :**

සාමය යනු නිහඬ, නිශ්චල, ශාන්ත, සමගි කිරිම් තත්වයකි. එය කෝලාහල හෝ තැවුල් සහිත හෝ සංවේගයක් හෝ නොවේ. මේ ගුනාංගය තිබෙන නායකයා විශ්වාසවන්ත වන අතර හදිසි අවස්ථාවකදි වුවද ඔහුට නිශ්චලව සිටිය හැකි නිසා තම හිස ඔසවා සිටිය හැක. තමාගේ විරුද්ධ පදය අවුල්සහගත බවයි.

දෙවියන්වහන්සේ අවුල්සහගත තත්වයන් ඇති නොකරයි. උන්වහන්සේගේ අගාව සාමය ගෙන ඒමයි. (1 කොරින්ති 14:33) සෑම සැබෑ සාමයක්ම පැමිණෙන්නේ ක්‍රිස්තුස්වහන්සේගෙන්ය. (ක්‍රියා 10:36 , එපීස 2:14, රෝම 5:1, යොහාන් 14:27, 16:33)

නායකයින් හඹා යා යුත්තේ ප්‍රතිඵලය ලෙස සාමය ඇතිකරවන දේවල්ය. (රෝම 14:19 ) ඔවුහු අන් අය සමග සාමයෙන් ජිවත් විය යුතුය. (2 කොරින්ති 13:11, හෙබ්‍රෙව් 12:14) ඕනෑම ප්‍රබල සේවයකට අත්‍යවශ්‍ය

ඒකත්වය ලැබෙනුයේ සාමයෙනි. (එපිස 4:3) දෙවියන්වහන්සේගේ සාමය පාලකයාගේ සිත පාලනය කළ යුතුය. (කොලෙස්සි 3:15)

**බොහෝ කල් දුක් විදිම :**

බොහෝ කල් දුක්විදිම ඉවසිමේ ගුනාංගයකි. එය ප්‍රිතියෙන් දරාගත නොහැකි තත්වයන් දරාගැනිම සහ ඉවසිමෙන් උසුලාගැනිමට ඇති හැකියාවයි. අපෝස්තුළු පාවුල් තුමාගේ සේවයේ සාක්ෂියක් වු උසස් ගුනාංගය වුයේ බොහෝකල් දුක්විදිමටයි. (2 තිමෝති 3 : 10) අප කැදවා ඇත්තේ ප්‍රිතියෙන් බොහෝකල් දුක් විදිමටයි. (කොලොස්සි 1:11, 2 තිමෝති 4:2) ආත්මික ගුනාංගයක් ලෙස ඔහු දිගු කාලින දුක් විදිම.

නායකයා දේව වචනය බොහෝ කල් දුක් විදිමින් දේශනා කල යුතු වන (2 තිමෝති 4:2) අතර, ඔහුගේ ඒකි ගුනාංගය සමගින් අන් අය සමග සම්බන්ධ විය යුතුය. (එපිස 4:2) ඔහු ආත්මික ගුනාංගයක් ලෙස බොහෝකල් දුක්විදිම පැළදගෙන සිටිය යුතුය. (කොලොස්සි 3:12)

**මෘදුකම:**

**මෘදුකම යනු දැඩි නොවු ප්‍රකෝපකාරි නොවු ගෝෂාකාරි නොවු මෘදු ස්භාවයකින් කටයුතු කිරිමේ** ගුනාංගයයි. එය නිහඬ ගරු කටයුතු කරුණාවන්තකමකි. බයිබලය ඇදහිලිවතුන්ට අන් අයට තරගයක් නොවි සියලු මනුෂ්‍යයන්ට ගුණවන්ත ක්‍රියා කරන ලෙසට අවවාද කරයි. (2 තිමෝති 2 9 24) අප කලහකාරි නොවිය යුතුය. කළහකාරි යනු හැම විටම දබරකරගන්න වාද කරන්නාවු අයයි. අප අපගේ මෘදුකම හේතුවෙන් පහසුවෙන් සංග්‍රහ කරවනු ලැබිමට හැකි අය එනම් පහසුවෙන් ආශ්‍රය කළ හැකි අය විය යුතුය. (යාකොබ් 3:17)

මෘදු නායකයා විශිෂ්ඨ නායකයෙකි. දාවිත් ලියුවේ :

**තවද ඔබගේ ගැලවිම නමැති පලිහ ඔබ මට දුන් සේක. ඔබගේ දකුණත මා දැරුවේය. ඔබගේ මෘදුකම මා උසස් කළේය. (ගිතාවලිය 18:35)**

**යහපත්කම :**

යහපත්කම යනු ශුද්ධකම හෝ ධර්මිෂ්ඨ ක්‍රියාය. දෙවියන්වහන්සේ ක්ෂමා ඇත්තා යහපතින් පුරවන සේක. (ගිතාවලිය 107:9) දෙවියන්වහන්සේගේ යහපත්කමත් කරුනාවත් අප අනුව එන්නේය. (ගිතාවලිය 23:6)

**ඇදහිල්ල :**

ඇදහිල්ල යනු දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසයේ, බලාසිටිමේ හා බලාපොරොත්තුවේ ආකල්පයකි. (හෙබ්‍රෙව් 12:1) එය දෙවියන්වහන්සේ විසින් පැවසු සියල්ල සත්‍ය බවත් උන්වහන්සේට කළ නොහැක්කේ නැති බවත්ය. ඇදහිල්ල දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ මහත් වු දේ ඉෂ්ඨ කරන පිණිස සේවයේ වැඩ හා සම්බන්ධවුවකි.

ඇදහිල්ල දෙවියන්වහන්සේ කෙරෙහි අනුගමනය කරන්නවුන්ට උන්වහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිකරවන්නාවු ආකාරයට උන්වහන්සේ විශ්වාස කිරිමේ ආකල්පයකි. එය මා ශක්තිමත් කරන්නාවු ක්‍රිස්තුස්වහන්සේ තුලින් මට සියල්ල කළ හැකියයි විශ්වාස කිරිමකි.

**විනිත භාවය :**

විනිතභාවය යනු ශක්තිය පාලනය කර ගැනිමකි. අන් අය හික්මවිය යුත්තේ විනීතභාවයෙන් යුතුවය. (ගලාති 6:1) එය නායකයාට සභාවේ එකමුතුභාවය රැක ගැනිමට උපකාරිවේ. (එපිස 4:1-3) එය සෑම මිනිසකු සම්බන්ධයෙන්ම ක්‍රියා කරන විට අදාල කරගත යුතුය. (තිතස් 3, 2 තිමොති 2:24-25) නුවනැති මනුෂ්‍යයා විනිත අයෙකි. (යාකොබ් 3:13) සියලු ඇදහිලිවතුන් මෙම ගුණය ලගා කරගන්නා ලෙසට ධෛර්‍යමත් කරනු ලැබේ. (කොලොස්සි 3:12, 1 තිමෝති 6:11, ශෙපනියා 2:3)

**පමණදැන ක්‍රියා කිරිම :**

පමණදැන ක්‍රියා කිරිම යනු හැගිම්, සිතුවිලි සහ ක්‍රියා පාලනය කර ගැනිමයි. එය තමාවම පාලනය කරගැනිමකි. පමණදැන ක්‍රියා කිරිම සෑම දෙයෙහිම ජය ලබා දෙන්නේය. (1 කොරින්ති 9:27 සහ 9:19-27) අපි අපගේ ජිවිතයට පමණදැන ක්‍රියා කිරිම එකතු කරගත යුතුය. (2 පේත්‍රුස් 1:6)

**විශේෂ සුදුසුකම්**

ආත්මික ඵලවලට අමතරව නායකත්වයට අවශ්‍ය සුදුසුකම් බයිබලය හදුනා ගනි. මේවා 1 තිමෝති 3 සහ තිතස් 1 හි සොයාගත හැකිය. පහත ලැයිස්තුගත කර සුදුසුකම් පාස්ටර්, බිෂෝප්, වැඩිමහල්ලන්, සහ උපස්ථායකයින් සඳහාය. මේවා විශේෂ තනතුරු සඳහා තිබිය යුතු ඒවා යැයි හදුනාගත්තද සියලු නායකත්ව තනතුරුවලට යෝග්‍යය.

**බිෂොප්වරු සහ වැඩිමහල්ලන් :**

**අපකිර්තියට පත් නොවු :**
හොද කිර්තිනාමයක් තිබිය යුතුය. සදාචාරාත්මක හික්මුණු දෙවියන්වහන්සේගේ වචනය කඩනොකරන්නාවු අයෙකු විය යුතුය. 1 තිමෝති 3:2, තිතස් 1:6,7

**එක භාර්යාවකට පමණක් පුරුෂයා වු :**
විවාහක නම් එක භාර්‍යාවක් පමණක් සිටිය යුතුය. 1 තිමෝති 3:2, තිතස් 1:6 (සේවයෙදි භාර්යාවගේ සහාය සහ සහයෝගිත්වය ද වැදගත්ය.)

**පමණ දන්නාවු :**
සියලු දේ ගැන පමණ දැන ක්‍රියා කරන්නාවු අයෙක් විය යුතුය. තිතස් 1:8, 1 තිමෝති 3:2

**තමාවම හික්මවාගන්නා ලද :**
ජිවිතයේ පැවැත්මේ සහ සෑම ප්‍රදේශයකම පාලනයක් පවත්වාගෙන යෑම. අනුන්ව පාලනය කිරිමට නම් නායකයාට තමාව පාලනය කරගත හැකිවිය යුතුය. තිතස් 1:8

**මධ්‍යස්ථ සිහිනුවණ ඇති :** එනම් දැනුම ඇති, සිහිය ඇති, ඥාණවන්ත, සහ ප්‍රායෝගික අයෙකු විය යුතුය. 1 තිමෝති 3:2, තිතස් 1:8

**ආගන්තුක සත්කාරයට ලැදි වු:** තම නිවස අන් අය වෙනුවෙන් ඇරි තිබිය යුතුය. 1 තිමෝති 3:2, තිතස් 1:8

**ඉගැන්විය හැකි :** දේව වචනය අන් අය වෙත සන්නිවේදනය කල හැකි අයෙකු විය යුතුය. 1 තිමෝති 3:2, තිතස් 1:9

**මුද්‍රිකපානයට ලොල් නොවු :** 1 තිමෝති 3:3, තිතස් 1:7

**ඉවසිලිවන්ත වු :** ඉක්මනින් කිපෙන යන්නෙහි විරුද්ධ අර්ථයයි. 1 තිමෝති 3:3

**තම කැමැත්තටම යටත් නොවු :** තම කැමැත්ත කෙරෙහිම යොමු නොවු එනම් තමන්ගේම මාර්ගය සැමවිටම නොසයන්නාවු තිතස් 1:7

**අලුත් ඇදහිලිවන්තයෙකු නොවු :** පරිනත සහ ඇදහිලිවන්තයෙකු ලෙස අත්දැකිම් ඇත්තෙකු විය යුතුය. 1 තිමෝති 3:6

**නිවැරදි දෙයට ප්‍රේම කරන්නාවු :** දෙවියන්වහන්සේට වටිනා සහ උන්වහන්සේගේ කාර්‍යයට සැම විටම උපකාරකරන්නාවු තිතස් 1:8

**යුක්තිගරුක වු :** මනුෂ්‍යයින් සමග කටයුතු කිරිමේදි සාධරනවු තිතස් 1:8

වචනයේ ස්තිර වු : තීතස් 1:9

**ශුද්ධ වු :** ධර්මිෂ්ඨ වු ශුද්ධ වු තිතස් 1:8

**නින්දිත ලාභයට ගිජු නොවු :** මුල්‍යම ලැබිම් වලට ගිජු නොවිය යුතුය. මුදලට ඇති අශාවෙන් තොර විය යුතුය. තිතස් 1:7, 1 තමෝති 3:3

**තම පවුල නිවැරදිම හසුරුවාගන්නා වු :** නායකත්ව හැකියාවන් තමන්ගේ පවුල තුල පෙන්විය යුතුය. 1 තිමෝති 3 : 4 - 5

**ඇදහිලිවන්තයන් වු දරුවන් ඇත්තාවු :** අරගල නොකරන්නාවු දෙවියන්වහන්සේට ප්‍රතිචාර දක්වන්නාවු දරුවන් සිටින්නාවු

නොඇදහිලිවතුන් අතරද හොද නමක් දිනා ඇත්තාවු : නොඇදහිලිවතුන් අතරද හොද සාක්ෂියක් තිබිය යුතුය. 1 තිමෝති 3:7

**උපස්ථායකයින් :**

**ගරුත්වය** : ගරුකටයුතු හැසිරිමක් සහ මනසක්, චරිතයක් පෙන්නුම් කල යුතුය. 1 තිමෝති 3:8

**දිව දෙකේ කථා නොකරන්නාවු** : පටලැලි සහිත වාර්ථා නොදෙන්නාවු අයකු විය යුතුය. 1 තිමෝති 3 : 8

**බොහෝ මුද්‍රිකපානයට ඇලුම් නොවු** : 1 තිමෝති 3:8

**නින්දිත ලාභයට ගිජු නොවු** : මුල්‍යමය ආසාවන්ට කැදර නොවු : 1 තිමෝති 3:8

**ඇදහිල්ලේ රහස පිරිසිදු හෘදසාක්ෂියකින් දරන්නාවූ :** 1 තිමෝති 3:9

**සෝදිසි කරනු ලැබූ :** ආත්මික සෝදිසි කිරීම් සහ පරීක්ෂා තුලින් ගොස් විශ්වාසවන්ත අයෙකු යැයි ඔප්පු කරනු ලැබූ අයකු විය යුතුය. : 1 තිමෝති 3:10

**යහපත් කීර්තිනාමයක් ඇත්තාවූ :** නරක හැසිරීමකට හෝ කිසි චෝදනාවකට ලක් නොවූ : 1 තිමෝති 3:10

**එක භාර්‍යාවකට පමණක් පුරුෂයාවූ :** විවාහකකම් එක භාර්යාවක් පමණක් සිටිය යුතුය. 1තිමෝති 3:12

**තම නිවස යහපත් ලෙස හසුරුවා ගන්නාවූ** : පවුල් ජීවිතයේද නායකත්වය පෙන්නුම් කල යුතුය. : 1 තිමෝති 3:12

තමා පිළිබඳ ඔප්පුකර පෙන්වනු ලැබූ : අලුත් ඇදහිලිවන්තයෙකු නොවූ : 1 තිමෝති 3:10

## සාමාන්‍ය සුදුසුකම්

නායකයන්ට වැදගත්වන තවත් අමතර සුදුසුකම් මෙසේය.

**දර්ශනය:**

නායකත්වය ගන්නා පුද්ගලයාට දර්ශණයක් තිබිය යුතුය. එම දර්ශනය දෙවියන්වහන්සේගේ කැමැත්ත සහ කාර්‍යයට, දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට සහ දෙවියන්වහන්සේගේ සැලැස්ම තුල තම කාර්‍යය දැන ගැනීමට අදාල විය යුතුය.

දර්ශණයක් සහිත නායකත්වයට පාවුල් තුමා හොඳ නිදසුනකි. මන්ද ඔහුට දෙවියන්වහන්සේ විසින් තමා කැඳවනු ලැබූ කාර්‍යට පැහැදිලි දර්ශණයක් තිබුනේය. ඔහුගේ සේවයේ අවශ්‍යතා අවුරුදු කිහිපයකදී ඔහුට “ස්වර්ගීය දර්ශණයට අකීකරු නොවූයෙමි” යි කියන්නට පුලුවන් විය.

දර්ශණය වර්තමානය අභිබවා දකිමින් අනාගතයේ ව්‍යාපෘති සැලසුම් කිරීමට දෙවියන්වහන්සේගේ මහත් වූ ක්‍රියා කෙරේ විශ්වාස කිරීමට උපකාරි වේ.

**විශිෂ්ඨත්වය:**

නායකයකු “සාමන්‍ය” හෝ “තරමක් හොඳ” යනුවෙන් දෙවියන්වහන්සේ විසින් තමාට දී ඇති සේවය නොකල යුතුය. ඔහු එය උපරිම විශිෂ්ඨත්වයෙන් යුතුව ඉෂ්ඨ කල යුතුය. ඔහු දක්ෂ සහ සුදුසු සේවයෙහි අලස නොවූ අයෙකු විය යුතුය. ඔහු වේලාවට වැඩ කරන පූර්ව, පක්ෂපාති, විශ්වාස කල හැකි සහ නොවරදින අයෙකු විය යුතුය.

**තීරණ ගත හැකි භාවය:**

තීරණ ගත හැකි භාවය යනු ස්තිර තීරණ ගැනීමට ඇති හැකියාවයි. තීරණ ගැනීමේදී එහාට මෙහාට වැනෙන තීරණ ගන්නාවූ අයෙකු නොවිය යුතුය.

හොඳ නායකයකුගේ ලක්ෂණ වන්නේ සියලු කරුණු ඇති විට කෙලින් පැහැදිලි තීරණයක් ගත හැකි වීමයි.

**රසිකතාවයෙන් යුක්ත වීම:**

හොඳ රසිකතාවයකින් යුක්ත විය යුතුය. දේවල් හි විහිළු පැතිද දැකිය හැකි අයෙකු විය යුතුය. එය අමාරු අවස්ථා වලදි උපකාර වනු ඇත.

**ධෛර්‍යය:**

නායකයා බියගුලු අයෙකු නොවිය යුතුය. මනුෂ්‍යයාගේ හෝ සාතන්ගේ විරුද්ධතා මැද ධෛර්‍යය මත සිටගත හැකි අයෙකු විය යුතුය. (නෙහෙමියා 6:11)

**හැකියා යන ආකල්පයෙන් යුක්ත විය යුතුය. :**

අධෛර්‍යය සහ නොහැකි යන ආකල්ප පරාජයට හේතු වේ. අපහසු වතාවරණයක් නායකත්වයට ඇති සෝදිසි කිරීමයි. ඒවා ඔබ අධෛර්‍යමත් කරන්නේද ? ඒවා ඔබ විනාශ කරන්නේද ? පරාජය කරන්නේද ? එසේනම් කල හැකිය හෝ සිදුවය හැකිය යන ආකල්පයෙන් යුතුව කටයුතු කල යුතුය. අධෛර්‍යමත් වීමට වඩා ධෛර්‍යය වීමේ ආත්මයක් ඔබ වර්ධනය කරගත යුතුය. ඔබගේ ආකල්ප නායකයකු වශයෙන් ඉදිරිපත් කරන දෙයට පමණක් නොව ඒවා ඔබට අනුගමනය කරන්නන් වෙතද පැතිර යනු ඇත. නැහැ බැහැ යනුවෙන් සිතන නායකයෙකුට ඇත්තේ නැහැ බැහැ කියන්නාවු අනුගමිකයන් සමුහයකි.

**සන්නද්ධ කරන්නෙකු විය යුතුය:**

නායකත්වයේ ප්‍රධාන ඉලක්කය වන්නේ මනුෂ්‍යයන් සේවයේ කාර්‍යය සඳහා සන්නද්ධ කිරීමයි. (එපිස 4:12) සන්නද්ධ කරන්නෙකුට මනුෂ්‍යයින් සංවිධානය කිරීමට, පෙළඹ වීමට, රැස්කර පුහුනු කිරීමට හැකි විය යුතුය. ඔහු දෙවියන්වහන්සේගේ සේවයට මුද්‍රා තැබුනු ආශාවෙන් සේවය කරන්නෙකු විය යුතුය. නායකයා මෙම ආකල්ප ඔහුගේ අනුගාමිකයන් වෙත සම්ප්‍රේෂණය කොට ඔවුන් දෙවියන්වහන්සේගේ සේවය සඳහා පොළඹවා ධෛර්‍යමත් කරන්නෙකි.

සන්නද්ධ කිරීමේ කොටසක් වශයෙන් තමාම සියල්ල කිරීම වෙනුවට නියමිත ඉලක්කිත වැඩ කොටස් අන්‍යයන් වෙත පවරා දෙන්නේ කෙසේද යන්න ඔහු දනී. හොඳ නායකයා තවත් නායකයන් ගොඩ නගයි. සන්නද්ධ කරන්නා අන් අයට සේවයක්, වගකීමක්, අධිකාරියක් මෙන්ම තමාට තර්ජනයක් වේය නෙසිතා ප්‍රශංසා කිරීමට තරම් ශක්තිවන්තයෙකු වේ.

**අධිකාරීත්වය**

නායකයා දෙවියන්වහන්සේගේ අධිකාරීත්වය යටතේ අධිකාරීත්වය ඇති අයෙකු වය යුතුය දෙවියන්වහන්සේ විසින් ඔහු වෙත පවරා දෙනු ලැබු බලය සහ අධිකාරීත්වයෙන් යුතුව මග පෙන්වීමට හැකි අයෙකු විය යුතුය.

**කැප වුනාවු :**

නායකයා දෙවියන්වහන්සේට, උන්වහන්සේගේ රාජ්‍යයට, තමා විසින් මගපෙන්වන්නාවු අයට සහ සේවයේ වැඩට කැප වෙන්නාවු, වෙන්වන්නාවු අයෙකු විය යුතුය.

**මූලිකත්වය ගන්නාවූ :**

සමහර නායකයන් අනුන් අනුගමනය කරන්නෝය. ඔවුන් අනුන් කරන දේ කොපි කරයි.

සමහර නායකයන් නඩත්තු කරන්නෝය. ඔවුන් සර ලෙස දැනටමත් ආරම්භ කර ඇති දේ පවත්වාගෙන යති. ඔවුන් සම්ප්‍රදායෙන් බැඳී සිටිති.

සමහර නායකයින් නියමයන් පිලිපදින්නෝය. ඔවුන් මනුෂ්‍යයින්ගේ කැමැත්ත පිලිපදිමින් “අප එය සැමවිටම කලේ මේ ආකාරයටයි.” යැයි කියති.

හොඳ නායකයන් මූලිකත්වය ගන්නෝ වෙති. එවුන් නම්‍යශිලි සහ වෙනස් වීමට විවෘත අය වෙති. ඔවුන් දැඩි සහ සම්ප්‍රදායෙන් නොබැඳුනෝ වෙති. මේ ආකාර නායකයා නිර්මාණශිලි අලුත් අදහස් නිපදවීමෙහි සමත් ශුද්ධාත්මයාණන් වහන්සේගේ පොළඹවනු ලැබීමෙන් නාව ආකාරයකට නව අදහස් ක්‍රියාවට නගන්නෝ වෙති. රාජ්‍යයේ වර්ධන උදෙසා ප්‍රමුඛතා පෙළගැස්වීමට, ක්‍රම වෙනස් කිරීමට, මොනවා උනත් කවදා වුවත් අවශ්‍යතා අනුව කිරීමට හැකි අයවලුන් විය යුතුය.

**බුද්ධිය සහ දැනුම:**

නායකයා ප්‍රඥා ගෝචරව සිතන්නාවූ තම ක්‍රියා සහ තිරණ බුද්ධිමත්ව ගනු ලබන්නාවූ බවට සාක්ෂි ලත් අයකු විය යුතුය. ඔහුට කෙසේ මගපෙන්විය යුතුද ? යන්න පිලිබඳ ප්‍රමාණවත් මානසික හැකියාවක් තිබිය යුතුය. මේ දක්ෂතා පුහුණු වීම්, අත්දැකිම, සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ මගපෙන්වීම් තුලින් ලබාගත හැකිය.

**අධ්‍යාපනය:**

අධයාපනය වැදගත්ය. නමුත් මතක තබාගත යුතු කාරණය නම්, දෙවියන්වහන්සේ තෝරා ගත්තේ අඥාණ ඥුගත් මිනිසුන්ය. එවුන් ශ්‍රේෂ්ඨ නායකයන් වුයේ දෙවියන්වහන්සේගේ බලය නිසා වෙනි.

**අත් දැකිම්:**

යෝෂුවාට යුද්ධායුද පිලිබඳ අත් දැකිම් තිබු බැවින් ඔහු ඉශ්‍රායෙල් සෙනග පොරොන්දු දේශයට ගෙන යෑම පිණිස තෝරා ගන්නා ලදි. “ශරීරයක් ලෙසට එක්ව සේවය කිරීම” සෑම ඇදහිලිවන්තයෙකු විසින්ම කල යුත්තේ එබැවිනි. එය නව නායකයන් ගොඩ නැගිමට අත්දැකිම් සපයනු ඇත.

**මිල ගෙවීමට ඇති කැමැත්ත:**

සැබෑ ගෝලත්වයට මිලයක් ඇති බව යේසුස් වහන්සේ පැවසු සේක. උන්වහන්සේ ශක්ති සම්පන්න ගෝලයින්ට මිල ගණනය කරන ලෙසට කලින් දැනුම් දුන් සේක. නායකයින් කුරුසිය රැගෙන තනිවුනු අමාරු වතාවරණ යටතේ තමාව අමතක කොට අමාරු වැඩ කිරීමට කැමති අය විය යුතුය.

**සේවය කිරීමේ ආත්මයක්:**

දේව රාජ්‍යයේ නායකයන්ගේ සුදුසුකම් ලෝකයේ නායකයින්ගේ සුදුසුකම් වලට වඩා වෙනස් බව යේසුස් වහන්සේ පෙන්නුම් කල සේක. කිතුණු සේවකයා නිහතමානි අනුකම්පාවෙන් පිරුණු සේවයේ ආත්මයක්

සහිත එඬේරෙකු මෙන් මගපෙන්වන්නෙකු විය යුතුය. මේ සුදුසුකම් කොපමන වැදගත් යැයි කිවහොත් මී ලග පාඩම් දෙක ඒ සඳහා යොමු කරයි.

## සංවර්ධනාත්මක ගුනාංග

ඔබ ආත්මික ඵල ලැයිස්තුව අධ්‍යනය කල බැවින් නිශ්චිත සහ සාමාන්‍ය සුදුසුකම් මෙම පාඩමේ කරණු ඇත. ඔබ නායකත්වයට අවශ්‍ය සුදුසුකම් යටපත් කර දමා සිටිනු විය හැකිය. “මේ සියලු ගුනාංග වර්ධනය කර ගැනිමට මට කිසිදා නොහැක ” යැයි සිතනු ඇත.

ඔබ නිවැරදිය “තමාවම නිර්මාණය කරගත් ” නායකයෙකු සඳහා වෙනත් වචන වලින් කිවහොත් මේ ගුනාංග ඔබට ඔබ විසින් වු වර්ධනය කරගත නොහැක. නායකයෙකුගේ ගුනාංග වර්ධනය කරගත හැකි ශුද්ධාත්මයාණන් වහන්සේම ඔබ තුල ක්‍රියා කිරිමට ඉඩ හැරිමෙන් පමණි.

ක්‍රියාවලිය දිගටම පවත්නා එකකි. බයිබලය පවසන්නාවු ආකාරයට අප උන්වහන්සේගේ හස්ත කර්මාන්තයයි. මේ වර්ථමාන කාල වක්‍යයකි. එහි තේරුම නම් අප දිගටම දෙවියන්වහන්සේගේ නිර්මාණාත්මක බලය තුලින් සංවර්ධනය වන්නෝ වෙමුව.

> **මක්නිසාද අප වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් වහන්සේ තුල මවන ලැබු දෙවියන්වහන්සේගේ කර්මාන්තයව සිටිමුව. ඒ යහපත් ක්‍රියා වල අප හැසිරෙන පිනිස දෙවියන්වහන්සේ ඒවා කලින් සුදානම් කල සේක. (එපිස 2 : 10)**

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන පද මතකයෙන් ලියන්න

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

2. "සුදුසුකම්" යන වචනයෙන් අදහස් කරන්නේ කුමක්ද ?

-----------------------------------------------------------------------------------------------

3. සුභාරංචි කරනයේ ඵල මොනවාද ?

-----------------------------------------------------------------------------------------------

4. ක්‍රිස්තුස් වහන්සේට සමාන ගුනාංග නැමැති ඵල කුමක්ද ?

-----------------------------------------------------------------------------------------------

5. පලමු වන ලැයිස්තුවේ ඇති ශුද්ධාත්මයාණන්ගේ ඵල දෙස බලන්න. ඊට දෙවැනි ලැයිස්තුවේ දි ඇති නිර්වචනය බලන්න. හොදම නිර්වචනය විස්තර කර ඇති පදවල අංකය පළමු තිරුවේ හිස්තැනෙහි ලියන්න.

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
|---|---|
| _______පමණ දැන ක්‍රියා කිරිම | 1. ගැඹුරු සෙනෙහස, රැකවරණය |
| _______විශ්වාසවන්තකම | 2. ප්‍රියවිම, අගාවිම |
| _______කරුණාවන්තකම | 3. නිහඬ, නිශ්චල, එකමුතු |
| _______මෘදුකම | 4. ඉවසිම, දරාගැනිම |
| _______යහපත්කම | 5. මෘදු ස්භාවය, දැඩි නොවු |
| _______ප්‍රිතිය | 6. ධර්මිෂ්ඨ ක්‍රියා |
| _______දිගු කාලින දුක් විදිම | 7. දෙවියන්වහන්සේ කෙරෙහි දැඩි විශ්වාසය |
| _______සමාදානය | 8. පාලනයකල ශක්තිය |
| _______ප්‍රේමය | 9. ස්වයං පාලනය |

6. සභාවේ නායකයින්ට තිබිය යුතු නිශ්චිත සුදුසුකම් හඳුන්වා දෙන ප්‍රධාන බයිබල් පද 2 ක් ලියන්න

-----------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

7. සෑම නායකයෙකුගේම අපේක්ෂා කරන මූලික සුදුසුකම් 4 මොනවාද ?

-----------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

( මෙම සංග්‍රහයෙහි අවසාන පරිච්ඡේදයේ පරීක්ෂණ වලට පිලිතුරු දැක්වේ. )

## වැඩිදුර අධ්‍යනය සඳහා

1. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයෙහි සියලු ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵළ සාක්ෂාත් විය. පහත උදාහරණ අධ්‍යනය කරන්න.

   **පිටත දැකිය හැකි ඵල :**

   | | |
   |---|---|
   | - සුභාරංචිය ප්‍රකාශ කිරිම | යොහාන් 10 : 16, මාර්ක් 1 : 38 |

   **අභ්‍යන්තරයේ දැකිය හැකි ඵල :**

   | | |
   |---|---|
   | - ප්‍රේමය | මාර්ක් 10 : 21, යොහාන් 11 : 5, 36 |
   | - ප්‍රිතිය | යොහාන් 5 : 11 |
   | - සමාදානය | යොහාන් 14 : 27 |
   | - දිගුකාලින දුක් ඉවසිම | 1 පේත්‍රුස් 3 : 15 |
   | - කරුණාවන්තකම | 2 කොරින්ති 10 : 1 |
   | - යහපත්කම | රෝම 11 : 22 |
   | - විශ්වාසවන්තකම | මතෙව් 17 : 14 - 21 |
   | - මෘදුකම | 2 කොරින්ති 10 : 1 |
   | - පමන දැන ක්‍රියා කිරිම | ලුක් 4 : 1 - 13 |

2. මේ පාඩමෙහි එන නායකයන් සතුවිය යුතු නිශ්චිත සහ සාමාන්‍ය සුදුසුකම් නැවත අධ්‍යනය කරන්න. ක්‍රිස්තුස් වහන්සේ තුල මෙම ගුනාංග පෙන්නුම් කෙරෙන බයිබලයේ සුභාරංචි පොත් වල යොමු කිරිම් වල උදාහරණ සොයා ගන්න.

3. මෙම පාඩමෙහි නායකයන්ට තිබිය යුතු ගුනාංග ලැයිස්තුව නැවත සමාලෝචනය කරන්න. ඔබගේ ජිවිතය ඇගයිමට ලක් කරන්න. ඔබ මේවා මනින්නේ කෙසේද ?

4. මතෙව් 21 : 18 - 20 හි ක්‍රිස්තුස්වහන්සේ අත්තික්කා ගහට ශාප කල ආකාරය අනුව උන්වහන්සේ අත්තික්කා ගහට ශාප කලේ එහි ඵල නොමැති වු නිසා වු කේන්තියෙන් නොවේ. උන්වහන්සේ වැදගත් සත්‍යයක් ඉන් පෙන්නුම් කලේය. අත්තිකා ගහට හොද පෙනුමක් තිබුනේය. එහි කොළ පාට කොල පෙනෙන්නට තිබුනේ ඵල දැරිය යුතු සේ නමුත් එහි ඵල නොතිබු බැවිනි.

   ආත්මිකත්වය බාහිර පෙනුමෙන් පමනක් තිබිම ප්‍රමාණවත් නොවේ. සමහර නායකයින් පිටතින් සියල්ල පාලනය කල බවක් පෙන්නුම් කලත් ඔවුන්ගේ ඇතුලාන්තය තුල ක්‍රිස්තුස්වහන්සේට සමාන විම සතුවත් ආත්මික ඵලය දක්නට නොලැබේ. මේය ක්‍රිස්තුස්වහන්සේ ජිවත් වු කාලයේ සිටි පරිසිවරු නමැති ආගමික කණ්ඩායම තුල පැවති තත්වයයි. යේසුස් වහන්සේ ඔවුන්ට ප්‍රකාශ කලේ

   **ලියන්නෙනි, පරිසිවරුනි, වංචාකාරවු නුඹලාට දුක්වේ. මක්නිසාද නුඹලා සුලු කල සොහොන් ගෙවලට සමානය. ඒවා පිටින් ලස්සනව පෙනුන නමුත් ඇතුලේ මිනි ඇට වලින්ද සියලු අපවිත්‍රකමින්ද පිරි තිබේ. (මතෙව් 23:27)**

   නායකයින් තුල මෙන්ම ඇදහිලිවතුන් තුලද දෙවියන්වහන්සේ අපේක්ෂා කරන්නේ පෙනුමට ඵල දරන්නාවු සොබාවය නොව ඇත්තවශයෙන්ම ඵල දරන්නාවු තත්වයයි.

5. අනාගත ඉශ්‍රායෙල් නායකයා වෙත මෝසෙස් විසින් පනවනු ලැබූ සුදුසුකම් 5 ගැන අවධානය යොමු කරනන්න. ( ගණන් කථාව 27:17 ) ඔහු :

   1. ඔවුනට පෙරටුව යා යුතුය : මගපෙන්වන්නා
   2. ඔවුන් වෙනුවෙන් ඉදිරියෙන් යන්නා : මනුෂ්‍යයන් වෙනුවෙන් මැදහත්කාරකම් දරන්නා
   3. ඔවුන් පිටතට රැගෙන යන්නා : සටනේදි නායකත්වය දැරිය හැකි වන්නා
   4. ඔවුන් ඇතුලත රැගෙන එන්නා : ඔවුන් දේශයට රැගෙන එන්නා
   5. නිසි නායකත්වය දෙන්නා : එම නිසා සභාවේ දෙවියන්වහන්සේගේ සෙනග එඬේරෙකු නොමැති බැටළුවන් මෙන් නොවනු ඇත.

6. ලෝකයේ නායකයින් සහ ආත්මික නායකයින් අතර පරස්පරතාවයක් මින් පෙන්නුම් කෙරේ.

| **ලෝකයේ නායකයා** | **ආත්මික නායකයා** |
|---|---|
| තමා කෙරෙහි ඇති විශ්වාසය | දෙවියන්වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය |
| මනුෂ්‍යයින්ව හඳුනයි | දෙවියන්වහන්සේව හඳුනයි |
| ඔහුගේම තිරණ ගනි | දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයයි බොහෝ |
| අපේක්ෂා සහිතව ජිවත්විම | නිහතමානි |
| ඔහුගේම ක්‍රම අනුගමනය කරයි | දෙවියන්වහන්සේගේ ක්‍රම අනුගමනය කරයි. |
| අන් අය කීකරුවිම භුක්ති විදි | දෙවියන්වහන්සේට කීකරුවේ |
| පුද්ගලික අගාවිම් මත ධෛර්‍යමත්වේ. | ප්‍රේමය කරනකොටගෙන පෙලඹේ |
| නිදහස | දෙවියන්වහන්සේ මත යැපේ |

7. හොද නායකයෙකු සහ නපුරු නායකයෙකු අතර ඇති පරස්පරතා. හිතෝපදේශ 28

**හොද නායකයා**

– ඔහු ස්තිරය ( පලායන්නේ නැත, නිර්භිතය ) : පදය 1 ජ් 2
– ගැටුම් වලදි නිවැරදි දේ සමග හිටගනි. : පදය 4
– නිතිය රකි. : පදය 4, 9
– දැනුම සහ එළිදරව් කිරීම් උදෙසා දෙවියන්වහන්සේ සෙවිමෙන් සියල්ල තේරුම් ගනි. : පදය 5, 11
– මා පිය ගරුත්වය රකි. : පදය 7
– අවංකය : පදය 6, 8
– යාච්ඤාවේ මනුෂ්‍යයෙකි : පදය 9
– සෞභාගයයමත්ය ( සෑම යහපත් දෙයින් ) : පදය 10, 20, 25
– තේරුම් ගන්නාවූ මිනිසෙකි ( තේරුම් ගැනිමට සොයයි. ) : පදය 11
– ප්‍රිතිය ගෙනෙන්නෙකි : පදය 12
– තම පව් පාපොච්චාරණය කරන්නෙකි. : පදය 13
– දෙවිය්නවහන්සේට භය ඇත්තෙකි. : පදය 14
– ගිජු නොවූ : 16
– බොහෝ කල් පාලනය කරයි : පදය 16
– සමාදානය ඇත්තෙකි : පදය 17

- කෙලින් ඇවිදි ( කෙලෙන් පුද්ගලයෙකි ) : පදය 18
- උත්සහවන්තයෙකි : පදය 19
- විශ්වාසවන්තය : පදය 20
- මනුෂ්‍යයින්ගේ තරාතිරම නොබලයි : පදය 21
- හික්මවීමට සහ තරවටුවට හිය නොවේ : පදය 23
- තම පවුලට මුලිකත්වය දේ : පදය 24
- ඔහු ගැනට වඩා දෙවියන්වහන්සේ ගැන නිහතමානිව විශ්වාස කරයි
- දෙවියන්වහන්සේගේ මගපෙන්වීම විශ්වාසකරයි : පදය 26
- තමා වටා සිටින්නන් කෙරේ අනුකම්පාව සහ සැලකිල්ල දක්වයි : පදය 27
- ධර්මිෂ්ඨයින්ට වැඩෙන්නට උපකාරි වේ : පදය 28

**දුෂ්ඨ නායකයා**

- අනවශ්‍ය ලෙස බියවී පලා යයි
- අස්ථිරය : පදය 1 ජ් 2
- දුප්පතාට පීඩා කරයි : පදය 3
- අහංකාරය, මනුෂ්‍යයින්ගේ ප්‍රශංසාව බලාපොරොත්තු වේ. අධර්මිෂ්ඨයින් අතර ප්‍රසිද්ධය : පදය 4
- ගැඹුරක් නැත. (වැස්සට සේදි යන්නා සේය)
- අනුගාමීත්වය අඩුය.
- නීතිය කඩකරයි : පදය 4
- තේරුම් ගැනිම මදය
- වංක මාර්ග ඇත : පදය 6, 18
- නාස්ති කාරයින්ගේ මිත්‍රයෙකි (නීතිගරුක නොවු මිනිසෙකි) : පදය 7
- තම දෙමාපියන් ලැජ්ජාවට පත්කරයි.
- අධර්මිෂ්ඨකම වපුරයි : පදය 8, 20, 22
- යාච්ඤා නොකරයි : පදය 9
- ධර්මිෂ්ඨයාව නපුරු මාර්ග වල ගෙනයයි : පදය 10
- තමා ප්‍රඥාවන්තයෙකි සිතයි : පදය 11
- ඔහුගේ බලයට පත්වීම බිය ගෙනදෙයි : පදය 12, 28
- පාපය සගවයි : පදය 13
- දැඩි සිත් ඇත්තෙකි : පදය 14
- ගොරවන සිංහයෙකු හෝ කෝප වු වලසෙකු ලෙස පැලනය කරයි : පදය 15
- හිංසාකාරිය : පදය 15, 17
- නුවණ නැති අයෙකි : පදය 16
- ගිජු : පදය 16
- වැටීම උරුම වු ( පරාජය උරුම වු ) : පදය 10, 18
- දුෂ්ඨකමට පත් වු : පදය 14
- නිශ්පලදේ අන්ව යන්නාවු ( අලස උසස් මනුෂ්‍යයින්ගේ බලපෑමට යටත් වු ) : පදය 19
- අල්ලස් ගන්නාවු, මනුෂ්‍යයන් භේද කරන්නාවු : පදය 21
- වරද කාරයෙක් වු : පදය 20
- ආත්මික හිගකමෙන් ජිවත්වන්නාවු : පදය 22
- ඉච්චා බස් කියන්නාවු ( ගුණ දොස් විචාරීමේදි ආදරණිය නොවු : පදය 23
- තම පවුලට ප්‍රමුඛ ස්ථානය නොදෙන්නාවු : පදය 27

- ආඩම්බර වූ : පදය 25
- තමාට මගපෙන්වා ගැනීමට තමාගේම හැකියාවන්මත විශ්වාස කරන්නාවූ : පදය 26
- ගොඩනගනවා වෙනුවට විනාශ කරන්නාවූ : පදය 24
- ඔහු අවට සිටින්නවුන් ගැන නොසලකා හරින්නාවූ : පදය 27

**මෙම පරස්පරයන්ගේ සංක්ෂිප්තය** සඳහා 28 වන පදය බලන්න.

## පස්වන පරිච්ඡේදය

### දාසයෙකුමෙන් නායකත්වය දිම

**ඉලක්කයන් :**

මෙම පඩම අවසානයේ ඔබට :

- ප්‍රධාන පද මතකයෙන් ලිවිමට
- කිතුණුවන්ට පමණක් ආවේනික වු එක් නායකත්ව ගුනාංගයක් හදුනා ගැනිම
- දාසයෙකු මෙන් නායකත්වය දිමේ ප්‍රතිඵලය බලයෙන් යුක්ත වන්නේ කෙසේද කියා විස්තර කිරිම
- ලෝක නායකයන් සහ කිතුණු නායකයන් අතර ඇති පරස්පරවිරෝධිතාවයන් 4 ක් ලැයිස්තුගත කිරිම
- අප සේවය කල යුත්තේ කා හටදැයි හදුනා ගැනිම
- දාසයෙකු මෙන් නායකයෙක් වන්නේ කෙසේදැයි විස්තර කිරිම

**ප්‍රධාන බයිබල් පදය :**

**ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුල තිබුණු සිතම නුඹලා තුලත් තිබේවා.**

**උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරන සේක.**

**දෙවියන්වහන්සේම සමානව සිටිම තමන් විසින් අල්ලාගෙනම සිටිය යුතු වු වස්තුවක් යැයි නොසිතා එය ඉවත්කර දාසයෙකුගේ ස්වරූපය ගෙන මනුෂ්‍යයින්ගේ සමානත්වයට පැමිණිසේක. (පිලිප්පි 2 : 5 - 7)**

### හැදින්විම

ලෝකයේ නායකත්වය නිතර මනිනු ලබන්නේ බලය, මුදල්, අධ්‍යපනය සහ හැකියාවන් මතය. ලෝකයේ විවිධ නායකත්ව ස්වරූපයන් තිබේ. “ ස්වරූපය ” යන්නෙන් අප අදහස් කරන්නේ පුද්ගලයෙකු නායකත්වය දෙ ආකාරයයි. උදාහරනයක් ලෙස මිනිසුන් පාලනය කරන ජනාධිපතිවරයෙක් සිටිති. මනුෂයයා ජන්දයෙන් පාලනය වන ප්‍රජාතන්ත්‍රවාදි නායකයන්ද ඇත.

ක්‍රිස්තුස්වහන්සේ ලෝකයට ආ කල දාසයෙකු විමෙන් උන්වහන්සේ ලෝකයේ සංකල්පය අනුව සාර්ථක නායකත්වය යන්න ආපස්සට වෙනස් කල සේක. මෙම පරිච්ඡේදය සලකා බලන්නේ නව ගිවිසුමේ දාසයෙකු ලෙස නායකත්වය දිමේ මුල ධර්ම ගැනය.

### පරස්පර විරෝධ උදාහරණ

යේසුස් වහන්සේ ලෝකයේ නායකත්වය, ආත්මික නායකත්වයසමග පරස්පර විරෝධ බව පෙන්වු සේක. උන්වහන්සේ පැවසුවේ :

**අන්‍ය ජාතීන් අතරේ ආණ්ඩුරයෝයැයි සලකනු ලබන්නන් ඔවුන් කෙරෙහි අධිපතිකම් කරන බවත්, ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරෙහි බලය පවත්වන බවත් නුඹලා දන්නහුය.**

**නුමුත් නුඹලා අතරේ එසේ නොවේය. නුඹලා අතරේ උතුම් වෙන්ට කැමති කවරෙක් නමුත් නුඹලාගේ සේවකයා වන්නේය.**

**නුඹලා අතරේ ප්‍රධානියා වෙන්ට කැමති කවරෙකු නමුත් සියල්ලන්ගේ දාසයා වන්නේය. (මාර්ක් 10 : 42 - 44)**

දාසයෙකු ලෙස නායකත්ව දිම ලෝකයේ නායකත්වයෙන් කිතුණු නායකත්වය වෙන්කර දක්වනු ලැබේ. එය කිතුණුවෙක්ටම ආවේනික එක්තරා නායකත්ව ස්වරූපයකි.

## අති උතුම් උදාහරණය

ස්වාමි වු ක්‍රිස්තුස් වහන්සේ දාසයෙකු ලෙස නායකත්වය දිමට වු උතුම්ම උදාහරණයකි. දාසයා යනු නිහතමානිව කැපවීමෙන් සහ ප්‍රේමයෙන් අන් අයට සේවය කරන පුද්ගලයෙකි. උන්වහන්සේගේ දාභාවය පිළිබඳ ඉගැන්වීම මෙන්ම ආදර්ශයක්ද වුවේය. යේසුස්වහන්සේ ලෝකයේ පැවති බලය පිලිබඳව අදහස් ප්‍රතික්ෂේප කල අතරම අලුත් දෙයක් එයට යෝජනා කල සේක. “ දාසයා ” යනු නායකයා යන්නට අමුතු වචනයකි. නමුත් යේසුස් වහන්සේ තමන් වහන්සේම සේවයට පැමිණීමෙන් එය පැහැදිලි කල සේක.

**නුමුත් ඔබ වනාහි නුඹලා මධ්‍යයෙන් උපස්ථාන කරන්නකු මෙන් වෙමි. (ලුක් 22 : 26)**

මාර්ක් පෙන්වා දුන්නේ යේසුස් වහන්සේ සේවය ලබන්නට නොව සේවය කරන්නට පැමිණි බවයි.

**මක්නිසාද සැබවින් මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්නට නොව සේවය කරන්නට ද බොහෝ දෙනෙකු උදෙසා මිදිමේ මිලයක් කොට තම ජිවිතය දෙන්නට ආයේයැයි කී සේක. (මාර්ක් 10 : 45)**

පාවුල් තුමා පැවසුවේ :

**එය ඉවත් කර දාසයෙකුගේ ස්වරූපය ගෙන මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණි සේක. (පිලිප්පි 2:7)**

## ක්‍රමය අනුගමනය කිරීම

මුල් කාලින සභා නායකයෝ යේසුස් වහන්සේ විසින් නිර්මාණය කල ක්‍රමය අනුගමනය කලහ. ඔවුන් ඔවුන්ට කියා ගත්තේ දාසයන් කියාය.

- **පාවුල්, ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයෙක් වු (රෝම 1 : 1)**
- **යාකොබ්, ක්‍රිස්තුස්වහන්සේගේ සහ දෙවියන්වහන්සේගේ සේවකයෙක් වු (යාකෝබ් 1 : 1)**
- **පේත්‍රුස්, ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයෙක් වු (2 පේත්‍රුස් 1 : 1)**
- **යුද්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයා ( යුද් 1 : 1 )**

- ඔබගේ වචනය නිර්භිතකමින් කථාකරන්ටත් ඔබගේ ශුද්ධ සේවකයාවූ යේසුස් වහන්සේගේ නාමය කරනකොටගෙන හාස්කම්ද පුදුමද කරන්ටත් ඔබගේ දාසයන්ට වරදුන මැනවැයි කීවෝය. (ක්‍රියා 4:30)

මෙම ක්‍රමය අපද අනුගමනය කළ යුතු වෙමු. අප විසින් නායකත්වය දිමට යටත්වන්නවුන්ගේ සේවකයන් විය යුතු වෙමු.

### දාසයාගේ බලය

මා විසින් නායකත්වය දෙනු ලබන සෙනගගේ දාසයා වන්නේ නම්, මා නායකයෙකු වන්නේ කෙසේදැයි ඔබ විසින් ඇසිය හැකිය. සෑම අවධාරනයක්ම සේවය කිරීම යන්න කෙරෙහි යොමු වන්නේ ඇයි ? සේවකයෙකු වීම (දාස භාවය) කී බලය ඇත යන්න ඊට පිළිතුර වේ. දාසයෙකු ලෙස නායකත්වය දිම යන්නෙහි දූර්වල නායකයෙකු යන්න අදහස නොවේ. ඉන් නායකත්වය ශක්තිමත්, ආරවුලට කැමති ආත්මික සතුරන්ට එරෙහිව ශක්තිමත් නොවි සිටිය යුතුය යන්න අදහස් නොවේ.

දාස භාවය බලය යනුවෙන් හදුන්වන්නේ එය මනුෂ්‍යයෙකු දෙවියන්වහන්සේ විසින් භාවිතා කල හැකි ආකාරයට එම පුද්ගලයා නිහතමාණි කිරීමයි. මෙය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයෙන් පෙන්නුම් කෙරිනි. ඔබගේ බයිබලයේ පිලිප්පි 2 : 5 - 11 දක්වා කියවන්න. ඔබ මෙම ජේදය මෙම පාඩමෙන් පසුව අධ්‍යනය කරනු ඇත. මෙම පද දාසයෙකු වශයෙන් තමන් වහන්සේ යටහත්වීම සහ කුරුසිය මත මරණය විදිම තුලින් විස්තර වේ. (පද 5 - 8) යේසුස් වහන්සේ මහත් වු බලයකින් යුක්තව ඔසවනු ලැබු සේක. නායකයෙකුවිමට සොයන්නෙකුට පොළව මත තිබිය හැකි අන්තිම ස්ථානය කුරුසිය විය හැකිය. නමුත් එය “ ගැලවීමේ මාර්ගයට දෙවියන්වහන්සේගේ බලය ” වේ. (1 කොරින්ති 1 : 18) දේව රාජ්‍යයෙහි බොහෝ දෙවල්හි පිලිවෙල ආපස්සට ගනු ලැබ ඇත. අප ශක්තිමත් වන්නේ අපගේ දූර්වලකමේදිය. අපට ලැබෙනුයේ අප විසින් දෙනු ලබන විටය. අප ජිවත් වන්නේ මියයැදිමේදිය. නායකයෙකු වශයෙන් ඔබ බලවත් වනුයේ සේවය කිරීම තුලිනි.

### පරස්පරතා හතර

මතෙව් 20 : 25 - 28 සහ මාර්ක් 10 : 42-44 දක්වා කියවන්න. මෙම පරිච්ජේදය ලෝකයේ නායකයින්ගේ සහ කිතුණු නායකයින් අතර තිබෙන පරස්පර විරෝධි චරිත ගුනාංග 4 ක් පෙන්නුම් කරයි.

1. ලෝකයේ නායකයින්ට තම අනුගාමිකයන් කෙරෙහි ආධිපත්‍යයක් නැත. “ආධිපත්‍ය” යන්නෙන් අදහස් වන්නේ “බලහත්කාරි පාලන බලයක්” යන්නයි. දාසයන් වන නායකයින් තම අනුගාමිකයන්ට බලහත්කාරය හෝ පාලන බලයක් නොපායි.

2. ලෝකයේ නායකයින් තම අනුගාමිකයන් කෙරෙහි අධිකාරි බලය පතුරුවයි. මේ අර්ථයෙන් අධිකාරි බලය යන්න අර්ථ දක්වන විට ශ්‍රේෂ්ඨත්වය යන්න ඉන් අදහස් වේ. ලෝකයේ නායකයින් තම අනුගාමිකයන්ට වඩා තමන් ශ්‍රේෂ්ඨයැයි අදහස් කරයි. කිතුණු නායකයින් කැදවා ඇත්තේ ශ්‍රේෂ්ඨත්වයට නොව සේවය කිරීමටය.

3. පෘතක්ජන නායකයින් තම අනුගාමිකයන්ගේ ප්‍රධානියෝ වෙති. මේ අර්ථයෙහි “ප්‍රධානියා” යන වචනයේ තේරුම පළමු තැන ලැබීම යන්නයි. දේව රාජයෙහි පළමු වැන්නා (නායකයා) අන්තිමයා වේ.

4. පෘතක්ජන නායකයින් තමන් නායකත්වය දෙන්නවුන්ගේ ස්වාමිවරු වෙති. "ස්වාමිනි" යන්නෙහි තෙරුම "සේවය ලැබිය යුත්තා" යන්නය. නමුත් කිතුණු නායකයා තම අනුගාමිකයන්ට සේවය සපයයි.

**අප සේවය කල යුත්තේ කාටද?**

දාසයෙකු මෙන් වන නායකයින් ලෙස අප සේවය කරන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයටය. පාවුල් තුමා කොරින්ති වරුන්ට පැවසුවේ :

**මක්නිසාද අපි අප ගැනම නොව ක්‍රිස්තුස් යේසුස් වහන්සේ ස්වාමින් වහන්සේ කියාද**

**යේසුස් වහන්සේ නිසා අපි නුඹලාගේ දාසයන්ය කියාද ප්‍රකාශ කරමුව. (2 කොරින්ති 4 : 5)**

අපද නැතිවුනාවු මියදෙමින් සිටින මනුෂ්‍යයන්ට සේවය කරමු. ලුක් 10 : 25 - 37 දක්වා වු යහපත් සමාරියගේ උපමා කථාව කියවන්න. දාස භාවය ගනු ලබන්නේ බලය සහ තත්වය මතය. අප අන් අයට සේවය කරන විට ඇත්තවශයෙන්ම අපි දෙවියන්වහන්සේට සේවය කරමු.

**එවිට රජ්ජුරුවෝ උත්තර දෙමින් සැබැවක් නුඹලාට කියමි. මාගේ සහෝදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකුට නමුත් නුඹලා ඒක කලහුද ඒක කලේ මටයැයි කියන සේක. (මතෙව් 25 : 40)**

මතෙව් 25 : 14 - 30 හි සඳහාන් සේවකයන් ගැන උපමා කථාව කියවන්න. අප දෙවියන්වහන්සේට සේවය කරන බැවින් අපි උන්වහන්සේට වගකිවයුතු වෙමු.

**සැබැවක් සැබැවක් නුඹලාට කියමි, දාසයෙක් තමාගේ ස්වාමියාට වඩා උතුම් නැත. පණිවිඩකාරයෙක්ට තමා යැවු තැනැත්තාට වඩා උතුම් නැත. (යොහාන් 13 : 16)**

**දාසයෙකු මෙන් වන නායකයෙක් වන්නේ කෙසේද?**

පිලිප්පි 2 : 5 - 8 දක්වා කියවන්න. මෙම පරිච්ජේදය ක්‍රිස්තුස්වහන්සේගේ උදාහරණ අනුව යමින් සේවකයකු මෙන් වන නායකයකු වන්නේ කෙසේදැයි පැහැදිලිකර දෙනු ඇත. සේවකයෙකු ලෙස නායකත්වය දැරීමේදි ඔබ විසින් කල යුතුම වන දේවල් මෙසේය.

**නිවැරදි ආකල්ප වර්ධනය කර ගැනිම**

දාසයෙකුමෙන් නායකත්වය දිමේදි එය ඔබේ ආකල්ප වලින් පටන් ගැනේ. යේසුස් වහන්සේ තුල තිබු ආකල්ප ඔබ තුල වර්ධනය කරගත යුතුය.

**ක්‍රිස්තුස්වහන්සේ තුල තිබු සිතම නුඹලා තුලත් තිබේවා.**

**උන්වහන්සේ දෙවියන් වහන්සේගේ රූපාකාරය දරන සේක. දෙවියන්වහන්සේට සමානව සිටිම තමන් විසින් අල්ලාගෙනම සිටිය යුතු වස්තුවක් යැයි නොසිතා එය ඉවත්කර දාසයෙකුගේ ස්වරූපය ගෙන මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණි සේක. (පිලිප්පි 2 : 5 - 7)**

දෙවියන්වහන්සේ භාවිතා කරන්නේ හදවතේ ඉරියව් නිවැරදි මනුෂ්‍යයින්ය. දාවිත් රජකමට ආලේප කලේ දෙවියන්වහන්සේ ඔහුගේ හදවත දෙස බැලූ බැවිනි. (1 සාමුවෙල් 16 : 7) අභිප්‍රායක් තීරණය කරන්නේ හදවතෙහිය. අපගේ ස්වාභාවික අභිප්‍රායන් ආත්මාර්ථකාමීය. දාසයෙකු වැනි වූ නායකයෙකු වීමට නම් ඔබගේ ආකල්ප සහ අභිප්‍රායන් වෙනස්විය යුතුය.

**තමාව යටත්කර ගැනීම**

**එය ඉවත්කර දාසයෙකුගේ ස්වරූපය ගෙන... (පිලිප්පි 2 : 7)**

ඔබගේ අශාවන්, සැලසුම්, තත්වය හෝ ප්‍රසිද්ධිය ගැන නොසිතන්න. මේ දේවල් දෙවියන්වහන්සේට භාරකොට ඔබගේ ජීවිතය යටත්කර ගන්න.

ඔබගේ ජීවිතය යටත් කිරීම ඔබ කරන යම් දෙයක් නොව දෙවියන්වහන්සේ කරන්නාවූ දෙයකි.

**මනුෂ්‍යයින් හඳුනා ගැනීම :**

යේසුස්වහන්සේට සේවකයෙකු මෙන් වීමට පුලුවන් වුයේ උන්වහන්සේ මනුෂ්‍යයන්ව හඳුනා ගත් බැවිනි. උන්වහන්සේ මනුෂ්‍යයින්ව හඳුනාගෙන ඔවුන්ගේ වුවමනාවන්ද ඉටුකර දුන්සේක.

**දාසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයින්ගේ සමානත්වයට පැමිණි සේක. (පිලිප්පි 2 : 7 - 8)**

උන්වහන්සේ මනුෂ්‍යයෙකු මෙන් පරීක්ෂාවට පත් වූ සේක. මනුෂ්‍යයෙකු මෙන් දුක් විඳි සේක. උන්වහන්සේගේ ශරීරය මරනය මනුෂ්‍යයෙකුගේ මෙන් අවශ්‍යතායන්ට සහ දුර්වලකම් වලට පත් වූ සේක. ඔබ නායකත්වය දෙන්නවුන්ට සේවය කිරීමට ඔබට අවශ්‍යය නම් ඔබ ඔවුන්ගේ දුර්වලතා දුක් විඳීම් සහ අවශ්‍යතා තේරුම්ගත යුතුය.

**කීකරුවීම :**

සේවය කිරීම පිණිස යේසුස් වහන්සේ කීකරු වූ සේක :

**උන්වහන්සේ කීකරු වූ සේක. (පිලිප්පි 2 : 8)**

නායකයෙකු ලෙස අධිකාරිත්වය ඇති සෑම කෙනෙකුම නායකයකුගේ අධිකාරිත්වය යටතේ සිටිනු ලැබේ. කිතුණු නායකයෙකු වශයෙන් ඔබ දෙවියන් වහන්සේගේ අධිකාරිත්වයට යටත්ය. ඔබ යම් ආයතනයක හෝ සභාවක නායකත්වයටද යටත් විය හැකිය. නායකයෙකු ලෙස නිසිලෙස සේවය කිරීමට නම් ඔබ ඔබගේම නායකයන්ට කීකරු විය යුතුය.

**තම කමට හා පාපයට මැරිය යුතුය :**

මැරෙණ මොහොත දක්වාම යේසුස් වහන්සේ කීකරුවිය.

**මරණය එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූ සේක. (පිලිප්පි 2 : 8)**

පාවුල් තුමා සදහාන් කලේ “ දිනපතා මා මිය යමි ” යනුවෙනි. 1 කොරින්ති 15 : 31 එතුමා සඳහන් කල මියයාම නම් නිරන්තරයෙන් පාපයට සහ තම කමට මිය යාමයි. සේවය කිරීමෙන් නායකත්වය දෙන්නවුන්ගෙන් අපේක්ෂා කෙරෙනුයේ මෙවැන්නකි. ඔබ පාපය සහ තමකම කුරුසියේ ඇණ ගැසිය යුතුය. කුරුසිය වේදනාකාරීත්වය අත්දැකිමකි. නමුත් ක්‍රිස්තුස්වහන්සේ මෙන්ම දුක්විඳිම තුලින් දාසයෙකු ලෙස නායකත්වය දිමේ මූලධර්ම ඔබ ඉගෙන ගනු ඇත.

**ප්‍රේමයෙන් සේවය කිරීම :**

ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේ තුල පැවති උතුම් ප්‍රේමය නිසා සේවකයකු ලෙස මනුෂ්‍යයන් හඳුනාගෙන මරණය දක්වාම කීකරු වු සේක.

> **ප්‍රේමය මේයයි, එනම් අප දෙවියන්වහන්සේට ප්‍රේම කලා නොව, උන්වහන්සේ අපට ප්‍රේමකොට අපේ පව් උදෙසා ශාන්තිකර පූජාව වන පිණිස තමන්ගේ පුත්‍රයා එවූ බවය.**
>
> **ප්‍රේමවන්තයෙනි දෙවියන්වහන්සේ අපට මෙසේ ප්‍රේමකල සේක් නම්, අප විසිනුත් එකිනෙකාට ප්‍රේමකල යුතු බවය. (1 යොහාන් 4 : 10 - 11)**

ප්‍රේමය දාසයෙකු ලෙස නායකත්වය දිමට මධ්‍යගතව පවති. පෙර්මය හදවතේ හැගිමකත් ලෙස හටගන්නා නමුදු, එය ප්‍රායෝගිකව දැකිය හැකිව තිබේ. ඔබ යම් අයෙකුට ඇත්තෙන්ම ආදරය කරන්නේ නම්, ඔවුනට සේවය කිරීමට කැමතිවනු ඇත.

දාසයෙක් වන නායකයා ඔහු සේවය කරන්නාවු අය ගොඩනගයි. ඔහු මනුෂ්‍යයන් ප්‍රයෝජනයට නොගන්නා නමුදු, ඔවුන් සමග සහ ඔවුන් තුලින් ඔවුන්ගේ ආත්මික වර්ධනය ඇතිකරන්නාවු ආකාරයට වැඩ කරයි. ඔහු ගන්නවා වෙනුවට දෙන්නෙකි. විනාශ කිරීම ඉක්මන් සහ පහසු වන නමුත් ගොඩනැගිම වඩා අපහසුය. ඊට කාලයද ගතවේ.

1 කොරින්ති 13 එහි සෑම තැනකම “ප්‍රේමය” යනුවෙන් සඳහන් කරයි. එය දාසයෙකු මෙන් වන නායකයා යන වචනයට ආදේශ්‍යකි. (උදාහරණ : සේවකයකු මෙන් වන නායකයා දිගු කාලිනව දුක් විදි.) මෙය ඔබට සේවක නායකයකු තුල තිබිය යුතු ප්‍රේමය යන්න උකහා ගැනිමට උපකාරි වනු අත.

**දෙවියන්වහන්සේට බලය පාන්නා වන්නට ඉඩහරින්න.**

යේසුස් වහන්සේ දාසයෙකු ලෙස මෙලොවට වැඩිය කළ උන්වහන්සේ “ තමා කෙරේ බලය පෑමට ඇති අයිතිය ” අත්හල සේක. උන්වහන්සේ ප්‍රකාශ කලේ “ මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා” කියාය. ඔබ දාසයෙකු විමට තිරණය කරන කල බලය පෑමට ඇති අයිතිය අත්හැරගන්නවා ඇත. ඔබ තවදුරටත් ඔබගේ රාජධානිය ගොඩනගන්නේ නැත. ඔබ දෙවියන්වහන්සේගේ රාජධානිය ගොඩනගනවා ඇත. තවදුරටත් ඔබ ඔබගේ අදහස් හෝ විශ්වාසයන් බෙදා නොහරිනු ඇත. ඔබ ඔබගේ ස්වාමියාගේ පණිවුඩය සම්ප්‍රේෂණය කරනු ඇත. තවදුරටත් ඔබගේ කැමැත්ත නොව දෙවියන්වහන්සේගේ කැමැත්ත කරනු ඇත. යේසුස් වහන්සේ සිය කැමැත්තෙන්ම සේවය කිරීම තෝරාගත් සේක. දැන් ඔබගේ වාරයයි. ඔබ සේවය කිරීම තෝරාගන්නේද ? ඔබ සේවය කිරීමට කැමතිවන්නාවු තත්වයට සුදුසුකම් ඇත්තේ ඔබට පමණයි.

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන පද මතකයෙන් ලියන්න

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

2. කිතුණුවන්ට ආවේනික වු නායකත්ව ක්‍රමවේදය කුමක්ද ?

-----------------------------------------------------------------------------------------------

3. දාසයෙකු මෙන් නායකත්වය දිමේ උතුම්ම උදාහරණය කවුද ?

-----------------------------------------------------------------------------------------------

4. දාසයෙකු ලෙස නායකත්වය දිමේදි බලයෙන් යුතුව ප්‍රටිපල ලැබෙන අයුරු විස්තර කරන්න.

-----------------------------------------------------------------------------------------------

5. ලෝකයේ නායකයකු හා කිතුණු නායකයකු අතර, ඇති පරස්පර විරෝධිතා 4ක් ලැයිස්තු ගත කරන්න.

---------------------------------- ----------------------------------

---------------------------------- ----------------------------------

6. නායකයන් වශයෙන් අප සේවය කළයුත්තේ කාටද ?

-----------------------------------------------------------------------------------------------

7. පිලිප්පි 2 : 5 - 8 දක්වා භාවිතා කරමින් දාසයෙකු වැනි නායකයකු වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

**වැඩිදුර අධ්‍යනය සඳහා**

**මෙම පදය කියවන්න.**

**කුමක්හෙයින්ද ඒ කාරන වලින් ක්‍රිස්තුස් වහන්සේට සේවය කරන අය දෙවියන්වහන්සේට ප්‍රසන්න වූද මනුෂ්‍යයින් විසින් යහපතැයි ඒත්තු ගන්නාවූද කෙනෙක්ය. (රෝම 14 : 18)**

**මෙම පදය සාර්ථක නායකත්වයක ප්‍රතිපල පෙන්නුම් කරයි.**

1. ක්‍රිස්තුස් වහන්සේට සේවය කරන අය
2. දෙවියන්වහන්සේට ප්‍රසන්න
3. මනුෂ්‍යයින් විසින් යහපතැයි ඒත්තු ගන්නාවූද

දැන් රෝම 12 - 14 කියවා දෙවියන්වහන්සේට ප්‍රසන්න සහ මනුෂ්‍යයා විසින් යහපතැයි ඒත්තුගන්නාවූ ක්‍රිස්තුස්වහන්සේගේ දාසයෙකු වන පිණිස අවශ්‍ය කරන්නාවූ දේවල් ලැයිස්තුවක් ලියන්න. අනුගමනය කිරීමට උදාහරණයක් පහතින් දැක්වේ.

| **යොමු කිරීම්** | **මා විසින් කල යුත්තේ කුමක්ද ?** |
|---|---|
| රෝම 12 : 1 | මාගේ ශරීරය දෙවියන්වහන්සේට පිළිගතහැකි ජීවමාන ශුද්ධ වූ යාගයක් සේ ඔප්පු කිරීම |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |
| ------------------- | ------------------------------------------------------------------ |

## **සය වන පරිච්ජේදය**

### **එඬේරෙකු ලෙස නායකත්වය සැපයීම**

**අරමුණු :**

මෙම පරිච්ජේදය අවසානයේ ඔබට :

- ප්‍රධාන බයිබල් පදයන් මතකයෙන් ලිවීමට හැකිවනු ඇත.
- යහපත් එඬේරා හඳුනා ගැනීමට
- සැබෑ බැටළුකම හඳුනා ගැනීමට
- එඬේරෙකුගේ වගකීම් සමාලෝචනය කිරීම
- අයහපත් එඬේරෙකු පිළිබඳ අවවාදය සමාලෝචනය කිරීම
- නායකත්වයට එඬේරකමෙහි වන්නාවූ ස්වාභාවික ප්‍රතිපත්ති හඳුනා ගැනීම.

**ප්‍රධාන බයිබල් පදය :**

**නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලා ගනිමින් බලාත්කාරය නිසා නොව දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද, නුඹලාගේ භාරයට දෙන ලද්දවුන් කෙරෙහි අධිපතිකම් කරන්නාක් මෙන් නොව නුඹලාම රැළට ආදර්ශව සිටිමින්ද එය රැකබලා ගනිල්ලා. (1 පේත්‍රුස් 5:2-3)**

### **හැඳින්වීම**

නායකත්වයට ඇති අනිකුත් ස්වාභාවික සමාන්තර උදාහරණය වන්නේ “එඬේරා”ය. ස්භාවික ලෝකයේ එඬේරා යනු බැටළුවන්ට රැකවරණය සපයන්නෙකි. “රැළ” යනු කණ්ඩායමක් හෝ බැටළු රංචුවකි. ආත්මික ලෝකයේ මනුෂ්‍යයා යන්න බැටළුවන්ට සමාන කර ඇත. එක්කෝ අපි ආත්මික මාවතෙන් ඉවත ගිය බැටළුවෝය. (යොහාන් 53 : 6) දෙවියන්වහන්සේගේ දැක්මෙන් බලන “රැළ” හෝ පට්ටිය යනුයි.

ක්‍රිස්තුස් වහන්සේ තමා යහපත් බැටළු එඬේරා ලෙස හඳුන්වා ගනිමින් ඊට අදාල ගුනාංග විස්තරාත්මකව පැහැදිලි කලේය. මෙම උදාහරණ ආත්මික නායකත්වය පිළිබඳ විශිෂ්ඨතම උදාහරණයන්ගෙන් එකකි. (යොහාන් 10 බලන්න) ප්‍රභල නායකයකු වීමට නම් ඔබ යහපත් එඬේරා දැනගෙන සිටීම සහ උන්වහන්සේට පෞද්ගලිකව සම්බන්ධව සිටීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, එඬේරෙකු වශයෙන් නායකත්වය දෙන්නේ කෙසේද යන්න ද දැනගෙන සිටිය යුතුය.

පේදුරුතුමා අවධාරනය කලේ අප එඬේරුන් සේ නායකත්වය දිය යුතු බවයි.

> **නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලාගනිමින්, බලහත්කාරය නිසා නොව ..... ... (1 පේත්‍රුස් 5 : 2)**

### **එඬේරත්වයේ මූලධර්ම**

යේසුස් වහන්සේ තමන් “ යහපත් බැටළු එඬේරාණෝ ” ලෙස හඳුන්වාගත් බැවින් උන්වහන්සේගේ සේවයේ උදාහරණ එඬේරත්වයේ මූලධර්ම තේරුම් ගැනීමට වැදගත්වනු ඇත. ඔබගේ බයිබලයේ යොහාන් 10

පරිච්ජේදයට පෙරලන්න. එය එඬේරත්වයේ මූලික මූලධර්ම අධ්‍යනය කිරීමට මගපෙන්වීමක්සේ භාවිතා කරන්න.

**එක රැළියක්, එක එඬේරෙක්**

පළමු මූලධර්මය ලෙස තේරුම් ගත යුතුව ඇත්තේ එක රැළක් සහ එක එඬේරෙකු පමණක් ඇති බවයි. රැළ යනුවෙන් අදහස් කරන්නේ නැවත උත්පාදනය වුනු සියලු කිතුනුවන් සහිත සභාවයි. එඬේරා යනු යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. රැළට එකතු වීමට ඇත්තේ එක මාර්ගයකි. ඒ යේසුස් වහන්සේ තුලිනි.

> **දොරකඩනම් මමය. යමෙක් මා කරනකොටගෙන ඇතුල්වේද, ඔහු ආරක්ෂා කරනු ලැබ ඇතුලට සහ පිටපතට ගොස් ගොදුරු ලබන්නේය. (යොහාන් 10 : 9)**

> **එක රැළක් ද එක එඬේරෙක්ද වන්නාහ. (යොහාන් 10 : 16)**

ස්වාභාවික ලෝකයේ මනුෂ්‍යය එඬේරුන් රැළ බෙදයි. මක්නිසාද එවිට වඩා පහසු වන ප්‍රායෝගික ලෙස රැකබලා ගැනිමට හැකි බැවිනි. ඔවුනට බොහෝ අයට වගකීමට සහ රැකවරණය දිමට පමණක් හැකිය. මෙය ආත්මික නායකත්වය සම්බන්ධයෙන්ද සත්‍යයකි. නමුත් යථාර්ථවාදිව ගත්කළ ඇත්තේ එක රැළකි. එය සෑදි ඇත්තේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැමැති යහපත් එඬේරාට අයත් සැබෑ ඇදහිලිවතුන්ගෙන්ය. නායකයකු හෝ එඬෙරෙකු වශයෙන් ඇත්තවශයෙන්ම ඔබ එඬේරෙකුට යටත්ය. ඔබ රැළට සේවය කරන අතර යහපත් මගපෙන්වීමට යටත්ව එය කරයි.

නිකාය භේද, ආයතන, ප්‍රාදේශිය සභා එකමුතුවක් මනුෂ්‍යයා විසින් සාදා ඇති අතර, ඒවායේ පැවැත්ම ට අවසර ලැබෙන්නේ පුද්ගලික රැකවරණය හා ආයතනික වශයෙන් ප්‍රායෝගික අවශ්‍යතා සඳහා පමණයි. යාථාර්ථවාදිව බැලු විට ඇත්තේ එක රැළක් පමණයි.

නිරාකරණය මගින් යහපත් බැටළු එඬේරාට අයත් ඔබගේ රැළෙහි මිනිසුන් අන් රැළවලින් වෙන් කිරීමට උත්සහ නොගන්න. ඔබගේ රැළ ප්‍රාදේශිය එකමුතුවක් වශයෙන් හෝ නිකායික වශයෙන් ගොඩ නැගිමට සිත යොමු නොකරන්න. සිත යොමු කළ යුත්තේ යහපත් බැටළු එඬේරාගේ රැළ ගොඩනැගිම ගැනය. සමහර බැටළුවන් පිටතට යෑම වලකන නීති සහ රෙගුලාසි නොදමන්න. යේසුස් වහන්සේ ප්‍රකාශ කලේ " එන්නාවු කවරෙකු නමුත් " යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැමැති දොරටුව තුලින් පැමිණෙන බවය.

දෙවියන් වහන්සේගේ " රැළ " යන්නට ඇතුල්වීම සීමා වුවක් නොවේ. දොරටුව උන්වහන්සේගේ සියලුම බැටළුවන්ටය.

> **තවද මේ ගාලට අයිති නොවූ වෙනත් බැටළුවෝ මට ඇත්තාහ. ඔවුන් දමා විසින් ගෙනෙන්නට ඕනැය. වුහු මාගේ හඬ අසන්නෝය. එසේ එක රැළක් ද එඬේරෙක්ද වන්නාහ. (යොහාන් 10 : 16)**

**බැටළුවන් දෙන ලද්දේ දෙවියන්වහන්සේ විසිනි.**

මක්නිසාද ඇත්තේ එක රැළකි. සෑම බැටළුවෙකුම (අනුගාමිකයෙකුම) දෙනු ලැබුයේ දෙවියන්වහන්සේ විසිනි.

> **ඔවුන් මට දුන්නාවු මාගේ පියාණන්වහන්සේ සියල්ලටම වඩා උතුම්ය. පියාණන්වහන්සේගේ අතින් ඔවුන් උදුරගන්ට කාටවත් බැරිය. (යොහාන් 10 : 29)**

අනුගාමිකයන් සත්‍ය වශයෙන් දෙවියන්වහන්සේට අයත්ය. ඔබට ඔවුන්ගේ රැකවරණය භාරදී ඇති බව පමණකි.

**සමහර බැටළුවන් අනුගමනය නොකරනු ඇත.**

ඔබ විසින් දැනගත යුතු දුක්ඛිත කරුණක් වන්නේ සමහර කැඳවනු ලැබූ බැටළුවන් අනුගමනය කිරීම, එඬේරකු වශයෙන් ප්‍රතික්ෂේප කිරීමයි. යේසුස් වහන්සේ ප්‍රකාශකර සිටියේ

**නුඹලා මාගේ බැටළුවන් නොවන බැවින් විශ්වාසකරන්නේ නැත.** (යොහනේ 10 : 26)

කැඳවනු ලැබූ නමුත් අනුගමනය නොකරන්නවුන්ද සිටිය හැකිය. ඔවුන් රැළෙහි කොටසක් වීම ප්‍රතික්ෂේප කරනු ඇත. එය දුකට කරුණක් වුවද සත්‍යයකි. මෙයට ඔබව අධෛර්‍යයට පත් කිරීමට ඉඩ නොහරින්න. අනුගමනය කරන්නන්ට මගපෙන්වන්න.

**එඬේරා ඔහුගේ බැටළුවන් හඳුනයි.**

යේසුස් වහන්සේ මෙසේ කී සේක.

> **මම යහපත් බැටළු එඬේරාය. පියාණන් වහන්සේ මා හඳුනන්නාක් මෙන්ද මා පියාණන් වහන්සේ හඳුනන්නාක් මෙන්ද මම මාගේ බැටළුවන් හඳුනමි.** (යොහාන් 10 : 14)

ක්‍රිස්තුස් වහන්සේ මෙලොව සේවය කල සමයෙහි, එඬෙරුන් සහ බැටළුවන් අතර මහත් පුද්ගලික සම්බන්ධතාවයක් විය. එඬේරා බැටළුවන්ගේ උපතේදී පවා ලගින් සිටිමින් ජීවිත කාලය තුරාවටම මගපෙන්වමින් රැකවරණය සලසයි. ප්‍රභල නායකයෙකු වීමට නම් ඔබගේ භාරයට දෙන ලද මනුෂ්‍යයින් ඔබ දැන සිටිය යුතුය. ඔබ ඔවුන් සමග පුද්ගලික සම්බන්ධතාව වර්ධනය කරගත යුතුය. යේසුස් වහන්සේ පැවසුවේ යහපත් බැටළු එඬේරා " ඔහුගේ බැටළුවන්ව නම කියා කැඳවන බවය. " (යොහාන් 10 : 3)

**බැටළුවන් එඬේරාව හඳුනයි.**

එඬේරා බැටළුවන් හඳුනනවා පමණක් නොව බැටළුවෝද එඬේරා හඳුනති.

> **මාගේ බැටළුවෝ මාගේ හඬ අසති. මමද ඔවුන් හඳුනමි. ඔවුන් මා අනුගමනය කරන්නෝය.** (යොහාන් 10 : 27)

යේසුස් වහන්සේ පැවසුවේ බැටළුවෝ එඬේරාගේ හඬ හඳුනන බවයි. ඔවුන්ම ඇහුම්කන් දී අනුගමනය කරයි. මන්ද ඔවුන් ඔහු විශ්වාස කරයි.

නායකයෙකු වශයෙන් ඔබගේ අනුගාමිකයින් සමග ප්‍රේමයෙන් සහ විශ්වාසයේ සම්බන්ධතාවයක් ගොඩනගා ගත යුතුය. මෙය කිරීමට ඔබ ඔබගේ බැටළුවන්ගෙන් වෙන් නොවී ඔවුන් සමග ඔවුන්ගේ අවශ්‍යතාවයෙදී සිටිය යුතුය. ඔබ ඔබගේ ජීවිතය යහපැවැත්මෙන් ගතකල යුත්තේ ඔබගේ බැටළුවෙකුට ඔබ ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කරන අයුරින් ඔබව අනුගමනය කිරීමට ඔවුන්ට ඉඩහැරීමෙන්ය.

> **මා ක්‍රිස්තුස් වහන්සේව ආදර්ශයට ගන්නාක් මෙන් නුඹලා මා ආදර්ශයට ගන්න. (1 කොරින්ති 11:1)**

හුදෙක් ඔබ නායකයෙකු ලෙස පත්කල නිසාම මනුෂ්‍යයින් ඔබ අනුගමනය නොකරනු ඇත. ඔවුන්ට මගපෙන්වීමේදි ඔවුන්ගේ විශ්වාසය ඔබ දිනාගත යුතුය. ඔබ මෙය දිනාගන්නේ ඔවුනට ඔබව දැනගන්නට ඉඩ හැරීමෙනි.

**එඬේරා බැටළුවන් රැකබලා ගනී.**

යහපත් එඬේරුන් තම බැටළුවන් රැකබලාගනී. ඔබ බැටළුවන්ගේ ආත්ම රැකබලාගත යුතුය. ඔබ ඔවුන්ගේ ආත්ම දෙවියන් වහන්සේ හා සමග නිවැරදි සම්බන්ධතාවයක රදන්නේදැයි බලාගත යුතුය.

> **උන්වහන්සේ මාගේ ආත්මය ප්‍රාණවත් කරන සේක. (ගීතාවලිය 23 : 3)**

බැටළුවන් රැකබලා ගැනීම යන්නට ඔවුන්ගේ දුකේදි සහ අවශ්‍යතාවයේදි අස්වැසීම අදාල වේ. එඬේරාගේ සේවක මණ්ඩලය බැටළුවන් පසුපස යෑමට සහ ඔවුන් අල්ලා ගැනීම ලගට ඇදගැනීමට, සැනසීමට සහ පරික්ෂාවට ප්‍රයෝජනයට ගනී. (ගීතාවලිය 23 : 4)

රැකබලා ගැනීම යන්නට සිය අවශ්‍යතා සැපයිය හැකි යහපත් බැටළු එඬේරා වෙත මනුෂ්‍යයින්ට මගපෙන්වීම අදාලය.

> **ස්වාමින්වහන්සේ මාගේ එඬේරාය. මට හිගයක් නොවන්නේය. (ගීතාවලිය 23 : 1)**

ආත්මික එඬේරෙකු වශයෙන් දෙවියන්වහන්සේගේ රැකවරණය ගැන නම් කිරීමේදිද දාවිත් තුමා කීවේ :

> **උන්වහන්සේ නිල් ගොදුරු බිම්වල මා ලගින්නට සලස්වන සේක. නිශ්චල වු දිය අසලින් මා ගෙන යන සේක. (ගීතාවලිය 23 : 2)**

බැටළුවන් හොදින් රැකබලාගත් විට ඔවුන් තෘප්තියෙන් වැගිරෙනු ඇත. ස්භාවික ලෝකයේ මෙන්ම ආත්මික ලෝකයේද ඔවුන් වැතිරෙනුයේ

**ඔවුන් බියෙන් නිදහස් වු විටය** : මනුෂ්‍යයින්ට හෝ සතුරාට ඇති බිය බැටළුවන් විසුරුවා දමයි. ඔබ බැටළුවන්ට .. ..

> **මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයෙත්, ප්‍රේමයෙත්, හික්මවීමෙත් ආත්මයක්ය. (2 තිමෝති 1 : 7)**

**අන් බැටළුවන් සමග ගට්ටන වලින් නිදහස් වීම**

බැටළුවන් එකිනෙකා සමග දබර කරන්නේ නම්, ලගින්ට හෝ ආහාර ගැනීමට නොහැකිය. ඔවුන් ආත්මික ප්‍රජනනය කරන්නේද නැත. ස්භාවික ලෝකයේ බැටළුවන් එකිනෙකා දබර කරගන්නා විට බයිබලයේ කාලයේදි ඔවුන්ගේ හිස මත තෙල් වත්කරයි. මේ නිසා ඔවුන්ගේ හිස් ලිස්සා යන බැවින් හිස් ඔසවමින් දබර කර ගැනීමට නොහැකිය.

බැටළුවන්ට ඉගැන්විය යුත්තේ සතුරා සමග සටන් කිරීමට මිස එකිනෙකා සමග සටන් කිරීමට නොවේ. නායකයෙකු වශයෙන් ඔබ ඔබේ අනුගාමිකයන් සමග ප්‍රේමයේ සම්බන්ධතාවයක් ගොඩනගා ගත යුතුය. මේ

සදහා ඔබ ඔබගේ බැටළුවන් සමග ඔවුන්ට ලගාවිය හැකි අයුරින් සිටිය යුතුය. ඔවුන්ගේ හිස් වන ශුද්ධාත්මයාණන් වහන්සේ නැමැති තෙයිලය ආලේප කරන්න.

**වසංගත වලින් නිදහස්වීම :** ස්භාවික ලෝකයේ විවිධාකාර වසංගත හේතුවෙන් බැටළුවන්ගේ ලෝම ආසාධනයට ලක් වී රෝගාතුර වී අපහසුතාවයට පත්විය හැකිය. එක්තරා වර්ගයක මැස්සන් විශේෂයක් බැටළුවන්ට පහර දි ඔවුන්ගේ හිසේ බිත්තර දමයි. උන්ගේ පැටවුන් බැටළුවන්ගේ හිස තුලට කා වැදි අන්ධ භාවය සහ මරණය ලගාකර දේ.

දාවිත් ප්‍රකාශකර සිටියේ "මාගේ හිස තෙලින් ආලේප කල සේක. (ගිතාවලිය 23 : 5) ස්භාවික ලෝකයේ එඬේරුන් බැටළුවන් පිරිසිදු කිරිමට රෝග සහ ආසාධන වලදි තෙල් භාවිතා කරයි. ආත්මික ලෝකයේදි පාපයට වසංගත සමාන කල හැක. පාපය ආත්මික අන්ධ බාවය සහ මරණය ලගාකර දේ පාපය නැමති වසංගතයෙන් බැටළුවන් බෙරා ගැනිමට ශුද්ධාත්මයාණන් වහන්සේ නැමැති තෙලය ආලේප කල යුතුය.

**බඩගින්නෙන් සහ පිපාසයෙන් තොර විය යුතුය :** බැටළුවන් රැළෙහි රදවා ගැනිමට නම් ඔබ ඔවුන් ආත්මිකව පෝෂණය කල යුතුය. නායකයා බැටළුවන් නිල් තණ ගොඩුරු බිම්වල ලගින්ට සලස්වා දෙවියන්වහන්සේගේ වචනය නැමැති සත්‍යයයෙන් පෝෂණය කල යුතුය.

**නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලා ගනිමින් ... .. (1 පේත්‍රැස් 5 : 2)**

නිල් තණ ගොඩුරු බිම්වල ලගින්ට සැලැස්වීම පමණක් ප්‍රමාණවත් නැත. එහි වැතිර ඒ මත එළඹ සිටිමට ඉඩ සැලැස්විය යුතුය. ඔබ ඔවුන් ඉදිරියෙහි දෙවියන්වහන්සේගේ යහපත් දේ වලින් මේසය සරසා එය ඔවුන් ඉදිරියෙහි තැබිය යුතුය. ( ගිතාවලිය 23 : 5 ) ඔබ බැටළුවන්ගේ පිපාසය සංසිදුවන ජිවනදායක ජලය වෙත ඔවුන් මගපෙන්විය යුතුය. ඔවුන්ගේ ආත්මික කුසලාන දේව වචනයේ උතුරා යන්නට සැලැස්විය යුතුය. ( ගිතාවලිය 23 : 5 )

ස්භාවික ලෝකයේ බැටළුවන්ට පිපාසා ඇති විට ඔවුන් ජලය සොයා යනු ඇත. ඔවුන් පිරිසිදු ජලය වෙත මගපෙන්වුයේ නැත්නම් ඔවුන් අපිරිසිදු ජලය බොනු ඇත. බැටළු එඬේරුන් බැටළුවන්ට පෙරටුව යමින් ජලය අපිරිසිදු කරන්නාවු විෂ පැලැටි පිළිබද පරික්ෂාකර බලයි. එඬේරෙකු වශයෙන් ඔබ ඔබගේ බැටළුවන් පිරිසිදු ජලය වෙත ගෙන යා යුතුය. යේසුස් වහන්සේ ප්‍රකාශ කලේ

**යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළගට ඇවිත් බීවාවේ. (යොහාන් 7 : 37)**

යෙරමියා අනාගතවක්තෘතුමා පැවසුවේ " වතුර නාල්ලන්නාවු කටාරම් ..... " හිස්කම ජිවනදායක ජලයෙන් මිස පිරවිය නොහැක. ( යෙරමියා 2 : 13 )

ගිතාවලිය 23 : 2 හි සදහන් "නිශ්වල දිය " යන්න කෙරෙහි අවධානය යොමු කිරිම වැදගත්ය. මෙහි නිසල දිය යන්න නිශ්වල නමුත් ගලා යන ජලයයි. එය දූෂිත අපිරිසිදු විල් ජලය නොවේ. එය නැවුම්ය. නමුත් කරදරකාරි නොවනවා මෙන්ම වේගයෙන් ඇදහැලෙන භයානක විය හැකි දිය ඇලිද නොවේ. එය තැනින් තැන සුලගේ ගසාගන යන අත්දැකිම් මත හෝ ජනප්‍රිය දේව ධර්මය මත පදනම් නොවු ස්ථාවර න්‍යායක් ගැන කථා කරයි.

**එඬේරා බැටළුවන් හික්මවයි.**

බැටළුවන් රැකබලා ගැනිම යන්නට හික්මවිම ද අදාල වේ. එඬේරුන් ගෙන යන දණ්ඩ භාවිතා කරනුයේ බැටළුවන් නිවැරදි මාවතට ඇද දැම්මටය. සමහර විට දන්ඩේ කොනේ ඇම්නිම යහපත් නොවුනද නුමුත් එය අත්‍යවශය වේ.

ආත්මික එඬේරුන් විසින් භාවිතා කරන දේව වචනයෙන් අධිකාරිත්වයද ස්භාවික ලෝකයේ මෙම එඬේරාගේ දණ්ඩට උදාහරණයකි. දණ්ඩෙන් හික්මවනු ලැබේ. එය සැම විටම හොදයැයි නොදැනෙනු ඇත. නමුත් එය අත්‍යවශ්‍යවේ.

නායකත්වය දිම යන්නට හික්මවිම, තරවටුව සහ නිවැරදි කිරිම් තුලින් බැටළුවන් නිවැරදි මාර්ගයේ ගෙන යැම අදාල වේ. බැටළුවෙකු මුලාව ගිය විට විනය සහ ඔහු පසුපස ගොස් නැවත ඔහු රැළට රැගෙන ඒම රැකබලාගැනිම යන්නට අදාලය. ( ලුක් 15 ) ඔබ බැටළුවන් පාපයේ සිට ධර්මිෂ්ඨකම දක්වා මගපෙන්විය යුතුය.

> **උන්වහන්සේ ධර්මිෂ්ඨකමේ මාවත්වල මා ගෙන යන සේක. (ගිතාවලිය 23 : 3)**

බැටළුවන් එම ප්‍රදේශය විනාශ වන තෙක්ම එහි රැදි සිටි. නැතහොත් සැම දිශාවකටම විසිරි යයි. එය පිරිමින් සහ ගැහැණුන් සම්බන්ධයෙන් ගත්කලද එසේමය.

> **අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුලිව් එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව.**
> **ස්වාමින්වහන්සේද අප සියල්ලන්ගේම අයුතුකම උන්වහන්සේ පිට තැබු සේක. (යෙසායා 53 : 6)**

ධර්මිෂ්ඨකමේ මාවත් වල මිනිසුන් සහ ගැහැණුන්ට මගපෙන්විම මගින් ඔබ ඔවුන්ව දෙවියන්වහන්සේගේ මහිමයෙහි මෙහෙයවයි.

**එඬේරා හෙලනු ලැබු බැටළුවන්ට උපකාර කල යුතුය.**

ස්භාවික ලෝකයේ හෙලනු ලැබු බැටළුවන් යනු පිටුපස වටවිම නිසා තනිව නැගි සිටිය නොහැකි බැටළුවන්ය. ඔවුන් සතුන්ට පහසු ලෙස ගොදුරු විය හැකි අතර, ඔවුන් අසරණය. එඬේරා පැමිණ දණ්ඩෙන් ඔහු ඔසවා තම පාද වලින් සිට ගන්නා පිනිස ඔහුව පෙළඹවිය යුතුය.

බැටළුවන් මෙන්ම ඇදහිලිවතුන්ද වැටි සිටිය හැකිය :

**ඔවුන් පහසුවෙන් තැන්පත්ව සිටිය හැකිය** : ස්භාවික ලෝකයේ බැටළුවන් සමහර විට සුන්දර නිල් තණ ගොදුරු බිමක සතුටින් නිසැකකමින් වැටි සිටිය හැකිය. ඔවුන් පසුපසින් පෙරලෙමින් සතුටින් දෙපයින් ගැසිය හැකිය. එවිට නැවතත් නැගි සිටිය නොහැක.

ආත්මික ලෝකයේද ඇදහිලිවතුන් ද්‍රව්‍යාත්මක දෙයෙහි පහසුව මත වැටි සිටිය හැකිය. ඔවුන් ලෝකයේ සතුට සහ ධනය සමග සම්බන්ධවිය හැකිය. ඔවුන් දෙවින්වහන්සේ උන්වහන්සේගේ රාජ්‍ය සහ නැතිවූ ආත්ම ගැන තැකිමක් නොකර සිටිය හැකිය. මෙය සිදු වු විට ඔවුන් දෙවියන්වහන්සේට ආකර්ෂක්ෂමව සතුරාට පහසු ගොදුරක්ව සිටිය හැකිය. එවැනි බැටළුවන්ට උපකාර කරන පිනිස ඔබ ඔවුන්ගේ අවධානය ආත්මික වටිනාකම් මත තැබිමට සහ රාජ්‍යයේ වැඩය සඳහා ඔවුන් පෙලඹවිය යුතුය.

**ඔවුන්ට ලොම් වැඩියෙන් තිබිය හැකිය.**

ලෝම වඩා දිගට වැවුණු කල කටු සහ පරඬැල් එහි එල්ලී මේවාත් සමග බැටළුවාගේ බර වැඩි වීමෙන් සතුරාගේ පහසු ගොදුරක් බවට ඌ පත්විය හැකිය. මෙවැනි වැටී ගිය බැටළුවන්ට උපකාර කිරීම පිණිස එඬේරුන් එසේ ලොම් වල එල්ලී ඇති සුන්බුන් කපා ඉවත් කරනු ලැබේ. මෙසේ කර විට බැටළුවා කෑ ගසයි, දඟලයි, පයින් ගසයි.

ආත්මික ලෝකයේ ඇදහිලිවතුන් " මේ ලෝකයේ රැකවරණය සහ පහසුවෙන් හසුවිය හැකි පාපය " නිසා බර වැඩි වී සිටිය හැකිය. ඔවුන් දෙවියන්වහන්සේට ප්‍රබල අයවලුන් වීමට නම් මේ දේවල් කපා හැරිය යුතුය. අප පයින් ගැසීම්, දැගලීම් සහ කෑගැසීම් කරනු ඇත. නමුත් එය අවශ්‍යවේ.

**ඔවුන් තරුබාරු විය හැකිය.**

තරුබාරු බැටළුවන්ට ඔවුන් පිටුපසින් පෙරලෙනවිට නැවතත් තරබාරු වී නැගිසිටිය නොහැකි වනු ඇත. සමහර ඇදහිලිවතුන් ආත්මිකව තරබාරු වෙති. ඔවුහු දෙවියන්වහන්සේ දෙන දේ ලබා ගන්නා අතර, ඒවා පිටතට නොදෙයි. ඔවුන් අන්‍යයන්ට සේවය නොකරන නමුත් දිගටම ඔවුන් ආත්මිකව වැඩෙමින් සිටිනු ඇත.

ස්වභාවික ලෝකයේ මෙවැනි තරබාරු බැටළුවන් නිතරම සෞඛ්‍යසම්පන්න හෝ වඩා පලදරන්නෝ නොවෙති. මේය ආත්මික ලෝකය සම්බන්ධයෙන්ද සත්‍යයකි. ආත්මික එඬේරුන් මෙම "තරබාරු බැටළුවන්" ගෙන දෙවියන්වහන්සේ වෙනුවෙන් ගමන් කිරීමට නැගිටුවිය යුතුය.

**එඬේරා බැටළුවන්ට මගපෙන්වයි.**

යේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කල සේක :

> **ඔහු තමාගේම සියළු බැටළුවන් පිටතට හැරියාම ඔහු උන්ට පෙරටුව යයි. බැටළුවෝද ඔහුගේ හඬ අඳුනන බැවින් ඔහු පස්සේ යයි. (යොහාන් 10 : 4)**

නායකත්වය යනු හරියටම වචනයේ පෙන්නුම්කර ඇති ආකාරය වේ. ඔබ පෙරටුව යමින් බැටළුවන්ට මගපෙන්විය යුතුය. ඔබ බැටළුවන්ට හුදෙක් යායුතු මාර්ගය කියා දෙනවා පමණක් නොවේ. ඔබ ඉදිරියෙන් ගමන් කරමින් එය පෙන්නුම් කරයි. ඔබ මෙය ප්‍රායෝගිකව ඔබ දේශනාකරන්නාවූ දේ ප්‍රකාශ කිරීමෙන් පමණක් නොව ඔබගේ ජීවිත පැවැත්මෙන්ද පෙන්නුම් කරයි. එඬේරා නායකයෙකුගේ උදාහරණයට සරිලන සේ මිස "ස්වාමියකු" ලෙස ජේත්තුවට හැසිරෙනවා නොවේ.
ජේදුරු සේවය කිරීමට කියා සිටියේ ...

> **නුඹලාගේ භාරයට දෙන ලද්දවුන් කෙරෙහි අධිපත්කම් කරන්නාක් මෙන් නොව නුඹලාම රැළට අදර්ශව සිටිමින්ද එය රැකබලා ගනිල්ලා (1 ජේත්‍රුස් 5 : 3)**

**එඬේරා සේවය කරනුයේ කැමැත්තෙනි.**

ජේදුරුතුමා කියා සිටියේ ...

**නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලාගනිමින් බලාත්කාරය නිසා නොව දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද (1 පේත්‍රැස් 5 : 2)**

ඔබට කී නිසා ඉල්ලා සිටි නිසා හෝ බල කල නිසා ඔබ නායකත්වය නොදිය යුතුය. ඔබ නායකත්වය

දිය යුත්තේ ඔබට නායකත්වය දැරීමට වුවමනා නිසාවෙනි. ඔබගේ කැදවීම කැමැත්තෙන් ඉෂ්ඨ කල යුතුය.

**එඬේරා බැටළුවන් වෙනුවෙන් තම ජීවිතය දේ :**

යේසුස් වහන්සේ මෙසේ කී සේක :

**මම යහපත් බැටළු එඬේරාය. යහපත් බැටළු එඬේරා තමාගේ ජීවිතය බැටළුවන් උදෙසා දෙන්නේය. (යොහෙනේ 10 : 11)**

මනුෂ්‍යය වර්ගයාගේ පාපය වෙනුවෙන් අවශ්‍ය වු එකම පුජාව යේසුස් වහන්සේය. මේ ආකාරයෙන් ඔබගේ බැටළුවන් උදෙසා මියයැමට ඔබට නොහැකිය. අපගෙන් සමහරකුට මෙසේ අන් අය වෙනුවෙන් මිය යාමට හෝ ජීවිත පරිත්‍යාග කිරීමට සිදුවය හැකිය.

නමුත් නායකයකු වීමට නම් "ඔබගේ ජීවිතය" වෙනත් මාර්ගයෙන් දීමට සිදුවනු ඇත. ඔබට ඔබගේම කැමැත්ත සහ ආත්මාර්ථකාමී ආශාවන් අන් අය වෙනුවෙන් කැප කිරීමට සිදුවිය හැකිය. මනුෂ්‍යයින් රැකබලා ගැනීමෙදි විවිධ අපහසුතාවයන් ඇතිවය හැකිය. එයට කාළය අවශ්‍ය අතර එය ඔබගේම සැලසුම් වලට මැදිහත් විය හැකිය.

යේසුස් වහන්සේ ලුක් 15 හි නැතිවු බැටළුවා පිලිබඳව උපමාවේ මේ පිළිබඳව පැහැදිලි කර ඇත. සියලුම බැටළුවන් කීකරු වී ඔවුන් සිටිය යුතු ස්ථානයෙහි සිටිය නමුත් එකෙකු නැති විය. රාත්‍රියේ ඌ සොයා යෑම පහසු නොවිය. එය කැමති හෝ සුවපහසු දෙයක් නොවේ. එය භයානක වීමට වුවද පුළුවන. නමුත් එඬේරා තම ජීවිතය පසෙකලා නැති වු බැටළුවා ගලවා ගැනීමට ගියේය.

**එඬේරා බැටළුවන් ආරක්ෂා කරයි.**

**සොරා එන්නේ සොරකම්කරන්ටත්, මරන්ටත්, විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවිනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහාන් 10 : 10)**

**එඬේරෙක් නොවු බැටළුවන්ගේ අයිතිකාරයා නොවන්නාවු කුලිකාරය වෘකයා එනවා දැක බැටළුවන් අතහැර පලායන්නේය. වෘකයා උන් අල්ලමින් විසුරුවා දමන්නේය. ඔහු පලායන්නේ ඔහු කුලිකාරයකු නිසාත් බැටළුවන් ගැන නොසලකන නිසාත්ය.**

**යහපත් බැටළු එඬේරා තමනට දැරීමට වන මිළය කුමක් වුවත් බැටළුවන් සමග රැඳී සිට උන්ව ආරක්ෂා කරයි.**

කුලිකරුවන් වැනි වු නායකයින් ඔවුන්ගේ නායකත්වය මුදලට තනතුර හෝ බලයට පාවිච්චි කරන්නවුන්ය. ඔවුන් සේවය කරන්නේ "නින්දිත ලාභයට" හෝ ඔවුන්ගේම වාසියටය. දෙවියන්වහන්සේ "විපත" හෝ විනිශ්චය පහත ආකාරයෙන් වන එඬේරුන් වෙත එවන බව මෙම පරිච්ජේදයෙහි පවසයි.

1. රැළ නොකවන්නවුන්ට : 2 පදය

2. ආත්මාර්ථකාමී ලෙස හෝ හොරෙන් බැටළුවන්ගෙන් ගන්නා එඬේරුන්ට : 3 පදය

3. බැටළුවන් රැකබලා නොගෙන තමුන්ව රැකබලා ගන්නා එඬේරුන්ට : 2 -3, 8 පදය

4. රැළෙහි අවශ්‍යතා පිලිබඳව සොයා නොබලන්නා : 4 පදය
   (ඔවුන් රිදුනාවූ අය සැනසුවේ නැත. බැටළුවන් ධෛර්‍යමත් කලේ නැත. ආත්මික ලෙඩ වලින් ලෙඩ වුනාවූ සහ අසනිප වුනාවූ අය පිළිබඳ සොයා බැලුවේ නැත.)

5. නැතිවූ බැටළුවන් පිළිබඳව සොයා බැලුවේ නැත : 4, 6 පදය

6. කෲරත්වයෙන් සහ බලයෙන් පාලනය කල : 4 පදය

7. බැටළුවන් විසුරුවා හැරිය : 5 - 6 පදය

8. සතුරාට බැටළුවන් විනාශ කිරීමට ඉඩහරින : 8 වන පදය

9. රෝග සහ භේදබින්න වීම මගින් රැළ විනාශ වීමට ඉඩහරින : 21 පදය

**එඬේරුන්ට පොරෙන්දුවක්**

ඔබ බයිබලිය අයුරින් එඬේරෙකුසේ රැළට නායකත්වය දෙන්නේ නම් දෙවියන්වහන්සේගෙන් මෙම පොරොන්දුව ඉෂ්ඨ කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

> **එවිට ප්‍රධාන එඬේරා ප්‍රකාශ වන කල්හි නුඹලා තේජසේ නොමැළවෙන්නාවූ ඔටුන්න ලබන්නහුය. (1 පේත්‍රුස් 5 : 4)**

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන බයිබල් පද මතකයෙන් ලියන්න

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

2. යහපත් බැටළු එඬේරා කවුද ?

---------------------------------------------------------------------------------------------------

3. සත්‍ය වු බැටළු රැළ වන්නේ කවුද ?

---------------------------------------------------------------------------------------------------

4. මෙම පාඩමෙන් ඔබ ඉටගන ගන්නාවු එඬේරකමේ මුලධර්ම වල සංක්ෂිප්ත සටහනක් ලියන්න. එඬේරෙකුගේ වගකීම් මොනවාද ?

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

5. එසකියෙල් 34 හි පරිදි අයහපත් එඬේරුන්ට දී ඇති අවවාද මොනවාද ?

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

(මෙම ප්‍රශ්ණ වලට පිලිතුරු මෙම සංග්‍රහයේ අවසාන පරිච්ඡේදයෙහි දැක්වේ)

**වැඩිදුර අධ්‍යනය සඳහා**

1. මෙම පාඩමෙහි ඉගෙන ගන්නා ලද එඩේරකම ගැන මූලධර්ම ඔබගේ ජීවිතයෙහි පරීක්ෂා කර බලන්න. ඔබ මෙම මූලධර්ම ඔබගේ සේවයට සහ ජීවිතයට අදාලකර ගන්නේද ? ඔබ පරාජය වූයේ කොතැනද ? ඔබ කොපමණ වර්ධනය කරගන්නේද ?

2. ගීතාවලිය 23 මෙම කටු සටහන ආශ්‍රයෙන් අධ්‍යනය කරන්න. ස්වාමින්වහන්සේ ඔබගේ :

| | |
|---|---|
| – සපයන්නා | ගීතාවලිය 23 : 1 |
| – සමාදානය | ගීතාවලිය 23 : 2 |
| – මග සාදන්නා | ගීතාවලිය 23 : 3 |
| – ආරක්ෂාව | ගීතාවලිය 23 : 4 |
| – සුදානම් කිරීම | ගීතාවලිය 23 : 5 |
| – බහුලත්වය ( කුසලාන උතුරා යයි ) | ගීතාවලිය 23 : 5 |
| – පොරොන්දුව | ගීතාවලිය 23 : 6 |

**ගීතාවලිය 23 ට අතිරේක සටහන්. යහපත්කම සහ කරුණාව සම්බන්ධයෙන් කථා කිරීමේදි 6 වෙනි පදය සැලකිල්ලට ගන්න.**

| | |
|---|---|
| – එහි සම්පත්වය | "එය මා අනුගමනය කරනු ඇත." |
| – එහි නිරන්තර පැවැත්ම | "එහි ජීවිතය පුරාම පවතිනු ඇත." |
| – එහි පැවැත්ම | "සියලු දිනවලදි" යනු පැවැත්මයි. |
| – සහතික කම | "සැබවින්ම" |

මේ ප්‍රශ්ණය ගැන සලකා බලන්න. කරුණාව සහ යහපත්කම ඔබ අනුව එන්නේද ? ඔබගේ ජීවිතය ගතකිරීමේදි ධෛර්‍යමත් කිරීම. පෙළඹවීම් කරුණාව සහ යහපත්කම ඔබ පසෙක තබා ඇත්ද ? අපගේ කිතුණු ජීවිතවල අමාරු කාලපරිච්ජේද ගැන කථා කරන මිටියාවත යන්න ගැන කථා කිරීමේදි

– එය සෙවනැල්ලක් මිස කිසිත් නැත. ස්වාභාවික ලෝකයේ සෙවනැල්ලක් දකින විට ඊට හේතු වන්නාවූ යමක් ඇත. හෙවනැල්ල සැබෑවක් නොවේ.

– ආත්මික ලෝකයේ දි එය අපගේ මිටියාවත් වලට ඇති සෑම සෙවනැල්ලකටම පිටුපසින් ඇති සතුරාගේ ආයුධයයි.

– එය "අතරින් ගමන් කිරීමකි" ඔබ මිටියාවතේ සදාකල් නොරැදෙනු ඇත. " එය මා මියෙනු ඇත " හෝ " එහි නැවතෙනු ඇත" කියා නොකියනු ඇත.

– එය "ඇවිදයාමක්" මිස භායානක දිවීමක් නොවේ.

– ස්වාභාවික ලෝකයේ බොහෝ එල ඇති ප්‍රදේශවල මිටියාවත් දක්නට ලැබේ. ප්‍රශ්ණය ඔබ මිටියාවත් තුලින් යයිද නොයයිද කියා නොවේ. ඔබ බොහෝ ඒවා තුලින් යනු ඇත. ප්‍රශ්ණය වන්නේ ඔබ ඒවාට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්නයි. ඔබ මිටියාවත්වල පමණක් වැඩෙන්නාවූ හොඳ දේවල් වලින් පෝෂණය කරන්නේද ?

– මිටියාවතේ අද්දැකිම් වලදි එඬේරාගේ සැරයටිය මෙන්ම රැකවරණය සඳහා වන කරුව යන්නද එකට ක්‍රියා කරයි.

3. පහත දක්වා ඇති බයිබල් යොමු කිරීම් කියවා එඬේරකම යන්න වැඩිදුර අධ්‍යනය කරන්න.
   - ගණන් කථාව 27 : 17
   - ගිතාවලිය 23, 80 : 1
   - යෙසායා 40 : 11
   - එසකියෙල් 34, 37 : 24
   - සෙකරියා 10 : 2, 11 : 15-17
   - මතෙව් 9 : 36, 25 : 32, 26 : 31
   - මාර්ක් 6 : 34, 14 : 27
   - යොහාන් 10
   - හෙබ්‍රෙව් 13 : 20
   - 1 පේත්‍රුස් 2 : 25, 5 : 4

# සත් වන පරිච්ඡේදය

## නායකයන්ගේ කාර්යයන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසානයේ ඔබට :

- ප්‍රධාන කෙටි ඡේදයන් මතකයෙන් ලිවීම.
- නායකයන්ගේ ප්‍රමුඛ කාර්යයන් හඳුනා ගැනීම.
- සම්පූර්ණ වීම නිර්වචනය කිරීම
- සභාවේ සේවාවන් සඳහා ජනතාව සම්පූර්ණ වීම පිළිබඳ ප්‍රථිඵල සමාලෝචනය කිරීම
- නායකයින්ගේ නිශ්චිත කාර්යයන් හඳුනා ගැනීම.

**ප්‍රධාන පදය :**

> **උන්වහන්සේ (දෙවියන්වහන්සේ) සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගත වක්තෘවරුන්ද, සමහරුන් සුභාරංචිය ප්‍රකාශකරන්නන්ද, සමහරුන් සභාපාලකයන්ද, සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. එසේ දුන්නේ ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය. (එපිස 4 : 11 - 12)**

## ප්‍රවේශය

යහපත් කැපකරුවකු, සේවකයෙකු, සහ මගපෙන්වන්නෙකු ලෙස ඔබ පෙරමුණ ගත යුත්තේ කෙසේද යනු ඔබ මින් පෙර පාඩම් තුලින් ඉගෙන ගනි. මෙම පාඩම සහ මින් අනතුරුව ඇති පාඩම් වලින් නයකයෙකු සැබවින්ම කරනුයේ කුමක්ද යන්න කෙරෙහි අවධානය යොමු කෙරේ.

නායකත්වය සඳහා බොහෝ කාර්යයන් අවශ්‍ය කෙරේ. කාර්යයක් යනු වගකීම, යුතුකම හෝ රැකියාවයි. නායකයෙකු කෙරෙන් අපේක්ෂා කරනු ලැබිය හැකි සෑම සෑම කාර්යක්ම අපට සාකච්ඡා කිරීමට හැකියාවක් නොමැත. එහෙයින් නායකයින්ගේ ප්‍රධානතම කාර්යයන් පමණක් අපි සලකා බලන්නෙමු.

## පළමු ප්‍රමුඛත්වය

ක්‍රිස්තියානි නායකයෙකුගේ පළමු ප්‍රමුඛත්වය පහත සඳහන් උපුටා ගැනීමෙහි පැහැදිලි කර ඇත.

> **උන්වහන්සේ (දෙවියන්වහන්සේ) සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගත වක්තෘවරුන්ද, සමහරුන් සුභාරංචිය ප්‍රකාශකරන්නන්ද, සමහරුන් සභාපාලකයන්ද, සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක.**
>
> **එසේ දුන්නේ ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය. (එපිස 4 : 11 - 12)**

සභාවේ සේවය සඳහා ඇදහිලිවතුන් "සම්පූර්ණ කිරීම" සඳහා දෙවියන්වහන්සේ සභාව තුල නායකයින් පිහිටුවන සේක.

මෙම "සම්පූර්ණ" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ සූදානම් කිරිම හෙවත් සම්පාදනය කිරිමයි. සභාවෙහි සියළුම තනතුරු. රාජකාර්යයන්, සහ වගකිම් මෙම "සභාවෙහි වැඩ කටයුතු" යන්නෙහි අඩංගුවේ.

සභාවෙහි වැඩකටයුතු සඳහා ඇදහිලිවතුන් සම්පූර්ණ කිරිම ක්‍රිස්තියානි නායකයින්ගේ ප්‍රධාන වගකීම් වන්නේය. සෑම ඇදහිලිවන්තයෙකු වෙතට යටත් පිරිසෙයින් එක් ආත්මික දිමනාවක් හෝ දෙනු ලැබ ඇති හෙයින් ඉන් උකහා ගැනිම සඳහා නායකයින් හට විශාල සම්පතක් ඇත. එක් එක් ඇදහිලිවන්තයෙකු දෙවියන්වහන්සේ වෙතින් ඔහු කැදවිම ලබා ඇති කාර්යය ඉටුකිරිම සඳහා ආත්මික වශයෙන් සම්පාදනය කල යුත්තේය.

ඉගැන්විම, උපදේශනය කිරිම, ප්‍රදර්ශණය කිරිම, සහ පුහුණු කිරිම ආදි දේ සම්පූර්ණ කිරිම අඩංගු වේ. සභාවෙහි කාර්යයන් සඳහා ජනතාව සංවිධානය කිරිමද සම්පූර්ණ කිරිම කෙරෙහි අඩංගු වේ. " සංවිධානය " කිරිම යනුවෙන් අදහස් වන්නේ ක්‍රියාත්මක කරවිම හෙවත් ක්‍රියාවෙහි යෙදවිමය. ඇදහිලිවතුන් පුහුණු කල යුතුවා පමණක්ම නොව, ඔවුන් ඉගෙන ගත් දෑ පාවිච්චි කිරිමටද ඔවුන් සංවිධානය කළ යුතුය.

ඇතැම් ජනයා නායකයින් ලෙසින්ද සෙස්සන් අනුගාමිකයින් ලෙසින්ද පුහුණු කරවිම සම්පූර්ණ කිරිම හා අදාල වේ. සභාවෙහි කටයුතු සඳහා සියල්ලෝම වැදගත් වෙති. මෙම පාඩමාලාවෙහි දසවන පරිච්ජේදය නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කිරිම කෙරෙහි කැපකර ඇත.

ඔබ දෙවියන්වහන්සේ වෙතින් කැඳවන ලද සහ තෝරාගැනුන නායකයෙකු වන්නේ නම් දෙවින්වහන්සේගේ කාර්යයන් ඉටුකිරිම සඳහා සෙසු අයවලුන් සම්පාදනය කිරිම කෙරෙහි ඔබ ක්‍රියාත්මක විය යුතුය. මෙය ඔබේ මුලික ප්‍රමුඛතාවය සහ ඔබගේ ප්‍රධාන පැවරුම වන්නේය. ඇදහිලිවතුන් සභාවේ කාර්යයන් සඳහා නිසි පරිදි " සම්පූර්ණ කල විට " ඇතිවන නියත ප්‍රතිඵල මෙසේය.

- සභාවෙහි කටයුතු සිදුවන්නේය. (එපිස 4 : 12)
- ක්‍රිස්තුස් වහන්සේගේ ශරිරය (සභාව) වර්ධනය (ශක්තිමත්) වන්නේය. (එපිස 4 : 12)
- ජනතාව ආත්මිය පරිණතභාවය වෙත ලගාවන්නේය. (එපිස 4 : 13 - 15)
- එක්සත් භාවය එලගැන්වෙන්නේය. (එපිස 4 : 13)
- ජනතාව ක්‍රිස්තුස් වහන්සේගේ ස්වරූපයට මාරුකරනු ලබන්නේය. (එපිස 4 : 13)
- සත්‍යයෙහි පදනම් වෙමින්, ජනතාව ධර්මයෙහි ස්ථාවර වන්නාහ. (එපිස 4 : 15 - 16)
- ක්‍රිස්තුස් වහන්සේගේ ශරිරය ප්‍රබලව ක්‍රියාත්මක වනසේක. (එපිස 4 : 16)

## සම්පූර්ණත්වයට පත් කිරිමේ ක්‍රියාවලියෙහි වගකීම්

ඇදහිලිවතුන් "පුර්ණවත් කිරිම" කෙරෙහි බොහෝ වගකීම් ඇත. එයින් සමහරක් මෙසේය.

**ආදර්ශමත් විම :**

අනුගාමිකයින් සඳහා නිසි ආදර්ශයක් ලබාදිමේ නායකයින් සතු වගකිම පිළිබඳ අපි දැනටමත් දිර්ඝ ලෙස සාකච්ජා කර ඇත්තෙමු. උදාහරණයක් වශයෙන්, නායකයා යහපත් භාරකාරයෙකු, සහ සැමදෙනාගේ සේවකයකු වශයෙන් හැඳිනිය යුතු, ආශිර්වාද ලැබිය යුතුවේ. සිව්වන පරිච්ජේදයෙහි සාකච්ජා කරන ලද නායකයින් සඳහා වන්නාවු සුදුසුකම් පිළිබඳව ඔහුගේ ජිවිතය සාක්ෂියක් විය යුතුය. ඔහු යාච්ඤාවේ මිනිසෙකු සහ දේව වචනයෙහි ශිෂ්‍යයෙකු විය යුතුය. ඔබගේ ආදර්ශය දැහැමි විය යුතුය. මක්නිසාදයත්...

ගෝලයා ගුරුවරයාට වඩා උතුම් නැත. නමුත් සම්පූර්ණත්වයට පැමිණි සෑම දෙනම තමන්ගේ ගුරුවරයා මෙන් වන්නෝය. (ලුක් 6:40)

අන්‍යයින් කළමනාකරනය කිරීමේ සහ මෙහෙයවීමේ හැකියාව ආරම්භ වනුයේ තමාව නිසි ලෙස කළමනාකරනය කිරීම කෙරෙන්ය. දෙවියන්වහන්සේ සමග සම්බන්ධතාවයෙන්ද. සුභාරංචිය ප්‍රකාශ කිරීම සහ සියළුම " සභාවේ ක්‍රියා කටයුතු " තුලින් ඔබ ආදර්ශයක් සැලසිය යුතුය.

**සත්කාරය :**

නායකයින්ගේ තවත් එක් ප්‍රධාන වගකීමක් වන්නේ අනුගාමිකයන් සඳහා සත්කාරය සැලසීමය. එඬේරෙකු සහ සේවකයෙකු ලෙසින් මෙහෙයවීම පිළිබඳ පාඩම්වලදි මෙය දැනටමත් අවධාරණය කරනු ලැබිය. අතිශයින් වැදගත් වනුයේ ජනතාව මිස, සැලසුම් හෝ ව්‍යාපෘතින් නොවේ.

නායකයෙකු වශයෙන්, දෙවියන්වහන්සේ ඔබ වෙත පවරන ලද අනුගාමිකයින් පිළිබඳව දැඩි අවධානය යෙදීම දෙවියන්වහන්සේ ඔබ වෙතින් බලාපොරොත්තු වන්නාහ. ඔබ ඔවුන්ට ප්‍රේම කල යුතුය. ඔවුන්ගේ ගැටළු පිළිබඳව සිත යොමු කල යුතු වන්නේ සහ දෙවියන්වහන්සේ හැකියාව සලසන ආකාරයට ඔවුන්ගේ ආත්මික, කායික සහ ද්‍රව්‍යමය අවශ්‍යතා පිළිබඳ උපදෙස් ලබා දිය යුතුය. සත්කාරය පිළිබඳව වැදගත් අංගයක් වන්නේ නායකයෙකු සිය අනුගාමිකයන් වෙනුවෙන් යාච්ඥා කිරීමයි. ඔබගේ ආරක්ෂාව යටතට පවරන ලද එම අය වෙනුවෙන් යාච්ඥා කිරීම පැහැර හැරීමෙන් දෙවියන්වහන්සේට එරෙහිව පව් නොකරන්න.

**මෙහෙයවීම :**

නායකයෙකු මෙහෙයවීම සහ මගපෙන්වීම කළ යුතුය. තමන් කැඳවන ලද්දවූ මෙහෙය සාක්ෂාත් කරගැනීම සඳහා ඔහු ජනතාව වෙත මාර්ග දේශකත්වය සපයයි. ඔවුන් ආත්මාර්ථයෙන් යුතුව අයාලයේ යෑමට ප්‍රිය කරන දෙසට නොව, ඔවුන් හට දෙවියන්වහන්සේ නියම කරන තැනට ඔබ ජනයා මෙහෙයවිය යුතුය. අධ්‍යාත්මීය ප්‍රතිපත්තින් තුල ඔවුන් හට මගපෙන්වමින් දේව මාර්ගයන්හි ගමන් කිරීම සඳහා ජනතාව හට උපදේශනය ලබාදීම මෙහෙයවීම හා අදාල වේ.

**තීරණ ගැනීම :**

අනෙකුත් අය මෙහෙයවීම සඳහා, ඔබ බොහෝ තීරණ ගැනීම අවශ්‍ය වේ. මෙම කර්තව්‍යයේදී ඔබට උපකාරී විය හැකි තීරණ ගැනීමේ ඇතැම් ප්‍රධාන වූ මූලධර්මයන් සමහරක් ඇත. අටවන පරිච්ඡේදයේදී ඔබ මේවා ඉගෙන ගනු ඇත.

**ආරාවුල් සහ ශික්ෂණයන් හැසිරවීම :**

ජන කණ්ඩායම් සමග කටයුතු කිරීමේදී, සෑම විටම ආරාවුල් පැන නැගේ ස්වාමින්වහන්සේගේ මගපෙන්වීමෙන් යුතුව එවන් ආරාවුල් විසඳීමට නායකයෙකු සමත් විය යුතුය. ඇතැම්විට අධ්‍යාත්මීය ශික්ෂණය අවශ්‍ය කෙරෙන ජනතාවද සිටීමට ඉඩ ඇත. මක්නිසාද යත් ඔවුන් ධර්මයට අනුව වැරදි වූ දේ හෙවත් පාපයෙහි ගැලෙන හෙයින් ඔවුන් නිවරැදි කරවීම අවශ්‍ය වන නිසාය. මෙම අධ්‍යන මාලාවෙහි නවවන පරිච්ඡේදය ආරවුල් සහ ශික්ෂණය පිළිබඳ කර්තව්‍යයන් හැසිරවීම සඳහා මෙහෙයුම් නිර්ණායකයන් සපයනු ඇත.

**පරිසරය විශ්ලේෂණය කිරිම :**

සඵලත්වයක් වීම සඳහා, ඔබ සේවය කරනු ලබන ජනතාව කවුරුන්දැයි ඔබ වටහාගත යුතුය. ඔවුන්ගේ ගැටළු, අවශ්‍යතා සහ ඕනෑ එපාකම් ඔබ තේරුම්ගත යුතුය. මෙවන් වැටහීමක් ලබා ගැනීම සඳහා, ඔවුන්ගේ අධ්‍යාත්මික, ශාරීරික, භෞතික සහ සංස්කෘතික තත්වයන් හා අදාලවන්නාවූ ඔවුන්ගේ " පරිසරය " ඔබ විශ්ලේෂණය කල යුත්තේය. සභාවේ අරමුණු සඳහා පාරිසරික විශ්ලේෂණය කිරීමෙහි මුලධර්මයන් හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතන පාඨමාලාවෙහි, " පාරිසරික විශ්ලේෂණයෙහි " සවිස්තරව දැක්වේ.

**අරමුණ හඳුනා ගැනීම :**

අරමුණ මූලික වශයෙන්ම අධ්‍යාත්මිය දර්ශණය වේ. ශුද්ධ වූ බයිබලය මෙසේ පවසයි :

**දර්ශණයක් නැති කළ සෙනඟ හිතුවක්කාරවෙති.... (හිතෝපදේශ 29 : 18)**

අරමුණ හෙවත් අධ්‍යාත්මිය දර්ශණය, කරුනු දෙකක් වටහා ගැනීම හා අදාල වේ :

1. දෙවියන්වහන්සේගේ අරමුණු
2. උන්වහන්සේගේ අරමුණු සහ සැලසුම් පරිපුර්ණවත් කිරීම සඳහා ඔබගේ කොටස

සභාව තුල ඔබගේ අරමුණ ඔබ හඳුනාගත් විට, දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ඔබගේ කොටස ඔබට අනාවරණය වේ. අරමුණ සභාව සඳහා වන්නාවූ දර්ශණයක් හෙවත් අපේක්ෂාවක් ස්ථාපනය කරයි. දෙවියන්වහන්සේ ඔබගේ සභාව මගින් ඉෂ්ඨකරවීම අපෙක්‍ෂා කරන දෙය නිශ්චිත ලෙසින්ම මෙහෙයැවීම සහ වටහාදීම එය සපයාදෙයි. ඔබගේ අරමුණ ඉටුකර ගැනීම සඳහා සැලසුම් සකස් කිරීමට සහ සැලැසුම් ක්‍රියාත්මක කිරීමට එය ඔබට අවසර ලබාදෙයි. දෙවියන් වහන්සේගේ අරමුණ සහ ඒ තුල ඔබගේ කොටස ඔබ පැහැදිලිව වටහාගත් විට ඵලදායි ලෙසින් අනෙකුත් අය මෙහෙයවීමට ඔබට හැකිය.

දෙවියන්වහන්සේගේ සැලසුම තුළ ඔබගේ අරමුණ හඳුනා ගැනීම සඳහා හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනිය පාඨමාලාව, " අභිප්‍රාය මගින් කළමණාකරනය " ඔබට උපකාරී වනු ඇත.

**සැලසුම් සැකසීම :**

සභාව සඳහා වන්නාවූ ඔබගේ අරමුණ දැනගැනීම ඔබගේ අරමුණ සඵලමත් කරගැනීමම වන්නේ නැත. එය සඵලමත් කරගැනීම සඳහා ඔබ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. සභාවේ වැඩ කටයුතු සඵලමත් කර ගැනීම සඳහා ඔබ දැනුමට ක්‍රියාව සහ විශ්වාසයට කාර්‍යයන්ද එක් කළ යුතු වන්නේය. ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම යටතේ සැලසුම් කිරීම තුලින් දෙවියන්වහන්සේ සමග සුසංගත වීමෙන් යුතුව උන්වහන්සේගේ සැලැසුම් සහ අරමුණු සඵලමත් කරගැනීම සඳහා ඔබට අවස්ථාව සැලසේ.

සභාව පිළිබඳ ඔබගේ විශේෂිත අරමුණු සඵලමත් කරගැනීම සඳහා ඔබ නිශ්චිත සැලැසුම් සකස් කල යුතුය. ඔබ නායකයෙකු නම්, ඒකාබද්ධ හෝ කණ්ඩායම් සහ කටයුතු සඵලමත් කරගැනීම සඳහා සැලැසුම් සකස් කිරීමට ඔබ අනුගාමිකයින් හට උපකාර කරන්නේය. පහත දැක්වෙන දෑ තීරණය කිරීම සැලැසුම් කිරීම හා අදාල වේ.......

- ඔබ කරන්නට සූදානම් වන්නේ කුමක්ද
- ඔබ එය කරන්නට යන්නේ කෙසේද (ක්‍රමවේදය හෝ ක්‍රියා පිළිවෙල)

- ඔබ එය කරන්නට යනුයේ කෙදිනකද
- එය කරනුයේ කවුරුන්ද
- එය කිරීමේ වියදම
- එය ඇගැයීමේ සහ ඔබ සැලැසුම් කල ආකාරයෙන් එය සිදුකර ඇත්දැයි නිශ්වය කිරීම සඳහා ක්‍රමවේදයක්

සැලැසුම් කිරීම නායකයින්ගේ මූලික කාර්යයකි. එය බයිබලයානුකූල ප්‍රතිපත්තියක් වන අතර හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතන පාඨ මාලාවෙහි "අරමුණු මගින් කළමණාකරනය" යනුවෙන් නම්වූ කොටසෙහිදී සවිස්තරාත්මකව සාකච්ජා කර ඇත.

**සැලැසුම් ක්‍රියාවෙහි යෙදවීම :**

නායකයෙකු සැලැසුම් සැකසීමෙන් පසු, මෙම සැලසුම් සපුරාලිය යුතු හෙවත් ක්‍රියාවට නැංවිය යුතුය. සැලැසුමක් සපුරාලීම සඳහා, නායකයෙකු පහත දැක්වෙන කටයුතු ක්‍රියාවට නැංවිය යුතුය. "අරමුණු මගින් කළමණාකරනය" යනුවෙන් නම්කරුති පාඨමාලාවෙහි මේවා එකිනෙක වශයෙන් සවිස්තරාත්මකව සාකච්ජා කරනු ලැබ ඇත.

– සැලැසුම සඵලමත් කිරීම සඳහා ජනයා තෝරාගැනීම

– සැලැසුම, සිදුකිරීම සඳහා වන්නාවූ සභාවේ කටයුතු ඔවුන් හට අවබෝධ කරවීම

– සැලැසුම සාර්ථක කිරීම සඳහා බලතල සහ වගකීම පැවරීම

– කාර්යය සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය නිපුණතාවයන්ගෙන් තෝරාගනු ලැබූවන් පුහුනු කිරීම.

– අදාල පුද්ගලයින් සහ සැලසුමෙහි සුවිශේෂී විස්තර සංවිධානය කිරීම

– ආරම්භක සහ සම්පූර්ණ කරන දින සහ සැලැස්මෙහි ගතිය පිළිබඳ කාලීනව කෙරෙන පිරික්සුම් උපලේඛන ගත කිරීම.

– සැලැසුම සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය අරමුදල් ඇස්තමේන්තු ගත කිරීම.

– තීරණ ගැනීම.

– ප්‍රගතිය සමාලෝචනය කිරීම

– සභාවේ කටයුතු ඇගැයීම.

ඔබ සැලැස්ම සම්පූර්ණ කලේද සහ ඔබගේ සභාව සඳහා වන්නාවූ දෙවියන්වහන්සේගේ අරමුණු සාර්ථක කිරීම සඳහා එය නිශ්චිත වශයෙන් දායක වුයේද යනු මෙම සමාලෝචනය නිශ්වය කරයි.

## කාර්යභාරය සඳහා ශක්තිමත් වීම

පෙර සඳහන් කරන ලද පරිදි නායකයෙකු හට ඉටුකිරීමට විය හැකි සෑම කාර්යයක්ම සාකච්ඡා කිරීමට හැකියාවක් නොමැති නමුදු, සෑම නායකයෙකුගේම මූලික වගකීම් වන්නේ මෙහි සඳහන් කරන ලද දේවල් වේ. මෙම කාර්යයන් සඳහාද නායකත්වය තුළින් ඔබ වෙතින් ඉටුකරනු ලැබීමට අවශ්‍යය කරුණු ලැබිය හැකි අන් සෑම වගකීමක් සඳහාම අවධානය ඉල්ලීම සඳහා වන්නාවූ ප්‍රතිඥාවක් මෙලෙස වේ.

**මා බලවත්කරන්නාවූ තැනැන්වහන්සේ තුළ මට සියළු දේ කරන්නට පුළුවන (පිලිප්පි 4 : 13)**

ඔබ පීඩාවට පත් වී "ඉටු කිරීම සඳහා වන්නාවූ සියළු කාර්යයන් ඉටුකිරීම සඳහා මට කිසිදු මගක් නැත." යන ලෙසින් සිතන්නට ඔබ පෙළඹෙන ඕනෑම අවස්ථාවකදී, දෙවියන්වහන්සේ සමග හුදෙකලාවී ඔබ වැඩි කාලයක් ගතකිරීම අවශ්‍ය වන්නේය. දෙවියන්වහන්සේ සමග පසුවීමට ඔබ කාලය ලබා ගන්නේ නම් ඔබ වෙහෙසට පත්වන්නේ සහ කළකිරෙන්නේ නැත.

**ඔබ කෙරෙහි සිත තබා සිටින තැනැත්තා ඔබ කෙරෙහි විශ්වාස කරන බැවින් ඔබ ඔහු ශාන්ත සමාදානයෙන් ආරක්ෂා කරන සේක. (යෙසායා 26 : 3)**

සාලමොන් රජු විසින් කරණ ලද මෙම " නායකයාගේ යාච්ඥාව " යාච්ඥා කරන්න :

**ඔබගේ මෙහෙකරුවා වනාහි ගණන් කරන්ටවත් ගණන කියන්ටවත් බැරි තරම් මහත් සමූහයක් වූ ඔබ විසින් තෝරාගත් ඔබගේ සෙනග මැද සිටියි.**

**එබැවින් ඔබගේ මේ සෙනග විනිශ්වය කරන පිණිස යහපත හා නපුර දැනගන්නට පුළුවන් වන ලෙස නුවණැති සිතක් ඔබගේ මෙහෙකරුවාට දුන මැනව, මක්නිසාද ඔබගේ මේ මහත් සෙනග විනිශ්වය කරන්නට කවරෙකුට පුළුවන්දැයි කීවේය. (1 රාජාවලිය 3 : 8 - 9)**

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන බයිබල් වාක්‍යයන් මතකයෙන් ලියන්න

2. නායකයින්ගේ පුමුඛතා කාර්යය කුමක්ද ?

3. " සම්පූර්ණ කිරීම " අර්ථ දක්වන්න.

4. සභාවේ කටයුතු සඳහා ජනතාව "සම්පූර්ණ කිරීම" මගින් ඇතිවන නිශ්චිත ප්‍රතිඵලමොනවාද ?

5. සභාවේ කටයුතු සඳහා ඇදහිලිවන්තයින් සම්පූර්ණ කිරීමෙහි නියුතු වන්නාවූ නායකයින්ගේ ප්‍රධාන වගකීම් සංක්ෂිප්ත ලෙස දක්වන්න.

(මෙම පරික්ෂණ වලට පිළිතුරු මෙම සංග්‍රහය අවසාන පරිච්ඡේදයේ දැක්වේ.)

**වැඩිදුර අධ්‍යනය සඳහා**

1. මෙම ජේදය තුල තුලදි හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනය පාඨමාලාව "පාරිසරික විශ්ලේෂණය" සහ "අරමුණු මගින් කළමණාකරනය" කෙරෙහි බොහෝ වශයෙන් යොමු කර ඇත. මෙම පාඨමාලාව ආරම්භයේදි සඳහන් කරැති පරිදි, බයිබලයානුකූල පරිපාලනය පිළිබඳ ඔබගේ අධ්‍යයනය පවත්වාගෙන යෑම සඳහා ඔබ මේ කි පාඨමාලාවන් දෙක ලබා ගත යුතු යැයි අපි යෝජනා කරමු.

2. නායකයින්ගේ ක්‍රියා කටයුතු වලින් සමහරක් පැහැදිලි කරන්නාවූ බයිබලයානුකූල නිදසුන් කිහිපයක් මෙසේය.

**ජෙරුසලමෙහි පවුරු නැවත ගොඩනැංවීම**

**විසඳිමට ඇති ප්‍රශ්ණය :**

ජුදා දේශයේ ඉතිරිව සිටින ආපසු පැමිනියවුන් මහත් විපත්තියෙනුත් නින්දාවෙනුත් පෙළෙන බවටත් ඒ කුමක් නිසාදයත් ජෙරුසලමෙහි පවුරු කඩා දමා ගින්නෙන් දවා දමා ඇති නිසා බවටත් වාර්ථාවක් නෙහෙමියා වෙත ලැබින : නෙහෙමියා 1 : 2 - 3

**විසඳුම :**

නෙහෙමියා නිරහාරව සිට යාච්ඤා කලේය : නෙහෙමියා 1 : 4 - 11

ඔහු තමන්ගේ කණගාටුව රජුට හෙළි කලේය : නෙහෙමියා 2 : 1 - 2

තමන් අධර්‍යමත්ව සිටිනුයේ මන්දැයි ඔහු රජුට කීවේය : නෙහෙමියා 2, 3

නුඹ ඉල්ලා සිටින්නේ කුමක්ද ? රජු ඇසිය : නෙහෙමියා 2 : 4

මෙම පැණයට පිලිතුරු දිමේදි නෙහෙමියා දෙවියන්වහන්සේගේ මගපෙන්වීම ඉල්ලිය : නෙහෙමියා 2 : 4

පවුරු නැවත ගොඩනැගිම සඳහා තමන් ජුදා දේශයට යවන මෙන් රජුගෙන් ඉල්ලිය : නෙහෙමියා 2 : 5

රජු ධනාත්මකව අනුකූලතාව දැක්විය : නෙහෙමියා 2 : 6

තමන් හට නිදහසේ ගමන් කිරිමට සහ වනයෙන් දැව ලබාගැනිම සඳහා රාජකාර්‍යමය ලිපි ලබාදෙන මෙන් නෙහෙමියා රජුගෙන් ඉල්ලිය. නෙහෙමියා 2 : 7 - 8

නෙහෙමියා එහි ලගා වූ පසු විසඳිමට ඇති එම ප්‍රශ්ණය ඉතා රහසින් සමාලෝචනය කරමින් රාත්‍රින් තුනක් ගෙවීමෙන් පසු නැවත ගොඩනැගිම සඳහා උපාය මාර්ගයක් සකස් කලේය : නෙහෙමියා 2 :12- 16

අනතුරුව නෙහෙමියා තම සැලසුම හෙළිදරව් කර පවුරු යලි ගොඩනැගිම සඳහා ඔහුට උපකාර කරන මෙන් ජනතාවගෙන් ඉල්විය : නෙහෙමියා 2 : 17 - 3 : 32

ඊශ්‍රායෙල්හි සතුරන් එම කාර්යය නවත්වා ලිමට උත්සහ කල විට, ජනතාව යාච්ඤාකර මුරකාවල් යෙදිය : නෙහෙමියා 4 : 1 - 13

ජනයා බියපත් වු විට, නෙහෙමියා ඔවුන් දිරිමත් කලේය : නෙහෙමියා 4 : 14

ඔවුන් තමන්ගේ ආරක්ෂාව සලසා ගැනිම සඳහා සුදානම්ව සිටින බව සතුරන් හට දැනගැනිමට ලැබුන වහාම ඔව්හු ගොඩනැගිම සඳහා නැවත හැරි ගියහ : නෙහෙමියා 4 : 15

ඔවුන් හට ගොඩනැගිමේ කාර්යයෙහි තවදුරටත් යෙදෙනු හැකි වන ලෙසට වැඩෙහි යෙදිමට සහ රැකවල් කිරිම සඳහා නෙහෙමියා නව සැලැසුමක් යෙදිය : නෙහෙමියා 4 : 16 - 23

**ප්‍රතිඵල :**

ඔව්හු දින 52 තුලදි නිම කලහ : නෙහෙමියා 6 : 15

ජනයා දෙවියන් වහන්සේට ප්‍රශංසා කලහ : නෙහෙමියා 12 : 27 - 29, 31 - 42

ජනයා තමන්වම සහ නගරය පවිත්‍ර කලහ : නෙහෙමියා 12 : 30

ඔව්හු දෙවියන්වහන්සේට පුජා ඔප්පු කලහ : නෙහෙමියා 12 : 43

ඊශ්‍රායෙල්හි සතුරන් මෙම ජයග්‍රහණය දැකිමෙන් සහ ප්‍රිතිඝෝෂා පවත්වනු ඇසිමෙන්, ඔවුන්ට තමන්ගේ විශ්වාසය හින විය : නෙහෙමියා 6 : 16

**ධර්මය පිළිබඳ වැරදි**

**විසඳිය යුතු ප්‍රශ්ණය :**

අන්තියෝකියේදි ඇතැම් මිනිසුන් මිත්‍ය ධර්මයන් උගන්වමින් සිටියහ : ක්‍රියා 15 : 1

පාවුල්ට සහ බර්ණබස්ට ගැටළුව විසඳිය නොහැකි විය : ක්‍රියා 15 : 2

**විසඳුම :**

ජෙරුසලමෙහි ප්‍රේරිතයින් සහ වැඩිමහල්ලන් වෙතින් මාර්ගෝපදේශණය ලබා ගැනිමට අන්තියෝකියේ සභාව තිරණය කලේය : ක්‍රියා 15 : 2 - 3

අන්‍ය ජාතිකයින් විශ්වාසය මාර්ගයෙන් පමණක් ධර්මය වෙත හරවා ගන්නා ලද ආකාරය අන්තියෝකියේ නියෝජිතයින් විසින් වාර්ථා කරනු ලැබිය : ක්‍රියා 15 : 4

ප්‍රේරිතයන්ද වැඩිමහල්ලන්ද මෙම කාරණය සාකච්ජා කිරිම සඳහා රහසිගත සභාවාරයක් පැවැත්වුහ : ක්‍රියා 15 : 6

කොර්නේලියස් සහ ඔහුගේ නිවසේ වැසියන් සඳහා දෙවියන්වහන්සේ විසින් සිදුකරන ලද දෙය පේත්‍රුස් ජනයාට සිහිපත් කලේය : ක්‍රියා 15 : 7 ජ 11

පාවුල් සහ බර්නබස් තමන් මාර්ගයෙන් දෙවියන්වහන්සේ අන්‍ය ජාතීන් අතරෙහි සිදු කළ දේ පිළිබඳ නියත සාක්ෂි ලබා දුන්හ : ක්‍රියා 15 : 12

අන්‍ය ජාතීන් දෙවියන්වහන්සේ වෙත හැරෙන බව පරණ ගිවිසුමේ අනාගතවක්තෘවරුන් පැවසූ ආකාරය යාකොබ් සිහිපත් කළේය : ක්‍රියා 15 :13 - 18

ගැටළුව සඳහා විසඳුමක් යාකොබ් යෝජනා කළේය : ක්‍රියා 15 : 19 - 21

ප්‍රේරිතයන්ද. වැඩිමහල්ලන් සහ මුළු සභාවද යෝජනාවට එකඟ විය : ක්‍රියා 15 : 22

ලිපියක් ලියන ලදි : ක්‍රියා 15 : 22 - 30

යුදස් සහ සිලස් ලිපිය භාරදීම සඳහා තෝරා ගැනින : ක්‍රියා 15 : 22

යුදස් සහ සිලස් ලිපිය එම ලිපිය සහ තවත් පණිවුඩයක් භාර දුන්හ : ක්‍රියා 15 : 30, 32

**ප්‍රතිඵල :**

රැස්වූ පිරිස ප්‍රීතියට පත් වූහ. : ක්‍රියා  15 : 31
යුදස් සහ සිලස් සාමයෙන් යුතුව යෙරුසෙලම වෙත ආපසු යවන ලදහ. : ක්‍රියා 15 : 33
දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් බාධා රහිතව ඉදිරියටද පැවතුනි : ක්‍රියා 15 : 35
ලිපි වල අඩංගු උපදෙස් පාවුල්, සිලස් සහ තිමෝති විසින් අනෙකුත් නව සභාවන් වෙත භාරදෙන ලදි : ක්‍රියා 16 : 4 - 5

## ජනතාව විනිශ්චය කිරීම

**ගැටළුව :**

සෙනග තමන්ගේ ගැටළු විසඳා ගැනීම සඳහා උදය පටන් සවස දක්වා මෝසස් අවට සිටියහ: නික්මයාම 18:13

මෝසස් සියළු දෙය තමන් විසින්ම පමණක් ඉටු කිරීමට උත්සහ කලේය : නික්මයාම 18 : 14 - 16

මෙම ක්‍රියාවලිය මෝසස්ට සහ සෙනග යන දෙකටම ගැටළු ඇති කලේය : නික්මයාම 18 : 18

**විසඳුම :**

ප්‍රමුඛතාවන් ස්ථාපනය කරන ලෙස යේත්‍රෝ මෝසස්ට උපදෙස් දුන්නේය : නික්මයාම 18 : 19

පැවරීම සඳහා ඔවුහු සැලසුමක් සකස් කලේය : නික්මයාම 18 : 19 ජ 22

මෝසස් ගැටළුව පිළිබඳව සෙනගට දැනුම් දුන්නේය : ද්විතිය කථාව 1 : 9 - 12

ප්‍රඥාවන්ත මිනිසුන් තෝරා ගන්නා ලෙසට මෝසස් එක් එක් ගෝත්‍රයට උපදෙස් දී ඔහු ඔවුන්ව නායකයින් වශයෙන් පත් කලේය : ද්විතිය කථාව 1 : 13

ඔවුන්ගේ වගකීම් පිළිබඳව මෝසස් ඔවුන් හට සැලකිලිමත් ලෙස උපදෙස් ලබා දුන්නේය: නික්මයාම 1:16-18

**ප්‍රතිඵල :**

නායකත්වයේ වගකීම් පිළිබඳව මෝසස් හට උපකාරී විය : නික්මයාම 18:22
තම නායකත්වය තුල ඇති අභියෝගයන් දරා සිටීමට මෝසස් හට හැකියාව ඇති විය : නික්මයාම 18:23

**නොසලකා හරින ලද වැන්දඹුවන්**

**ප්‍රශ්නය :**

ගෝලයින් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවෙමින් පැවැති අතර, එවන් වර්ධනයක් සමගින් ප්‍රජා ක්‍රමය කෙරෙහි පීඩනයක් ඇති කෙරින. ඇතැම් වැන්දඹුවන් නොසලකනු ලද නිසා ඔවුන් පැමිනිලි කිරීමට පටන් ගත්හ: ක්‍රියා 6:1

ප්‍රේරිතයින් මෙම ගැටළුව පිළිබඳ කරුනු කෙරෙහි යොමු වු හෙයින් ඔවුන්ගේ මූලික වගකිම වන්නාවු දෙවියන්වහන්සේගේ වචනය ඉගැන්වීම අතපසු කිරීමට ඔවුන්ට සිදුවිය : ක්‍රියා 6 : 2

**විසඳුම :**

සියළුම ඇදහිලිවතුන්ගේ රැස්වීමක් කැඳවනු ලැබීය : ක්‍රියා 6 : 2

ප්‍රේරිතයන් 12 දෙනාගේ ප්‍රධාන කාර්ය්‍ය වන යාච්ඤාව සහ සභාවේ වචනය පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදහ : ක්‍රියා 6 : 3 - 4

පවතින්නාවු අවශ්‍යතා පිළිබඳව කටයුතු කිරීම සඳහා සුදුසුකම් සහිත මිනිසුන් හත් දෙනෙකු තෝරා ගන්නා ලෙස ජනතාවට දන්වනු ලැබීන : ක්‍රියා 6 : 3

ජනයා මිනිසුන් හත් දෙනෙකු තෝරා ගත්හ : ක්‍රියා 6 : 5

ප්‍රේරිතයන් යාච්ඤාව මගින් සහ අත් තැබීමෙන් ඔවුන්ගේ තේරීම තහවුරු කලහ : ක්‍රියා 6 : 6

**ප්‍රතිඵලය :**

ජනයාගේ අවශ්‍යතාවන් ලබා දෙන ලද අතර එක්සත්කම යළිත් ඇති කරන ලදි. සිය මූලික කාර්ය්‍යයන් ඉටු කිරීමට ප්‍රේරිතයන් හට හැකියාව ඇති විය : ක්‍රියා 6 : 7

# අට වන පරිච්ඡේදය

## තිරණ ගැනිම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසු පහත සඳහාන් දෑ ඔබට හැකිවනු ඇත. :

- ප්‍රධාන වාක්‍යය මතකයෙන් ලිවීම.
- තිරණ ගැනිම සම්බන්ධයෙන් බයිබලයානු කුල ප්‍රවේශය විස්තර කිරිම
- තිරණ ගැනිම සඳහා වන්නාවු මෙහෙයුම් ( ප්‍රතිපත්තින් ) සමාලෝචනය කිරිම.
- ආකෘතියක අදහස විස්තර කිරිම
- තිරණ ගැනිම කෙරෙහි ආකෘතියක වටිනාකම පැහැදිලි කිරිම
- තිරණ ගැනිම සඳහා බයිබලයානු කුල ආකෘතියක් පාවිච්චි කිරිම

**ප්‍රධාන වාක්‍ය :**

> **මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමු කරවයි. එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමින්වහන්සේය. (හිතෝපදේශ 16 : 9)**

### හැදින්වීම

තිරණ ගැනිම යනු නායකයින් දිනපතා මුහුණ පාන අපහසු කාර්‍යයකි. සෑම තිරණයක්ම වැදගත් වන්නේ මන්ද යත්, කාලයක් පුරාවට කුඩා කරුණු පිලිබඳ ගනු ලබන තිරණයන් ඔබගේ මුළු ජිවිතයට සහ සභාව කෙරෙහි බලපාන්නේය.

තිරණයක් යනු තෝරාගැනිමකි. ජිවිත අවශ්‍යතාවයන් සඳහා ඔබ පිළිතුරු සෙවිය යුතු වන අතර ඒ පිළිබඳව ඔබ ගත යුතු ක්‍රියා මාර්ග තිරණය කල යුතුය. තිරණයන් දෛවය නිශ්චය කරයි. නායකයකු විසින් ගනු ලබන තිරණ ඔහුගේ දෛවය කෙරෙහි පමණක් නොව, ඔහුගේ අනුගාමිකයින්ගේ දෛවය කෙරෙහිද අනිසි බලපෑම් ඇති කරනු ඇත.

ජිවිතය යනු තෝරාගැනිම් සහ තිරණයන් ගෙන් යුතු නොනිම්. අනුක්‍රමිකයකි. තිරණ ගැනිම යනු වගකිමකි. තිරණයක් ගැනිම ප්‍රතික්ෂේප කිරිම පවා තිරණයකි. මෙම පාඩම යහපත් තිරණ ගැනිම සහ  තිරණ ගැනිම සඳහා බයිබලයානුකුල ආකෘතියක් සඳහා මාර්ගෝපදේශණය ඉදිරිපත් කරයි.

### බයිබලයානුකුල ප්‍රවේශය

තිරණ ගැනිම පිළිබඳව බයිබලයානුකුල ප්‍රවේශය වන්නේ ජනතාව විසින් ඡන්දය පාවිච්චි කිරිම මගින් සිදු කිරිම නොවේ. එය ප්‍රජාතාන්ත්‍රිය පිවිසුම හෙවත් “ බහුතර පාලනය ” නොවේ. මෙම ප්‍රවේශයෙහි ගැටළු සම්බන්ධයෙන් කානාන් තිරයේ ඊශ්‍රායෙල්වරු පිලිබඳ කථාවෙහි පැහැදිලිකර ඇත. (ගණන් කථාව 13 බලන්න.)

සභාවෙහි ප්‍රජාත්‍රන්ත ක්‍රියාවලිය කෙරෙන් එකගතාවය, නිත්‍යානුකුල බව සහ තරගකාරිත්වය මතුකරවයි. නියෝග, ඉල්ලිම් සහ ඡන්ද පිළිබඳ නියමයන් මගින් ශුද්ධාත්මයාණන්ගේ හෙළිකිරිම් සිමා කරවයි.

නිරන්තරයෙන් පාහේ ඡන්දය විමසීමෙහි ප්‍රතිඵලය වන්නේ විරසක හැඟීම්, කෝපය සහ සභාවේ බෙදීම් ඇතිවීමය. සභාව වෙනුවෙන් තීරණ ගැනීම සඳහා වන්නාවූ බයිබලයානුකූල ක්‍රමවේදයන් මේවා නොවේ. ඒවා සභාව විසින් ලෝකයේ ප්‍රජාතාන්ත්‍රිය රාජ්‍ය පාලන රාටාවන් කෙරෙන් සභාව විසින් උකහා ගනු ලැබ ඇති ක්‍රම වේදයන් වෙති.

ක්‍රියා 15 පරිච්ඡේදය තීරණ ගැනීම සඳහා බයිබලයානු කූල පිළිසුම සඳහා වන්නාවූ විශිෂ්ඨ උදාහරණයයි. යුදාවේ චාරිත්‍ර පිලිබඳ ගැටළුවක් කෙරෙහි බයිබලයානුකූල ප්‍රවේශය හා සම්බන්ධයෙන් මෙම උදාහරණය අදාල වේ. එය නිරාකරණය කිරීම සඳහා, නායකයින් මුණගැසී, යාත්‍රාකර, යථා කරුණු පරීක්ෂාකර බලා, ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම යටතේ එකගත්වයකට පැමිණියහ.

තීරණ ගැනීම සඳහා දෙවියන්වහන්සේ සභාව තුල නායකයින් පිහිටුවති. මෙම වගකීම ක්‍රියාත්මක කිරීම සඳහා උන්වහන්සේ ඔවුන් හට ප්‍රඥාව ලබාදෙන්නාහ. තීරණයක් ගැනීමට සිදු වී ඇති විටකදී නායකයින් එක්ව රැස්විය යුතුය. යාච්ඤා කල යුතුය. සිද්ධි කාරනා පිරික්ෂා කර බැලිය යුතු අතර, තවද ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම යටතේ එකගත්වයකට එළඹිය යුතුයි.

## තීරණ ගැනීම සඳහා උපදේශණ

යහපත් තීරණ ගැනීම සඳහා නායකයින් හට සහයවීම සඳහා වූ උපදේශණ කිහිපයක් මෙසේය.

### 1. ගැටළුව හදුනා ගන්න :

තීරණයක් අවශ්‍ය වන්නාවූ වාදයට හේතු කාරකය ගැටළුව හෝ ප්‍රශ්ණය කුමක්ද ? එම කාරණය හා අදාලව තිබෙන සියළු තොරතුරු එක්රැස් කරන්න. කෙටි ලිඛිත නිවේදනයක ගැටළුව සඳහන් කරන්න ඔබ නිවැරදි ගැටළුව හදුනා නොගෙන ඇත්නම් නිවැරදි තීරණය වෙත එළඹීමට ඔබට නොහැකි වේ.

### 2. තීරණ ගැනීම සඳහා ආකෘතියක් අනුගමනය කරන්න :

ආකෘතියක් යනු කිසියම් දෙයන ආදර්ශයකි. තීරණ ගැනීමේදී අනුගමනය කිරීම සඳහා වූ ආදර්ශයක් තීරණ ගැනීමේ ආකෘතියක් මගින් සපයා දෙයි. දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ නැණවත් තෝරාගැනීම් කිරීම පිණිස ඔබට උපකාරී වන බයිබලයානුකූල ආකෘතියක් මීලග පිටුවෙහි ඇත. ආකෘතිය දෙස බලන්න. අනතුරුව එයට පසුව එන පැහැදිලි කිරීම කියවන්න.

## තිරණ ගැනිම සඳහා බයිබලයානුකූල ආකෘතියකි

මගපෙන්වීම අපේක්ෂිත කෙරෙන ගැටළුව, ප්‍රශ්ණය හෝ ජීවන අවස්ථාව හඳුනා ගන්න.

↓

ඒ පිළිබඳව අදාලව ඇත්තේ ශුද්ධ වු ලියවිල්ලෙහි සුවිශේෂී අඥාවක්, සාමන්‍ය මුලධර්ම හෝ නිදර්ශණයක් මගින්ද ?

**ඔව්**

පළමු තීරුව

- බයිබලයානුකූල ආඥාව, මුලධර්මය, හෝ උදාහරණ මත පදනම්ව තිරණයක් ගන්න.

නැත

දෙවන තීරුව

- එය සැක කටයුතු පුරුද්දකි ?
- මෙම ප්‍රශ්ණ පිළිබඳ පිළිතුර මත පදනම්ව තිරණයක් ගන්න
- එයින් දෙවියන්වහන්සේට ප්‍රශංසාව ලැබේද?
- ඔබගේ පෙළඹවීම කුමක්ද?
- එය අවශ්‍ය වන්නේද?
- එය ආත්මීය වර්ධනය වඩවනු ඇත්ද?
- එය පුරුද්දෙහි වහලෙකු කරවන්නක්ද?
- එය දෙක්ෂයෙහි ගිවිස ගැනිමක්ද?
- එය වරදෙහි බැදීමට හේතුවිය හැකිද?
- එය පාපයෙහි ලක්ෂන පෙන්නුම් කරන්නේද?
- එය ඔබගේ හෘද සාක්ෂිය කෙලෙසන්නේද?
- එය අන් අය කෙරෙහි කෙසේ බලපාන්නේද?
- යාච්ඤා කරන්න, අනතුරුව තිරණයක් කරන්න.

**සාමයේ විනිශ්චයකරු විමසන්න.**

තෙවන තීරුව

- එය ජිවිතයේ අවස්ථාවක්ද ?
- මෙම පියවර සමග ඉදිරියට යන්න
- යාච්ඤා කරන්න,
- දේව වචනය හදාරන්න
- ශුද්ධාත්මයාණන්ගේ හඬට, කන් යොමුකරමින් ආශ්චර්යමත් මගපෙන්වීමට සවන් දෙන්න.
- ක්‍රිස්තියානි උපදෙස් ලබා ගන්න
- ස්වභාවය තොරතුරු විභාගකර බලන්න.
- මගපෙන්වීම උදෙසා බයිබලයානු කුල මාර්ගයන් පාවිච්චි කරන්න.
- තිරණය කරන්න.

**සාමයේ විනිශ්චයකරු විමසන්න.**

**ඔබ වෙත සාමය නොමැත්තේ නම්, ආකෘතිය ප්‍රයෝජනයට ගනිමින් ස්වාමින්වහන්සේගේ අභිමුඛය සොයන්න**

**ආකෘතිය පාවිච්චි කිරීම :**

තීරණ ගැනීමේ ආකෘතියේ ප්‍රථම පියවර වන්නේ මගපෙන්වීම, බලාපොරොත්තුවන ගැටළුව, ප්‍රශ්ණය හෝ ජීවන පැවැත්ම හඳුනා ගැනීමයි. අනතුරුව ගැටළුව අදාල වන්නේ දේව පනත්, උදාහරණ හෝ සාමාන්‍ය ප්‍රතිපත්ති හා සමගින් ද යනු නිශ්චය කිරීම සඳහා ලිඛිත දේව වාක්‍ය විමසා බලන්න. බොහෝ තීරණයන් සඳහා විශේෂයෙන් හරි සහ වැරදි පිළිබඳ කාරණා සම්බන්ධයෙන් මගපෙන්වීම බයිබලයෙහි සපයා දී ඇත.

**ඔව් :**

පිළිතුර "ඔව්" වේ නම්, එම ගැටළුව දෙවියන්වහන්සේගේ ලිඛිත වාක්‍යයෙහි විමසීමට භාජනය කර ඇති හෙයින් එවිට ලිඛිත හෙලිදරව් කිරීම මත පදනම්ව තීරණය ගන්න. (ආකෘතියේ පළමු තීරුව බලන්න.) ඔබගේ තීරණයේ ශුද්ධ වු ලියවිල්ල හා අනුකූල බවට සහතික වන්න.

**නැත :**

පිළිතුර " නැත " වේ නම්, එවිට " නැත " යන වචනය යටින් වු තීරණ ගැනීමේ ආකෘතිය මත ඉදිරි පියවර ගන්න. බයිබලයේ සාකච්ජා කර නොමැති අවස්ථාවන් සඳහා ආකෘතිය මත තෝරා ගැනීම් දෙකක් ඇත. තීරණය ගත යුතුව ඇති කරුණ ප්‍රශ්ණකාරී ක්‍රියා පිලිවෙතක් හෝ සත්‍ය ජීවන පැවතුම් ක්‍රමයක් හා අදාල වන්නේදැයි ඔබ නිශ්චය කල යුතු වේ.

ප්‍රශ්ණකාරී ක්‍රියා පිලිවෙතක් :

ප්‍රශ්ණකාරී ක්‍රියා පිළිවෙත යනු නිවැරදිය හෝ වැරදිය වශයෙන් ශුද්ධ වු ලියවිල්ලෙහි නිශ්චිත ලෙෂ හඳුන්වනු ලැබ නොමැති වු කිසියම් දෙයකි. එය කිසියම් විනෝදාංශයක් හෙවත් විවේකී අවස්ථා ගත කිරීමේ ක්‍රියා කලාපයක් විනෝදාංශයක් හෙවත් විවේකී අවස්ථා ගත කිරීමේ ක්‍රියා කලාපයක්, පුරුද්දක්, ආහාර පාන හෝ ඇඳුම් විලාසිතාවක්, අදාල විය හැකිය.

ඔබගේ තීරණය අදාල වන්නේ ක්‍රියා පිළිවෙතක් සමග වේ නම්, ආකෘතියේ දෙවෙනි තීරුව යටතේ ලැයිස්තුගත කරුති ප්‍රශ්ණ ඔබම අසා බලන්න. ඔබ මෙම එක් එක් ප්‍රශ්ණයට පිළිතුරු සැපයීමේ සහ යාච්ඤා කිරීමෙන් පසු ආකෘතියේ ප්‍රශ්ණ සඳහා ඔබගේ පිළිතුරු පදනම් කර ගනිමින් තීරණය ගන්න.

ජීවන පැවැත්මෙහි අවස්ථාව :

ජීවන පැවැත්ම පිළිබඳ අවස්ථාවක් යනු ඔබගේ ජීවිතය කෙරෙහි බලපැවැත්මක් ඇති කල හැකි ප්‍රධාන අවස්ථාවකි. විවාහය හා අදාල තීරණ, සහාව, ජීවන වෘත්තිය, නවාතැන, දෙවස්ථානයක් තෝරා ගැනීම, ආදි විවිධ කරුණු එහි අන්තර්ගත විය හැකි නමුදු, ඒවා කෙරෙහි පමණක් සීමාවන්නේ නොවේ. ජීවන කැමැත්ත පිළිබඳ අවස්ථාවන් සඳහා තුන්වන තීරුව ප්‍රයෝජනයට ගන්න. ප්‍රථමයෙන් තීරණය පිළිබඳව යාච්ඤා කරන්න. ඔබගේ ජීවිතය තුල දෙවියන්වහන්සේගේ අභිප්‍රාය සිද්ධකරන මෙන් ඉල්ලන්න. නිවැරදි තීරණ කිරීම සඳහා ඥානය දෙන මෙන් උන්වහන්සේට පවසන්න. ඔබ හා එක්ව යාච්ඤා කරන මෙන් අනිකුත් අයගෙන් ඉල්ලන්න. ශුද්ධ ලියවිල්ල අධ්‍යනය කර ලිඛිත දේව වචනයේ ඇතුලත් මගපෙන්වීම සඳහා වු ප්‍රතිඥාවන් ඉල්ලා සිටින්න.

දෙවියන්වහන්සේ ඔබ වෙත ලබා දිමට කැමති වෙත්නම් ස්වර්ගික හෙළිදරව් කිරීම පිළිබඳ කෘතඥතාවය පිරිනමන්න. තමන් වහන්සේගේ කැමැත්ත හෙලිකිරීමට සහ තිරණ ගැනිම සඳහා ඔවුන්ට උපකාර කිරීමට දෙවියන්වහන්සේ ස්වර්ගික හෙලිදරව් කිරීම් මිනිසුන් වෙත ප්‍රකාශ කිරීමේ මාර්ග කිහිපයක් ඇත. දර්ශණය වීම්, අනාගතවාක්‍ය, සිහින, සුරදූතයින්, සහ ඇතුලාන්ත හඬ වැනි ක්‍රම මේවායේ අන්තර්ගත වේ.

එහෙත් එවන් ස්වර්ගිය ප්‍රකාශ වීමක් සාමන්‍ය සිද්ධියකට වඩා කලාතුරකින් සිදුවන්නක් වේ. ඇදහිලිවන්තයාගේ ජිවිතය තුල ශුද්ධාත්මයාණන් වහන්සේ වාසය කිරීමේ එක් අරමුණක් වන්නේ :

> **එසේ වී නුමුත් උන්වහන්සේ එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල උන්වහන්සේ මුළු සත්‍ය කරා නුඹලාට මගපෙන්වන සේක. මක්නිසාද උන්වහන්සේ තමාගෙන් උපදවා කථා නොකර උන්වහන්සේ අසන දේ කියා පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශ කරන සේක. (යොහාන් 16:13)**

ස්වාමින්වහන්සේ බොහෝ විට මේ ආකාරයට මගපෙන්වන්නාහ. ස්වර්ගිය හෙළිකිරීම දෙන ලද්දේ නම් දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. එහෙත් සැම විටම සිහි තබා ගන්න .... කිසිදු සිහිනයක්, දර්ශණයක්, අනාගතවාක්‍යක්, හෝ වෙනත් එළිදරව් කිරීමක් උන්වහන්සේගේ ලිඛිත වාක්‍ය සමග ගැටේ නම් එය දෙවියන්වහන්සේගේ නොවන්නේය.

තිරණ ගැනිම සඳහා ඉවහල් වන්නාවූ තවත් බයිබලයානුකූල ක්‍රමයක් වන්නේ ක්‍රිස්තියානි උපදේශණයයි. ආත්මික නායකයින් වෙතින් වූ නැණැති උපදේශණය වැදගත් වන්නේ :

> **ඥානවන්ත පාලනයක් නැති විට සෙනග වැටෙති. එහෙත් මන්ත්‍රිවරු රාශියක් කරණ කොටගෙන ආරක්ෂාව ඇත්තේය. ( හිතෝපදේශ 11 : 14 )**

> **මෝඩයාගේ මාර්ගය තමාගේ ඇස්වලට නම් හරිව පෙනෙන්නේය. එහෙත් ඥානවන්තයා දැනමිතිකම් අසන්නේය. ( හිතෝපදේශ 12 : 15 )**

තිරණය කෙරෙහි බලපාන්නාවූ භාහිර තත්වයන්ද ඔබ විග්‍රහ කර බැලිය යුතු වන අතර, මගපෙන්වීම සඳහා (හිතෝපදේශ 3 : 5 - 6) සපයා ඇති බයිබලයානුකූල සූත්‍ර ප්‍රයෝජනයට ගත යුතුය.

## 3. විවිධ විකල්පයන් හඳුනා ගන්න

තිරණ ගැනිම සඳහා වූ ආකෘතිය අනුව ඔබ කටයුතු කරන කල ඔබ මුහුණ පාන්නාවූ ගැටළුව සඳහා වෙනත් විවිධ විසඳුම් ඔබට හමුවනු ඇත. විවිධ විකල්පයන් හඳුනා ගෙන පහත සඳහන් පදනම මත කල හැකි සැම විසඳුමක්ම තක්සේරු කර බලන්න.

**අවධානම :**
සාමන්‍ය අවබෝධය සහ යථාර්තය සමග විශ්වාසය තුලනය කරන්න. එක් එක් සුදුසු විසඳුම පිළිබඳ හිතකර අහිතකර බාවයන් ගණනය කර බලන්න. බාහිර තත්වයන් සඳහා සම්පූර්ණයෙන් විවෘත වීම සහ සම්වෘත්තවීම ඔබගේ තිරණය කෙරෙහි බලපෑ හැක.

**සම්පත් :**
කිසියම් විසඳුමක් සපුරාලීම සඳහා අවශ්‍ය සම්පත් ඔබට තිබේ. කිසිදු තිරණයක් එය ක්‍රියාත්මක කල යුතු පුද්ගලයින් තරමට වටින්නේ නැත. අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන් ඔබ සතුව නොමැත්තේනම්, හෝ එය

සැපයිමට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි නම් කිසිදු තීරණයක් ක්‍රියාත්මක නොවනු ඇත.

**ප්‍රතිඵල :**
අවට පරීක්ෂමයෙන් විශාලතම ප්‍රතිඵල දෙනුයේ කිනම් විසඳුමද ? අපහසු මගින් කිසිවක් කිරීමේ හේතුවක් නැත. එම ප්‍රතිඵලයම ලබා ගැනීම සඳහා පහසු මගක් වේ නම් එය තෝරාගන්න. (දෙවියන්වහන්සේ වෙනත් ආකාරයකින් එළිදරව් නොකරන්නේ නම්)

**4. ඉතා සුදුසු විසඳුම තෝරා ගන්න :**

ඔබට හැකි සියළුම විසඳුම් පරීක්ෂා කළ පසු, ඉතා සුදුසු දෙය තෝරාගන්න. ඔබට මාර්ගෝපදේශකත්වය දෙන මෙන් ඔබ දෙවියන්වහන්සේගෙන් අයැද ඇත, එහෙයින් උන්වහන්සේ එසේ කරන බව විශ්වාස කරන්න. සාමන්‍යයෙන් ඔබ තෝරාගත යුතු වනුයේ අවදානම, විය පැහැදැම් ආදිය සහ ප්‍රතිඵල ආදිය හා අනුව වඩාත් සුදුසුවන විසඳුමයි.

අප “ සාමන්‍යයෙන් ” යැයි පවසන්නේ, ඇතැම් විට දෙවියන්වහන්සේ මෙහෙයවන ආකාරය ස්වාභාවික සැලකීමේදි ඉතා හොඳම ක්‍රමය ලෙස නොපෙනිය හැකි නිසාය. ඇතැම් විට උන්වහන්සේගේ සැලැසුම ඉතාම හොඳම දෙය නොවන බවක් සාමාන්‍ය බුද්ධියට පෙනී යා හැකි නිසාය. එහෙයින් මේ පිළිබඳව විවෘත මනසකින් පසුවන්න.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය තුලින් හෝ දිව්‍යමය හෙළිදරව් කිරීමක් මගින් එක එල්ලේ ඔබට අමතන්නේ නම්, හැර සෑම තීරණයක් තුලම කිසියම් ප්‍රමාණයක අවදානමක් වේ. වැරදි තීරණය ගැනීමට බිය නොවන්න. බොහෝ වැරදි නිගමනයන් නිවරදි කල හැකිය.

ශුද්ධාත්මයාණන් ඔබගේ තීරණයන් කෙරෙහි මගපෙන්වන බව සිහි තබා ගන්න :

> **මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමුකරවයි. එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමින්වහන්සේය. (හිතෝපදේශ 16 : 9)**

ඔබ තීරණයක් ගැනීමේදි ඔබගේ අධ්‍යාත්මයෙහි සාමය නොමැති නම්, ආකෘතියෙහි දැක්වෙන පියවරයන් අනුව ස්වාමින්වහන්සේ වෙතින් නොකඩවා ඉල්ලා සිටින්න. ශුද්ධාත්මයාණන් නිවැරදි තීරණ තහවුරු කරන එක් මාර්ගයක් වන්නේ ඇතුලාන්තයේ සාමයයි. ඔබගේ තේරීම තහවුරු කරමින් දෙවියන්වහන්සේගේ සමාදානය සතුවන තෙක් අවසාන තීරණය නොකරන්න.

**5. තීරණය අන් අය වෙත පවසන්න :**

ඔබ විසින් ගනු ලැබූ තීරණය ජනතාව හට දැන ගැනීමට සලසන්න. ඒ මත ක්‍රියා කිරීමට පෙර එය පැහැදිලි ලෙස ප්‍රකාශ කරන්න.

**6. තීරණය ක්‍රියාත්මක කරන්න :**

තීරණ ගැනීමෙන් පසු, එය ක්‍රියාත්මක කර (එය ක්‍රියාවෙහි යොදන්න.) ඉන්පසු වෙනත් දෙයක් කෙරෙහි යොමුවන්න. පසුගිය තීරණයන් පිළිබඳව පසුතැවීම තුලින් ඔබට සිදුවන යහපතක් නැත. ඒ වෙනුවට, කිසියම් කාල පරාසයකට පසු තීරණය විශ්ලේෂණය කර බලන්න.

## 7. තිරණය විශ්ලේෂණය කිරිම :

ඔබ ගත් තිරණය විශ්ලේෂනය කරන්න. එය අදාල ගැටළුව නිරාකරනය කලේද? එය යහපත් තීරනයක්ද? දෙවියන්වහන්සේ එයට ආශිර්වාද කරන සේක්ද? කිසියම් වෙනසක් කිරිමට ඔබට අවශ්‍යවේද? අවශ්‍යවන්නේ නම් බොහෝ තිරණ වෙනස් කල හැක. බොහෝ තිරණ වඩා යහපත් බවට පත්කල හැක. ශුද්ධාත්මයාණන් හසුරුවන අයුරින් වෙනස්කම් සිදුකිරිම සඳහා නම්‍යශිලිව විවෘත වන්න.

## අවධානය සඳහා අවසන් වචනයක්

ඔබ කෝපව, සිත් අවුලින් යුතුව හෝ බලපෑම් යටතේ පසුවන කිසිදු අවස්ථාවක තීරණයක් නොගන්න. අනිසි හදිසියෙන් යුතුව තීරණ නොගන්න. යතා කරුණු කලට සවන් දීම සඳහා කාලය යොදන්න. බොහෝ තීරණයන් කඩිනමින් කල යුතු දේවල් නොවේ. සන්ත්‍රාසය සහ හදිසිය වෙත තල්ලු කරනුයේ සාතන්ය. ශුද්ධාත්මයාණන් මගපෙන්වනුයේ ශාන්ත ලෙසය. තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිදි කිසිදු විටකදි ඉක්මන් නොවන්න :

**ස්වාමීන් කෙරෙහි බලා සිටුව, ශක්තිමත් වෙව, තාගේ සිත ධෛර්මත් වේවා, එසේය, ස්වාමීන් කෙරෙහි බලා සිටුව (ගීතාවලිය 27 : 14)**

**මගේ ආත්මය, ස්වාමීන්වහන්සේ කෙරෙහි පමණක් බලාසිටුව, මක්නිසාද මාගේ බලාපොරොත්තුව උන්වහන්සේ කෙරෙන්ය. (ගීතාවලිය 37 : 7)**

**ස්වාමීන් කෙරෙහි රඳා, ඉවසිල්ලෙන් උන්වහන්සේ බලා සිටුව ... (ගීතාවලිය 37 9 7)**

**නුමුත් ස්වාමීන්වහන්සේ ගැන බලාසිටින්නෝ තමුන්ගේ සවිය අලුත්කර ගන්නෝය, ඔවුහු රාජාලීන් මෙන් පියාඹා නගින්නෝය, ඔවුහු දුවන්නෝය, එහෙත් වෙහෙස නොවෙති, ඔවුහු ඇවිදින්නෝය, එහෙත් කලාන්ත නොවෙති. (යෙසායා 40 : 31)**

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන වාක්‍ය මතකයෙන් ලියන්න

-------------------------------------------------------------------------------------------------------------

-------------------------------------------------------------------------------------------------------------

2. තීරණ ගැනීම පිළිබඳ බයිබලයානුකූල ප්‍රවේශය කුමක්ද ? එය ජන්දය සහ බහු පාලනයද ?

3. තීරණ ගැනීම පිලිබදව මෙම පාඩමෙහි දි ඇති මාර්ගෝපදේශක නියමයන් හත සාරාංශ කරන්න

-------------------------------------------------------------------------------------------------------------

-------------------------------------------------------------------------------------------------------------

-------------------------------------------------------------------------------------------------------------

-------------------------------------------------------------------------------------------------------------

-------------------------------------------------------------------------------------------------------------

-------------------------------------------------------------------------------------------------------------

4. තීරණ ගැනීම සදහා වු ආකෘතිය යනු කුමක්ද ?

-------------------------------------------------------------------------------------------------------------

5. ආකෘතියක අදහස කුමන්ද ?

(මෙම ප්‍රශ්ණ වලට පිලිතුරු මෙම සංග්‍රහයේ අවසාන පරිච්ජේදයෙහි දැක්වේ)

**වැඩිදුර අධ්‍යනය සඳහා**

1. ආදර්ශ ගැටළුවක් සහ තීරණය මෙසේය.

**ගැටළුව :**

ප්‍රමාණවත් කරමින් ඉරුදින දහම් පාසල් ගුරුවරුන් නැත. අනුප්‍රාප්තියකින් ලෙස ක්‍රියා කිරීමට කැමැත්තේ පුද්ගලයින් කිහිප දෙනෙකුන් පමණකි. කීප අවසන්ථාවන්හිදි පන්ති ඒකාබද්ධ කර ඇත. පැමිණීම අඩුවෙමින් පවති.

**ගත හැකි ක්‍රියා මාර්ග :**

1. ස්වෙච්ජා ගුරුවරුන්ට ආයාචනය කරන්න.
2. තව වැඩිපුර පන්ති ඒකා බද්ධ කරන්න.
3. නව ගුරුවරුන් පුහුණු කිරීම සඳහා පුහුණු වැඩසටහනක් අරඹන්න.

**තීරණයන් විග්‍රහකර බැලිම :**

1. ස්වෙච්ජා ගුරුවරුන් සඳහා ආයාචනය කිරීමෙන් ඉගැන්වීම සඳහා වැඩි පුද්ගල සංඛ්‍යාවක් ලැබෙනු ඇත. නුමුත් මෙම අයවළුන් නිසි පරිදි පුහුණු කරණු ලැබ ඇති අය විය හැකිද ?

2. වැඩිපුර පන්ති ඒකාබද්ධ කිරීමෙන් ගුරු හිගය පිළිබඳ ගැටළුව නිරාකරණය විය හැක. එහෙත් එවන් විශාල පන්ති වලදි ශිෂ්‍යයින් හට පෞද්ගලික අවධානය ලැබේවිද ? කුඩා කණ්ඩ සබඳතාවයන්හි ගුණාත්මක බව නැතිවියේද ?

3. පුහුණු වැඩසටහනක් මගින් අනුප්‍රාප්තිකයින් ලෙස ක්‍රියා කිරීමට හෝ පන්ති භාර ගැනිමට සුදානම් නව ගුරුවරුන් සැපයෙනු ඇත.

**ඉතා උචිත තීරණය තෝරා ගැනිම :**

3 වන තෝරාගැනිම ඉතාම උචිත දෙයයි. පුහුනු වැඩසටහනක් මගින් ඉගැනිවීම සඳහා නිසි ලෙස සුදානම් කෙරුණ නව ගුරුවරුන්ගේ අඛන්ඩ ප්‍රභවයක් සැපයෙනු ඇත. ප්‍රථම ගුරු කාණ්ඩය පුහුණු කෙරෙන තෙක් 1 වන තේරීම (ස්වෙච්ජා ගුරුවරු) සහ 2 වන තේරීම (පන්ති ඒකාබද්ධ කිරීම) ඔබට ප්‍රයෝජනයට ගත හැක.

**ඇගයිම :**

1. තෙමසකින් පසු, තීරණය පිළිබඳ ඇගැයිමක් කරන්න. පුහුණු වැඩසටහන ගුරු හිගය පිළිබඳ ගැටළුව නිරාකරණය කරන්නේද ?

2. ඔබ මුහුණ දි ඇති තීරණයක් පිළිබඳව සිත යොමු කරන්න. නිසි තේරීම කිරීම පිණිස මෙම අභ්‍යාසයෙහි ඔබ ඉගෙනගත් මුලධර්මයන් යොදා ගන්න.

3. බයිබලය යනු දෙවියන්වහන්සේගේ අභිමතය පිළිබඳව නොයෙක් පුද්ගලයින් සහ ජාතින් විසින් ගන්නා ලද තීරණයන් පිළිබඳ ඉතිහාසයයි.

තීරණ ගැනීම සහ දේව අභිමතය පිළිබඳ වැඩිදුර අධ්‍යනය කිරීම සඳහා භාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනය පාඨමාලාව, " දෙවියන්වහන්සේගේ හඬ හඳුනා ගැනීම " ලබා ගන්න.

4. තීරණයක් දීම කෙරෙහි මුහුණ පෑ කල, අනිසි උපදෙස් පිළිගත් රෙහෙබොවම් රජු පිළිබඳව කියවන්න : ( 1 රාජාවලිය 12 : 1 - 19 )

## නව වන පරිච්ඡේදය

### ආරාවුල් සහ හික්මවීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසු පහත සඳහන් දෑ ඔබට හැකිවනු ඇත. :

- ප්‍රධාන වාක්‍යය මතකයෙන් ලිවීම.
- සෑම ආරාවුලක් සඳහා වූ සත්‍ය හේතූන් හඳුනා ගැනීම.
- ආරාවුල් වැලැක්වීමේ මාර්ග සම්පිඩනය කිරීම.
- ආරාවුල් පිළිබඳ ක්‍රියාකිරීම සඳහා මාර්ගෝපදේශන නියමයන් සම්පිඩනය කිරීම.
- හික්මවීම අවශ්‍යවන්නාවූ හේතු මොනවාදැයි හඳුනා ගන්න.
- හික්මවීම පිළිබඳ ශුද්ධ වූ ලියවිල්ලෙහි මූලධර්මයන් සම්පිඩනය කරන්න.

**ප්‍රධාන වාක්‍ය :**

> **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යා සම්පූර්ණව, සියළු යහපත් ක්‍රියා වලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත්, තරවටුවටත්, හික්මවීමටත්, ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3 : 16 - 17)**

### හැඳින්වීම

හත් වන පරිච්ඡේදයේදි ඔබ නායකයින්ගේ කාර්‍යයන් පිළිබඳව උගත්තෙහිය. සෑම නායකයෙකුගේම වැදගත් කාර්‍යයන් දෙකක් වනුයේ හික්මවීමට සැලැස්වීම සහ ආරාවුල් විසඳීමය. ඔබ ජනතාව සමග කටයුතු කරන සහ ඔවුන්ට උපදේශනය කරන සෑම විටකදීම මෙම කාර්‍යයන් අවශ්‍ය කෙරේ. හික්මවීම යනු වැරදි අය නිවැරදි කරවීමයි. ආරාවුලක් යනු සටනක් හෝ කෝලාහලයකි. සිය අනුගාමිකයින් නිවැරදි කිරීමට සහ ඔවුන් අතර වන ගැටළුව විසඳීමට හොඳ නායකයෙකු සමත් විය යුතුය.

### ආරාවුලින් තොර මත භේදය

ආරාවුල් ඇතිකර නොගෙන මිනිසුන් අතර මතභේද පැවැත්විය හැකි නමුදු, බොහෝ විට මතභේදයන්හි ප්‍රතිඵල වශයෙන් ආරාවුල් පැන නගී. රිදවන්නේද, විනාශකරන්නේද මතවාදයන් පිළිබඳ වෙනස්කම් නොවන්නේ නුමුත් අප කෙරෙහි ඒවා පවතින කළ ප්‍රේම කිරීමට අතපසු කිරීම නිසා ඒවා සිදුවේ.

(ක්‍රියා 15:36-41) හි මාර්ක් සම්බන්ධයෙන් පාවුල් සහ බර්නබස් අතර මතභේදයක් විය. මෙම මතභේදය එදිරිවාදිකමක් සහ වෛරයක් කරා යොමු නොවිය. එම ගැටළුව දෙවන ධර්මදූත කණ්ඩායමක් නිර්මාණය කිරීම මගින් විසඳනු ලැබින. මෙම විසඳුම ඇත්ත වශයෙන්ම දේවධර්මය පතුරුවාලීම වර්ධනය කරවිය. පාවුල් සහ බර්ණබස් විරසක වුයේ, කථාබස් කිරීම නැවතුයේ සහ එකිනෙකා අතර සබැඳියාව නිමා කලේ හෝ නැත.

දෙදෙනාගෙන් එක් අයෙකු හෝ " ඔවුන් හට යම් කිසිවකු රිදවූ " හෙයින් ක්‍රිස්තියානි සේවාවෙන් ඉවත් වූයේ නැත. ඔවුන් දෙදෙනාම ස්වාමීන්වහන්සේට සේවය කිරීම නොකඩවා කරගෙන ගියෝය.

මිනිසුන් එකිනෙකා සමග සටන් කරන කල, ඔවුන් සාතන්ට එරෙහිව සටන් වදින්නේ නැත. තමන්වහන්සේගේ රාජ්‍යයෙහි කටයුතු කාර්‍යක්ෂමව කරගෙන යා හැකිවනු සඳහා ආරාවුල් සහ හික්මවීම පිළබඳ කටයුතු කිරීම දෙවියන්වහන්සේ නායකයින් වෙතින් අපේක්ෂා කරාන්නාහ.

**දේව වාක්‍යයේ භූමිකාව**

හික්මවීම පිළිබඳ ගැටළු සහ ආරාවුල් විසදීමේදි වැදගත් කාර්‍යභාරයක් දේව වචනය සතුව ඇත.

> **දෙවියන්වහන්සේ මනුෂ්‍යා සම්පූර්ණව, සියළු යහපත් ක්‍රියාවලට සුදානම්ව සිටින දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ.** (2 තිමෝති 3 : 16 - 17)

දේව වචනයේ පදනම මත අප හික්මවමින් ආරාවුල් විසදන කල, සභාවේ කටයුතු සඳහා මිනිසුන් පරිපූර්ණ වී අවශ්‍ය දේවලින් සම්පාදනය වෙති. දෙවියන්වහන්සේගේ වචනය හික්මවීමටත්, තරවටුවට සහ නිවරදි කිරීමටත් ඵලදායි වන්නේය.

## බයිබලයානුකූල ආකෘතියක්

දේවස්ථානයක්, සංවිධානයක් හෝ දෙවියන්වහන්සේගේ කටයුත්තක් ආරම්භ කල ඕනෑම විටෙකදි එය සංවිධානයක් ඇතැම් වැදගත් අවස්ථාවන් පසු කරයි. මෙම වැදගත් අවස්ථාවන් පිළබඳ නිදර්ශණයක් මෙසේය. ඔබගේ බයිබලයෙහි පහත සඳහන් පරිච්ඡේදයන් කියවන්න.

| | |
|---|---|
| ක්‍රියා 1 | දෙවියන්වහන්සේ ඇතැම් මිනිසුන් තෝරාගත්සේක. |
| ක්‍රියා 2 | උන්වහන්සේ මෙම මිනිසුනට කාර්‍යභාරයක් පැවරිය |
| ක්‍රියා 3 | විශාල වර්ධනයක් ඇති විය. |
| ක්‍රියා 4 | විශාල ව්‍යාපාරයක් හට ගැනින ( සභාව ) |
| ක්‍රියා 5 - 6 | හික්මීම සහ ආරාවුල පැන නැගින. |

ක්‍රියා 1 - 4 දෙවියන්වහන්සේ විශාල කාර්‍යයක් උපත ලැබිය. තවද ක්‍රියා 5 : 1 - 11 විනය ගැටළුවක් පැන නගී. ප්‍රේතෘස් එය නොසලකා නොහරී. එහෙත් එයට මුහුණ පා ඒ පිළිබඳව කටයුතු කරයි. ක්‍රියා 5 : 12 - 42 හි සභාව පිටතින් ආරාවුලක් පැන නගී. ප්‍රේරිතයන් විරුද්ධවාදින්ට මුහුණ පාමින් නිර්භිත ලෙස පවසන්නේ :

> **මනුෂ්‍යයින්ට වඩා දෙවියන්වහන්සේට අප විසින් කීකරු විය යුතුය..... දවස්පතාම, දේවමාලිගාවේදිත්, ගෙදරදිත් ඉගැන්වීමෙන්ද, යේසුස් වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ යැයි දේශනා කිරීමෙන්ද නොනැවතුනේය.** (ක්‍රියා 5 : 29 සහ 42)

ක්‍රියා 1 : 6 හි, සභාව ඇතුලත ආරාවුල් පැන නගී. වැන්දඹුවන් හට අවශ්‍ය සැපයුම් බෙදාහැරීම සම්බන්ධයෙන් වාදයක් ඇති වේ. නැවතද, ප්‍රේරිතයෝ වහාම ආරාවුල නිරවුල් කරති.

“නුඹලා ආත්මික වුයේ නම් පැමිණිලි කරන්නේ නැත.” කියමින් පැමිණිලි කරන්නන් පහසුවෙන් නිහඬ කිරීමට ඔවුන්ට හැකිව තිබින.

"දෙවියන්වහන්සේගේ නායකත්වයට අභියෝග නොකරපල්ලා. යටත් වෙයල්ලා නැතහොත් ඉවත් වී පලයල්ලා. " යනුවෙන් පැවසීමටදැ ඔවුන්ට හැකිව තිබින. ඒ වෙනුවට, ඔවුන්ට යහපත් නායකයෙකුගේ ආකල්පයක් තිබිනි. " නුඹලාට ප්‍රශ්ණයක් පවතින බව ඇසුවෙමු. අපට එක්වී, දෙවියන්වහන්සේගේ පිළිසරණය මත, අපට එය විසදීමට හැකිදැයි බලමු. " යැයි ඔව්හු පැවසිය. (ක්‍රියා 6 : 2 - 7)

සභාවක් හෝ දේව කාර්යයක් ආරම්භ කරන සෑම විටම, එය මෙම රටාවට අත් දකිනු ඇත. පිටතින් සහ ඇතුලතින් ඇතිවන විනය ගැටළු සහ ආරාවුල් හට ගැනෙනු ඇත. සභාවේ කටයුතු විනාශ කිරීමට සාතන්ට අවශ්‍ය කෙරේ.

ශුද්ධාත්මයාණන් විසින් මෙහෙයවනු ලබන අයෙකු, මාංශය විසින් මෙහෙයවන අනෙකුත් අය සමග (යටත් පිරිසෙයින් කාලයකට) හෝ ගැටුම්වලට එළෙඹෙන බව ඔබ සිහි තබා ගත යුතුය. (මෙම පාඩමෙහි "වැඩිදුර අධ්‍යනය සඳහා" වූ කොටසෙහි ඇති යේසු තුමන්ගේ විරුද්ධතා බලන්න.)

යහපත් නායකයෙකු එවැනි අපහසු අවස්ථාවන් නොසලකා නොහරියි. ගැටළු තම අවධානය වෙත යොමු කිරීම පිළිබඳව ඔවුන් "ආත්මික නැතැයි" ඔහු මිනිසුන් පවසන්නේ නැත. හික්මවීම සහ ආරාවුල් පිළිබඳව ප්‍රශ්ණ ගැන ඔහු වහාම ක්‍රියාත්මක වන්නේය.

## ආරාවුල් සඳහා සත්‍ය හේතුව

ඇදහිලිවතුන් අතරද, දේවස්ථානය සහ ක්‍රිස්තියානි සේවාවන් තුළද වන්නාවූ ආරාවුල් සඳහා වන සත්‍ය හේතුව ශුද්ධ ලියවිල්ල හෙළිකරයි :

> **නුමුත් නුඹලාගේ සිත්වල තිබෙන ඊෂ්‍යාවද, පක්ෂවාදිකමද තිබේ නම්, පාරට්ටුකරමින් සත්‍යයට විරුද්ධව බොරු නොකියල්ලා.**
>
> **ඒ ප්‍රඥාව ඉහලින් පැමිණෙන එකක් නොව භූමිකව, මාංශිකව, යක්ෂාකාරව තිබේ.**
>
> **මක්නිසාද ඊෂ්‍යාවද, පක්ෂවාදිකමත් ඇති තැන, අවුල්කමත්, සියළු නපුරු ක්‍රියාවලුත් ඇත්තේය. (යාකෝබ් 3 : 14 - 16)**
>
> **නුඹලා අතරෙහි යුධයත්, ඩබරයත්, කොයින්ද ? ඒවා පැමිණෙන්නේ නුඹලාගේ අවයවයන් තුළෙහි යුද්ධ කරන නුඹලාගේ තෘෂ්ණා වලින් නොවේද ?** (යාකොබ් 4 : 1)
>
> **මක්නිසාද නුඹලා තවම මාංශිකය. නුඹලා අතරෙහි ඊෂ්‍යාවද, විවාදයද, ඇති බැවින්, නුඹලා මාංශිකව මනුෂ්‍ය ප්‍රකාරයෙන් හැසිරෙනවා නොවේද ? (1 කොරින්ති 3 : 3)**

ආරාවුල් හට ගන්නේ ආත්මිකව නොමේරූ සහ නාමික කිතුණුවන් සාතන් , මාංශය සහ අහංකාරය විසින් පොළඹවනු ලබන නිසාය.

## ආරාවුල් වැලැක්වීම

ආරාවුල් පාලනය කිරීමේ ඉතා හොඳ ක්‍රමය එය ඇති වීමට පෙර වැලැක්වීමයි. ආරාවුල් වැලැක්වීමට මාර්ගයන් සමහරක් මෙසේය.

1. අධ්‍යාත්මිකව පරිණත වු ඇදහිලිවතුන් ඉහලට ඔසවන්න. (යාකොබ් 3 : 14 - 16, 4 : 1, 1 කොරින්ති 3 : 3)

2. මිනිසුන් මනා ලෙස දැනුවත්ව තබන්න. ව්‍යාකුලතාව සහ තොරතුරු හිගකම ගැටළු ඇති කරවයි. සභාවේ කටයුතු සම්බන්ධයෙන් ඔබ සමග සහභාගිව ඇති අය අතරෙහි ශක්තිමත් සන්නිවේදන සම්බන්ධතා ගොඩනගන්න. ශුද්ධ ලියවිල්ලේ ඇති යහපත් නායකයින් (මෝසස්, නෙහෙමියා, එස්රා, ආදි වැනි) දක්ෂ සන්නිවේදකයෝ වුහ.

3. ඔබ දෙවියන්වහන්සේ සඳහා කිසියම් කාර්‍යයක් සිදුකරන සෑම විටකම, නිතරම ගැටළු ඇති වේ. ඔබ ගැටළු බලාපොරොත්තු වන බවත්, ඒවා මතුවන කල ඔබ තැති නොගන්නා බව සහ ශුද්ධාත්මයාණන්ගේ බලය තුලින් ඒවා විසදිමට ඔබට හැකියාව ලැබෙන බවත් ජනයාට දැනගැනිමට සලස්වන්න.

4. ඉදිරියට කල්පනා කරන්න. බොහෝ ප්‍රශ්ණ සම්බන්ධයෙන් ප්‍රවේශම් සහිතව සැලසුම් කිරිම මගින් ඒවා ආරාවුල් බවට පත්විමට පෙර ඒවා පිළිබඳව ඔබට කටයුතු කල හැක.

5. ශක්තිමත් සම්බන්ධතාවන් ගොඩනගා ගන්න. අනෙකුන් පිළිබඳව හොඳ පමණක් පවසන්න, එමෙන්ම සභාවෙහි ඔබ සමග එක්ව ක්‍රියා කරන අයවලුන්ව සෙසු අය සම්බන්ධයෙන් යහගුණ පැවසිමට පුහුණු කරන්න.

6. ඔබ සමග සභාවෙහි කටයුතු කරන්නවුන් හට අවංක ලෙසින් කෘතඥතාව සහ පැසසුම පුද කරන්න.

7. ඔබට වරදක් සිදුවුවහොත්, එය පිලිගෙන නිවැරදි කිරිමට තරම් වැදගත් වන්න.

8. ඔබගේ අරමුණ සහ සභාවේ සැලැසුම් පිළිබඳව නිරවුල් වන්න.

9. නිති පැණවිම අවශ්‍යය වු විට, පැහැදිලි නිති සම්පාදනය කර ඒවා සැනෙකින් අනෙකුත් අය වෙත සංනිවේදනය කරන්න.

10. ගැටළු පැන නැගෙන විට ඔබට ඒවා පිළිබඳව දැනුවත් විමට හැකි වනු සඳහා ඔබගේ සහයක ක්‍රියාකාරින් සඳහා විවෘතව පවතින්න.

11. බයිබලයානුකුල මුලධර්මයන් හි විශිෂ්ඨතම දෙය වන ප්‍රේමය මත සභාව ක්‍රියාත්මක කරන්න.

## ආරාවුල් පිළිබඳ කටයුතු කිරිම

ගැටළුවක් හෝ ආරාවුලක් පැන නැගුන කල මතු දැක්වෙන මාර්ගෝපදේශන රිති අනුගමනය කරන්න.

1. ඒ පිළිබඳව ක්‍රියා කිරිම සඳහා ඔබම ඉදිරිපත් වන්න. ඔබ කිසි විටෙකත් සමුවිම අපහසු නම් ඔබට ගැටළු පිළිබඳ ක්‍රියා කිරිමට හැකි වන්නේ නැත.

2. ගැටළු පිළිබඳව ක්‍රියා කිරිමට හැකිවිම සඳහා යාච්ඤා කරන්න.

3. නියම ගැටළුව නිශ්චය කරන්න. ආරාවුල නියම ගැටළුව නොවේ. නියම ගැටළුව වන්නේ ආරාවුල ඇති කිරීමට හේතු සාධක වූ කාරණයයි. ගැටළුව නිශ්චය කර ගැනීම සඳහා ඔබ ප්‍රශ්ණ ඇසිය යුතුය, නිරීක්ෂණය කල යුතුය. සහ හෙළිදරව් වීම සඳහා නොකඩවා යාච්ඤා කල යුතුය. ගැටළුවෙහි සියළු පැතිවලට සහ ඒ හා අදාල වන්නාවූ සියළු පාර්ශවයන් හට සවන් දෙන්න. සියළු කරුණු පිළිබඳ පැහැදිලි වැටහීමෙකින් තොරව ක්‍රියා නොකරන්න. ගැටළු පැණ නැගීමට හේතු සාධක වන නිශ්චිත කරුණු සැමවිටම සිහි තබා ගන්න. (යාකොබ් 3 : 14 - 16, 4 : 1, 1 කොරින්ති 3 : 3)

4. ගැටළුව හේතුවෙන් කෙලින්ම බලපෑම් ඇති වන පුද්ගලයින් හට විසඳීම යෝජනා කිරීමට ඉඩ සලස්වන්න. සියළු යෝජනාවන්ට උවමනාවෙන් සවන් දෙන්න. විසඳුමක් සඳහා එක්ව යාච්ඤා කරන්න. බැරෑරුම් අරගලයන් අවස්ථාවන්හිදි, නිරාහාරශීලය නිර්දේශ කෙරේ.

5. අරගලය පුද්ගලයින් දෙදෙනෙකු අතර පෞද්ගලික ප්‍රශ්ණයක් නම්, (මතෙව් 18 : 15 - 17) මූලධර්මයන් අනුගමනය කරමින් ඔවුන් එක් කරන්න.

6. ආරාවුල් සම්බන්ධයෙන් නිසි ආකල්පයකින් යුතුව ක්‍රියා කරන්න. සම්බන්ධතා බිඳ දැමීමට නොව නගා සිටුවීමට අපේක්ෂා කර සමාව දීමට උත්සහ කරන්න. ප්‍රේමණීය වන්න. තරවටුකිරීම හෝ කෝප වීම නොකරන්න. මොර දීමට හෝ එකිනෙකාට එරෙහිව නොහොබිනා දේ පැවසීමට මිනිසුන්ට ඉඩහරින්න.

උපාය පාවිච්චි කරන්න. උපාය යනු මිනිසුන් සිත් නොරිදවමින් බුද්ධිමත්කමින් සහ ප්‍රේමයෙන් යුතුව අසීරු අවස්ථාවන් පිළිබඳව ක්‍රියා කිරීමේ හැකියාව උපාය නම් වේ. බෙදුම් ඇති කිරීම සහ හානි කිරීම වෙනුවට, අන් අය හට සංවේදී වීම, තේරුම් ගැනීමෙන් යුක්ත වීම, සහ ප්‍රකෘතිමත් කර සුවපත් කිරීම, ඒ හා අදාල වේ. නම්‍යශීලි වන්න, ආත්මාර්ථකාමී ලෙස තමන්ගේ මාර්ග අනුවම කටයුතු කිරීමෙහි පිහිටා නොසිටින්න. ගැටළු විසඳීම පිළිබඳ විවිධ අදහස් සහ මාර්ග සඳහා විවෘතව පවතින්න.

7. වරකට එක් ආරාවුලක් හෝ ගැටළුවක් පිළිබඳව පමනක් කටයුතු කරන්න. වෙනත් ඊට සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීමෙන් විසඳීමට ඇති කරුණ අවුල් නොකරන්න.

8. ආරාවුලට පාදක වූ ගැටළුව පිළිබඳව ඔබ පැහැදිලි අවබෝධයක් ලබාගත් පසු, එය නිවරද කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන්න. කිසියම් තීරණයක් නිරතුරුවම දෙවියන්වහන්සේගේ රාජ්‍යය පෙරමුණට පැමිණවිය යුතු බව සිතෙහි ධාරනය කරගන්න. පාවුල් සහ බර්නබස්ගේ උදාහරණයේදි මෙන්, ආරාවුල් සහයෝගිතාව වෙත හරවන්න.

9. ආරාවුල ඔබ එම ආකාරයෙන් මෙහෙයවනුයේ කුමන හේතුවක් නිසාදැයි පැහැදිලි කරන්න. උදාහරණයක් වශයෙන් ක්‍රියා 15 විස්තර කරැති සභා ආරාවුලෙහිදි, නායකයන් තමන්ගේ තීරණය විස්තර සහිත ලියවිල්ලකින් අදාල අය වෙත විස්තර කලහ.

10. ගැටළුව පිළිබඳව එම අත්දැකීම තුලින් ඔබ ඉගෙනගත් දේ සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට තුති පුදන්න. " සැම දෙයක් " පිළිබඳව ඔබ තුති පුදන කල, ඔබ වෙනුවෙන් ක්‍රියා කරනු පිණිස එය දිව්‍යමය ශක්තිය සහ දෙවියන්වහන්සේගේ බලය මුදා හරින්නේය.

## හික්මවීම සඳහා වන හේතු

අධිකාරියට එරෙහිව කැරලි ගැසීම පාපයේ ස්භාවයයි. ලුසිපර් (යක්ෂයා) සහ මිනිසා (ආදම් සහ ඒවා) ගේ ප්‍රථම පාපය සිදුකලේ මෙයයි. මෙම මුලික පාප ස්වභාව හේතුවෙන්, මගපෙන්වනු ලැබීමට අකැමැති විය හැකි එවැන්නන් හට මගපෙන්වීමට ඇතැම් විට ඔබට සිදුවනු ඇත. කැරලිකාර බවට, පාපයට සහ අධ්‍යාත්මික කාමුකත්වය සහ අපරිණත බවට වැඩෙන අනුගාමිකයන් ඔබ සමග සිටිය හැක.

සභාව තුල හික්මවීම සඳහා වන අධිකාරි බලය පුජකවරයා හෙවත් අධ්‍යාත්මික නායකයා සතුව පවතිනුයේ මක්නිසාදයත් තම අනුගාමිකයින්ගේ අධ්‍යාත්මික ශුභ සිද්ධිය සඳහා වගකීම ඔහු සතු වන නිසාය :

> **නුඹලාගේ ප්‍රධානියෝ ගණන් දෙන්ට සිටින්නන් මෙන් නුඹලාගේ ආත්ම ගැන රැකබලා සිටිති. ඔවුන් සුසුම්ලමින් එසේ කලොත් නුඹලාට අලාභ බැවින්, සුසුම්ලමින් නොව ප්‍රීතියෙන් එසේ කරන පිණිස ඔවුන්ට කීකරුව යටත් වෙයල්ලා. (හෙබ්‍රෙව් 13 : 17)**

හික්මවීම පිළිබඳ ප්‍රශ්ණ පැන නැගුන වහාම ඒවා පිළිබඳ ක්‍රියා කිරීමට නායකයා කැමැත්තෙන් සිටිය යුතුය. අධ්‍යාත්මික අතපසු කිරීම් හෝ පාපය අභියෝග කිරීමෙන් තොරව නිදැල්ලේ හැරීම ඕනෑම සභාවක විනාශකාරි විය හැක. හික්මීම අවශ්‍ය වීම සඳහා ශුද්ධ වු ලියවිල්ල තුල දැක්වෙන හේතු සමහරක් මෙසේය :

1. දෙවියන්වහන්සේගේ වචනය ප්‍රතික්ෂේප කරන්නාවු හෝ නීතිවිරෝධි ක්‍රියාවක් පිළිබඳ වගකිව යුත්තෙකු ප්‍රකෘතිමත් කිරීම සඳහා : ගලාති 6 : 1, මතෙව් 6 : 14 - 15

2. පාපය නිවරද කිරීම පිණිස : 1 කොරින්ති 8 : 9

3. දේව ගෘහයෙහි ක්‍රිස්තියානි සාක්ෂිය ආරක්ෂා කිරීමට : 1 තිමෝති 3 : 7

4. තමන්ගේ සාක්ෂි දැරීම කෙරෙහි විශ්වාසවන්තව සිටීමට සහ අපරික්ෂාකාරි නොවීමට සාමාජිකයින් දිරි ගැන්වීමට : 1 කොරින්ති 5 : 6 - 7

## හික්මවීම පිළිබඳ මුලධර්ම

හික්මීම සඳහා වු මාර්ගෝපදේශන රීතින් කිහිපයක් මෙසේය :

1. හැකියාවක් තිබේනම් පළමුවෙන් වැරදි කරන සහෝදරයා වෙත ගොස් තනි තනිව සහ පෞද්ගලිකව අදාල කරුණ නිරාකරණය කරන්න : ලුක් 17 : 3, මතෙව් 18 : 15 - 17

2. වරද කරන ඇදහිලිවන්තයා ඔබට ඇහුම්කන් දි පසු නොතැවෙන්නේනම්, සාක්ෂිකරුවන් සමග නැවත යන්න : මතෙව් 18 : 15 - 17

3. ඔහු තවදුරටත් ඔබට ඇහුම්කන් දීම ප්‍රතික්ෂේප කරයි නම්, අදාල කරුණ මුළු සභාව ඉදිරියට රැගෙන යන්න : මතෙව් 18 : 15 - 17

4. හරි ආත්මයකින් නායකයින් විසින් හික්මීම කල යුතුය. ( මතෙව් 7 : 1 - 5, රෝම 15 : 1 - 2, 2 කොරින්ති 2 : 6 - 8, සහ ගලාති 6 : 1 - 4 ) බලන්න. අධ්‍යාත්මිකව වර්ධනය වු නායකයින්

ප්‍රථමයෙන් තමන්වම විනිශ්චය කර ඉන්පසුව නිහතමානි, ප්‍රේමවන්ත, සහ උපකාරි බවින් යුත් හැගිමෙකින් යුතුව වරද කලවුන් සමග කටයුතු කල යුතුය.

5. සාතන් විසින් සිරගත කරනු ලැබ ඇති වරදකරු මුදාගැනිමේ අදහසින් යුතුය නිවරදි කිරිමේ කාර්‍යය සිදු කල යුතුය. : 2 තිමෝති 2 : 24 - 26

6. නිවරදි කිරිම ප්‍රතික්ෂේප කරන්නේ නම්, සහෝදරත්වය කෙරෙන් ඉවත් කිරිමද විනය කාර්‍යය තුල අන්තර්ගත කල හැක. ඇදහිලිවතුන් වෙත දෙවියනවහන්සේ දි ඇති සුවිශාල තිළිණයන්ගෙන් එකක් වනුයේ අනෙකුත් ඇදහිලිවතුන් සමග සහෝදරත්වයයි. අති දරුනු දණ්ඩනයන්ගෙන් එකක් වනුයේ එම සහෝදරත්වය අත්හිටුවිමයි. : මතෙව් 18 : 15 - 17, 1 කොරින්ති 5, 2 කොරින්ති 3 : 14, 2 යොහාන් 7 - 11 සහ 3 යොහාන් 9 - 11

7. ප්‍රතිචාර දැක්විම සදහා වරද කරන සහෝදරයාට අවස්ථාව ලබා දිය යුතුය. ඔහුගේ ආකල්පය හික්මිම සහ සභාව තුල ඔහුගේ අනාගතය කෙරෙහි බලපැවැත්විය යුතුය. ඔහුගේ ආකල්පය යහපත් වේ නම් සහ ඔහු පසුතැවිලි වන්නේ නම්, ඔහුව සහෝදරත්වයට සහ සභාව තුල නැවත පිහිටු විමට නායකයාට පුළුවන් වරද බරපතළ එකක් නම්, ඔහු තම ජිවිතය සහ නිවාසය නැවත පිළිවෙලට ගෙන එන තෙක් වරදකරු ක්‍රියාකාරි සහභාගිත්වයෙන් ඉවත්කර තැබිම අවශ්‍ය විය හැක. ඔහු කැරලිකාරිවේ නම්, සහ පසුනොතැවෙන්නේ නම්, ඔහු නායකත්වයන්ගෙන් සහ ඇතැම් විට, දේවස්ථානයේ සාමාජිකත්වයෙන් ඉවත් කල යුතුය.

8. පෞද්ගලික ගැටළු සහ ප්‍රසිද්ධ පාපයන් වෙනස් අයුරින් හැසිරවිය යුතුය. (මතෙව් 18 : 15 - 17, 1 කොරින්ති 5, ගලාති 2 : 1 - 14, 1 තිමෝති 5 : 20 ) බලන්න. මතෙව් හි සදහන් පාඩය අන්ව පෙනෙන්නේ ගැටළුව පෞද්ගලික පුද්ගලයින් අතර වුවක් පරිද්දෙනි. එය පිළිබදව ක්‍රියා කල යුතු වුයේ අනෙකුත් ඇදහිලිවතුන්ගේ උපකාරය ලබා ගැනිමෙන් වු අතර, වරදකරු සවන් නොදෙන්නේ නම් සහෝදරත්වය වෙතින් නෙරපා හැරිමෙනි. අනෙක් පාඩයන්හි ආදාල ගැටළු පොදු කාරණාවන් හා අදාල ගැටළු වු හෙයින් ඒවා පිලිබදව ප්‍රසිද්ධියේ ක්‍රියා කිරිම අවශ්‍ය විය.

9. කරුණු පිළිබද අවබෝධය මත පමණක් පිහිටා හික්මවිම ක්‍රියාත්මක කරන්න. " දෘෂ්‍යමාන ආරංචි " ප්‍රමාණවත් නැත. සාක්ෂිකරුවන් දෙදෙනෙකු ද සිටිය යුතුය : මතෙව් 18 : 15 - 18, 1 කොරින්ති 5 : 1, සහ 1 තිමෝති 5 : 1 - 9

**සිහිතබා ගැනිම සදහා නියමයක්**

අනෙකුත් අයවලුන් හික්මවිය යුතු අවස්ථාවේදි සිහිතබා ගැනිම සදහා වන හොද නියමයක් වන්නේ ..

**මනුෂ්‍යයන් විසින් නුඹලාට යමක් කරනවාට නුඹලා කැමති ද නුඹලාත් එසේම ඔවුන්ට කරපල්ලා (මතෙව් 7 : 12)**

නිතරම ඔබගෙන්ම විමසන්න :

1. දෙවියන්වහන්සේගේ වචනය මේ පිළිබදව පවසන්නේ කුමක්ද ?
2. යේසුස් වහන්සේ මෙය කෙසේ හසුරුවනු ඇත්ද ?
3. අපගේ තත්වයෙන් දෙපසට මාරු වි මා ඔහුගේ තත්වයෙහිද ඔහු මගේ තත්වයේද වි නම් මෙවන් අවස්ථාවේදි සලසනු ලැබිමට මා කැමති වන්නේ මොන ලෙසින්ද ?

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන බයිබල් වාක්‍යයන් මතකයෙන් ලියන්න

----------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------------

2. ආරාවුල් වැලැක්වීමේ මාර්ගයන් කිපයක් ලැයිස්තුගත කරන්න.

----------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------------

3. ආරාවුල් පිළිබඳ ක්‍රියා කිරීම සඳහා මාර්ගෝපදේශ නියමයන් සාරාංශ කරන්න.

----------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------------

4. හික්මවීම සඳහා බයිබලීය හේතූන් කීපයක් නම් කරන්න.

----------------------------------------------------------------------------------------------------------------

5. හික්මීම සඳහා ඔබ මෙම පාඩමෙන් උගත් බයිබලයේ සඳහන් සිද්ධාන්ත කිපයක් කෙටියෙන් නම් කරන්න.

----------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------------

6. වියවුලකට සැබෑවු හේතු මොනවාද ?

----------------------------------------------------------------------------------------------------------------

7. හික්මීමේදි දෙවියන්වහන්සේගේ වචනය වැදගත් වන්නේ මක්නිසාද ?

----------------------------------------------------------------------------------------------------------------

(මෙම පරික්ෂණ වලට පිළිතුරු මෙම සංග්‍රහය අවසාන පරිච්ඡේදයේ දැක්වේ.)

## වැඩිදුර අධ්‍යනය සඳහා

1. දේව සභාවක් හෝ ක්‍රිස්තියානි සංවිධානයක් තුළ හික්මවීම අවශ්‍යය වන්නාවූ සාමාන්‍ය හේතුන් කිපයක් මෙසේය.සහෝදරයෙක් හෝ සහෝදරියක් ......

   - දුසිරිත්හි නියුතු වේ.ලිංගික පාපයන්, පරදාර සේවනය,අසභ්‍ය කෘති, අවිවාහක ස්ත්‍රී පුරුෂයන් ලිංගිකව හැසිරීම.
   - සභාවේ අරමුදල්, පෞද්ගලික මුදල්, හෝ ව්‍යාපාර ආදිය පිළිබඳ අවංක නැත.
   - සත්‍යවාදි නොවේ.
   - අනෙකුත් මනුෂ්‍යයන් සමග කටයුතු කල නොහැක.
   - කැරලිකාරභාවයෙහි, විවේචනයෙහි, සහ ද්වේෂයෙන්, වැරදි ආකල්ප දරන්නේය.
   - ලෞකිකය, කාමුකය, ආත්මික වර්ධනය නොමැතිකම
   - තමන්ගේ හැසිරීමෙන් සහ ජිවන රටාවෙන් නරක ආදර්ශ ලබා දෙයි.
   - සිය නායක තත්වයෙහි වගකිම් සම්පුර්ණ නොකරයි.
   - දේව වචනය විශ්වාස නොකරයි.
   - අනෙකුත් අය පිළිබඳ කථා කරමින් කරදර මතු කරවයි.

   ඔබට වෙනත් හේතුන් සිතා ගත හැකිද?

2. ඇතැම් විට නායකයින් විවේචනය පිළිබඳව නිසි පරිදි ක්‍රියා කිරිමට නොහැකිවීම කරණ කොට ගෙන ආරවුල් ඇති කර ගනි. විවේචකයෙකු යනු ඔබ ක්‍රියා කරන අන්දම හා එකග නොවන එහෙයින් ඒ බව ඔබට පවසන අයයි. දයාව තුලින් කෙරෙන්නාවූ අවංක විවේචනය උපකාරි විය හැක. එහෙත් අසාධාරන විවේචනයන් අත්විදිමටද ඔබට සිදුවිය හැක.

   විවේචනය සම්බන්ධයෙන් ක්‍රියා කිරිම සඳහා යෝජනා කිපයක් මෙසේය :

– හොඳින් සවන්දෙන්නෙකු වන්න. විවේචකයාට පැවසිමට ඇතිදෙයට සවන් දෙන්න.

– කිසියම් කරුණක් ඔබගේ අවධානයට යොමු කිරිම පිළිබඳ ඔහුට ස්තුති කර “මම මේ පිළිබඳ සොයා බලන්නම් ඒ පිළිබඳ යාච්ඤා කරන්නම්” යැයි පවසන්න.

– විවේචනය සම්බන්ධව යාච්ඤා කරන්න. එය ඇත්ත වශයෙන්ම නිවැරදි කල යුතුවන් සැලකිලිමත් විමට අවශ්‍ය කරුණක් ද යන බව පෙන්වා දෙන ලෙස දෙවියන්වහන්සේට පවසන්න.

– විමර්ශනය කරන්න : ඔබ වැරදි තිරණයක් කළේද? ඔබ වැරදි කරන්නේද? ඔබගේ තිරණය ස්ථිර කිරිම සඳහා අවශ්‍යය තතු එක් රැස් කරන්න.

විවේචනය අසාධාරණ එකක් නම් එය නොසලකා හරින්න. එය අසමර්ථ කමක් පිළිබඳ, ගැටළුවක් පිළිබඳ සාධාරණ විවේචනයක් නම් තත්වය නිවැරදි කරන්න.

3. ජේසුස්වහන්සේ තමන්වහන්සේගේ මිහිමත සේවය තුලදී බොහෝ සංඝට්ටනයන්ට මුහුණ දුන්හ. උන්වහන්සේ සංඝට්ටන පිළිබඳව ක්‍රියා කළ ආකාරය අධ්‍යයනය කරන්න. ......

- තනතුරු පිළිබඳව උන්වහන්සේගේ අනුගාමිකයින් අතර : මාර්ක් 9 : 33- 37
- සබත් දිනයේදී සුවපත් කිරීම පිළිබඳව ඵරිසිවරුන් සමග : මතෙව් 12 : 9 - 14
- යක්ෂයින් පලවා හැරීම පිළිබඳව ඵරිසිවරුන් සමග : මතෙව් 12 : 22 - 25
- උන්වහන්සේගේ බලය පෙන්වීම සඳහා ආශ්වර්‍යයන් සිදුකරන ලෙස
- උන්වහන්සේගෙන් ඉල්වූ ඵරිසිවරු හා සද්දුසිවරු සමග : මතෙව් 11 :15 - 18
- දේව මාලිගාව තුලදී මුදල් මාරු කරන්නන් සමග : මාර්ක් 11 : 15 - 18
- තමන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් නොවේයැයි කිමට උන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම හේතු කොට නායක පුජකයින් සහ රෝම පාළකයින් සමග : මාර්ක් 14 : 60 - 63 , 15 : 15

4. නායකයින් ආරවුල් සහ විනය කාරණා වෙත මුහුණ දෙමින් ඒවා සම්බන්ධව සාර්ථක ලෙස ක්‍රියා කල ආකාරය පිළිබඳව බයිබලයානුකුල නිදර්ශනයන් බොහෝ ඇත. පහත දැක්වෙන යොමු කිරීම් අධ්‍යයනය කරන්න.

- මෝසස් : ගණන් කථාව 16 , නික්මයාම 18 : 13 - 26
- සොලමන් රජු : 1 රාජාවලිය 3 : 16 - 28
- නාදාන් දාවිත්ට මුහුන දෙයි : 2 සාමුවෙල් 12
- සාමුවෙල් සාවුල්ට මුහුණ දෙයි : 1 සාමුවෙල් 15
- නෙහෙමියා : නෙහෙමියා 13 : 23 - 25
- සභා නායකයෝ යෙරුසෙලමේදි : ක්‍රියා 15
- සියලු ඇදහිලිවතුන් පිළිබඳ දෙවියන්වහන්සේගේ හික්මවීම : හෙබෙව් 12 : 5 - 7
- ප්‍රේරිතවු පාවුල් : ගලාති 2 : 11

# දසවන පරිච්ඡේදය

## නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසු පහත සඳහන් දෑ ඔබට හැකිවනු ඇත. :

- ප්‍රධාන වාක්‍යය මතකයෙන් ලිවීම.
- නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කිරීමේ අරමුණ පැහැදිලි කිරීම.
- අනෙකුත් පුහුණු කිරීම භාරදුන් වගකීමක් වනුයේ මන්දැයි පැහැදිලි කිරීම
- තෝරාගැනීම පිළිබඳව යේසුස්වහන්සේ භාවිතා කළ ප්‍රතිපත්තීන් හයක් හඳුනා ගැනීම
- පුහුණු  කිරීම පිළිබඳව යේසුස් වහන්සේ භාවිතා කල ප්‍රතිපත්ති අටක් හඳුනා ගැනීම
- නායකත්ව පුහුණු ආකෘතියක බයිබලයානුකූල නිදසුනක් දීම

**ප්‍රධාන ජේදය :**

> **ගෝලයා ගුරුවරයාට වඩා උතුම් නැත. නමුත් සම්පූර්ණත්වයට පත්වූ සෑම දෙනම තමුන්ගේ ගුරුවරයා මෙන් වන්නේය. (ලූක් 6 : 40)**

### හැඳින්වීම

නායකයින් හට අනුගාමිකයින් සහ අනුගාමිකයින් හට නායකයින්ද සිටිය යුතුය. සාමාන්‍ය සභාවක් තුල, නායකයින් සහ අනුගාමිකයින් වර්ධනය කිරීම සඳහා කිසිවෙකුන් හෝ පත්කරනු ලැබ නොමැති වන අතර, එසේ නුමුත් සභාවේ අනාගතය රඳා පවතින්නේ ඔවුන් මත වේ. ක්‍රිස්තුස්වහන්සේගේ සභාව තුළ තම කොටස ඉටුකිරීමෙහිලා තරුණයින් සූදානම් කිරීම ළමා වියෙහි සිට ආරම්භ කරමින් නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කිරීම සිදුවිය යුතුය. පුහුනු කිරීමෙන් පසු නොපමාව කුමන වයසකදී වුවද හැරවිය යුතුය.

දෙවියන්වහන්සේ ඇතැම් ඇදහිලිවතුන් හට දෙවියන්වහන්සේ නායකත්වයේ සුවිශේෂී වරප්‍රසාද ලබා දෙන බව, ඔබ ඉගෙන ඇත. අනෙකුත් අය මගපෙන්වීමෙහි සහජ හැකියාවන් ඇතිව උපත ලබා ඇත.  ඇතැම් මනුෂ්‍යයන් සහජ අනුගාමිකයින් බව පෙනී යයි. සෑම අයෙකුම නායකයෙකුද අනුගාමිකයෙකුද  යන දෙකම වේ.

සහජ නිපුනත්වයෙන් යුතු වුවත් දෙවියන්වහන්සේගේ වරප්‍රසාද ලද්දේ වුවත් නායකයින්ට සහ අනුගාමිකයින් හට පුහුණුව අවශ්‍යය කෙරේ. “ එක් අය තවත් අයෙකුට කෙනෙකු වෙත ලඟා වීමට උගන්වයි. ” යනු නායක හිගය සඳහා දෙවියන්වහන්සේගේ පිළිතුරවේ.

> **බොහෝ සාක්ෂි කාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමාර්ථ වූ විශ්වාස වූ මනුෂ්‍යයන්ට භාර දීපන්න. (2 තිමෝති 2 : 2)**

නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කිරීම පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගනු ඇත.

## අනුගාමිකයෝ

සෑම අයෙකුම අනුගාමිකයෙකි. පාවුල් යේසුස් වහන්සේගේ අනුගාමිකයෙන් තමන් හඳුන්වන අතර, ඔහු අනුගමනය කරන ලෙස කොරින්තින් වෙතින් ඉල්ලයි

> **මා ක්‍රිස්තුස්වහන්සේව ආදර්ශයට ගන්නාක් මෙන් නුඹලාත් මා ආදර්ශයට ගනිල්ලා. (1 කොරින්ති 11:1)**

මේ හා සමාන උපදෙස්ම එපිසවරුන් හට (එපිස 5 : 1) පිලිප්පිවරුන් (පිලිප්පි 3 : 17) සහ තෙසලෝනිකයන් හට (1 තෙසලෝනික 1 : 6) දෙනු ලැබ ඇත.

යහපත් අනුගාමිකයෙකු වීම සඳහා සෑම ඇදහිලිවන්තයෙකුම පුහුණු කල යුතුය. අපගෙන් බොහෝ දෙනෙකු හට අනුගාමිකයින් වීමට අවශ්‍යය නැත. අප වැඩි කැමැත්තක් ඇත්තේ නායකයන් වීමට එහෙත් හොඳ නායකයෙකු ප්‍රථමයෙන් හොඳ අනුගාමිකයෙකු වේ. නායකයෙකු සෑම විටම වෙනත් අයෙකුට වගකිව යුතු අතර ඒ අනුව ඔුද අනුගාමිකයෙකි. අපි සාර්ථක ලෙස මගපෙන්වනුයේ සාර්ථක ලෙස අනුගමනය කිරීමෙනි.

යහපත් අනුගාමිකයෙකු වීම සඳහා නායකයින්ගේ කාර්‍යභාර්‍ය සතුටක් වීම පිණිස ඔබගේ නායකයින්ට කීකරු විය යුතුව මෙන්ම එවුන්ගේ බලධාරීත්වයට අවනත විය යුතුය :

> **නුඹලාගේ ප්‍රධානියෝ ගණන් දෙන්ට සිටින්නාක් මෙන් නුඹලාගේ ආත්ම රැකබලා ගනි. ඔවුන් සුසුම්ලමින් එසේ කලොත් නුඹලාට අලාභ බැවින් සුසුම්ලමින් නොව ප්‍රීතියෙන් එසේ කරන පිණිස ඔවුන්ට කීකරුව යටත් වෙයල්ලා. (හෙබ්‍රෙව් 13 : 17)**

අනුගාමනය කරන්නන් සිය නායකයින් අනුගමනය කල යුතු වන්නේ ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන තෙක් පමණි. නායකයින් දේව වචනයේ සත්‍ය කෙරෙන් පිට පැන යන විට ඔවුන් අනුගමනය නොකරන්න.

## නායකයෝ

සෑම අයෙකුම සභාවේ නායක තත්වයට කැඳවුම් නොලබති. එහෙත් කලින් කල එක් එක් පුද්ගලයා කිසියම් වු අයුරෙකින් නායකත්වය දරයි. උදාහරණයක් වශයෙන්, කිසියම් පුද්ගලයෙකු සභාවේ නායකත්වයට කැඳවීම නොලද්දේ වන්නේ නමුත්, ඔහු සිය ගෘහයෙහි නායකයා වන්නේය.

කිසියම් ඇදහිලිවන්තයෙකු හට නායකත්වය සඳහා ආත්මික දීමනා නොමැති විය හැකි වුවද, සභාවෙහි අවශ්‍යතාවයන් හේතු කොට ඇතැම් විට නායක භූමිකාවෙහි හිඩැසක් පිරවීමේ අවශ්‍යතාවය පැවැතිය හැක. මේ හේතූන් මත සියලුම විශ්වාසකයින් නායකත්වය පිලිබඳව පුහුණු කරවිය යුතු වේ.

## භාරදූර වගකීමක්

අනෙක් අය වලුන් පුහුණු කර වීම භාරදූර වගකිමක් වනුයේ මන්ද යත්...

> **ගෝලයා ගුරුවරයාට වඩා උතුම් නැත. නුමුත් සම්පූර්ණත්වයට පැමිණි සෑම දෙනම තමුන්ගේ ගුරුවරයා මෙන් වන්නෝය. (ලූක් 6 : 40)**

ඔබ පුහුණු කරවන මිනිසුන් ඔබ මෙන් වන්නේය. ඔබගේ හැසිරීම සහ ජිවන රටාව මගින් නිති ආදර්ශයක් සැලසීමේ භාරදූර වගකීමක් ඔබ සතුව ඇත.

## පුහුණු කරවීමේ අරමුණ

අප නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කිරීම හේතුව වන්නේ යේසුස්වහන්සේ තුලින් දෙන ලද නියමයක් සපුරාලීම වේ.

**එබැවින් නුඹලා ගොස් සියළු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේ නාමයට ඔවුන් බව්තිස්ම කරපල්ලා.**

> **මා විසින් නුඹලාට අණ කල සියල්ලම පවත්වන්ට ඔවුන් උගන්වාගල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටිමියි කී සේක.** (මතෙව් 28 : 19 - 20)

අප නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කරනුයේ සුභාරංචිය උගන්වමින්, බව්තිස්ම කරවමින් සහ අනතුරුව වැඩිදුර ඉගැන්වීම මගින් දේව ධර්මලාභීන් ආත්මීය පරිනතභාවය සඳහා මෙහෙයවීම සඳහා සියළු ජාතීන් කරායාමේ අරමුණ පිණිසය. අනුකූලත්ය ලබා දීම පාපය වෙනුවෙන් පසුතැවිලිවීම, සහ යලිත් උත්පත්තිය ලැබීම සඳහා මනුෂ්‍යයින් දේව ධර්මය ශ්‍රවණය කල යුතුය. එවැන් ඉගැන්වීම “ සුභාරංචිය පැතිරවීම ” යනුවෙන්ද හැඳින්වෙනු ලැබේ.

> **එබැවින් නුඹලා ගොස් සියළු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේ නාමයට ඔවුන් බව්තිස්ම කරපල්ලා.** (මතෙව් 28 : 19)

නව ඇදහිලිවතුන් ඇතැම් විටකදි “ ගෝලයන් ” ලෙසද හඳුන්වනු ලැබේ. ගෝලයෙකු යනු විශ්වාසය තුලින් යලිදු උපත ලබා දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි කොටස්කරුවෙකු බවට පැමිණි යේසුස් ස්වාමින් කෙරෙහි විශ්වාස කරන්නෙකි. එහෙත් අළුත් ගෝලයා අනුගාමිකයෙකු වීම සඳහා පුහුණු කල යුතු වේ. යේසුස් වහන්සේ ඉගැන්වූ සියළු දේ පිළිබඳව අළුත් ගෝලයින් හට උපදෙස් ලබා දිය යුතුය.

> **මා විසින් නුඹලාට අණ කල සියල්ලම පවත්වන්ට ඔවුන් උගන්වාගල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටිමියි කී සේක.** (මතෙව් 28 : 20)

යේසුතුමන්ගේ සැලසුම වන්නේ හරවනු ලැබූවන් ශ්‍රාවකත්වය තෙක් අප විසින් මෙහෙයනු ලැබීමයි. “ශ්‍රාවකයා” යන වචනයේ අර්ථය වන්නේ “ඉගෙනගන්නෙකු, ශිෂ්‍යයෙකු, අනුගමනය කිරීම මගින් ඉගෙන ගන්නා අයෙකු” යනුවෙනි. ශ්‍රාවකයෙකු යනු ක්‍රිස්තියානි විශ්වාසයේ මුලධර්මයන් තුල පිහිටා ඇති සහ අළුත් ගෝලයන් ඇති කරමින් ඔවුන් හිකමවන්නාවූ අනුගාමිකයෙකි. ඔහු මෙසේ කටයුතු කරන කල ඔහු නායකයෙකු බවට පැමිනෙන්නේය. මෙම ක්‍රියාවලිය යලි යලිත් සිදුකරන කල රාජ්‍යයේ සුභාරංචිය පැතිරවීම සඳහා නව අනුම්ගාමිකයින්ද, නායකයින්ද නොකඩවා ඇති කෙරෙනු ඇත.

## හරවනු ලද්දන් අනුගාමිකයින්, නායකයින් කරා

මනුෂ්‍යයන් හරවන ලද්දන්ගේ තත්වය කෙරෙන් අනුගාමිකයින් සහ ඉන්පසු නායකයින්ගේ තත්වය කරා ඔබ මෙහෙයවනුයේ කොයි අයුරෙන්ද? ඔබ ඔවුන් පුහුණු කල යුතුය අළුත් ගෝලයින් දිනා ගැනීම වැදගත්

වේ. එහෙත් ආත්මීය වශයෙන් සිය වර්ගයා වැඩි කිරීමට ඔවුන්ට හැකියාව ලැබෙන්නේ ඔවුන්ව අනුගාමිකයින් සහ නායකයින් ලෙස පුහුණු කිරීම තුලින්ම පමණි.

තමන්වහන්සේගේ අනුගාමිකයින් තෝරාගැනිමේදි සහ ඔවුන් නායකයින් බවට උචිත වන ලෙස පුහුණු කිරීමේදි යේසුස් වහන්සේ මෙය පැහැදිලි කල සේක. තමන් වහන්සේ වෙත දෙවිදුන් පැවරු කාර්ය ඉටුකිරීමට උන්වහන්සේට තිබුනේ අවුරුදු 3 1/2 වු දේව සේවා කාලයක් පමණි. එම කෙටි කාල වකවානුව තුල උන්වහන්සේට යාහැකි වුයේ ස්ථාන සුචි ප්‍රමාණයක් කරා පමණක් වන අතර, ලංවීමට හැකි වුයේ ඉතා සීමිත මිනිසුන් සංඛ්‍යාවක් වෙත පමණක්ය.

උන්වහන්සේගේ පැවරුම සම්පූර්ණ කරනු ලැබීම සහතික කිරීම සඳහා යේසුස් තුමා අනුගාමිකයින් සහ නායකයින් පුහුණු කිරීම කෙරෙහි ප්‍රමුඛත්වය දුන් සේක. තමන්වහන්සේට කිසි දිනක ලගාවිමේ අවස්ථාවක් නොලැබෙන ගම් සහ නගර රාශියක් කරා තමන්වහන්සේ පුහුණු කල වුන් ලගාවනු ඇති බව උන්වහන්සේ දැන සිටි සේක.

## තෝරා ගැනිමේ මුලධර්ම

ඔබ ඉතාසුළු කාලයක් පමනක් ඇති එක් පුද්ගලයෙකු පමණක් වන හෙයින් සෑම අයෙකුම පුහුණු කරවීම ඔබට කල නොහැක. මෙහෙ අර්ථය නම් ඔබ පුහුණු කරවන අය කවුරුන්දැයි ඔබ තෝරාගත යුතු බවයි. ඔබ පුහුණු කරවන අය තෝරා ගන්නේ කෙසේද ? අධ්‍යාපනය, පලපුරුද්ද, පරීක්ෂණ හෝ අත්හදා බැලීම් ශෛලියෙන් තෝරා ගැනිමට ඔබට හැකියාව ඇත.

එහෙත් තෝරාගැනිම වන ඉතා හොදම මාර්ගය නම් තමන්වහන්සේගේ ශ්‍රාවකයින් තෝරා ගැනිමේදි යේසුස් වහන්සේ භාවිතා කල මුලධර්මයන් අනුගමනය කිරීමය. උන්වහන්සේගේ තෝරා ගැනිම පිළිබඳ වාර්ථාව ( මතෙව් 5 : 1, 10 : 2 - 4, මාර්ක් 3 : 13 - 19, ලුක් 6 : 12 - 16, 10 : 1 - 16 ) හි දි ඇත. ඔබ පුහුණුව දෙන්නවුන් තෝරා ගැනිමේදි භාවිත කල හැකි වන යේසුස් වහන්සේ අනුගමනය කලාවු වැදගත් මුලධර්මයන් කිහිපයක් මෙලෙස වේ :

**දෙවියන්වහන්සේ කෙරෙහි රදා සිටින්න :**

යේසුතුමා දෙවියන්වහන්සේ කෙරෙහි රදා පැවතිය සේක.

> **මට තනිවම කිසිවක් කරන්නට නුපුළුවන...... මක්නිසාද මාගේම කැමැත්ත නොව මා එවු තැනැන්වහන්සේගේ කැමැත්ත සොයමි. (ශු . යොහාන් 5 : 30)**

**එය යාච්ඤාවේ කාරණයක් කරන්න :**

තමන්වහන්සේ ශ්‍රාවකයින් තෝරාගැනිමෙදි යේසුස්වහන්සේ රාත්‍රිය මුලුල්ලෙහි යාච්ඤාවේ යෙදි කාලය ගෙවු බව ( ලුක් 6 : 12 - 13 ) සඳහන් කරයි. පුහුණුව සඳහා විශ්වාසවන්ත වු පුරුෂයින් සහ ස්ත්‍රීන් තෝරා ගැනිමට බුද්ධිය ලබා දෙන මෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න .

**මුලාරම්භය සපයන්න :**

තමන් වහන්සේගේ ශ්‍රාවකයින් කැදවීම සඳහා යේසුස්වහන්සේ මුලාරම්භය ගත්සේක. අනුගාමිකයින් හෝ නායකයින් වීම සඳහා මිනිසුන් ඔබ වෙතට රොක් නොවෙති. ඔවුන් කැදවීමට ඔබ මුල් පියවර ගත යුතුය.

**ගැටළුව නොව සමාර්ථතාව දෙස විමසන්න :**

යේසුස්වහන්සේ ශ්‍රාවකයින් තෝරා ගැනිමේදි උන්වහන්සේ සාමාන්‍ය මිනිසුන් කැඳවූහ. ඇතැම්හු අධ්‍යාපනයෙන් තොරවූ අතර, සෑම දෙනා තුළ වැරදි සහ අසමාර්ථතා පැවතුනි. වර්ථමාන ධර්මදූත මණ්ඩලයක් විසින් ප්‍රථම ශ්‍රාවකයින් දොලොස්දෙනා නිරීක්ෂණය කරනු ලැබුවේ නම් ධර්දූත සේනාව සඳහා ඔවුන් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිව තිබූ බවට අදහසක් ප්‍රකාශ කරනු ලැබ ඇත.

එහෙත් යේසුස්වහන්සේ ක්‍රියා කලේ සමාර්ථතා පදනම මතය ගැටළුමත නොවේ.

උන්වහන්සේ ස්ත්‍රීන් සහ පුරුෂයින් තෝරාගත්තේ ඔවුන් කවරෙකුදැයි යන නිසා නොව ඔවුන් කවුරුන් බවට පත්විය හැකිද යන්න පාදක කර ගනිමිනි. උන්වහන්සේ ඔවුන්ගේ ගැටළු වලට ඔබ්බෙන් ඔවුන්ගේ සාමාර්ථතාවයන් කෙරෙහි යොමු වු සේක.

**ගෙවිය යුතු මිලය පැහැදිලිව නියම කරන්න :**

**යේසුස් වහන්සේ ශ්‍රාවකයින්** තෝරා ගැනිමේදි ගෙවිය යුතු මිලය පැහැදිලි කල සේක. අවංක අනුගාමිකයෙකු හෝ නායකයෙකු තමා සන්තක සියල්ල අත්හැර දැමිය යුතුවේ :

> **එසේම නුඹලා අතරෙහි තමා සන්තක සියල්ලම අත්නාරින කවරෙකුටවත් මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලුක් 14 : 33)**

කුරුසිය උසුලාගනිමින් ඔහු තමාව ප්‍රතික්ෂේප කල යුතුය :

> **එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථා කොට යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාව නොසලකා තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා (මතෙව් 16 : 24)**
>
> **තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලුක් 14 : 27)**

ඔහු යේසුතුමන් අනුගමනය කල යුතුය :

> **එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථා කොට යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාව නොසලකා තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා (මතෙව් 16 : 24)**

දෙවියන්වහන්සේගේ රාජ්‍යය තමන්ගේ ප්‍රමුඛතාව විය යුතුය :

> **එහෙයින් කුමක් කමුද, කුමක් බොමුද, කුමක් අඳිමුද කියමින් කනස්සළු නොවෙල්ලා.....**
>
> **නුමුත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා. මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6 : 31 - 33)**

උන්වහන්සේගේ රාජ්‍යය ඔබගේ ජිවිතයේ ප්‍රමුඛතාවය වන්නේ නම්, ඔබගේ අවශ්‍යතා සැපයිමට දෙවියන්වහන්සේ ප්‍රතිඥා දුන් සේක.

අනුගාමිකයෙකු සෑම කෙනෙකු හටම දාසයෙකු විය යුතුය :

> **ගෝලයෙක් තමාගේ ගුරුවරයාටත් දාසයෙක් තමාගේ ස්වාමියාටවත් වඩා උතුම් නැත. (මතෙව් 10:25)**

එහෙත් ඔබ අතර, එය එලෙස නොවනු ඇත. එහෙත් ඔබ අතරින් උදාර වන්නාවූ කවරෙකු හෝ වෙත්නම් ඔහු ඔබගේ සේවකයා විමට සලස්වන්න :

> **නුඹලා අතරේ එසේ නොවන්නේය, නුඹලා අතරේ යමෙක් උතුම්වෙන්ට කැමතිනම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය.**
>
> **එසේම මනුෂ්‍යය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්ටද බොහෝ දෙනෙක් උදෙසා මිදිමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටද ආවේයයි කී සේක. (මතෙව් 20 : 26 - 28)**

## මූලික අවශ්‍යතාවයන් සපුරාලන අයවලුන් තෝරාගන්න. :

විශ්වාසවන්ත මිනිසුන් තෝරාගෙන තමන් උගන්වා ඇති දේ ඔවුන්ට පවරන ලෙස පාවුලු තිමෝති හට පැවසිය. අනෙකුත් අය හට ඉගැන්වීමේ හැකියාව මෙම විශ්වාසවත් මිනිසුන් සතුවිය යුතුය. මූලික අවශ්‍යතාවයන් වනුයේ විශ්වාසවත්කම සහ අනෙකුත් අය හට ඉගැන්වීමේ හැකියාවයි. යම් අයෙකු විශ්වාසවන්ත නොවේනම් අධ්‍යාත්මික ප්‍රවර්ධනය කිරීම සඳහා වන්නාවූ තම වගකීම පූර්ණවත් නොකරනු ඇත. ඔහු විශ්වාසමත් වන්නේ නමුත් අනෙකුත් අය හට ඉගැන්විය යුත්තේ කෙසේදැයි ඔහු නොදනි නම් එවිට ඔහුද අසාර්ථක වන්නේය.

විශ්වාසවන්තකම කෙරෙහි අධ්‍යාත්මික පරිනතභාවය අදාල වන්නේය. අනිකුත් අය හට ඉගැන්වීමට හැකියාව පවතිනු විය යුතු වන නමුත් අධ්‍යාත්මිකව තවමත් පරිනත නොමැති ඇදහිලිවතුන් පිළිබඳව පාවුල් පැවසිය. එවැනි පුද්ගලයින් සැබෑ ගෝලකම සඳහා තවම සුදානම් නොමැත. විශ්වාසවන්ත භාවයේ මූලධර්ම පිළිබඳව ඔවුන් තව දුරටත් උපදේශනය කල යුතුය.

විශ්වාසවත් මිනිසුන් අත්‍යවශයෙන්ම වැරදි රහිත මිනිසුන් විය යුතු වන්නේ නැත. ඔහු සිය ජීවිතයන් තුල ක්‍රිස්තුස් - සමාන ගුනාත්මක භාවයන් වර්ධනය කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටින විශ්වාසවන්තයින් වෙති. මුල් ගෝලයින් හා පරිද්දෙන්ම “ විශ්වාසවන්ත මිනිසුන් ” හට පවා යටපත් කර දැමිය යුතුවන ගැටළු සහ දුර්වලතා ඇත.

ලෝකය සහජ හැකියාවන්ගෙන් යුතු වූ මිනිසුන් රැගෙන ඔවුන් හට ස්භාවයක් ලබා දිමට උත්සහ දරයි. වෘත්තිමය දක්ෂතා සහිත පුද්ගලයන් නිර්මානය කිරීම කෙරෙහි ඔව්හු අවධානය යොදවති. ගති ස්භාවයෙන් යුතු වූ “ විශ්වාසවත් ” මිනිසුන් තෝරා ගන්නා ලෙසත් එවිට තමන් වහන්සේ අධ්‍යාත්මික සහජ නිපුණතාවයන් සහ හැකියාවන් වලින් ඔවුන් බලවත් කරවාලන බවත් දෙවියන්වහන්සේ පැවසිය. දෙවියන්වහන්සේගේ අභිමතයන් ඉෂ්ඩ කිරීම සඳහා විශ්වාසවත් මිනිසුන් ලබා ගත හැක. සිමොන් සහ ඇන්ඩෘ හට යේසුස් වහන්සේ හඬ ගැසි විට ඔවුන් “ සැනෙකින් ” තමන්ගේ දැල් අතහැර දැමුහ. ඔවුන් ලබා ගැනිම සඳහා වූ පහසුව “ සැනෙකින් ” යන වචනය අනාවරණය කරයි.

ක්‍රිස්තුවහන්සේගේ ගෝලයින් හා පරිදිවම විශ්වාසවන්ත මිනිසුන් තුලද දේව වචනය කෙරෙහි දැඩි ආශාවක් පවති. උන්වහන්සේ ශුද්ධ වු ලියවිලි ඔවුන් හට පැහැදිලි කරන විට ඔවුන්ගේ “ හදවත් දැවිල්ලට පත්විය ” ( ලුක් 24 : 32, 45 ) ඔවුන් උගන්වනු ලැබීමට කැමති වු අතර, ඉතා අගා කලහ. දෙවියන්වහන්සේටද මනුෂ්‍යයාටද ප්‍රේම කිරිම තුලින් විශ්වාසවන්ත මිනිසුන් සලකණු කරනු ලැබ ඇත. පළමු සහ දෙවන ප්‍රධාන නියමයන් ඔහු ඉතා බැරෑරුම් ලෙස පිලිගනි.

තවද නුඹේ මුළු හෘදයෙන්ද, නුඹේ මුළු ආත්මයෙන්ද, නුඹේ මුළු බුද්ධියෙන්ද, නුඹේ මුළු ශක්තියෙන්ද දෙවිවු ස්වාමින්වහන්සේට ප්‍රේම කරපන්න. : මේ පළමු වන දෙයට නියමය වේ.

තවද දෙවැන්නද සමාන වන අතර, එය මෙසේය. නුඹට මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේම කරපන්න මේවාට වැඩියෙන් උතුම් වු කිසිදු ආඥාවක් නැත.

## පුහුණු කිරිම පිළිබද මුලධර්ම

තමන්වහන්සේගේ ගෝලයින් තෝරා ගැනිමෙන් පසු, ඔවුන් පුහුණු කිරිම සදහා වැදගත් මුලධර්ම අටක් යේසුස් වහන්සේ පැහැදිලි කර දුන් සේක.

1. ඇසුරු කිරිම :

යේසුස් වහන්සේ සිය ගෝලයින්ට කථා කළ විට “ තමන්වහන්සේ සමග සිටින ලෙසට ” උන්වහන්සේ ඔවුන්ට පැවසුහ. උන්වහන්සේ ඉතා කුළුපග ලෙසින් තමන්වහන්සේගේ ජිවිතය සිය ගෝලයින් සමග බෙදා ගත්හ. විධිමත් සේවා අවස්ථාවන්හිදි සාමාන්‍ය අවස්ථාවන්හිදිත් යන අවස්ථා දෙකහිදිම උන්වහන්සේ ඔවුන් සමග ගත කළ සේක. කම්ටු රැස්විම් සහ ඉරුදින වන්දනා මෙහෙයන් තුලින් පමණක් ඔබට අනුගාමිකයින් සහ නායකයින් පුහුණු කළ හැකි නොවේ. ඔබ පුහුණු කරවන්නන් සමග සමීප ආශ්‍රයක් පැවැත්විය යුතුය. ඔබගේ ජිවිතය ඔවුන් සමග ඔබ බෙදා හදා ගත යුතුය. ඔවුන්වද, ඔවුන්ගේ ගැටළු සහ ඔවුන්ගේ අධ්‍යාත්මිය මට්ටම ආදි වෙනත් කරුණුද ඔබ දැනගත යුතුය.

2. කැප කිරිම :

යේසුස් වහන්සේ සමග සම්බන්ධතා පැවැත්විම කෙරෙන් කැප  කිරිම සකස් විය. කිසියම් වර්ගයකට (නිකායකට) හෝ සංවිධානයකට නොව කිසියම් පුද්ගලයෙක් හට කැප කරන ලෙස යේසුස් වහන්සේ සිය ගෝලයින්ට දැන්වුහ. දෙවියන්වහන්සේ වෙත කෙරෙන මෙම කැප කිරිම සදහා උන්වහන්සේගේ වචන සහ අභිප්‍රායන් වෙත පුර්ණ කීකරුකම අවශ්‍යවේ. (යොහාන් 4 : 34, 5 : 30, 15 : 10, 17 : 4, සහ ලුක් 22 : 42)

3. දර්ශණය :

තමන්ගේ ගෝලයන් වෙත අධ්‍යාත්මික දර්ශණය ලබා දෙමින් යේසුස් වහන්සේ ඔවුන් පෙළඹ වු සේක. දෛනික ජිවන රටාවෙන් බැහැර වු වෙනත් විශාල කාර්‍යයක් ඉටු කිරිම සදහා උන්වහන්සේ ඔවුන් හට පැවරුහ. මනුෂ්‍යයන් අල්ලන්නන් වන ලෙස උන්වහන්සේ ඔවුන්ට පැවසුහ (මතෙව් 4 : 19) උන්වහන්සේ ඔවුන් හට මුළු ලෝ පුරා පැතිරි අධ්‍යාත්මික අස්වැන්න පිළිබද දර්ශනයක් ලබා දුන් සේක. (යොහාන් 4 : 35) දෙවියන්වහන්සේගේ රාජ්‍යය අනාවරණය විම පිළිබදව ඔවුන්ට අභියෝග කළ සේක. (මතෙව් 13)

දර්ශණයක් නැති කළ මිනිස්සු වැනසෙන්නෝය. (හිතෝපදේශ 29 : 18) ඔවුන්ට මගපෙන්වීමක් හෝ දිරිගැන්වීමක් නැත. ඔබ වෙනත් අය පුහුණු කරවන කළ, කාර්යභාර්ය දිරිගන්වනු පිණිස ආධ්‍යාත්මික දර්ශණය ඔවුන් වෙත සන්නිවේදනය කල යුතුය. දර්ශණය වන්නේ දේව රාජ්‍යයේ ශුභාරංචිය ලොව පුරා විජයග්‍රහණය කරවීමය. එයට වඩා අඩු අභිප්‍රායකින් කිසිදු විටෙක වියවුල් නොවන්න.

## 4. උපදේශනය :

යේසුස්වහන්සේ තමන්වහන්සේගේ කාලයෙන් විශාල කොටසක් උන්වහන්සේගේ ගෝලයින් උගන්වමින් ගත කල සේක. උන්වහන්සේගේ උපදේශ්‍ය ඔවුන්ට උන්වහන්සේ ලබා දුන් දර්ශණය හා අදාල විය. යේසුස් වහන්සේගේ ක්‍රම අනුගමනය කරමින් ඔබ ගෝලයින් පුහුණු කරවයිනම් එවිට ඔබ යේසුතුමන් ඉගැන්වූ දේවල් ඉගැන්විය යුතුය. මේ මහා නියෝගය පිළිබඳ ආඥාවේ කොටසකි.
(මතෙව් 28 : 20)

අවධාරණය යේසුස්වහන්සේගේ ඉගැන්වීම් සහ මුල් සභාව තුල මෙම ඉගැන්වීම් ක්‍රියාත්මක කරන ලද කල අනාවරණය වූ දෙය පිළිබඳව විය යුතුය. මෙයින් අදහස්වනුයේ ඉගැන්වීමෙහි කෙන්ද්‍රය විය යුතු වන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මයන් සහ නව ගිවිසුමෙහි සන්දේශයන් මත බව (හාවස්ටයිම් ජාත්‍යන්තර අයතනයේ අධ්‍යනය පටිපාටිය එවන් පුහුණුව සපයයි. යේසුස් වහන්සේගේ ක්‍රම අනුගමනය කරමින් ඉගැන්වීම ඔබට පුහුණු කරවන “ ඉගැන්වීමේ උපාය මාර්ග ” යනුවෙන් නම් කල පාඨමාලාවක්ද හාවස්ටයිම් ඉදිරිපත් කරයි.)

යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඔබ උගන්වන කල දේව වාක්‍ය පිළිබඳ සම්පූර්ණ එලිදරව් කිරීම. ඔබ උගන්වනුයේ එය පැරණි ගිවිසුම මත පදනම්ව ඇති නිසාය. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක :

> **...මා ගැන මොසෙස්ගේ ව්‍යාවස්ථාවෙහිද අනාගතවකතෘන්ගේ ලියවිලිවලද, ගිතිකාවලද ලියන ලද සියල්ල සම්පූර්ණ විය යුතුයැයි, මා නුඹලා සමග සිටියදිම නුඹලාට කී වචන මේය....**
>
> **...මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වද විදින්ටත්, තුන්වෙනිදා මලවුන්ගෙන් නැගිටින්ටත් :**
>
> **යෙරුසලමේ පටන් සියලු ජාතින්ට පසුතැවිලිව සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබනටත් යුතු යයි, ලියා තිබේ. (ලුක් 24 : 44, 46 - 47)**

## 5. පත්‍යකෂණ කිරීම

යේසුස්වහන්සේ ඉගැන්වූයේ වාචික උපදෙස් මගින් පමණක් නොවේ. තමන්වහන්සේ ඉගැන්වූ දේවල් උන්වහන්සේ ක්‍රියාවෙන් සනාතකර පෙන්නූ සේක. යේසු තුමන් සුවපත් කිරීම ඉගැන්වූ අතර රෝගින් සුවපත් කරමින්, එය තහවුරු කර පෙන්වූහ. සාතන් කෙරෙහි ඇදහිලිවන්තයාගේ ආධිපත්‍ය උන්වහන්සේ උගන්වා යක්ෂයින් පලවා හරිමින් එය පත්‍යක්ෂකරවිය. උන්වහන්සේ අසරණයින් වෙනුවෙන් සැලකීම උගන්වා සමුහයා වෙත ආහාර සපයා එය පැහැදිලි කලහ.

ගෝලයන් ශිෂ්‍යයින් පමණක් නොව, ඔවුන් දෙවියන්වහන්සේගේ බලය පිළිබඳව ඇසින් දුටු සාක්ෂි කරුවෝද වූහ. ඔවුන් උගන්වනුයේ “ඇසින් දුටු සාක්ෂි ” ලෙස “ අප දුටුවාවූ ඇසුවාවූ ඒ දෙය ” බව ඔව්හු පසු අවස්ථාවේදි ප්‍රකාශ කලහ. (1 යොහාන් 1 : 1)

යේසුස් වහන්සේ උදාහරණ මගින් ඉගැන්වූ සේක. උන්වහන්සේ ජිවත් වූ සහ සේවා සැලසූ ආකාරය මගින් තමන්වහන්සේ ප්‍රකාශ කල දේ පත්‍යක්‍ෂ කර පෙන්නූ සේක. උන්වහන්සේ මෙසේ පැවසූහ :

> **මක්නිසාද මා නුඹලාට කල ලෙස නුඹලාත් කරන පිණිස නුඹලාට ආදර්යක් දුනිමි. (ශු. යොහාන් 13:15)**

දෙවියනවහන්සේගේ බලය පත්‍යක්‍ෂ කිරිම ජනයා ඔබගේ පණිවුඩය වෙත සවන්දිමට සලස්වයි.

> **සමූහයෝ ඇමිකත් දි පිලිප් කල ආශ්වර්ය්‍යයන් දුටු කල ඔහු කී කරුණු එක්සිත්ව සැලකුවෝය. (ක්‍රියා 8 : 6)**

පාවුල් ප්‍රකාශ කලේ ශුද්ධ ලියවිල්ලෙහි සත්‍ය පමණක් නොව (ගලාති 5 : 2) එහෙත් ශුද්ධවූ ලියවිල්ලෙහි බලය පිලිබඳව ප්‍රකාශ කලේය. (රෝම 1 : 16) ඔහු ශුද්ධ ලියවිල්ල ප්‍රකාශ කර පත්‍යක්‍ෂ කලේය. (1 කොරින්ති 2 : 1, 4) මෙම විෂය කෙරෙහි සම්පූර්ණයෙන් කැප කරනු " බල මූලධර්ම " යනුවෙන් මාතෘකා කෙරුණු පාඩමාලාවක් හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය සතුව ඇත.

## 6. සහභාගිත්වය :

හුදු දැනිම පමණක් ප්‍රමාණවත් නැත. ප්‍රතිඵලදායක විම සඳහා දැනිම යෙදවිය යුතුය. ක්‍රියා කිරිම සඳහා කිසියම් අවස්ථාවක් පැමිනෙනු ඇත. ගෝලයෝ යේසුස්වහන්සේගේ ඉගැන්විම් වලට සවන් දිම සහ පත්‍යක්‍ෂ කිරිම් දර්ශණය කිරිම පමණක් නොව, ඔවුහු ඒවා සඳහා සහභාගි විමද කලහ. ඉගෙනුම සහතික කිරිම සඳහා ඉගැන්විම පමණක් ප්‍රමාණවත් නොවේ. ඉගැන්විම පමණක් කිරිම පොතක් කියවිම මගින් ශෛල්‍යකර්ම කිරිම ඉගෙනිමට උත්සහ කිරිම වැනිය.

තමන් ඉගෙනගන්නා දේ පිලිබඳ නිශ්චිත පලපුරුද්දක් ගෝලයින් හට තිබිය යුතුය. ශුද්ධ ලියවිල්ල බෙදා ගන්නා ආකාරය කෙසේද, රෝගින් වෙනුවෙන් යාච්ඤා කරන්නේ කෙසේද, යක්ෂයින් පලවා හරින්නේ කෙලෙසද ආදිය පිලිබඳව ඔවුන් පලපුරුද්දක් ලබා ගත යුතුය. තමන්වහන්සේගේ ගෝලයින් හට එවන් අවස්ථාවන් යේසුතුමා සැපයුහ. (මාර්ක් 6 : 7 - 13 සහ ලූක් 9 : 1 - 6) කියවන්න. ඔවුන් හට ඉගැන්වූ දේ අත්විදිම සඳහා යේසුස්වහන්සේ තමන්වහන්සේගේ ගෝලයින් පිටත්කර යැවූ සේක. ඔබ පුහුණු කරවන්නන් අසන්නෝ පමනක් නොව කරන්නන් බවටද, පත්විය යුතුය.

## 7. අධික්ෂණය :

යේසුස්වහන්සේගේ ගෝලයින් තම සේවා ගමන නිමවා ආපසු පැමිණි කල යේසුස්වහන්සේ ඔවුන්ගේ උත්සහයන් තක්සේරු කර බැලුහ. (ලූක් 9 : 10) සම්පූර්ණ පුහුණු ක්‍රියාවලිය පුරාවටම යේසුස්වහන්සේ තමන්වහන්සේගේ ගෝලයින් අධික්ෂණය කල සේක. තම පරිශ්‍රමයන්හිදි ඔවුන් තනිකරනු නොලැබුහ. එවුන් නිවැරදි කිරිම දෝෂාරෝපණය කිරිම, සහ දිරිගැන්විම පිනිස උන්වහන්සේ ඔවුන් සමග වුහ.

කිසියම් දෙයක් කිරිමට කැමැත්තෙන් ඉදිරිපත් වන සේවයකයෙකු හට එය කල යුතු ආකාරය පෙන්වා දි උනුසුම් බලාපොරොත්තු සහිතව ඔවුන් පිටත් කර යවන ලද හේතුව නිසාම පමනක් මෙම කාර්ය ඉටු කෙරෙනු ඇතැයි ඔබට පිලිගත නොහැක. ඔබ අධික්ෂනය කල යුතුයි. සේවකයා සංකාවට සහ බාධකයන්ට මුහුණ පාන විට එම අභියෝගයන් වලට මුහුණ දිය යුතු ආකාරය ඔබ ඔහුට ඉගැන්විය යුතුයි.

අධික්ෂනයේ ඇතැම් විට " ඔස්සේ යෑම " ලෙසින්ද හැදින්වේ. පාවුල් තම ගොලයින් අධික්ෂණය කලේය. හෙවත් " ඔස්සේ ගියේය "

> **ඔහු එහි කලක් පසුකොට පිටත්ව පිලිවෙලින් ගලාතියේ සහ පිරිගියේ පලාත මැදින් ගොස් සියළු ගෝලයන් ස්ථිර කලේය. (ක්‍රියා 18 : 23)**

> **අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යට බොහෝ දුක්විදිමින් ඇතුල්වෙන්ට ඕනැයැයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාද කලේය. (ක්‍රියා 14 : 22)**

8. **පැවරීම :**

ගෝල භාවය පිලිබඳ ක්‍රියාවලියේ අවසාන අවධිය වුයේ යේසුස්වහන්සේ තමන්වහන්සේගේ අනුගාමිකයින් වෙත තමන්ව ගෝලයින් සදාන්නන් බවට පැවරූ අවස්ථාවයි. ලෝකයේ ජාතින් පුරා අධ්‍යාත්මික වර්ධනය ඇති කිරිමේ කාර්යය උන්වහන්සේ ඔවුන් වෙත පැවරූ සේක.

**එපිසයේ ආදර්ශය**

ඔබගේ බයිබලයේ (ක්‍රියා 19 : 1 - 20 කියවන්න) එපිස නැමැති නගරයේදි පාවුල් අපෝස්තුළුවරයාගේ සේවාව පිලිබඳව මෙම පරිච්ජේදයෙන් විස්තර කෙරේ. පාවුල් ප්‍රථමයෙන් එපිසයට ලගා වු කල, ඔහු එහි වාසය කල ඇදහිලිවන්තයින් සොයා බැලුවේය. මෙම පුරුෂයින් සහ ස්ත්‍රින් ඒ වන විටත් සුභාරංචිය පිලිගෙන යේසුස්වහන්සේගේ අනුගාමිකයින්ව සිටි අතර, (ක්‍රියා 19 : 1) එහෙත් එලදායි අයුරින් තමන්ගේ නගරය තුල සේවා කිරිම සඳහා ඔවුන්ට වැඩිදුර පුහුණුව අවශ්‍යව තිබුනහ.

අත්දැකිම් පාදක කරගනිමින් ඉගෙනිමට පාවුල් ඔවුන්ට සැලැස්විය. ඔහු කල පළමු කාර්ය වුයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය වන නව අධ්‍යාත්මික අත්දැකිම් වෙත ඔවුන් යොමු කිරිමය. (ක්‍රියා 19 : 2 - 8) ආදර්ශය මගින් පාවුල් ඔවුන්ට ඉගැන්විය. ස්වාමින්වහන්සේගේ නාමයෙන් සිදුකරන ලද විශාල ආශ්වර්යෙන් ඔහු අත්දුටුවෝය. (ක්‍රියා 19 : 11 - 12) නියම ඇදහිලිවතුන් නොවුවන් අනාවරණය වු අතර, එවුන් පසුතැවුනෝය. (ක්‍රියා 19 : 13 - 17) අලුතින් ගැලවිම ලැබුවන් ස්වාමිවු යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙත දිනා ගනු ලැබින. (ක්‍රියා 19 : 17 - 20)

සාම්ප්‍රදායික නායකයින් කෙරෙන් සුභාරංචිය කෙරෙහි විරෝධය එල්ල වු කල, පාවුල් එපිසයේ පුහුණු මධ්‍යස්ථානයක් පිහිට විය.

> **මුත් සමහරූ මුරන්ඩුව, අකිකරුව, සමුහයා ඉදිරියේ ඒ ලබැදි මාර්ගය ගැන දොස් කී කල්හි ඔහු ඔවුන් ලගින් අහක්ව ගෝලයින් වෙන්කර ගෙන කුරානස්ගේ ශිල්ප ශාලාවේ දවස් පතා තර්ක කරමින් සිටියෝය. (ක්‍රියා 19 : 9)**

නායකත්වය පුහුණු පිලිබඳව ආකෘතිමය වැඩසටහනක් සඳහා එපිසය ඇති විශිෂ්ඨ වු උදහරණයකි. පුහුනුව ලැබිම සඳහා තමන්ගේ උපන් පරිසරය වෙතින්, පාවුල් ඔවුන් ඉවත් නොකලෝය. ඔවුන්ට ස්භාවික වු පරිසරයක් තුලදි ඔහු ඔවුන් පුහුනු කලේය. ඔවුන් ස්වකීය පුජාව තව දුරටත් සිටිමින් ඔවුන්ගේම භාෂාවක් උගත්හ.

පාවුල් පිහිට වු මධ්‍යස්ථානයේ ගෝලයින් සඳහා දෙවසරක පුහුණු පාඨමාලාවක් පිරිනැමිය. පසුකාලයේ අරමුණ වුයේ ශුද්ධ වු ලියවිලි පණිවිඩය ව්‍යාප්ත කරන්නාවු ගෝලයින් සංඛ්‍යාව වැඩිකර ගැනිමය :

**මෙය දෙවසරක් කෙරීගෙන ගියේය, මෙසේ ආසියාවේ විසූ සියල්ලෝ වන යුදෙව්වරුද, ග්‍රීක්වරුද, ස්වාමින්වහන්සේගේ වචනය ඇසූහ. (ක්‍රියා 19 : 10)**

මෙම පුහුණු මධ්‍යස්ථානය සංස්කෘතික වෙනස්කමක් නොසැලකිය. යුදෙව්වරුන් සහ අන්‍යජාතීන්ටද (යුදෙව්වරු නොවන ලෝකයේ අනෙකුත්) **යන දෙකොටසටම ශිෂ්‍යයෝ සේවා කලහ. මෙම පාසලට භූගෝලීය මායිම් නොවිය. ශිෂ්‍යයින් තමන්ගේම නගරය වන එපිසයට සේවා සැලසීම පමණක් නොව ඔහු මුළු මහත් අසියානු මහද්වීපය වෙත සම්ප වූහ.**

**එපිස උදාහරණය, පුහුණුව සඳහා වූ හොඳ ආකෘතියක් වනුයේ එසේ පුහුණු කරන ලද්දෝ අනිකුත් අය හට ඉගැන්වූයේය**

**.... මෙසේ ආසියාවේ විසූ සියල්ලෝ වන යුදෙව්වරුද, ග්‍රීක්වරුද ස්වාමින්වහන්සේගේ වචනය ඇසූහ. (ක්‍රියා 19 : 10)**

**එපමන බලගතු ලෙස ස්වාමින් වහන්සේගේ වචනය වර්ධනය වී බලවත් වුනෝය. (ක්‍රියා 19 : 20)**

එපිස පාසල ගෝලයින් පුහුණු කරවා, සභාවේ කටයුතු සඳහා ඔවුන් සන්නද්ද කලේය. අරමුණ වූයේ භූගෝලීය වශයෙන් (ආසියාව පුරා) සහ සංස්කෘතික වශයෙන් (යුදෙව්වරු සහ ග්‍රීක්වරු දොකොටසටම) ශුද්ධ ලියවිල්ල පතුරුවා හැරීමය. අලුතින් ඇදහිල්ලට පැමිනි අය ඉන්පසු ගෝලයින් ලෙස පුහුණු කර වූයේ නොකඩවා වර්ධන ක්‍රියාවලියක් පරිද්දෙනි.

## පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම

එපිස ආකෘතියේ හා සමාන පුහුණු මධ්‍යස්ථානයන්හි අවශ්‍යතාවයක් අද පවති. ඇදහිල්ලට පැමිණෙන අයගේ සංඛ්‍යාව වර්ධනය වන විට, ශුද්ධ ලියවිල්ල ලොව පුරා ගෙන යැමේ වගකීමෙහි අභියෝගයට මුහුණ දෙන්නාවූ අනුගාමිකයින් සහ නායකයින් වශයෙන් ඔවුන් පුහුණු කරවීම ඉතා වැදගත්ය.

එපිසයේ පුහුණු මධ්‍යස්ථානයෙන් සභාව ආදේශනය වූයේ නැත. මුල් කාලීන ශුද්ධ වූ සභාවේ එක්රැස්වෙන ස්ථානය වූ සිනගෝගයේදී ඇදහිලිවතුන් තවදුරටත් රැස්වූහ. තමන්ගේ නිවාසයන් හි පිහිටි සභාවන්හිදී හමු වීමද ඇදහිලිවතුන් නොකඩවා සිදුකරගෙන ගියහ. එපිස පාසල සභාවේහිදි ව්‍යාප්තියක් මිස එහි ආදේශකයක් නොවිය. එවන් පුහුනු පාඨමාලා වෙත අරමුණ වන්නේ ශුද්ධ ලියවිල්ල ක්‍රියාකාරීව පතුරුවා හරින පවතින්නාවූ කිසිදු ආයතනයක් වෙනුවට ආදේශනයක් කිරීම නොවන්නේය.

එපිස ආකෘතිය හා සමාන පුහුණු මධ්‍යස්ථානයක් ආරාම්භ කිරීමට ඔබ උනන්දු වන්නේ නම්, මේ සඳහා උපදෙස් “ වර්ධනය කිරීමේ ක්‍රම වේදයෝ ” යනුවෙන් නම් කරැති හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතන පාඨමාලාවෙන් සපයා ඇත.

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන බයිබල් වාක්‍යයන් මතකයෙන් ලියන්න

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

2. සෙසු අය පුහුණු කරවීම භාරදූර වගකීමක් වනුයේ මන්ද ?

--------------------------------------------------------------------------------

3. නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කිරීමේ අරමුණ කුමක්ද ?

--------------------------------------------------------------------------------

4. යේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයෝ නැමැති අධ්‍යනයෙහි සාකච්ඡා කෙරුන, තෝරා ගැනීම සඳහා වූ මූලධර්ම 6 ක් ලැයිස්තුගත කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

5. යේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයෝ නැමැති අධ්‍යනයෙහි සාකච්ඡා කරන ලද, පුහුණු කිරීම පිළිබඳ මූලධර්ම 8 ක් ලැයිස්තුගත කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

6. නායකත්ව පුහුණු ආකෘතියක් ලෙස දක්වා ඇතිතේ නව ගිවිසුමේ කිනම් උදාහරණයක්ද ?

--------------------------------------------------------------------------------

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම සංග්‍රහය අවසාන පරිච්ඡේදයේ දැක්වේ.)

## වැඩිදුර අධ්‍යනය සඳහා

1. අනුගාමිකයෝ නායකයින් වන්නාහ :

– මොසස්ගේ අනුගාමිකයෙක් වු යෝෂුවා නායකයෙකු බවට පත්වේ. (ගණන් කථාව 27 : 18, ද්විතිය කථාව 3 : 28)
– එලියාගේ අනුගාමිකයෙක් වු ඒලිෂා නායකයෙකු බවට පත්විය. ( 2 රාජාවලිය 2 )

2. පසුව නායකයින් බවට පත් වු අනුගාමිකයින් යේසුස්වහන්සේ පුහුණු කලහ. යේසුස් වහන්සේ යලි යලිත් කල ප්‍රකාශය වුයේ අනුගමනය කිරීම සඳහා වු ඉල්ලීමය "අනුගමනය කරන්න" "මා අනුගමනය කරන්න" සහ "මා පසු පස එන්න" යන වචන යේසුස්වහන්සේ 20 වතාවකට වඩා පාවිච්චි කල සේක. එම ඇමතුම් කරනු ලැබුයේ

| | |
|---|---|
| - සිමොන් සහ අන්ද්‍රෑ | මතෙව් 4 : 19, මාර්ක් 1 : 17 |
| - යාකොබ් සහ යොහාන් | මතෙව් 4 : 21, මාර්ක් 1 : 20 ( ඇගවීම ) |
| - මතෙව් | මතෙව් 9 : 9, මාර්ක් 2 : 14, ලුක් 5 : 27 |
| - පිලිප් | යොහාන් 1 : 43 |
| - ප්‍රේත්‍රුස් | යොහාන් 21 : 19, 22 |
| - පොහොසත් යෞවනයා | මතෙව් 19 : 21, මාර්ක් 10 : 21, ලුක් 18 : 22 |
| - උන්වහන්සේගේ ගෝලයන්ගෙන් තවත් කෙනෙකු | මතෙව් 8 : 22 |
| - ඕනෑම අයෙකුට | මතෙව් 16 : 24, මාර්ක් 8 : 34, යොහාන් 12 : 26, ලුක් 9 : 23 |

3. 1 සාමුවෙල් 19 : 18 - 20 සහ 2 රාජාවලිය 2 : 1, 4 : 38, 6 : 1, හි පැරනි තෙස්තමේන්තු කාලයේදි නායකයින් පුහුණු කිරීම පිළිබඳව කියවන්න.

4. අනුගාමිකයින් සහ නායකයින් පුහුණු කරවීමේදි ඔබ මැඩපවත්වා ගත යුතු ප්‍රධාන බාධකයන් මෙසේ:

    1. මනුෂ්‍යයාට භිය වීම

    2. උදාසින බවත්

    3. වෙනසකට විරෝධය දැක්වීම

    4. ප්‍රමුඛතාවයන් අවුල්කර ගැනිම

    5. නොදැනිම (ශුද්ධ වු ලියවිල්ලහෙි පංගුකාරයන් විය යුතු ආකාරය සහ සභාවෙහි නිශ්චිත කාර්‍යයන් කල යුත්තේ කෙසේද යනු පිලිබඳව මිනිසුන් පුහුණු කල යුතු වේ.)

5. අනුගාමිකයින් සහ නායකයින් යන දෙකොටසම පුහුණු කිරීමේදී හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවන් ඔබට සහය විය හැක. ලබා දිය හැකි පාඨමාලාවන් පිලිබඳ ලේඛනයක් සඳහා අදම ඉල්ලුම් කරන්න.

6. පුහුණු කිරීමෙහි අධ්‍යයන වාරයක් පැවැත්වීම සඳහා මාර්ගෝපදේශකත්වය මෙසේය :

**සූදානම්ව සිටින්න :**

හැම ගුරුවරයෙකුම තමන් ඉගැන්වීමට අදහස් කරන විෂය පිලිබඳව පරිපූර්ණ පලපරුදුකම් සහිතව සිටිය යුතුය. යාච්ඤා කිරීම මගින් ඔහු සූදානම් විය යුතුය. සෑම පන්ති වාරයක් සඳහාම සූදානම් කරන ලද නිසි සැපයීම් සහ අවශ්‍ය ද්‍රව්‍ය ඔහු සතුව තිබිය යුතුය.

හැම ගුරුවරයෙකුටම එක් එක් පාඩම සඳහා වූ නිශ්චිත අරමුණු තිබිය යුතුය. ඔබ හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ ලිපි ලේඛණ භාවිතා කරනුයේ නම්, එක් එක් පරිච්ජේදය ආරම්භයෙහි අරමුණු ලේඛණ ගත කර ඇත.

ශිෂ්‍යයින් වෙනුවෙන් පන්ති කාමර සූදානම්ව තැබීමට සහතික වන්න.

**නියමිත වේලාවට වැඩ කරන්න :**

පන්තිවාරයන් නියමිත වේලාවට ආරම්භ කර සහ අවසාන කරන්න. (ශුද්ධාත්මයාණන් වහන්සේ වෙනස් මෙහෙයවීමක් කරනුයේ නම් හැර)

**යාච්ඤා කරන්න :**

පන්ති වාරයන් ආරම්භයේ සහ අවසානයේ යාච්ඤා කරන්න.

**සමාලෝචනය සහ සම්පිඩණය කරන්න :**

සෑම පන්තා වාරයක්ම ආරම්භ කිරීමට පෙර පසුගිය පන්තියේදී ඉගැන්වූ දෙය පිලිබඳ කෙටි සමාලෝචනයක් කරන්න. එක් එක් පන්ති වාරය අවසන් කිරීමට පෙර ඒ වාරයේදී උගන්වන ලද දෙය සම්පිඩනය කරන්න.

**විවිධ ඉගැන්වීම් ක්‍රම අනුගමනය කරන්න :**

යේසුස් වහන්සේගේ ක්‍රමවේදයන් භාවිතා කරමින් ඉගැනිවීම සඳහා “ඉගැන්වීමේ ක්‍රමවේද” යනුවෙන් නම් කරැති හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව ඔබ පුහුණු කරවනු ඇත.

**ශුද්ධාත්මයාණන් හට විවෘතව පවතින්න :**

ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීම වෙනුවෙන් විවෘතව පැවතිම පාඩම සම්පූර්ණ කිරීම හෝ සැලසුම් කරන ලද බාහිර රූපකය අනුගමනය කිරීමට වඩා බෙහෙවින් වැදගත්ය.

**ප්‍රදර්ශණය කරන්න :**

උගන්වන ලද දෙය ප්‍රදර්ශණ්‍ය කරන්න. උදාහරණයක් වශයෙන් ඔබගේ අනුශාසනය සුවකිරීම පිලිබඳව නම්, එහි පැමිණ සිටින රෝගි වූ අය වෙනුවෙන් යාච්ඤා කරන්න. ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය පිළිබඳව අනුශාසනය කිරීමේදි, එය අත්දකිනු සඳහා ජනයා මෙහෙයවන්න.

**අත් දැකිම් අධ්‍යයනයට සැලැසුම් කරන්න :**

පන්ති වාරයන් අතරතුරදි සම්පූර්ණ කිරිම සඳහා අධ්‍යනය පැවරුම් ශිෂ්‍යයන් වෙත ලබා දෙන්න. ඔවුන් ඉගෙන ගන්නාවූ දෙය තමන්ගේ සභාව සහ සමාජය තුල ක්‍රියාවෙහි යෙදවීම සඳහා ඔවුන් වෙත ඉඩ ප්‍රස්ථා සලස්වන්න.

7. ඔබගේ සලකා බැලිම සඳහා ප්‍රශ්ණ කීපයක් මෙහි ඇත :

අනෙකුත් අය ඉදිරියෙහි ඔබගේ ආදර්ශය දෙවියනවහන්සේ වෙනුවෙන් ජිවත්වීම පිනිස ඔවුන් යොමුකරවන්නේද ?

ඔබගේ ආදර්ශය නිරික්ෂණය කිරිම පිනිස අනෙකුත් අය හට අවකාශ ලැබෙන්නේද, එසේ නැතහොත් ඔබ ජනයා කෙරෙන් දුරස්ව සිටින්නේද, ඔබ ක්‍රමවත් ආකාරයකට අනෙකුත් අය සඳහා විවෘතව පවතින තුන් ආකාරයක් ලැයිස්තුගත කරන්න.

ඔබගේ ජිවිත ආදර්ශය අනෙකුත් අය විසින් අනුගමනය කල යුතු බව ඔබ සහතික වශයෙන් විශ්වාස කරන්නෙහිද ? එය එසේ විය යුත්තේ හෝ නොවිය යුත්තේ මන්ද ? ඔබගේ ආදර්ශ්‍ය වඩා යහපත් බවට පත්කර ගැනිමට ඔබට හැකිවන්නේ කුමන ආකාරයෙන්ද?

ඔබගේ නායකත්වය ක්‍රියාත්මක කිරිමේදි ඔභ දේව වක්‍යයෙහි කිසියම් නිශ්චිත මුලධර්මයක් කෙලසන්නෙහිද? ඒ කුමන ආකාරයකින්ද? මෙය ඔබට නිවැරදි කර ගත් හැකිවන්නේ කෙසේද? ඔබට උපකාර කරනු සඳහා ඔබ විසින් පුහුණු කරවනු ලද යම් අයෙකු ඔබට නම් කළ හැකිද?

## එකොලොස්වන පරිච්ඡේදය

### අසමත් වීමට මුහුණ දීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසු පහත සදහන් දෑ ඔබට හැකිවනු ඇත. :

- ප්‍රධාන ජේදය මතකයෙන් ලිවීම.
- අසමර්ථතාවය සදහා වන්නාවූ මූලික හේතු 3ක් හදුනා ගැනීම.
- අසමර්ථතාවය තුලින් විජයග්‍රහණය ලබාගත් බයිබලයානු නායකයින් හදුනා ගැනීම.
- අසමර්ථතාවය කෙරෙන් සිය ජිවිත අවසන් වූ බයිබලයානු නායකයින් හදුනා ගැනීම
- අසමර්ථතාවය සමෘද්ධියට හරවා ගැනීම සදහාවූ බයිබලයානුකූල මාර්ග රටාවන් ලැයිස්තුවක් සකස් කරන්න.

**ප්‍රධාන ජේදය :**

**ධර්මිෂ්ඨයා සත්වරක් වැටුනත් නැගිටින්නේය. (හිතෝපදේශ 24:16)**

### හැදින්වීම

"බයිබලයානුකූල පරිපාලන මූලධර්ම" පිළිබඳ මෙම පාඨමාලාවෙහි ඇතුලත් මෙම පාඩම ඉතා වැදගත් ඒවා අතරින් එකකි. එය අසමර්ථතාවය පිලිබදව සලකා බලයි. දෙවියන්වහන්සේ සතුව ඇති ශ්‍රේෂ්ඨ සැලසුම් ඇත, එහෙත් තමන්වහන්සේගේ සැලැසුම් සාධනය කිරීම සදහා උන්වහන්සේ ශ්‍රේෂ්ඨ නොවූ මිනිසුන් මගින් ක්‍රියා කරන්නාහ. ඔබ ශ්‍රෙෂ්ඨයෙකු නොවන හෙයින්, අසමර්ථතාවය සදහා වූ හේතුන් ඔබ තේරුම් ගත යුතු වන අතර, අසමර්ථවූ කල්හි කළ යුතු වන්නේ කුමක්දැයි ඔබ දැනගත යුතුය.

අසමර්ථතාවයේ මූලික හේතුන් ඔබ මෙම පාඩමේදි ඉගෙන ගන්නනවා ඇත. අසමර්ථතාවය කෙරෙන් ජිවිත අවසානවූ නායකයින්ගේ සහ අසමර්ථතාවය විජයග්‍රහනයට පෙරළාගත් අයවලුන්ගේ උදාහරණයන් ඔබ අධ්‍යනය කරනු ඇත. අසමර්ථතාවයට මුහුණ දෙමින් එය සාර්ථකත්වයට හරවා ගැනීම සදහා වූ බයිබලයානුකූල මෙහෙයුම් රටාවන්ද ඔබ වෙත ලබා දෙනු ඇත.

### අසමර්ථතාවයට සලස්වන්නේ කුමක්ද ?

අසමර්ථතාවය සදහා පාදක වන මූලික හේතු 3 කි.

**1. සම්බන්ධතාවය තුලින් වූ අසමර්ථතාව :**

බොහෝ නායකයින් අසමත් වනුයේ දෙවියන්වහන්සේ සමග ඔවුන්ගේ පවතින සම්බන්ධතාවය නුසුදුසු වන නිසාය. ඔවුන් (හෙබ්‍රෙව් 6 : 1 - 3) ලේඛන ගත නිසි ආධ්‍යාත්මික පදනම් වර්ධනය කර නොමැත්තේ විය හැක. දෙවියන්වහන්සේ වෙනුවෙන් කිසියම් කාර්‍යයක් දුබල අධ්‍යාත්මික පදනමක් මත ගොඩ නැගිමට ඔවුන් ප්‍රයත්න දරන කල, එය ඇද වැටෙන්නේය.

ඇතැම් නායකයින් " දෙවියන්වහන්සේගේ කාර්‍යයන් " කිරීමෙන් කොතරම් අවිවේකි බවට පත්වන්නේද යත්, ඔහු යාච්ඤාව, දේව ධර්ම අධ්‍යනය, නිරාහාරශිලය, සහ ස්වාමින්වහන්සේද උන්වහන්සේගේ කැමැත්තද පැහැර හරිති. තවත් සමහරු ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඔවුන් තුල මුලින් පැවති අධික ප්‍රේමය නැතිකර ගනිති. දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ රාජ්‍යය වෙත ප්‍රමුඛතාව ලබා දිම වෙනුවට ලෞකික අධ්‍යනයන් සහ සම්පත්, මුදල් ඉපයිම හෝ මිනිසුන් සතුටු කිරීම ඔවුන්ගේ ජිවිතයන් හි ප්‍රමුඛස්ථානයට පත් වෙති.

දෙවියන්වහන්සේ සමග තමන්හටම පමනක් සිමා වු සම්බන්ධතාව හේතු කොට අසමර්ථතාවයට පත්වු නායකයෙකු පිලිබඳ උදාහරණයකි (උස්සියා රජු) උස්සියා රජු යහපත් ලෙස ආරම්භ කලේය. ඔහු ස්වාමින්වහන්සේ සෙව්ය. (2 ලේකම් 26 : 6 - 8) ඊශ්‍රායලයේහි සතුරන්ට එරෙහිව සාර්ථක ලෙස සටන් කලේය. (2 ලේකම් 26 : 6 - 8) එහෙත් උස්සියා රජු ප්‍රසිද්ධිය ලබා අහංකාර විමෙන් පසු, ඔහු " දූෂිත ලෙස ක්‍රියා කිරීමට " පටන් ගත් අතර, ඔහු තව දුරටත් දෙවියන්වහන්සේ නොසෙව්ය.
(2 ලේකම් 26 : 16)

**2. ක්‍රියාවන් හේතු කොට ගෙන අසමර්ථ විම :**

"ක්‍රියාවන් හේතු කොට ගෙන අසමර්ථ විම" යනුවෙන් අර්ථවත් කෙරෙනුයේ තමන්ගේම පාපකාරි ක්‍රියාවන් කරනකොට ගෙන අසමර්ථ විමයි. සෑම වැරදි ක්‍රියාවක්, වචනයක්, ආකල්පයක් හෝ පෙළඹවිමක් පාපකාරි "ක්‍රියාවන්" හා අදාලවේ. එවන් ක්‍රියාවන් හෙවත් පාපකාරි "ක්‍රියාවන්" අසමර්ථවිම ප්‍රතිපල ලෙස ගෙන දෙයි.

**3. අතපසු කිරිම හේතු කොට ගෙන අසමර්ථ විම :**

ඔබ නොකරන දේ හේතු කොට ගෙන ඇති වන අසමර්ථතාව "අතපසු කිරිම හේතු කොට අසමර්ථවිම" යනුවෙන් අර්ථවත් කෙරේ. "අතපසු කිරිමෙන්" ඔබ පාපයෙහි ගැලෙන කල ඔබ විසින් කළ යුතු වන දේ ඉටුකිරිමට ඔබ අසමත් වන්නේය. ශුද්ධ වු බයිබලය මෙසේ පවසයි.

**එබැවින් යමෙක් යහපත කරන්ට දැන එය නොකරන්නේ නම්, ඔහුට ඒක පාපයය. (යාකොබ් 4:17)**

**"අතපසු කිරිම" පිළිබඳ පාපයන් වන්නේ ඔබ විසින් කරනු ලැබිය යුතු බවට දේව වචනයෙන් ප්‍රකාශ කෙරෙන එහෙත් එසේ කිරිම ඔබ පැහැර හරින දේවල්ය. එවැනි " අතපසුකිරීම් " සම්බන්ධයෙන් යේසුස්වහන්සේ තමන්වහන්සේගේ කාලයෙහි විසු ආගමික නායකයින්ට තරවටු කල සේක. උන්වහන්සේ මෙසේ කීහ.**

> **ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාර වු නුඹලාට දුක්වේ. මක්නිසාද නුඹලා සුවඳතලාය, ශාක පුෂ්පයය, සුදුදුරුය යන මෙයින් දසයෙන් කොටසක් දෙන්නහුය. නුමුත් යුක්තියත් දයාවත් විශ්වාසකමවත්, ව්‍යාවස්ථාවේ වඩා වැදගත් කාරණා නුඹලා විසින් අතහැර තිබේ. ඒ දේවලුත් නැර මේවාත් කටයුතුව තිබුනේය. (මතෙව් 23 : 23)**

**තම අසමර්ථතා මතින් විජයග්‍රහනය කල නායකයෝ**

සිය ජිවිතයන්හි කිසියම් වු අවස්ථාවක නායකයින් වශයෙන් අසමත් වු ශ්‍රේෂ්ඨ මිනිසුන් පිළිබඳ බොහෝ උදාහරණයන් ශුද්ධ ලියවිල්ලෙහි අන්තර්ගතව ඇත :

**ආබ්‍රහම් :** තමන් මරා දමා තම භාර්යාව ඔහුගෙන් පැහැරගනු ලැබෙනු ඇතැයි. යන බියෙන් සාරා තමන්ගේ භාර්යාව බව සම්බන්ධයෙන් ඔහු අසත්‍යය පැවසුවේය. එසේවුද්, ඔහු විශ්වාසයේ මිනිසෙකු සහ "දෙවියන්වහන්සේගේ මිත්‍රයා" ලෙස හඳුන්වනු ලබයි.

**මෝසෙස් :** ඔහු කෝපයෙන් යුතු ව් දෙවියන්වහන්සේ අණ කල පරිදි පර්වතයට කථා නොකරමින්, පර්වතයට පහරදී ජලය ලබා දෙන ලෙස කෑ ගැසිය. එහෙත් මෝසස් තරම් වූ වෙනත් ශ්‍රේෂ්ඨ දිව්‍යස්වරයෙකු කිසිදිනෙක නොසිටි බව ශුද්ධ ලියවිල්ල පවසයි.

දාවිත් රජු : ඔහු වෙනත් පුරුෂයෙකුගේ භාර්යාව සමග පරදාර සේවනයෙහි යෙදිමෙන් පසු ඔහුගේ පාපය සැගවිමෙහි උත්සහයෙන් මිනිසා මරා දැමීය. එහෙත් ඔහු ශ්‍රේෂ්ඨ රජෙකු වූ අතර "දෙවියන්වහන්සේගේම ආත්මය අනුව ගිය මිනිසෙකු" ලෙසින් හඳුන්වනු ලැබිය.

යෝනා : නිනිවය වෙත ගොස් දේශනා කරන ලෙස දෙවියන්වහන්සේ ඔහුට අණකල කළ ඔහු එයට විරුද්ධ දෙසට ගියේය. පසුව ඔහු ඉතිහාසයේ සුවිශාලතම පිබිදිම සැලසු දේශනයක් කලේය. මුළු නුවරම පශ්චාත්තාප විය.

යෝෂුවා : මෙම මිනිසා මෝසෙස්ගේ මරණයෙන් පසු ඊශ්‍රායෙල් ජාතියෙහි නායකත්වය භාරගත් ශ්‍රේෂ්ඨ හමුදා අණ දෙන්නෙකි. දෙවියන්වහන්සේ යොෂුවා වෙත භාරදුන් එක් අභියෝගයක් වුයේ උන්වහන්සේගේ පොරොන්දු දේශය ලබා ගැනිම සඳහා ඊශ්‍රායෙල් ජනතාව මෙහෙයවිමය. එහෙත් එක් අවස්ථාවකදි ඔහු කෙතරම් ආශ්චර්‍යමත් වුයේද යත්, ඔහු යෝර්දානයෙන් අනෙක් පස ජනශුන්‍ය ප්‍රදේශයෙහි තනිව සිටිමට කැමති විය. වෙනත් එක් අවස්ථාවකදි ඔහු ගිබියොන්වරුන් විසින් රවටනු ලැබිය. එසේවතුදු, දෙවියන් වහන්සේ විසින් පොරොන්දු වු දේශය අත්පත් කරගැනිම සඳහා මෙම මිනිසා ඉදිරියටම ගියේය.

ප්‍රොපේත එලියා : යෙසබෙල් නම් වු දුෂ්ඨ රැජිනක් තමන් එළියා ප්‍රොපේතවරයා මරා දැමිම සඳහා සැලසුම් කරනබව දන්වමින් ඔහු වෙත පණිවුඩකරු යැවුවාය. එලියා මෙසේ කිවේය

> **තමාම දවසක ගමන්, කාන්තාරයට ගොස් රෝතෙම් ගසක් යට හිදගෙන, තමා මැරෙන ලෙස ඉල්ලමින්, ස්වාමින්වහන්ස, ඉතින් ඇත. දැන් ස්වාමින්වහන්සේ මාගේ ප්‍රාණය ගත මැනව මක්නිසාද මාගේ පියවරුන්ට වඩා මම උතුම් නොවෙමි.** (1 රාජාවලිය 19 : 4)

දෙවියන්වහන්සේගේ නාමය කෙරෙන් රෝගින් සුවකල, මළවුන් නැගිටවු සහ ස්භාවධර්මයේ මුලධාතුන් පාලනය කල මිනිසා මොහුය. දැන් ඔහු බියපත්ව, අධෛර්‍යමත්ව සහ මරණය ඉල්වමින් සැගවෙන්නේය. එහෙත්, කාර්මාල් කඳුවැටියේදි මුළු ජාතිය ඉදිරියෙහි දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරිම සඳහා එලියා නැවත පැමිණියේය.

**පේත්‍රුස්** : මෙම මිනිසා යේසුතුමන්ට පිටුපෑ නමුත් මුල් සභාවෙහි විශිෂ්ඨ නායකයෙකු බවට පත් වුයේය.

**ප්‍රේරිත පාවුල්** : ප්‍රේරිත පාවුල්ද අසමර්ථබවට මුහුණ පෑවේය. ආසියාවේදි ලැබු අත්දැකිම් හේතුවෙන් ඔහුට "උසුලන්ට බැරි පමන බර පැමුණනහ." බවත් "ජිවිතය ගැන පවා බලාපොරොත්තුවක් නොතිබුනි. බවත් (2 කොරින්ති 1 : 8) ඔහු එක් අවස්ථාවකදි ප්‍රකාශ කලේ තමන් අතවරයට පත්වු ව්‍යාකුලත්වයට පත් වු සහ හිංසා කරනු ලැබු සහ පහත හෙලනු ලැබු (2 කොරින්ති 4 : 8 - 11) අවස්ථාවන් ඔහු ප්‍රකාශ කලේය. තමන් බියට පත්වි සහ කරදර සහිතව සිටි බව ඔහු පැවසිය.

(2 කොරින්ති 7 : 5 - 6) එනමුත් ලෝකයේ සියළු ජාතින් අතර, විශිෂ්ඨ සභාවන් සහ නායකයින් ඇතිකරවමින් ප්‍රේරිත පාවුල් සාධක ලෙස අන්‍ය ජාතින් කෙරෙහි ශුද්ධ වු ලියවිල්ල ප්‍රචාරනය කලේය.

### තම අසමර්ථාවන් පරාජයෙන් අවසන් වු නායකයෝ

තම ජිවිතයන් අසමර්ථාවයෙන් සහ පරාජයෙන් අවසන් කිරිමට සිදුවු නායකයින් පිලිබඳවද බොහෝ උදාහරණයන් ශුද්ධ වු ලියවිල්ලෙහි අඩංගුව ඇත.

සැම්සන් : ඊශ්‍රායල්හි විශිෂ්ඨ විනිශ්චයකරුවකු සහ දෙවියන්වහන්සේ වෙතින් ඔහු ලද සුවිශේෂ වු කාය ශක්තියෙන්ද හෙබියේය. ඊශ්‍රායලය පලස්තිනු සතුරාගෙන් මුදා ගැනිම ඔහු ආරම්භ කලේය. මිත්‍ය දූෂ්ඨික කාන්තාවක් සමග සම්බන්ධතාවක් මගින් සැම්සන් සිරකරුවෙකු ලෙස ගෙන සතුරාගේ සිරකරුවෙකු ලෙසින් සිටියදිම මරණයට පත් විය.

උස්සියා : තමන් අවුරුදු 16 ක් වයස්ව සිටියදි ඔහු රජකමට පත් වි ස්වාමින්වහන්සේගේ දර්ශණය හමුවේහි නිවැරදි දෙය කරන තෙක් ඔහු සාර්ථක විය. දෙවස්ථානය තුලට ඇතුලු වි පුජකයින් විසින් පමණක් සිදු කිරිම සඳහා බලය පැවරි තිබු සේවා සිදු කිරිම මගින් ඔහු පාපයට යොමු විය. දෙවියන්වහන්සේ ඔහු ලාදුරු රෝගය මගින් තරවටුකරනු ලැබ හෙතම මරණයට පත්විය.

සාවුල් : ජනතාව වෙතින් ගෞරවාභිමානයෙන් පුද කරන ලද සහ දෙවියන්වහන්සේගේ ආත්මය තමන් මත රදා සිටි මිනිසෙකු වු ඔහු ඊශ්‍රායෙල් හි පළමු රජ වුයේය. ඔහුගේ අකීකරුකම හේතුවෙන් සාවුල් දෙවියන්වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඔහුගේ කාර්‍යය නිම කිරිම සඳහා වෙනත් රජ කෙනෙකුන් තෝරා ගැනින. සාවුල්ගේ ජිවිතය පරාජයෙන්, අවමානයෙන් සහ දිවිනසා ගැනිමෙන් අවසන් විය.

ඒලි : ඔහු ප්‍රථමයෙන් ස්වාමින්වහන්සේගේ ගෘහයෙහි ප්‍රධාන පුජකයෙකු වුයේය. අකීකරුකම හේතුවෙන් ඒලි සහ ඔහුගේ පුත්‍රයෙන් අවමානයෙන් යුතුව මරණයට පත් වුහ.

යුදස් : යේසුස්වහන්සේගේ මිහිතලය මත සේවා කාලයේදි පළමුවෙන් ඔහු උන්වහන්සේගේ ගෝලයෙකු විය. යේසුස් වහන්සේගේ විශිෂ්ඨ ප්‍රතිහාර්‍යයන් පිලිබඳ ඔහු සාක්ෂි කරුවකු වු අතර, උන්වහන්සේගේ ඉගැනිවිම ඇසිය. එහෙත් ඔහු යේසුතුමන් පාවා දි සිය දිවිනසා ගනිමින් ඔහු තමාගේම ජිවිතය අවසන් කලේය.

### වෙනස සිදුවුයේ කුමක් නිසාද ?

මෙම නායකයින් අතුරින් ඇතැමෙක් සිය අසමර්ථතාවයන් කෙරෙන් ඉවත්ව යලි ප්‍රකෘතිමත් වෙමින් දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨයන් බවට පත්විමට ක්‍රියා කලහ. අනෙක් අය කිසිදු විටෙක යලි වෙනස් නොවුහ. ඔවුන්ගේ ජිවිත පරාජයෙන් කෙළවර විය. වෙනස ඇති කලේ කුමක්ද ?

මෙම ප්‍රශ්ණයට සැපැයිම සඳහා, ඊශ්‍රායෙල් වංශයේ ශ්‍රේෂ්ඨ රජුන් දෙදෙනෙකු වන දාවිත් සහ සාවුල් රජවරුන්ගේ ජිවිතයන් පිළිබඳව විස්තරාත්මක වශයෙන් පිරික්සා බලමු. ප්‍රථමයෙන්, (2 සාමුවෙල් 11-12) හි දාවිත්ගේ අසමර්ථ විම පිළිබඳව කථාව කියවන්න. ඉන්පසු (1 සාමුවෙල් 15) හි සාවුල්ගේ අසමර්ථතාවය පිලිබඳ කතාව කියවන්න.

අපගේ සාමාන්‍ය තර්කය අනුව, දාවිත්ගේ අසමර්ථතාවය සාවුල්ගේ වරදට වඩා බෙහෙවින් විශාල සේ පෙනේ. සාවුල් කලේ ඔහුට එසේ නොකරන ලෙසට දෙවියන්වහන්සේ උපදෙස් දි තිබිය දි යුධ පිටියෙන් එකතුකරගත් ගවයින් කිපයක් ආපසු ඒමේදි රැගෙන ඒම පමණි. දාවිත් වෙනත් මිනිසෙකුගේ ස්ත්‍රියක සමග පරධර සේවනය කලේය. ඇය ගර්භනිව ඇති බව දැනගත් කල, පාපය වසන් කිරිම සඳහා ඔහු ඇයගේ ස්වාමිපුරුෂයා මරා දැම්මවිය. දෙවියන්වහන්සේ විසින් සාවුල් රජු වශයෙන් ප්‍රතික්ෂේප කල නුමුත්, දාවිත් කිරුළ අත්නොහැර සිටිමින්, “ දෙවියන්වහන්සේගේම ආත්මය පසුපස ගමන් කරන ලෙසින් හදුන්වනු ලැබිය.

එක් මනුෂ්‍යයෙකුගේ ජිවිතය පිරිහිමෙන් අවසන්වු අතර අනෙක් තැනැත්තා අනාගත සාර්ථකත්වය කරා යොමුවුයේ මක්නිසාද? පිලිතුර වන්නේ එක් වචනයකි. පශ්චත්තාපය, සාමුවෙල් දිවැසිවරයා සාවුල් හට ඔහුගේ පාපය පිලිබඳව පැවසු විට සාවුල් මෙසේ පැවසිය....

> **මම පව් කලෙමි, මක්නිසාද මම සෙනගට භයවි ඔවුන්ගේ හඩට කිකරු වු බැවින් ස්වාමින්වහන්සේගේ අණදාවද ඔබගේ වචනයද කඩ කලෙමි.**
>
> **එවිට ඔහු, මම පව් කලෙමි. එහෙත් දැනට මාගේ සෙනගගේ වැඩිමහල්ලන්ද ඊශ්‍රායෙල්වරුන්ද, ඉදිරියෙදි මට ගෞරවය දි මා විසින් ඔබගේ දෙවිවු ස්වාමින් වහන්සේට නමස්කාර කරන පිනිස මා හා සමග හැරි ආවමැනවයි කිවේය.** (1 සාමුවෙල් 15:24, 30)

සාවුල් තම පාපය සිදුකිරිමේදි හසුවු අතර, ඔහු එය පිලිගත්තේය. ඔහු කණගාටුවට පත්විය, එහෙත් හසුවිම පිලිබඳව පමණකි. පාපය සම්බන්ධයෙන් කණගාටු විම පමණක් ප්‍රමාණවත් නැත. එම කණගාටුව පශ්චත්තාපය තෙක් යොමු විය යුතුය.

> **මක්නිසාද දේව කැමැත්තට එකග වු ශෝකයෙන් තැවෙන්ට කාරණයක් නොවන්නාවු ගැලවිමට පමුනුවනු පසුතැවිලි විම හටගන්නේය. නුමුත් ලොකික ශෝකය මරණය උපදවන්නේය.** (2 කොරින්ති 7:10)

තමන් අසාර්ථක වු බව සාවුල් පිලිගත්තේය. එහෙත් තමුන්ගේ අසාර්ථකත්වය පිලිබඳව ඔහු අනෙකුත් මිනිසුන් වෙත දොස් පැවරිය. තමන් හට අවමානයක් සිදු නොවනු සඳහා, ජනයාගේ නායකයින් ඉදිරියේදි ඔහුට ගෞරව කිරිම එහු සාමුවෙල් වෙතින් බලාපොරොත්තු විය. තමන් තවමත් ආධ්‍යාත්මික තැනැත්තෙකු බව ජනයාට පෙන්විම සඳහා තමන් සමග එක්ව් දෙවියන්වහන්සේට නමස්කාර කිරිම සාමුවෙල් වෙතින් ඔහුට අවශ්‍ය විය.

සාවුල් කිසි විටෙකදිවත් තම පාපය නොසගවා දෙවියන්වහන්සේ වෙත පැවසුවේවත්, පශ්තාපවුයේ සහ ක්ෂමාව අයැදුවේවත් නැත. තමන්ගේ ක්‍රියාවන් පිලිබඳව පෞද්ගලික වගකිම භාරගැනිම ඔහු ප්‍රතික්ෂේප කලේය. දෙවියන්වහන්සේ පශ්චත්තාප ඉල්වු කල ඔහු නමස්කාරය පුද කලේය. දෙවියන්වහන්සේ සමග තම සම්බන්ධතාවයට වඩා සාවුල් සැලකිලිමත් වුයේ ජනයා අතර වු තම කිර්තිය පිලිබඳවය. ඔහු රාජදානිය සැලකුයේ දෙවියන්වහන්සේගේ රාජධානිය විලසින් නොව, තමන්ගේම ආධිපත්‍ය ගොඩ නංවා ගැනිමේ මාර්ගයක් ලෙසිනි.

මේ හේතුවෙන් සාමුවෙල්, සාවුල් හට පැවසුවේ ......

> **ස්වාමින්වහන්සේ අද ඊශ්‍රායෙල් රජකම නුඹෙන් පැහැරගෙන නුඹට වඩා යහපත් වු නුඹේ අසල්වාසියෙකුට දි තිබේ.** (1 සාමුවෙල් 15:28)

රාජධානිය සාවුල් වෙතින් ඉවත්කර දාවිත් හට දෙනු ලැබිය.

නාතාන් දිවැසිවරයා දාවිත්ගේ පාපය පිලිබඳව ඔහුගෙන් විමසූ කල දාවිත් වහාම එය පිලිගත්තේය:

**මම ස්වාමින්වහන්සේට විරුද්ධව පව් කලෙමි (2 සාමුවෙල් 12 : 13)**

වෙනත් අය වෙත දොස් පැවරීමට ඔහු උත්සහ නොකලේය. ඔහු බැත්ෂෙබා හට දොස් පැවරුවේ නැත. එහු තමාගේම වැරදි පිලිගෙන දෙවියන්වහන්සේ ඉදිරියෙහි නිහතමානිව පසුතැවිලි වුයේය. දාවිත්ගේ පශ්චත්තාපයේ **සුවිශේෂ යාච්ඤාව (ගිතාවලිය 51) වර්ථා වි ඇත. ඔබගේ බයිබලයේ ඇති මෙම සම්පූර්ණ ගිතිකාව කියවන්න. දාවිත් තමාගේ පාපය පිලිගෙන තමාව ඉල්විය.**

**මක්නිසාද මාගේ අපරාධ මම ඒත්තු ගනිමි මාගේ පාපයද නිරතුරුව මා ඉදිරියෙහිය**

**ඔබට විරුද්ධව ඔබට පමණක්ම විරුද්ධව පව් කලෙමි. ඔබගේ ඇස් හමුයෙහි නපුරුව තිබෙන දේ කලෙමි. දෙවියන්වහන්ස පවිත්‍ර සිතක් මා තුල මැව්ව මැනව, ස්ථිර ආත්මයක් මා තුලෙහි අලුතින් සැදුව මැනව. (ගිතාවලිය 51 : 3, 4, 10)**

වරද පිලිබඳව විමසූ විට දාවිත් පශ්චාත්තාප වෙමින් දිශාව වෙනස් කලේය. සාවුල් එලෙස කලේ නැත. ඔහු දේව කැමැත්ත වෙතින් තවත් දූරස්ව මංමුලාව ගියේය. එම නිසා ඔහුගේ ජිවිතය අසාර්ථකත්වයෙන් පරාජයෙන් සහ දිවිහානිකර ගැනිමෙන් අවසන් විය.

## ඔබ අසමත් වු කල

ඔබ අසමත් වු කල ඔබ ඒවා අනුගමනය කරනුයේ නම් අසමර්ථතාව සඵලත්වය කරා හැරවිය හැකි වන බයිබලයානු කුල මෙහෙයුම් මාර්ගයන් ඇත. මෙම මෙහෙයුම් මාර්ග අධ්‍යයනය කිරිම සඳහා අපි යෝනාගේ උපමාව පාවිච්චි කරන්නෙමු. මෙම පාඩම සම්බන්ධව ඉදිරි කටයුතු ආරම්භ කිරිමට පෙර බයිබලයේ යෝනාගේ ලියවිල්ල කියවන්න (පරිච්ජේද 4 කි)

නිනිවය නම් වු පවින් පිරි දේශය වෙත ගොස් දේශනා කරන ලෙස ස්වාමින්වහන්සේ විසින් යෝනාට අණකරනු ලද්දාහ. දෙවියන්වහන්සේගේ හඬට කිකරුවනු වෙනුවට ඔහු එහි විරුද්ධ දිශාව වෙත ගමන් ඇරඹිය. යෝනා තමාගේ වැරදි නිවැරදි කිරිම සඳහා පහත දැක්වෙන පියවර ගත්තේය. ඔබ අසමර්ථතාව අත්දකින කල ගත යුතු පියවරයන් මේවාය.

**එළිදරව් කිරිම :**

ඔබ අසමර්ථ වු කල එම අසමර්ථතාවයට හේතුව එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේ වෙතින් ඉල්ලන්න. ධෛර්‍යමත් වන්න :ඔබ අසමර්ථ වු විට එය ඔබට දැනගැනිමට සැලැස්වම පිනිස මාර්ගය දෙවියන්වහන්සේ සතුව ඇත. යෝනා දෙවියන්වහන්සේගේ කැමැත්ත පිටු දැක ඇති බව මුහුදේ ඇති වු විශාල කුණාටුවකින් එට එළිදරව් විය. මෙම එළිදරව් කිරිමෙන් පසු යෝනා එහුගේ වරද පිලිගත්තේය. (යෝනා 1 : 12) ඔබ තම වරද පිලිනොගන්නා තෙක් ඔබ අසමර්ථ අයෙකු ලෙසින්ම පවතිනු ඇත.

**තමාගේ වරද සඟවන්නා සඵල නොවන්නේය. එහෙත් ඒවා කියා දි අත්හරින්නාට කරුණාව ලැබේ. (හිතෝපදේශ 28 : 13)**

**අපට පාපය නැතැයි කියමු නම් අපි අපම රවටා ගනිමුව, සැබෑවද අප තුල නැත. (1 යොහාන් 1:8)**

අසමර්ථතාවය පිලිගැනිමට ඔබ වලක්වන කිසිදු නිදහසට කාරණයකට ඉඩ නොදෙන්න. ඇතැම් සාමන්‍ය ඒවා කිහිපයක් මෙලේසය :

– "මිනිසුන් මා කෙරෙහි ඇති විශ්වාසය බිඳ වැටෙනු ඇත."
– "මම අසමත් විම පිලිගතහොත් එය මා වැරදි බව පිලිගැනිමක් වන්නේය"
– "මම අසමත් වි අවසානය. එලෙසම මා යටත් විමට සුදුසුයි"
– "දැන් පමා වැඩි"
– "මා නරක ආදර්ශයක් වෙමි. එහෙයි මා ඉවත් වි යාම සුදුසුය"
– "සියල්ල නිවැරදි කර ගැනිම සඳහා මම දෙවියන්වහන්සේගේ කැමැත්ත වෙතින් දුරස් වැඩිය."

වෙනත් අයගේ පිවිතයන් කෙරෙහි බලපෑම් සිදුකර නොමැතිව සහ ඔබ ඔවුන්ගේ සමාව අයැදිම අවශ්‍ය නොවන්නේ නම් ඔබගේ අසමර්ථතාවය ප්‍රසිද්ධියේ හෙලිකිරිම අවශ්‍ය නොවන්නේය. එහෙත් සෑම විටම ඔබගේ අසමර්ථතාවය දෙවියන්වහන්සේටද ඔබටමද පිලිගත යුතුය. අසමර්ථතාව සවිලත්වය වෙත පරිවර්තණය කිරිමේ පළමු පියවර මෙය වේ. පාපය හෙලිකල යුතුය. ඔබ එයට මුහුණ පෑ යුතුය.

## පසුතැවිම :

ඔබගේ අසමර්ථතාවයට හේතුව හෙළි වු පසුව, ඔබ පශ්චාත්තාපය විය යුතුය :

**අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් සියළු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහාන් 1 : 9)**

යෝනාගේ පශ්චාත්තාපයේ සුවිශේෂි යාච්ඤාව (යෝනා 2) පරිච්ඡේදයේ වර්ථා වි ඇත. දෙවියන්වහන්සේ ඉදිරියෙහිදි යෝනා තම පාපය පිලිගෙන පශ්චාත්තාප වි සමාව ඉල්ලා සිටියේය. ඔබ අසමත් වන විට පශ්චාත්තාපයෙන් දෙවියන්වහන්සේ ඉදිරියට එන්න. ඔබගේ අසමත් විම සඳහා ඔබ සමාවන මෙන් දෙවියන්වහන්සේ වෙතින් ඉල්ලන්න තමන් හටද සමාව දිමට සහතික වන්න.

**ආපසු පැමිණිම :**

යාච්ඤාව, දේව වචනය, සහ ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්විම මගින් ඔබගේ අසමර්ථතාව ආරම්භ වු ස්ථානය දෙවියන්වහන්සේ ඔබ වෙත අනාවරණය කරනු ඇත. ඔබ එවිට එම ස්ථානය වෙත ආපසු පැමිණ ඔබගේ ගමන් දිශාව ආපසු හරවන්න.

යෝනාගේ ප්‍රශ්ණයේදි ඔහුගේ අසමර්ථතාවය ආරම්භ වුයේ නිනිවය වෙතින් ඔහු විරුද්ධ දෙසට යැමේදි බව ඔහු වටහා ගත්තේය. ඔහුට මෙම අසමර්ථතා ස්ථානය වෙත ආපසු පැමිණ ඔහුගේ දිශාව ආපසු හැරවිමට ඔහුට සිදුවිය. දිශාව වෙනස් කිරිම සැබෑ පශ්චත්තාපයක් හා අදාල වේ. ඔබ අසමර්ථතා ස්ථානයක් කරා ආපසු පැමිනි කල්හි ඔබ පලමුව පාපය සිදුකල ස්ථානය වෙත නැවත හැරී ගොස් ඔබගේ වරද නිවැරදි කරන්නේය. මෙය කරනුයේ ..... මෙම ක්‍රමයෙන්ය.

**ප්‍රකෘතිමත් කිරිම :**

යෝනාගේ ප්‍රශ්ණයේදි තමන්ගේ අසමාර්ථතාවය ආරම්භ වුයේ නිනියව වෙතින් විරුද්ධ දිශාවට ගමන් කිරීමෙන් බව ඔහු හඳුනා ගත් කල ඔහු ගමන් දිශාවන් ආපසු හරවිය. ඔහු නිනිවය දෙසට ගමන් කලේය. ඔහු තමාගේ අසමර්ථතාව නිවැරදි කලේය. ( යෝනා 3 : 3 ) සියල්ල නිවැරදි කිරීම සඳහා ඔහුට කල හැකිව තිබූ දෙය ඔහු කලේය. මෙය “ ප්‍රකෘතිමත් කිරීම ” ලෙස හඳුන්වනු ලැබේ.

ඇතැම් අවස්ථාවන්හිදි පසුතැවෙනු හැර ඔබගේ අසමර්ථතා නිවැරදි කිරීම සඳහා ඔබට කිසිවක් කල නොහැක. අප සාකච්ඡා කල දාවිත්ගේ උදාහරණයේදි බැත්ෂෙබා සමග වු තම පාපය පිලිබඳව එය සිදු කිරීමෙන් පසු ඔහුට කල හැකි කිසිවක් නොවිය. වරද සිදු කල අවසානය පරධර සේවනය සිදු වී ඇගේ ස්වාමි පුරුෂයා මිය ගොස් ඇත. පශ්චාත්තාප වනු හැර එය නිවැරදි කිරීම සඳහා ඔහුට කල හැකි අන් කිසිවක් නැත.

එහෙත් අසමර්ථතාවය ඇති වු ස්ථානය වෙත පෙරළා පැමින වන්දි ගෙවීම කල හැකි අවස්තාවන් හිදි ඔබ එලෙස කල යුතුය. කිසියම් අයෙකුගෙන් සමාව යැදිමට ඔබට සිදුවිය හැක. ඔබ සොරාගත් යමක් ආපසු දිමට හෝ ඔබ මුසාවක් පැවසු බව පිලිගැනිමට ඔබට සිදු විය හැක. මේ සියල්ල ප්‍රකෘතිමත් කිරීම පිලිබඳ උදාහරණයන්ය.

අසමර්ථතාවයෙන් පසුව තමන්වම ප්‍රකෘතිමත් කර ගැනිමට සහ ඔබගේ ආධ්‍යාත්මිය ශක්තිය යලි ගොඩ නගා ගැනිම සඳහා ඔබට කාලයද අවශ්‍ය වේ. සභාවේ වගකිම කෙරෙන් තාවකාලිකව ඉවත් වි සිටිමට ඔබට සිදුවනු ඇත. දෙවියන්වහන්සේ සමග හුදෙකලා විම සඳහා සහතික ලෙසින්ම ඔබට කාලය අවශ්‍ය වනු ඇත.

ඔබගේ ආත්මිය ශක්තිය ප්‍රකෘතිමත් කිරීම සඳහා මාර්ග කිහිපයක් මෙසේය :

- දේව වාක්‍ය අධ්‍යනය කරන්න.

- යාච්ඤාවෙන් සහ නිරාහාර ශිලයෙන් කාලය ගත කරන්න.

- අනාගතයේදි අසමර්ථතා ඇතිවිම වැලැක්විමට ඔබට හැකිවන පරිදි අසමර්ථතා සඳහා වන්නාවු මුලික හේතු කාරක ( මෙම පාඩමේ සපයා ඇති ) විමසා බලන්න. ඔබගේ ජිවිතයේ ගැටවී සහගත ප්‍රදේශයන් වෙතොත් ඒවා නිරාකරණය කර දි නිවැරදි කර ගැනිම සඳහා ඔබට පිහිට වන ලෙස දෙවියන්වහන්සේගේන් ඉල්ලන්න.

- මීලග වාරයේදි වඩාත් ප්‍රබලව සංග්‍රාමයෙහි යෙදිමට ඔබට උපකාරි වනු සඳහා අධ්‍යාත්මිය සංග්‍රාමය පිලිබඳ යුධ උපාය මාර්ග පිලිබඳව විමසා බලන්න. ( “ අධ්‍යාත්මිය සංග්‍රාම විධි : ආත්මිය සංග්‍රාමය පිලිබඳ අත් පොත ” යනුවෙන් නම් කරුති හාර්වස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඩමාලාව බලන්න. )

- ශාරිරික විවේකය ලබා ගන්න. මනුෂ්‍යයා යනු ශාරිරය, ආත්මය සහ ආධ්‍යාත්මයයි. ඔබගේ භෞතික ශරිරය අතිශය වෙහෙසට පත් වු විට, එහි වාසිය ලබා ගනිමින් ඔබගේ ආත්මය, සහ ආධ්‍යාත්මය කම්පා කරවමින් ඔබ අසමත් විමට සැලැස්විම සඳහා සාතන්ට අවකාශ සැලසෙනු ඇත.

## සාර්ථකත්වය කරා!

ඔබ මෙම පියවරයන් ගැනිමෙන් පසු, ඔබගේ අසමර්ථතා පසෙකලා සාර්ථකත්වය කරා පියනගන්න යෝනා තමාගේ අසමර්ථතා ඔහු පිටුපසින් හැර දැමීය. ස්වාමින්වහන්සේ ඔහුට දෙවන වරට කථාකරමින් “ නුඹ නැගිට නිනිවය නම් මහත් නුවරට ගොස්.... ” යැයි කීසේක. (යෝනා 3 : 1 - 2) මෙවර ඔහු වහාම කීකරු විය. නිනිවයේදි යෝනා ඉතිහාසයේ අති විශාලතම නව ජිවනය සිදු කලේය. මුළු නගරයම පශ්චත්තාප විය. ප්‍රකාශ කිරිම, පසුතැවිම, ආපසු හැරි යැම, සහ ප්‍රකෘතිමත් කිරිම නැමැති පියවර අනුගමනය කිරිම මගින් ඔහුගේ අසමර්ථතාව සමර්ථතත්වයට හරවනු ලැබිනි.

යෝනා වැනිවු මිනිසුන් පිලිබඳ බොහෝ කථා ශුද්ධ වු ලියවිල්ලහෙි අඩංගුය. මෙම මිනිසුන් අසමත් වු නමුදු ඔවුන්ගේ අසමර්ථතාව පිලිගෙන දෙවියන්වහන්සේගේ සමාව අයැදුහ. ඔවුන් එසේ කල විට, සමාව දි නව දිශාවන් සලසා දිමට දෙවියන්වහන්සේ කිසිදු විටෙකදි අතපසු නොකල සේක. අසමර්තාව සමර්ථතත්වය බවට පත්කිරිම පිනිස වන්නාවු බයිබලයානු කුල විධි ක්‍රමය මෙයයි.

ඔබටද එලෙසම කිරිමට දෙවියන්වහන්සේට හැකියාව ඇත. උන්වහන්සේ ඔබගේ අතිත අසමර්ථ දෙස නොබලන සේක. ඔබ අද දවසේ සිටින ආකාරයෙන් උන්වහන්සේ ඔබ දෙස නොබලන සේක. උන්වහන්සේ බලනුයේ මිනිසා හෝ ගැහැනිය වශයෙනි......උන්වහන්සේට කිකරුව ඔබ ගමන් කලහොත් පමනක් ඔබට නායකයෙකු විය හැක.

## අසමර්ථතා තුළින් ඉගෙනිම

පාවුල් මෙසේ ලියා තැබිය :

> **එබැවින් සහෝදරයෙනි, ආසියාවේදි අපට පැමිණි පිඩාව ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමෙත්තෙමු. එනම් ජිවිතය ගැන පවා අපට බලාපොරෙත්තුවක් නැතිතරමට, උසුලන්නට බැරි පමණ, අප පිටට බර පැමුණුන බවය. එසේය මළවුන් නැගිටුවන්නාවු දෙවියන්වහන්සේ කෙරෙහි මිස අප කෙරෙහිම විශ්වාස නොකරන පිනිස මරණ-මුගිංචිය අප තුලේම තිබුනේය.**
>
> **උන්වහන්සේ මෙබඳු මහත් මරණයකින් අප ගැලෙව්සේක. මතුත් ගලවන සේක. උන්වහන්සේ තව දුරටත් අප ගලවනසේකැයි යන බලාපොරොත්තුව අප විසින් උන්වහන්සේ කෙරෙහි තබා තිබේ. (2 කොරින්ති 1:8-10)**

ආසියාවේදි පැන නැගුන ගැටළු තමන් හට වැදගත් පාඩමක් ඉගැන්වු බව පාවුල් පැහැදිලිකලේය. “ අපි අප කෙරෙහි නොව දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කල යුත්තෙමු ” තමන් කෙරෙහි ඔබට විශ්වාස කල නොහැක. නායකයෙකු වශයෙන් ඔබගේ ශක්තිය ඔබගේ පාලනය, ඔබගේ සාර්ථකත්වය සහතික වන්නේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුල පමණකි. ගැටළු, දුර්පරික්ෂා, වෙහෙසකරවිම් සහ අසමාර්ථතාවයන් කෙරෙන් සිදුකෙරෙන ආධ්‍යාත්මික ප්‍රතිලාභ වටහා ගැනිම සඳහා පාවුල් භාහිර ලෝකයෙන් ඔබ්බට නිරික්ෂනය කලේය.

> **එහෙයින් අපි ක්ලාන්ත නොවෙමු. අපේ පිටත මනුෂ්‍යා ක්‍ෂයවෙන නුමුත්, අපේ ඇතුල් මනුෂ්‍යා දවසින් දවස අලුත් කරනු ලබන්නේය.**
>
> **මෙහොතකට පවතින අපේ සැහැල්ලු වු දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්න වු අපට,**

**ඉතාමත් වැඩි වශයෙන් සදාකාල තේජස් භාවයක් සදා දෙන්නේය. මක්නිසාද පෙනෙන දේ කාලිකය. නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4 : 16 - 18)**

බාහිර මනුෂ්‍යයා විනාශ වු නමුදු අභ්‍යන්තර පුද්ගලයා යලි යලිත් අලුත් කරනු ලබන බව පාවුල් ඉගෙන ඇත. යටත් වෙනවා වෙනුවට, පාවුල් අසමර්ථතාවයෙන් දැනුම ලබාගෙන සාර්ථකත්වය කරා පිය නැගුවේය. (2 කොරින්ති 1 : 10) ඔහු පෙන්වුයේ දෙවියන්වහන්සේ...

"මුදාගත්සේක." (අතීතයේදි)

"මුදාගන්නා සේක." (වර්ථමානයේදි)

"මුදාගනු ලබන සේක" (අනාගතයේදි)

අප සැම අපගේ සියළු ගැටළු, වෙහෙසකරවීම්, දුර්පරීක්ෂා සහ අසමර්ථතා වෙතින්, උන්වහන්සේ පැවසුවේ අපි...

හිරිහැරයට පත්කරනු ලැබ ඇත. ... එහෙත් ව්‍යසනය වී නොමැත්තෙමු.

වියවුල් කරනු ලැබ ඇත. .... එහෙත් අපේක්ෂාභංග වී නොමැත්තෙමු.

පීඩාවට පත් කරනු ලැබ ඇත ..... එහෙත් අතහැර දමනු ලැබ නොමැත්තෙමු

හෙලා දකිනු ලැබ ඇත. ..... එහෙත් විනාශ වනු ලැබ නොමැත්තෙමු. (2 කොරින්ති 4:8-9)

සියලු වියවුල්, පීඩාකිරීම්, හිරිහැර සහ ආදි සියලු ද්වේශකාරී ක්‍රියාවන් අතරින්, තම අවසානය කාල සීමාවේදි මෙලෙස පැවසීමට පාවුල් හට හැකියාව තිබිනි.

**මම යහපත් යුද්ධයක් කලේම, මම දිවීම කෙලෙවර කලෙමි, මම ඇදහිල්ල රක්ෂා කලෙමි. (2 තිමෝති 4:7)**

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන ජේදය මතකයෙන් ලියන්න

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

2. ස්වකීය අසමර්ථතා මගින් ජයග්‍රහනය කල ශ්‍රේෂ්ඨ නායකයින් පිලිබඳ බයිබලයානුකූලය උදාහරණ 3 ක් ලැයිස්තුගත කරන්න.

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

3. සිය ජිවිතයන් අසමර්ථතා තුලින් අවසන් කල පුද්ගලයන් පිලිබඳ ශුද්ධ වු ලියවිල්ල ප්‍රකාර උදාහරණ 3ක් හඳුන්වන්න.

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

4. අසමර්ථතාව, සාර්ථකත්වය කරා මෙහෙය විමට පිණිස, වන්නාවු ශුද්ධ වු ලියවිල්ල හා අනුකූල මෙහෙයුම් කාරකයන් සඳහන් කරන්න.

නි ----------------------------------- නි -----------------------------------

නි ----------------------------------- නි -----------------------------------

5. අසමර්ථතාවයෙහි ප්‍රධාන හේතු කාරකයන් 3 මොනවාද ?

(මෙම ප්‍රශ්ණ වලට පිලිතුරු මෙම සංග්‍රහයේ අවසාන පරිච්ජේදයෙහි දැක්වේ)

## වැඩිදුර අධ්‍යයනය සඳහා

1. සිය පියාණන් අත හැර දමා නුහුරු දේශයක ජිවත්වීම සඳහා ගිය තරුණ මිනිසෙකු පිලිබඳව යේසුස්වහන්සේ පැවසු කථාව (ලූක් 15 : 11 - 32) සඳහන්වේ. මෙම කථාව විශේෂයෙන්ම පුත්‍රයා සිය පියාණන්ගේ නිවස වෙත ආපසු පැමිණීම පිලිබඳ කොටස, අවධානයෙන් යුතුව අධ්‍යනය කරන්න. මෙම පරිච්ඡේදයෙහි සාකච්ජා කරන ලද ඒ කී මෙහෙයුම් ක්‍රියා පටිපාටින්ම ඔහු භාවිතා කල බව ඔබට පැහැදිලි වනු ඇත.

2. තමන්ගේ ජිවිතයන් හි කිසියම් හෝ අවස්ථාවකදි අසාර්ථක භාවට පත්වු නායකයින් පිලිබඳව ශුද්ධ වු ලියවිල්ලෙහි ඇතුලත් පහත සඳහන් උප ලේඛනය අධ්‍යනය කරන්න. සිය අසමර්ථතාවයන් නිවැරදි කරගත්තු කවරෙකුන්ද? සිය අසමර්ථතාවයන් ඔවුන් සාර්ථකත්වය ඔවුන් වෙත පෙරලා ගන්නා ලද්දේ කෙසේද? සිය අසමර්ථතාවයන් නිවැරදි කර නොගත්තේ කිනම් අයවලුන්ද? ප්‍රථිපලය වුයේ කුමක්ද? දේව වචනය ඔබම අධ්‍යනය කිරීමෙන් වෙනත් උදාහරනයන් ඔබට මෙම උපලේඛනයට එකතු කල හැක.

| | |
|---|---|
| - ආබ්‍රහම් : | උත්පත්ති 20 : 21 |
| - මෝසෙස් : | නික්මයාම, ක්‍රියා 7 : 20 - 44 |
| - ආරොන් : | නික්මයාම 32 |
| - බාලාම් : | ගණන් කථාව |
| - උස්සියා : | 2 ලේකම් 26 |
| - සම්සොන් : | විනිශ්චයකාරයින්ගේ පොත |
| - දාවිත් : | 2 සාමුවෙල් 11 : 12, ගිතාවලිය 51 |
| - සාවුල් : | 1 සාමුවෙල් 8 : 15 |
| - යෝනා : | යෝනා පොත |
| - ප්‍රේත්‍රැස් : | මතෙව්, මාර්ක්, ලුක්, යොහාන්, ක්‍රියා |
| - යොහාන් මාර්ක් : | ක්‍රියා 12 : 12, 25, 15 : 39, 2 තිමෝති 4 : 11 |
| - දේමස් : | 2 තිමෝති 4 : 9 |

3. අසමර්ථතාවයට හේතු වන මුලික හේතුන් 3 ක් ඇති බව ඔබ මෙම අභ්‍යසයේදි ඉගෙනගත් අතර, පහත සඳහාන් දෑ එහි අන්තර්ගතව ඇත :

– දෙවියන්වහන්සේ සමග පුද්ගලික සම්බන්ධතාව සඳහා අපොහොසත් වීම (වැරදි අධ්‍යාත්මික පදනම, යාච්ඤාවෙහි ශුද්ධ ලියවිල්ල නොකියවීම)

– ක්‍රියාව මගින් පව් සිදු කිරීම (කිසියම් ආකාරයක දේව වචනය කඩ කිරීම)

– අතපසු කිරීම මගින් පව් සිදු කිරීම (කල යුතු දේ නොකිරීම)

මෙම මුලික අසමර්ථතාවන් හි ඇතැම් ප්‍රථිපල පිලිබඳ උප ලේකනයක් පහත දැක්වේ. මෙම උපලේඛනයට එකතුකල හැකි වන වෙනත් ප්‍රථිපල ඔබට සිතා ගත හැකිද ?

– අධෛර්යමත්වීම.
– තරගකාරීභව (වෙනත් අයගේ සේවාවන් අනුකරණය)
– දර්ශනයෙහි ඌනතාව

– පුහුණුවෙහි ඌනතාව
– මිලය ගෙවීමට අකමැත්ත
– කැපවීමෙහි ඌනතාව
– වැරදි ප්‍රමුඛතාවන්
– දුරාචාරය (දුෂ්චරිතය)
– තන්හාව, ධන සම්පත්, අරමුදල් වැරදි ලෙස භාවිතය, මුදලට ගිජු බව
– අහංකාරය
– ඊෂ්‍යාව
– ඇදහිලිවතුන් හට අයුතු ලෙස සැලකිම
– ඇදහිලිවතුන් වෙත තොරතුරු දැන්වීමෙහි ඌනතාව
– මනුෂ්‍යයින් කෙරෙහි භිය සහ පුද්ගල වන්දනාව
– ජනප්‍රියතාව
– අවස්ථාවර බව
– ස්වයං ඇගයුමක් නොමැති වීම
– කථාව අනෙකුත් අය සමග සන්සන්දනය කිරීම
– මධ්‍යම ප්‍රතිපදාව
– බලයට හෝ කීර්තියට ගිජු කම
– අනෙක් පුද්ගලයින් පැවරීම් කිරීමේ නොහැකියාව. (සියල්ල තමන්ම කිරීමට උත්සහ කිරීම)
– දෙවියන්වහන්සේ වෙනුවට මිනිසාට සවන් දීමෙන් කීකරු වීම ජනප්‍රිය මතය හේතු කොට වංචල වීම.
– විශ්වාසය නොමැති කම
– සේවයකයෙකු සහ එඩේරෙකු ලෙස ක්‍රියා කිරීමේ නොහැකියාව
– නායකත්ව තනතුරු සඳහා අවශ්‍ය බයිබලයානු කුල සුදුසුකම් නොපිරවීම.
– නායකත්වය සඳහා නිශ්චිත ඇරයුමක් නොමැති වීම.
– අධ්‍යාත්මිය සංග්‍රාම ප්‍රතිපත්ති පිලිබඳ නොදැනීම සහ ඒවා යොදා ගැනීමේ හැකියාවට ඇති ඌනතාව
– දෙවියන්වහන්සේගේ හඬ ශ්‍රවනය කිරීමටත් උන්වහන්සේගේ කැමැත්ත පැහැදිලිව දැකීමටත් ඇති නොහැකියාව හේතු කොට ඇති වන වැරදි නිගමන
– අධ්‍යාත්මික ශක්තියෙහි ඌනතාවය
– සැලසුම් අඩුපාඩු කම
– අධ්‍යාත්මික සමපත් පිලිබඳ නොමනා පරිපාලනය.
– අධ්‍යාත්මික පලදායි නොමැතිවීම.
– අප්‍රසන්නතාවයේ හේතු සාදකය
– අලසකම සහ මන්දගාමී බව
– ලෞකික අශාව
– අලේපයෙහි මද බව

4. උඩගුව අසමර්ථතාව සඳහා වන ප්‍රධාන හේතු කාරකයකි. මිනිසාගේ පළමු පාපයට හේතු සාදක වුයේ එයයි. “ඔබ දෙවියන් හා සමාන වන්නේය” යනුවෙන් පැවසීමෙන් සාතන් ඇමතුවේ උඩගුව වෙතය. උඩගුව පිලිබඳව ලක්ෂනයන් කිහිපයක් මෙසේය:

– යම් අයෙකුගේ වැදගත්කම පිලිබඳ ප්‍රමානයට වඩා සැලකිලිමත් වීම : ගීතාවලිය 101 : 1
– “සියලු පිලිතුරු” තමන් සතු වීම : හිතෝපදේශ 3 : 7
– අහංකාර බැල්ම : හිතෝපදේශ 6 : 17

– "මම" හෝ "මාගේ" යන වචනය නිරන්තරව ප්‍රමාණය ඉක්මවීම. (මමත්වය): යෙසායා 14:14-15
– කෙනෙකුගේ රූප ස්භාවය පිලිබඳව පමනක් ඉක්ම වූ උනන්දුව : යෙසායා 28:1
– ඔබට සිටින්නවුන් හට නියෝග දීමෙන් සන්තෝශ වීම. : මතෙව් 20:26-27
– තනතුරු තන්හාව : මතෙව් 23:6-11
– දෙවියන්වහන්සේ වෙනුවෙන් කරන ලද සේවය පිලිබඳ කීර්තිය ලබා ගැනීම : ක්‍රියා 12:21-23
– වැරදි පෙලඹවීම මත ක්‍රියා කිරීම : රෝම 8 : 6
– මේසයේ හෝ එලියේ ප්‍රධාන ආසන වෙනුවෙන් පොරවැදීම : මාර්ක් 12 : 38 ජ් 39
– කෙනකුගේ බුද්ධිය පිලිබඳ ප්‍රමානය ඉක්මවා සැලකිලිමත් වීම : 1 කොරින්ති 3 : 20
– වැදගතුන් තමන් හා සමීප සමබන්ධතා පැවැත්වීම පිලිබඳ පමන ඉක්ම වූ කුල්මත් බව : 1 කොරින්ති 4:6-7
– ස්වයං ප්‍රශාංසාව : 2 කොරින්ති 10 : 12 - 13
– අනෙකුත් පුද්ගලයින් ඉටුකල  කාර්යන් පිලිබඳව ගෞරවය තමන් වෙත පවරා ගැනීම. : 2 කොරින්ති 10 : 15
– සෙසු අය පිලිබඳව සැලකිල්ල මදබව : පිලිප්පි 2 : 2 ජ් 4
– ප්‍රශ්න සහ අර්ථ විචාරය පිලිබඳ තද අශාවෙන් යුතු වීම : 1 තිමෝති 6 : 4
– සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් පිලිබඳ පුරසාරම් කීම : යාකොබ් 4 : 16
– වැඩිමහල්ලන්ගෙන්ද අධ්‍යාත්මික පුද්ගලයන්ගේද උපදෙස් නොසැලකීම : 1 පේත්‍රුස් 5:5-6
– නොරුස්සනු සුලු ස්වධීනත්වය : එපිස 5 : 21
– දෙවියන්වහන්සේ මත සියලු භාරය පවරනු වෙනුවට අසාහානයට පත් වීම. : 1 පේත්‍රුස් 6:7
– ප්‍රධානයන්, පිලිගැනීම, තනතුරු සහ වන්දි පිලිබඳ ආශා කිරීම : 1 යොහාන් 2:15-16

5. අප අසමර්ථ නොවී සිටිනු සඳහා යේසුස්වහන්සේ යාච්ඥා කල සේක. : (යොහාන් 17:15-20) හි ඇති උන්වහන්සේගේ යාච්ඥාව කියවන්න.

6. මතෙව් 23 අනුව, ක්‍රිස්තියානි නායකයින් සඳහා වන ප්‍රායෝගික ආශාවන් 10 ක ලේකණයක් සකස් කරන්න. මෙම ප්‍රායෝගික මෙහෙයුම් සකස්කරන පිනිස පරිසිවරුන්ගේ සෑම අසමර්ථතාවයක්ම ආපසු හැරවිය හැක.

7. ප්‍රථිපල ලෙසින් අසමර්ථතාව සලසවන්නාවූ දේවල් පිලිබඳ බොහෝ අවවාද හිතෝපදේශ පොතෙහි අන්තර්ගතය. දිනකට එක් පරිච්ජේදය බැගින් කියවූ කල ඔබට එක් එක් මසයේදි එක්වරක් බැගින් පොත කියවිය හැක. අසමර්ථතාව ප්‍රතිපලය ලෙස ගෙන දෙන්නාවූ දේවල් ඔබගේ බයිබලයෙහි ලකුණු කර ඒවායින් වැලකෙන්න. (බයිබලයෙහි අනික් පොත් වලද එලෙසම කිරීම ඔබට අවශ්‍යවනු ඇත.)

8. බයිබලයෙහි කථා වලින් කියවා ඇති නායකයින්ගේ ජීවිතයන් පිලිබඳව අධ්‍යනය කල යුතු වන්නේ කෙසේදැයි මෙම පාඨමාලාවේ උපගන්ත්‍රයෙහි විස්තර කොරේ. අසමර්ථ වූ නායකයින් කිහිප දෙනෙකු අධ්‍යණය කරන්න. ඔවුන් අසමර්ථවීමට හේතු පාදක වූ කරුණු පිලිබඳ ලැයිස්තුවක් සකසන්න.

9. සභාව තුල නායක තනතුරුවල සිටින යෞවන මිනිසුන් සඳහා 1 සහ 2 තිමෝති සහ තිතස් පොත ලියනු ලැබ ඇත. මෙම පොත් අවදානයෙන් යුතුව අධ්‍යනය කර මෙම මිනිසුන්ට වැලකෙන ලෙසට ප්‍රේරිත පාවුල් පවසා ඇති දේවල් ලේඛනගත කරන්න.

## දොලොස් වන පරිච්ඡේදය

### සාර්ථකත්වයේ මූලධර්ම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසු පහත සඳහන් දෑ ඔබට හැකිවනු ඇත. :

- ප්‍රධාන ජේදය මතකයෙන් ලිවීම.
- සාර්ථකත්වය නිර්වචනය කිරීම
- දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි සාර්ථකත්වය, ලෞකික සාර්ථකත්වය කෙරෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීම.
- සාර්ථකත්වයෙහි ප්‍රධාන මූලධර්ම සමාලෝචනය කිරීම.
- සාර්ථකත්වය පිලිබඳ බයිබලයානුකූල මූලධර්ම පිලිබඳ වැඩිදුර හැදෑරීම

**ප්‍රධාන ජේදය :**

> **මේ ව්‍යවස්ථා පොත නුඹේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිනිස රෑ දහවල් ඒ ගැන මෙනෙහි කරපන්න. එවිට නුඹේ මාර්ගය සඵල වී නුඹට සුභ සිද්ධ වන්නේය. (යොෂුවා 1 : 8)**

### හැඳින්වීම

"ඔබගේ සාර්ථකත්වයෙහි රහස කුමක්ද" යනුවෙන් සාර්ථක පුද්ගලයින් වෙතින් නිතර විමසනු ලැබේ. ලෞකික ක්‍රමය තුල පවතින අය බොහෝ විට සඳහන් කරනුයේ අධ්‍යනය, තත්වය, පරමාර්ථය, සහජ හැකියාව, ශක්තිය සහ මුදල් සාර්ථකත්වයේ රහස් ලෙස ප්‍රකාශ කරති. මෙම විෂය පිලිබඳව බොහෝ ග්‍රන්ත රචනා කර ඇති නුමුදු, සාර්ථකත්වයෙහි සත්‍ය මූලධර්මයන් එළිදරව් කර ඇත්තේ ශුද්ධ වූ ලියවිල්ලෙහිය. සාර්ථකත්වයේ ශුද්ධ වූ ලියවිල්ල ප්‍රකාර වූ මූලධර්ම ඔබ මෙම පාඩමෙන් ඉගෙන ගන්නවා ඇත.

හෙබ්‍රෙව් 6 : 1 - 3 හඳුන්වනු ලැබ ඇති විශ්වාසයෙහි පදනම ඔබ දැනටමත් පිහිටුවා ඇතැයි උපකල්පනය කරනු ලැබේ. බයිබලයානුකූලව සාර්ථකත්වය මූලධර්ම ඔබගේ ජීවිතය සහ සභාව තුල අදාල කර ගැනිම සඳහා නිසි අද්‍යාත්මික පදනමක් අවශ්‍ය වේ.

### සාර්ථකත්වය යනු කුමක්ද ?

දේව රාජ්‍යය තුලදි සාර්ථකත්වය යනු " දෙවියන්වහන්සේ විසින් නියම කරනු ලබන වගකීම් පරාසයන් ඇතුලත කෙනෙකුගේ දේව තිලිනයන් සහ හැකියාවන් උපරිම ලෙසින් පාවිච්චි කිරීම " වේ. ඔබගේ අධ්‍යාත්මික සම්පත් දෙවියන්වහන්සේගේ කාර්‍යයන් වෙනුවෙන් නිසි අයුරු පාවිච්චි කල විට ඔබ සාර්ථකය.

දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ සාර්ථකත්වය ලෞකික ප්‍රමිතින් අනුව ගැනෙන සාර්ථකත්වය වෙතින් වෙනස්ය. ලෝකයේ සාර්ථකත්වය දකින්නේ භෞතික ලෙසින්ය. දෙවියන්වහන්සේ එය අධ්‍යාත්මික ලෙස දකින්නාහ. දේව රාජ්‍යයේහිදි සාර්ථකත්වය නිර්වචනය කෙරෙන වෙනස් ප්‍රමිතියක් ඇත. ලෝකයේ එයටම ආවේනික ප්‍රමිතියක් පිහිටුවයි. දෙවියන්වහන්සේ පවත්වන ප්‍රමිතිය " විශ්වාසවන්තකම " ලෙස හැඳින්වේ.

සාර්ථකත්වය පිලිබඳ එකිනෙකාට වෙනස් ප්‍රධාන මුලධර්යන් වේ. ලෞකික සාර්ථකත්වයේ ප්‍රධාන මුල ධර්මය වෙනස් වන සුලු අතර තාවකාලිකය. දෙවියන්වහන්සේගේ රාජ්‍ය තුල සාර්ථකත්වය පිලිබඳ මූලික පදනම ස්ථාවර සහ සදාකාලික වන්නේ එය එලිදරව් වු සත්‍යය මත පදනම් වන හෙයිනි. සාර්ථකත්වය සඳහා විවිධ චේතනාවන් පවති. ලෝකය තුල, තෘෂ්ණාව, උඩඟුකම සහ කිර්තිය සඳහා වු අගාව, මගින් ජනයා පොලඹවනු ලබති. ඇදහිලිවන්තයෝ දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා සාර්ථකවිමට පොළඹවනු ලබති.

සාර්ථකත්වය පිලිබඳව වෙනස් ආකෘතියක් දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි ඇත. ධනවත් සහ බලවත් මිනිසුන් කෙරෙහි ලෝකය නෙත් යොමු කරයි. අපගේ ආකෘතිය ස්වාමිවු යේසුස් ක්‍රිස්තුස්ය. සාර්ථකත්වය සඳහා වෙනස් වු අපේක්ෂාවක් වේ. මුදල්, උඩඟුව සහ තත්වය ලෞකික අපේක්ෂාවන් ලෙස අවධාරනය වේ. දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි අපේක්ෂාව වන්නේ ක්‍රිස්තුස් වහන්සේ මෙන් විමය.

දේව රාජ්‍යයේ සාර්ථකත්වය ගැනිම වෙනුවට දිම, තනතුරු වෙනුවට සේවය කිරිම, උඩඟුව වෙනුවට නිහතමානි බව, ශක්තිය වෙනුවට යටහත බව අවධාරනය කරයි. ලෝකයේ සාර්ථකත්වය දෙස බලන්නේ ඔබ කරන්නේ කුමක්ද, යන්න හා අනුකූලවය. දෙවියන්වහන්සේ එය දෙස බලන්නේ ඔබ කුමන ආකාරයද යන දෙය හා අනුකූලවය. කාර්ය සිද්ධිය පිලිබඳ උත්කෘෂ්ඨත්වය වෙනුවට චරිත ස්භාවයේදි උත්කෘෂ්ඨත්වය අවධාරනය කෙරේ.

දේව රාජ්‍යයේදි ඔබ කවුද යන හේතුවෙන් සාර්ථකත්වය මනිනු නොලැබෙයි. මිනුම් දණ්ඩ වන්නේ ඔබට කවුරුන් විය හැකිද යන්ට සාපේක්ෂව ඔබ කවුරුන්ද යන්නයි. සාර්ථකත්වය මනිනු ලබන්නේ ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් සිදු කරන දෙය මත නොවේ. එය මනිනු ලබන්නේ ඔබට කල හැකිව තිබෙන දෙයට සාපේක්ෂව ඔබ කරන දෙය හා අනුකූලවය.

## සාර්ථකත්වය පිලිබඳ රහස්

සභාව තුල සාර්ථක විම දෙවියන්වහන්සේ ඔබෙන් අපේක්ෂා කරන සේක. තමන් තුල ඔබ සඳහා වන්නාවු අරමුණ සහ සැලසුම් ඉෂ්ඨ කිරිම උන්වහන්සේ ඔබගෙන් අපේක්ෂා කරන්නාහ. අධ්‍යාත්මික "සාර්ථකත්වයේ රහස්" සැබවින්ම රහස් නොවේ. ඒවා දේව වචනය තුල විවෘත ලෙස ප්‍රකාශිතය. ඒවා "රහස්" වන්නේ ඒවා සොයා බලා හඳුනා ගැනිම මිනිසුන් ප්‍රතික්ෂේප කරන නිසාය.

දේව වචනය තුල වන්නාවු සාර්ථකත්වයේ මුල ධර්ම සැම එකක්ම ආවරණය කිරිම අපට නොහැකි වන්නේ ඒවා විශාල සංඛ්‍යාවක් ඇති නිසාය. වෙනත් බයිබලයානුකූල මුලධර්ම පිලිබඳව අධ්‍යනයන් නොකඩවා ඉදිරියට ගෙන යාම සඳහා මෙහෙයුම් මාර්ග මෙම පාඩමෙහි "වැඩි දුර අධ්‍යනය සඳහා" කොටසින් සපයා ඇත. එහෙත් ඇතැම් අතිශය වැදගත් ප්‍රධාන මුලධර්මයන් සමහරක් මෙහි ඇත.

**නිසි චිත්ත ආකල්පයක් පවත්වා ගන්න :**

සාර්ථකත්වය ආරම්භ වන්නේ හදවතේ සැගවි සිටින මිනිසා කෙරෙන්ය.

> **ස්වාමින් වහන්සේ මනුෂ්‍යයා බලන්නාක් මෙන් නෙබලන සේක. මනුෂ්‍යය තෙමේ පිටස්තර පෙනිම බලන්නේ, නුමුත් ස්වාමින්වහන්සේ සිත බලන සේක.** (1 සාමුවෙල් 16 : 17)

**නිසි චිත්ත ආකල්පයක් තුල ප්‍රේමය, නිහතමානිබව, කීකරුකම, සේවා කිරීමේ ජීවය සහ සත්‍යය වු ශුද්ධවන්තකම ඇතුලත්වේ.**

**සාර්ථකත්වයේ උල්පත හඳුනා ගන්න :**

ඔබව සාර්ථකත්වයට පත් කරන්නේ ඔබ දන්නා දෙය නොව, ඔබ දන්නා අයයි. සම්බන්ධතාව රදා පවතින්නේ ඔබ දන්නා අය මත මිස ඔබ දන්නා දෙය මත නොවේ. මුළු ජිවිතයම පදනම්ව පවතින්නේ සම්බන්ධතාවය මතයි. ඔබ ස්වර්ග රාජ්‍යය වෙත කැදවා ගෙන යනුවේ ඔබ දන්නේ කවුරුන්ද (යේසුස් ස්වාමින්) මිස ඔබ දන්නා දෙය නොවේ.

ස්වාමින්වහන්සේ දැන සිටිමෙහි ප්‍රතිපලය ලෙස සාර්ථකත්වය ඇතිවේ :

ස්වාමින් වහන්සේ මෙසේ කියන සේක. ප්‍රඥාවන්තයා තමාගේ ප්‍රඥාව ගැන පාරට්ටුකර නොගනිවා. බලවන්තයාද තමාගේ බලය ගැන පාරට්ටුකර නොගනිවා. වස්තු කාරයාම තමාගේ වස්තුව ගැන පාරට්ටුකර නොගනිවා, නමුත් පාරට්ටුකර ගන්නා පොළවේ කරුණාවත්, විනිශ්චයත්, ධර්මිෂ්ඨකමත් පවත්වන ස්වාමින්වහන්සේ මම යයි තේරුම් ගෙන .... (යෙරමියා 9 : 23 - 24)

තමුන්ගේ දෙවියන්වහන්සේ හඳුනන්නෝ වන සෙනග බලවත් වි, සමර්ථකම් කරන්නෝය. සෙනග අතරෙන් නුවන ඇත්තන් විසින් බොහෝ දෙනෙකු ඥානයට පමුනුවනවා ඇත. (දානියෙල් 11 : 32 - 33)

**ස්වාමින්වහන්සේ සොයන්න :**

ස්වාමින්වහන්සේ සෙවිම යනුවෙන් අර්වත් කරන්නේ උන්වහන්සේ පිලිබඳව විමසිමෙන්ද, යාච්ඤා කිරීමෙන් සහ උන්වහන්සේ හඳුනා ගැනිමට සහ උන්වහන්සේගේ අභිමතය ඉෂ්ඨ කිරීමට ඉවහල් වන ලෙසින් ශුද්ධ වචනය හැදෑරිමයි. ස්වාමින් වහන්සේ සෙවිමේ ප්‍රතිලාභ මොනවාදැයි හෙසකියා නම් වු යුදාවේ ධර්මිෂ්ඨ රජකෙනෙකුන් විසින් සනාථ කරනු ලැබිය. ඔහු දෙවියන්වහන්සේව සෙවු අතර, ඔහුගේ සාර්ථකත්වයේ හේතුව වන්නේද එයයි.

**හෙසකියා යුදා මුළුල්ලෙහි මෙසේ කරමින් තමාගේ දෙවිවු ස්වාමින්වහන්සේ ඉදිරියෙහි යහපත්ව, හරිව, යුතුව තිබුන දේ කලේය.**

**ඔහු තමාගේ දෙවියන්වහන්සේ සොයමින් උන්වහන්සේගේ ගෘහයෙහි මෙහෙයද, ව්‍යවස්ථා වල ආඥාවද, සම්බන්ධව පටන් ගත් සියළු කාර්තව්‍යයන් තමාගේ මුළු සිතින් ඉෂ්ඨ කර සඵල විය. (2 ලේකම් 31 : 20 - 21)**

උස්සියා නම් රජෙකු පිලිබඳවද මෙසේ කියා ඇත :

**ඔහු ස්වාමින්වහන්සේ සෙවුතාක්ම දෙවියන්වහන්සේ ඔහු සපල කල සේක. (2 ලේකම් 26 : 5 )**

ස්වාමින් වහන්සේ සෙවිම වැදගත්වන්නේ කුමක් නිසාද යත්, තමන්වහන්සේගේ සැලසුම් සහ අභිප්‍රායන් මොනවාදැයි නායකයින් වෙත හෙළි කිරීමට දෙවියන්වහන්සේ කැමති වන සේක. (ආමෝස් 3 : 7) බලන්න.

**වචනය මත සිත යොමුකරන්න (භාවනාවෙහි යෙදෙන්න) :**

දෙවියන්වහන්සේගේ වචනය මත සිත යොමු කරන අය වෙත සාර්ථකත්වය පොරොන්දුව ඇත. ස්වාමින්වහන්සේ යෝෂුවට මෙසේ පැවසුහ.

> **මේ ව්‍යාවස්ථා පොත නුඹේ මුඛයෙන් පහ නොවේවා. එහි ලියා තිබෙන සියල්ල කරන්න බලාගන්න පිනිස රෑ දහවල් ඒ ගැන මෙනෙහි කරපන්න. එවිට නුඹේ මාර්ගය සඵල වී නුඹට සුබ සිද්ධ වන්නේය. (යෝෂුවා 1 : 8)**

"සිත යොමු වීම" එහි අර්ථය වේ. "ඒ පිලිබඳව කල්පනා කරමින් නැවත මෙනෙහි කරමින් සහ දිර්ඝ වශයෙන් අධ්‍යනය කිරීම" වන්නේය. වචනයට සිත යොමුකරන තැනැත්තා, දෙවියන්වහන්සේ මිනිසාට කථාකර ඇති බවත් ශුද්ධ වු ලියවිල්ල යනු උන්වහන්සේ පවසා ඇති දේ පිළිබඳ වාර්ථාවක් බවත් සහ දෙවියන්වහන්සේගේ වචනය සත්‍ය වන්නාවු බවත් විශ්වාස කරන්නේය.

**වචනයට කීකරු වන්න :**

සාර්ථකත්වය නැමැති ප්‍රතිපලය ගෙන දෙන්නේ සිත යොමු කිරීම පමනකින්ම නොවේ. වචනයට කීකරු වීමද ඒ හා අදාල වේ.

> **එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිනිස, රෑ දහවල් ඒ ගැන මෙනෙහි කරපන්න. එවිට නුඹේ මාර්ගය සපල වී නුඹට සුභ සිද්ධ වන්නේය. (යෝෂුවා 1 : 8)**

සාලමොන් ඉශ්‍රායලයේ රජු වීමට පෙර, දාවිත් මෙම උපදේශය ඔහුට දුන්නේය.

> **ඉතින් මාගේ පුත්‍රය, නුඹ සඵල වී නුඹේ දෙවිවු ස්වාමින්වහන්සේ නුඹ ගැන කී ලෙස උන්වහන්සේගේ ගෘහය ගොඩ නගන පිනිස උන්වහන්සේ නුඹ සමග වන සේක්වා. නුඹ නුඹේ දෙවියන්වහන්සේගේ ව්‍යාවස්ථාව රක්ෂා කරන පිනිස නුඹට නුවනත් බුද්ධියත් දි, ඉශ්‍රායලය ගැන බාරයක් නුඹට දෙන සේක්වා. (1 ලේකම් 22 : 11 - 12)**

දේව වචනයෙහි ඇතුලත් සෑම ආඥාවක්ම වැදගත් වේ. මෙම ආඥාවන් ආරක්ෂා කිරීම මගින් ඔබ සාර්ථකත්වයට පත්කරවයි.

ඔබ පෞද්ගලිකවම දේව වචනය කෙරෙහි සිත යොමු කරමින් සහ එයට කීකරු විය යුතුව පසුවිය යුතු වනු පමණක් නොව, ඔබගේ මගපෙන්වීම ලබන ජනයා ඉදිරියෙහිදි එය එහි නියම ස්ථානයට ඔසවා තැබිය යුතුය. නෙහෙමියා දෙවියන්වහන්සේගේ වචනයෙහි ආධිපත්‍ය ප්‍රකෘතිමත් කල ආකාරට කෙලෙසදැයි (නෙහෙමියා 8:1-8) තුලින් කියවන්න. නෙහෙමියා සිදුකල ප්‍රතිසංස්කරනයන් දේවවචනයෙහි බලපරාක්‍රමයෙන් යුතුව පැවතිමට හැකියාවක් නොතිබුනෙම් විය හැක. දේව වචනයෙහි ආධිපත්‍ය මත පදනම් වු සභාවක් නිරතුරුවම සාර්ථක වනු ඇත.

**දෙවියන්වහන්සේගේ කැදවීම මත පිහිටා සිටින්න :**

දෙවියන්වහන්සේගේ කැදවීම සහිත වීමේහිදි වැදගත්කම පිලිබඳව මෙම පාඩමාලාව තුලින් ඔබ මෙයට පෙර ඉගෙන ගත්තෙහිය. උන්වහන්සේ ඔබ වෙත ප්‍රධානය කර ඇති අධ්‍යාත්මය තිලිණය භාවිතා කරමින්, දෙවියන්වහන්සේගේ නිශ්චිත කැදවීම දැනගනිමින් ඒ අනුකුව සේවා නොකලහොත් ඔබ සාර්ථක වන්නේ නැත.

**දෙවියන්වහන්සේ අභිමුඛයෙහි පැවතිම අත්දකින්න :**

සභාව සාර්ථකත්වයට පත් කරනුයේ දෙවියන්වහන්සේ එහි වැඩ සිටීමයි.

> **ස්වාමින්වහන්සේ යොසෙප් සමග වූ සේක. ඔහු සපලවත් මනුෂ්‍යයෙක්ව තම ස්වාමිවූ මිසරයාගේ ගෙයි සිටියේය.**
>
> **ඔහුගේ ස්වාමියා ස්වාමින්වහන්සේ ඔහු සමග සිටින බවත් ඔහු කල සියල්ල ඔහුගේ අතේ දියුණු වෙන්ට සලස්වන බවත් දුටුවේය. (උත්පත්ති 39:2-3)**

දෙවියන්වහන්සේට ඔබ සමග පැවතිය හැකි වනුයේ, ඔබ උන්වහන්සේ සමග සහභාගිත්වයෙන් යුතුව ගමන් කරමින්, ඔබගේ නිශ්චිත කැඳවීම අනුව සේවාව සලස්වමින් සහ පවිත්‍ර ජිවිතයක් ගත කරන කල පමණකි.

**දෙවියන්වහන්සේගේ ආලේපය ලබා ගන්න :**

දෙවියන්වහන්සේගේ ආලේපය ලබා ගැනිමෙහි වැදගත්කම පිලිබඳව පාඩමාලාවෙහි තෙවන පරිච්ඡේදයෙන් පැහැදිලි කෙරිනි. සභාව තුල සාර්ථකවිම සදහා ඔබට එම ආලේපය අත්‍යවශ්‍යය.

**ගැටළු සහ තිරණ වලට මුහුණ දෙන්න :**

ගැටළු වලට සහ තිරණ වලට මුහුණ පැම ප්‍රතික්ෂේප කිරිම අසමර්ථතාවය කරා යොමු කරවයි. මෙම පාඩමාලාවේ දි ඔබ හැදැරූ ක්‍රමෝපායන් භාවිතා කරමින් ගැටළු වලට නොකඩවා මුහුණ දි ඥානවන්ත ලෙස නිගමනයන් කරා එළඹෙන්න.

**ඔබගේ අරමුණු දැනගන්න :**

සෑම ඇදහිලිවන්තයෙකු වෙනුවෙන්ම විශේෂිත වූ අරමුණක් දෙවියන්වහන්සේ සතු වේ. අධ්‍යාත්මික දර්ශන ලබා ගැනිම එනම් ඔබගේ පැවැත්ම කුමක්ද ? අරභයාද සහ දෙවියන්වහන්සේ වෙතින් ඔබ කැඳවීම ලබා ඇත්තේ කුමන කාර්‍ය්‍යයක් ඉටු කිරිම සදහාද යන බව දැන ගැනිම ඔබගේ අරමුණ තුල අන්තර්ගතය. (හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඩමාලාවෙහි “ අරමුණ මගින් පරිපාලනය ” වෙතින් ඔබට මේ පිලිබඳව වැඩිදුරට අධ්‍යනය කල හැක.)

දර්ශනයක් සහිත පුද්ගලයෙකු, වැරදිම් සහ අසමත්විම් පිලිබඳව කනස්සලු වෙමින් හෝ ජයග්‍රහනය පිලිබඳව උදම් අනමින් අතිතයේහි ජිවත් වන්නේ නැත. අරමුණ පිලිබඳව දර්ශණයක් සහ පැහැදිලි දැනිමක් තුලින් අනාගතය කෙරෙහි කේන්ද්‍රගත විමට ඔබට උපකාරි වනු ඇත. පාවුල් පැවසූ පරිදි :

> **සහෝදරයෙනි, මම තවමත් අල්ල ගත්තේමියි නෙසිතමි. නුමුත් එකක් කරමි, එනම් පස්සෙන් තිබෙන දේ මතක නැති කොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගෙන යමි.... ( පිලිප්පි 3 : 13 )**

**සැලසුමක් සකසා ගන්න :**

ඔබගේ අරමුණ සපලමත් කරගැනිම සඳහා ඔබ සතු සැලසුමක් තිබුනහොත් මිස ඔබට එය සාර්ථක කර ගැනිමට කිසි දිනෙක හැකිවනුයේ නැත. (සැලසුම් කල යුත්තේ කෙලෙසදැයි නුඹට හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ " අරමුණු මගින් පරිපාලන " මගින් උගත හැක.)

**සැලසුම ක්‍රියාත්මක කරන්න :**

සේවය කල ඔබගේ අරමුණ මුදුන් පමුනුවා ගැනිම සඳහා හොඳ සැලසුමක් තබා ගැනිම පමණක් ප්‍රමාණවත් නැත. ඔබ එම සැලසුමට අනුව ක්‍රියා කල යුතුවේ. සංවිධානය කිරිමට, වගකිම් පැවරිමට සහ අධික්ෂණය කිරිමට ඔබට හැකියාව තිබිය යුතුය. යහපත් අධ්‍යාත්මික නායකත්වය පිලිබඳව එක් පරික්ෂණයක් වන්නේ දෙවියන්වහන්සේගේ අරමුණු සහ සැලසුම් සාර්ථක කල හැකි මාර්ගයක්ද එසේ නොවන මාර්ගයක්ද යන්න විමසා බැලිමෙනි. " අරමුණු මගින් පරිපාලනය " නම් වු හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව මගින් මෙය කල යුත්තේ කෙසේදැයි ඔබට උගත හැක.

**පවිත්‍ර ජිවිතයක් ගත කරන්න :**

සභාව තුල ඔබ සාර්ථක වන්නේ, මෙම පාඨමාලාවෙහි සිව්වන පරිච්ජේදයෙහි සාකච්ජා කර ඇති නායකයින් සඳහා වු සුදුසුකම් සපුරාලමින්, පවිත්‍ර ජිවිතයක් ගත කලහොත් පමණකි. පාපය අසාර්ථකත්වය සහතික කරවයි. භක්තිමත්කම සාර්ථකත්වය තහවුරු කරයි.

> **තමාගේ වරද සඟවන්නා සවිල නොවන්නේය. එහෙත් ඒවා කියා දි අත් හරින්නාට කරුණාව ලැබේ. (හිතෝපදේශ 28 : 13)**

**දෙවියන්වහන්සේ වෙතින් බුද්ධිය අයැද සිටින්න:**

යහපත් තිරණ ගනිමින් අනෙකුත් අය මෙහෙයවිම සඳහා මනුෂ්‍යය බුද්ධිය ප්‍රමාණවත් නැත. සාර්ථක නායකයෙකු විම සඳහා ඔබ දෙවියන්වහන්සේ වෙතින් බුද්ධිය ලබාගත යුතුය.

> **නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩුනම්, වරද නොතබන්නාවූ, බොහෝ කොට සියල්ලන්ට දෙන්නාවු දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා. එවිට ඔහුට එය දෙනු ලැබේ. (යාකෝබ් 1 : 5)**

**විශිෂ්ඨත්වය සඳහා විර්‍යය වඩන්න :**

"මේ හොදයි" යනුවෙන් සෑහිමට පත් නොවන්න. විශිෂ්ඨත්වය සඳහා විර්‍යය වඩන්න.

> **උතුම් වු දේවල් ඒත්තු ගන්ට නුඹලාට පුළුවන් වෙන්ටත් (පිලිප්පි 1 : 10)**

**සියළු දෙය දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා සිදු කරන්න :**

තමාගේ කිර්තිය සඳහා නොව, දෙවියන්වහන්සේගේ මහිමය වෙනුවෙන් ඔබ සෑම දෙයම කරන්නේ නම්, ඔබ සාර්ථක වනු ඇත.

> තවද නුඹලා වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ මොකක් කරතත්, සියල්ලම ස්වාමිවු යේසුස් වහන්සේගේ නාමයෙන් කරමින්, උන්වහන්සේ කරණකොටගෙන පියවු දෙවියන්වහන්සේට ස්තුති කරපල්ලා. (කොලොස්සි 3:17)

**ප්‍රථමයෙන් දේව රාජ්‍යය සොයන්න:**

ඔබගේ ප්‍රමුඛත්වය දෙවියන්වහන්සේගේ රාජ්‍යය වේ නම් ඔබ සාර්ථක වනු ඇත.

> **නුමුත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා. මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6 : 23)**

නිසි සංවිධානය මගින් දේවරාජ්‍යයේ ප්‍රමුකතාවන් තිරණය කල හැක. (ක්‍රියා 6 : 1 - 7) බලන්න.

**ආදර්ශය අනුගමනය කරන්න :**

ඔබ මෙම පාඨමාලාවෙහි ඉගෙනගත් පරිදි, ශ්‍රේෂ්ඨතම ආධ්‍යාත්මික නායකයා පිලිබඳව ආදර්ශය වන්නේ යේසුස් වහන්සේය. යේසු තුමා මෙසේ පැවසුහ :

> **මක්නිසාද නුඹලාට කල ලෙස නුඹලාත් කරන පිනිස නුඹලාට අදර්ශයක් දුනිමි. (යොහාන් 13 : 15)**

ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශයට හැර වෙනත් දෙයකට තමන්ව සංසන්ධනය කල විට, එය සුදුසු නොවේ. යාකොබ් තම සහෝදරයින් යෝසප් සමග ඊෂ්‍යාවෙන් සහ වෛරයන් මෙහෙයවනු ලැබූ සිද්ධීන් ක්‍රියාත්මක කලේය. ඊශ්‍රායලයේ ජනයා ඔවුන්ව වෙනත් දේශයන් සමග සසදවමින් ඔවුන්ගේ කුරිරු ක්‍රියා මාර්ග උපුටා ගත්හ. සාවුල් තමන් පිලිබඳව දාවිත් සංසන්ධනය කරනු ලැබීමත් ගැන අසා ඊෂ්‍යයාවෙන් විසගැන්වුනේය.

ඔබගේ දර්ශණය විහිදවාලනු සඳහා සහ තම වර්ධන හැකියාවන් මුදුන්පමුනුවා ගැනිම සඳහා සංසන්ධනය කිරිම උපකාරි විය හැක. එහෙත් වෙනත් පුද්ගලයෙකු ජයග්‍රහණයන් ඔබගේ ජිවිතය සඳහා ප්‍රමිතියක් නොවේ. ඔබගේ සාර්ථකත්වය අනෙකුත් අයගේ කාර්‍යාලයන් හා සාපේක්ෂව තක්සේරු නොකරේ. මේ හේතුව කරණ කොට ගෙන, “ ස්වමිනි මොහු ගැන කිමෙක්ද ” යනුවෙන් ස්වාමින්වහන්සේගෙන් යොහාන් පිලිබදව පේත්‍රුස් ඇසු ප්‍රශ්ණ සදහා “ ඒ ගැන නුඹට මොකද ? නුඹ මා අනුව වරෙන්න ” යන තරවටුව ලැබින. (යොහාන් 21 : 21 - 22)

**තිරණය, හික්මවිම, මෙහෙයවිම, අධික්ෂණය**

ඇත්තවශයෙන්ම, සාර්ථකත්වය එක් ප්‍රකාශයකින් ඉතා පහසු ලෙස සම්පිඩනය කල හැක :

> තිරනය, විනය, මෙහෙයවිම සහ අධිෂ්ඨානය සම්බන්ධයෙන් යේසු තුමන්ගේ ආදර්ශය අනුගමනය කරන්න.

ප්‍රේරිත පවුල් එසේ කලේය :

> **දුවන ස්ථානයෙහි සියල්ලන්ම දුවන නමුත් තෑග්ග ලබන්නේ එක්කෙනෙක්ම පමණක් බව නොදනිමුද ? එසේම නුඹලාත් ලබා ගනු පිනිස දුවපල්ලා.**
>
> **දිනන පිනිස වීර්‍යයකරන්නාවූ සියල්ලෝම සියල්ලෙහි පමණ දැන හැසිරෙති. ඔවුන් එසේ කරන්නේ දිරන්නාවූ ඔටුන්නක් ලබා ගන්න පිනිසය. අප වනාහි නොදිරන එකක් ලබා ගන්නා පිනිසය.**

**එබැවින් මා දුවන්නේ සැකයෙන් මෙන් නොවේය, පහර දෙන්නේ හුළගට පහර දෙන්නාක් මෙන් නොවේය.**

**නුමුත් මාගේ ශරීරය දමනය කර වාල්කමට පමුණුවමි, එසේ කරන්නේ අනුන්ට දේශනා කලාට පසු කොයි ලෙසකින්වත් මාව එපා කරනු නොලබන පිනිසය.** (1 කොරින්ති 9 : 24 - 27)

පාවුල් තීරණය කලේය. ඔහුට සාර්ථක වීමට අවශ්‍ය විය. ඔහුට ජීවිත "තරණය" ජයග්‍රහණය කිරීමට අවශ්‍ය විය. (ජේද 24) මෙය ඉටු කිරීම සඳහා, ඔහු තමාව හික්මවාගත යුතු බව, එනම් සියළු දෙයකම පමණ දැන හැසිරිය යුතු බව ඔහු අවබෝධ කර ගත්තේය. (ජේද 25 සහ 27) එහුට මෙහෙයවීම තිබුනි. ඔහු නිශ්චිත ඉලක්කයකින් තොරව දිවුයේ හෝ සටන් කලේ නැත. ඔහු තමාගේ අරමුණ හෝ සැලසුම් පිලිබඳව අවිනිශ්චිත නොවිය. (ජේද 26) තවද ඔහු ලබා ගැනීම සඳහා, සාර්ථක වීම සඳහා අධිෂ්ඨාන සහගත විය (ජේද 24 - 25)

**සාර්ථකත්වයේ අගය**

සාර්ථකත්වයෙහි අගය ගෙවීමට ඔබ කැමැත්තෙහිද? එය මෙන්න :

**නුමුත් නොදැන, පහර ලැබීමට සුදුසු දේ කලාවූ අය පහර ස්වල්පයක් ලබන්නේය. යමෙකුට බොහෝ දේ දෙන ලද්දේද, ඔහුගෙන් බොහෝ දේ අය කරනු ලබන්නේය. යමෙකුට බොහෝ දේ භාරදෙන ලද්දේද, ඔහුගෙන් වඩා ඉල්ලනු ලබන්නේය.** (ලූක් 12 : 48)

ඔබ වැඩියෙන් සාර්ථකවන තරමට, දෙවියනවහන්සේ ඔහුගෙන් වැඩිපුර ඉල්ලන සේක.

## ස්ව පරික්ෂණය

1. ප්‍රධාන බයිබල් ඡේදයන් මතකයෙන් ලියන්න

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

2. සාර්ථකත්වය නිර්වචනය කරන්න.

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

3. දේව රාජ්‍යයේ සාර්ථකත්වය ලෝකයේ සාර්ථකත්වය කෙරෙන් වෙනස් වන්නේ කෙසේද ?

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

4. ඔබ මෙම අභ්‍යාසයේදී ඉගෙනගත් සාර්ථකත්වය පිළිබඳ ප්‍රධාන මූලධර්ම සම්පීඩනය කරන්න.

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

(මෙම පරික්ෂණ වලට පිළිතුරු මෙම සංග්‍රහය අවසාන පරිච්ඡේදයේ දැක්වේ.)

## වැඩිදුර අධ්‍යනය සඳහා

සාර්ථකත්වය පිලිබඳ ප්‍රධාන මුලධර්මයන් කිහිපයක් මෙම පාඩමෙන් ආවරණය විය. දේව වචනයෙහි වර්ථා කරනු ලැබ ඇති වෙනත් බොහෝ මුලධර්මයෝ වෙති. මෙම මුලධර්මයන් පිලිබඳ අධ්‍යනය ඉදිරියට ගෙන යෑම සඳහා මෙම කොටස ඔබට උපකාරී වනු ඇත.

1. ඊලග වසර තුලදී, බයිබලය සම්පූර්ණයෙන් කියවන්න. දී ඇති සෑම ආඥාවක්ම ලකුණු කරන්න. මෙම අඥාවන් පිලිපැදිම සාර්ථක ජිවිතයක් සහ සභාවක් සහතික කරයි. (යෝෂුවා 1 : 8)

2. බයිබලයෙහි තම කථාව ඇතුලත්ව ඇති නායකයින්ගේ ජිවිත අධ්‍යනය කල යුතු වන්නේ කෙසේදැයි මෙම පාඨමාලාවෙහි උපග්‍රන්ථය තුළින් විස්තර කර ඇත. සාර්ථකත්වය ලැබූ නායකයින්ගේ ජිවිත අධ්‍යනය කරන්න. නුමුත් සාර්ථක විමට හේතු සාධක වු දේවල් හඳුනාගෙන ඒවා ඔබගේ ජිවිතය තුලට අනුගත කරන්න.

3. භෞතික “ සාර්ථකත්වය ” විස්තර කරන දේශනාකාරයාගේ පොත කියවන්න. විශේෂයෙන් 2 පරිච්ජේදය වෙත අවධානය යොදවන්න. එවන් ප්‍රමිති මත සාර්ථකත්වය පදනම් කරන තැනැත්තා හිස්ව සහ ප්‍රිතියෙන් තොරව පසුවන්නේය. සිය සමෘද්ධිය දෙවියන්වහන්සේගේ ප්‍රමිතිය මත පදනම් කරන තැනැත්තා තෘප්තිමත්ව ප්‍රිතියෙන් සිටී. (දේශනාකාරයා 12 : 13 - 14) නිමාව බලන්න.

4. 1 සහ 2 තිමෝති පොත් සහ තිතස් පොත් ලියා ඇත්තේ සභාවෙහි නායකත්ව තත්වයෙහි සිටින තරුණ මිනිසුන්ටය. මෙම පොත් සුපරික්ෂාවෙන් අධ්‍යනය කර ප්‍රේරිත පාවුල් උගන්වන සාර්ථකත්වයේ මුලධර්ම ලේඛනයක් සකස් කරන්න.

5. මෙය සිහි තබා ගන්න. “කිසිවක් නොකර සාර්ථක විමට වඩා උත්සහකර අසාර්ථක වීම සුදුසුය.” “මම ඉවත්වෙමි” යැයි ඔබ පවසන තෙක් කිසිදු විටකදී ඔබ අසමර්ථ නොවන්නේය.

6. සාර්ථක සභාවක් විමට මුදල් ප්‍රතිපාදන අතිශයින් වැදගත්ය. දෙවියන්වහන්සේගේ වචනය ඉෂ්ඨකිරිම සඳහා ඔබට මුදල් අවශ්‍යය. මුලධර්මය සාර්ථකත්වය පිලිබඳ ශුද්ධ වු ලියවිල්ලෙහි සඳහන් මුලධර්මයන් කිහිපයක් මෙසේය :

**දෙවියන්වහන්සේ ඔබගේ උල්පතයි :** උත්පත්ති 22 : 14

**මුලධර්මයන් වශයෙන් සාර්ථක විම දෙවියන්වහන්සේ ඔබ වෙතින් අපේක්ෂා කරන සේක:** ගිතාවලිය 35 : 27, 23 : 1, මාර්ක් 12 : 43 - 44, එපිස 3 : 29, ගලාති 3 : 13, 1 තිමෝති 6 : 17, 3 යොහාන් 2

**ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යය පළමුවට තබන්නේ නම්, උන්වහන්සේ ඔබගේ අවශ්‍යතා සපයන සේක :** මතෙව් 6 : 33

**මුල්‍ය සාර්ථකත්වය මතු දැක්වෙන දේ සඳහා වු තිළිණයකි :**

– දෙවියන්වහන්සේට ප්‍රමුඛතාව ලබා දිම : හිතෝපදේශ 3 : 9 - 10, මතෙව් 6 : 33
– දෙවියන්වහන්සේට ප්‍රේම කිරිම : හිතෝපදේශ 8 : 21
– දෙවියන්වහන්සේට මහිමය ලබාදිම : හිතෝපදේශ 10 : 22
– දැහැමි විමට කැමැත්ත : හිතෝපදේශ 13 : 21, 15 : 6

- නිහතමානි බව : හිතෝපදේශ 22 : 4
- දීමෙහි සූදානම : හිතෝපදේශ 22 : 9
- දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය : හිතෝපදේශ 28 : 25
- ත්‍යාගශීලී වීම : හිතෝපදේශ 11 : 24 - 25, ලූක් 6 : 38, 2 කොරින්ති 9 : 6, 10

**වස්තුව ලබා ගැනීම පිනිස දෙවියන්වහන්සේ ඔබට ශක්තිය දෙන සේක :**
දේශනාකාරයා 8 : 18 - 19

**වස්තුව ක්‍රියාවෙහි ප්‍රථිපලය වේ :**

**කැපවීමෙන් යුත් ක්‍රියා :** හිතෝපදේශ 10 : 4, 13 : 4
- බුද්ධිමත් ක්‍රියා : හිතෝපදේශ 10 : 5
- අවංක ක්‍රියා : හිතෝපදේශ 13 : 11
- නිහඩ ක්‍රියා : හිතෝපදේශ 14 : 23

**දීම ඔබ මූල්‍යමය වශයෙන් සාර්ථක කරවයි. ඔබ දිය යුතු වන්නේ :**

- පළමුව දෙවියන්වහන්සේට : මලාකි 3 : 1 - 2, හිතෝපදේශ 3 :9 - 10
- ප්‍රීතියෙන් යුතුව : 2 කොරින්ති 9 : 7
- කැමැත්තෙන් : නික්මයාම 25 : 2, 1 ලේකම් 29 : 9, 2 කොරින්ති 8 : 12
- බැඳීම් රහිතව : එස්රා 2 : 68
- ඔබගේ හැකියාව අනුකූලව : මතෙව් 5 : 42, ක්‍රියා 11 : 29, 2 කොරින්ති 8 : 12, දේශනාකාරයා 16 : 17, එස්රා 2 : 69
- දේව මහිමය පිනිස : මතෙව් 6 : 3
- නිහතමානීව : රෝම 12 : 8
- දුගී අය හට : හිතෝපදේශ 3 : 27 - 28, 19 : 17, 21 : 13, 8 : 27,
- රහසින් : මතෙව් 6 : 3
- විධිමත්ව : 1 කොරින්ති 16 : 2
- අදායමෙහි ප්‍රතිශතය අනුව : උත්පත්ති 14 : 20, 28 : 22, ලෙවී කථාව 27 : 30,
- 2 ලේකම් 31 : 5, මලාකි 3 : 10

**මූල්‍යමය වශයෙන් සාර්ථක වීම සඳහා ඔබ වැලැකිය යුතුයි :**

- මුදල් පිලිබඳ අශාව : 1 තිමෝති 6 : 10
- ධනය කෙරෙහි විශ්වාසය : ගීතාවලිය 49 : 6, 1 ලේකම් 29 : 14
- ණය : රෝම 13 : 8
- අලසකම : හිතෝපදේශ 6 : 6 - 11, 24 : 30 - 34
- ස්වීය-වින්දනය : හිතෝපදේශ 13 : 18, 21 : 17, 23 : 21
- සිහින මැවීම : හිතෝපදේශ 13 : 4
- ප්‍රචන්ඩත්වය : 1 : 10 - 19
- වංචාව : යාකොබ් 5 : 3 - 4, හිතෝපදේශ 20 : 23, 13 : 11, 22 : 16,
- රැවටිල්ල : හිතෝපදේශ 10 : 2
- අල්ලස : හිතෝපදේශ 14 : 27

– වංචා සහගත බව : ක්‍රියා 5 : 3 - 4, හිතෝපදේශ 21 : 6
– "කඩිනමින් ධනවත්වීමේ" කුටෝපාය : හිතෝපදේශ 28 : 20
– ණයට ගෙන ආපසු නොගෙවීම : ගීතාවලිය : 37 : 21
– අන් අයගේ ණය වෙනුවෙන් ඇප වීම : හිතෝපදේශ 6 : 1, 11 : 15, 22 : 26
– දුබල පෞද්ගලික සිරිත් : හිතෝපදේශ 23 : 1
– මුල්‍ය සාර්ථකත්වය කෙරෙහි බලපාන්නාවූ පරිදි යටත් නොවී සිටීම : හිතෝපදේශ 13 : 18
– මුදල් රැස්කිරීම : හිතෝපදේශ 10 : 22, 1 තිමෝති 6 : 10
– සාධාරණ වැටුප් නොගෙවීම : යෙරමියා 22 : 13
– කෑදරකම : හිතෝපදේශ 28 : 22
– දේව උපදෙස් ප්‍රතික්ෂේප කිරීම් : හිතෝපදේශ 13 : 18
– පෞද්ගලික වාසිය සඳහා විශාල පූජා යාගයන් භාර ගැනීම : 1 සාමුවෙල් 2 : 29
– පූජා යාගයන් රඳවා තබා ගැනීම : හිතෝපදේශ 11 : 24

**ඔබ දිමෙහිදි විශ්වාසවන්ත වන ප්‍රමාණයට ඔබ අධ්‍යාත්මිකව පරිණත වන්නේය : ලූක් 16 : 11**

7. ශුද්ධ වූ ලියවිල්ල පුරාම ඇති ශ්‍රේෂ්ඨ සාර්ථකත්ව මූලධර්මයන්ගෙන් සමහරක් හිතෝපදේශ පොතෙහි අඩංගු වේ. එක් දිනකට එක් පරිච්ඡේදය බැගින් කියවීමෙන් සම්පූර්ණ පොතම එක් මසකට එක් වර බැගින් කියවා නිම කල හැක. සාර්ථකත්ව මූලධර්මයන් ඔබගේ බයිබලයෙහි ලකුණු කර ඒවා කේන්ද්‍ර කර ගනිමින් සිත යොමු කරන්න. ඒවා ඔබගේ ජීවිතයට සහ සභාව තුලට සංයෝජනය කරගන්න.

8. සාර්ථකත්වය සහ සමෘද්ධිය සඳහා ශුද්ධ ලියවිල්ලෙහි පැහැදිලි ලෙස පෙන්වා දි ඇති මූලධර්මයන් සමහරක් මෙසේය :

- ගණන් කථාව 29 : 9
- යෝෂුවා 1 : 8 - 9
- 2 ලේකම් 31 : 21, 32 : 30,
- 1 රාජාවලිය 2 : 3
- නෙහෙමියා 1 : 11, 2 : 20
- ගීතාවලිය 1 : 3, 73 : 12, 122 : 6
- හිතෝපදේශ 28 : 13
- දේශනාකාරයා 7 : 14, 11 : 6
- යෙසායා 54 : 17, 55 : 11
- 3 යොහාන් 2

9. කරුණු හතරකින් යුතු වූ සාර්ථකත්වය පිලිබඳ සැලැස්මක් හෙසකියා සතුව තිබින. ඔහු...
- දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කලේය.
- උන්වහන්සේට තදින් බැඳි ( සමීප සම්බන්ධතාවන් ) සිටියේය.
- උන්වහන්සේ අනුගමනය කලේය.
- උන්වහන්සේගේ අණදාවන් අනුගමනය කලේය.

මේ නිසා, ඔහු කල සෑම දෙයකදිම ඔහු සාර්ථක විය.

# දහතුන්වන පරිච්ඡේදය

## පිරිවැය ගණනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසු පහත සඳහාන් දෑ ඔබට හැකිවනු ඇත. :

- ප්‍රධාන ජේදය මතකයෙන් ලිවීම.
- නායකත්වය වෙනුවෙන් දැරිය යුතු වට්නාකම් පිලිබඳ අංගයන් තුනක් සාරාංශ කර දක්වන්න.
- අධ්‍යාත්මික නායකත්වය පිලිබඳව නියම පිරික්සුම හඳුන්වන්න

**ප්‍රධාන ජේදය :**

> **එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කථා කොට, යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16 : 24)**

### හැඳින්වීම

නිසි නායකත්වය මගින් ආධ්‍යාත්මිය සම්පත් කළමණාකරනය කිරීම පිලිබඳව ඔබ මෙම පාඨමාලාවෙන් අධ්‍යනය කර ඇත. නිසි භාරකරුවකු ලෙසින් ක්‍රියා කල යුත්තේ කෙලෙසින්ද යන්න සහ සේවකයෙකු ද දේවගැතිවරයෙකු ද ලෙසින් මෙහෙයවිය යුත්තේ කෙසේදැයි ඔබ ඉගෙන ගෙන ඇත.

නායකයින්ගේ සුදුසුකම් සහ කාර්යයන්ද, ආලේපයෙහි වැදගතකම සහ තිරණ ගනිමින් ගැටළු විසඳිය යුත්තේ කුමන ලෙසද යන්නත් ඔබ ඉගෙන ඇත. සාර්ථකත්වයේ මුලධර්මයන් ඔබ උගත් අතර, අසාර්ථකත්වය ප්‍රතිපල ලෙස ලැබෙන දේ පිලිබඳව ඔබ වෙත අනතුරු අගවනු ලැබිය. නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කල යුත්තේ කෙසේද යන්නත් ඔබ උගත්තෙහිය.

ඉතිරිව ඇත්තේ එක් ප්‍රශ්නයක් පමනකි. අධ්‍යාත්මික නායකයෙකු ලෙස සේවය කිරීම පිලිබඳ අධික මිළ ගෙවීමට ඔබ සුදානම්ද ?

### මිළ ගණනය කිරීම

ඔබ අධ්‍යාත්මික තීරණයක් වෙත එළඹීමට පෙර ඒ සඳහා ගෙවිය යුතු මිළ ගණන් බැලිමෙහි ඇති වැදගත්කම යේසුස් වහන්සේ අවධාරණය කල සේක. කුළුනක් ගොඩ නගන මිනිසෙකු පිලිබඳව සහ යුධයට යන රජෙකු පිලිබඳ ලෙසින් වු ස්වභාවික උදාහරණ දෙකක් උන්වහන්සේ භාවිතයට ගත් සේක.

> **මක්නිසාද කොතක් ගොඩනගන්න කැමති වු නුඹලාගෙන් යමෙක් ඒක නිම කරන්ට තමාට පුළුවන්දැයි පළමු කොට හිඳ වියදම ගණන් බලන්නේ නැද්ද ?**
>
> **එසේ නොකලොත් අත්තිවාරමක් දමා නිම කරන්ට බැරි වු විට ඒ දකින සියල්ලෝ...**

**මේ මනුෂ්‍යයා ගොඩනගන්ට පටන් ගත් නුමුත් නිමකරන්ට ඔහුට බැරිවී යැයි කියා ඔහුට සරදම් කරන්ට පටන් ගත්තෝය.**

**නොහොත් වෙන රජෙකුට විරුද්ධව යුද්ධයට යන කවර රජෙක් තමාට විරුද්ධව විසි දහසක් ගෙන එන්නාවූ ඔහු ඉදිරියට දස දහසක් සමග යන්ට පුළුවන්දෝ කියා පළමු කොට හිඳ මන්ත්‍රණය නොකරන්නේය.**

**බැරි නම් ඒ රජ දුර සිටයදිම ඔහුට පණිවුඩයක් යවා සමාදාන ගිවිසුම ඉල්ලා සිටී. (ලූක් 14:28-32)**

ඔබ අධ්‍යාත්මික කැප කිරීමක් සිදු වීමට පෙර පිරිවැය ගණනය කිරීමේ වැදගත්කම යේසුස් වහන්සේ මෙම උදාහරණ මගින් පැහැදිලිකල සේක. අධ්‍යාත්මික නායකයෙකු වශයෙන් සේවා සැලසීමේ සැබෑ මිළ වන්නේ මොනවාද?

**නායකත්වය පිළිබඳ ආකාර විධි තුනක්**

ඔබගේ බයිබලයෙහි ලූක් 9 : 57 - 62 කියවන්න. මෙම උදාහරනයෙහි මිනිසුන් තුන් දෙනෙකු තමන් ගෝලයින් වශයෙන් බඳවා ගන්නා ලෙස ඉල්ලමින් යේසුස් වහන්සේ වෙත පැමිණියෝය. ගෝලයින් වීමේ බලාපොරොත්තු සහිත තැබිය හැකි මෙම තිදෙනාට එක් එක් අය හට එකි නෙක වෙනස් වූ මාදිලියේ වන අධ්‍යාත්මික මිලක් යේසුස් වහන්සේ අනාවරණය කලහ.

**සලකා බලන ලද වටිනාකම්: (ලූක් 9 : 57 - 58)**

පළමු පුද්ගලයා තමාගේම උත්සහය මාර්ගයෙන් ගෝලයෙකු වීමට ප්‍රයාත්න දරයි. යේසුස් වහන්සේ වෙතින් කැඳවීම ලැබෙන තෙක් ඔහු නොසිටියි. ගෝලකම ලෙසින්ම නායකත්වයද මිනිසා විසින් දෙවියන්වහන්සේ වෙත කෙරෙන පුද කිරීමක් නොවේ. එය දෙවියන්වහන්සේ වෙතින් මිනිසාට ලැබෙන කැඳවීම තමාගේම ප්‍රයාත්නය මාර්ගයෙන් වෙහෙසීමට ඔබ ප්‍රයාත්නය දරන්නේනම් එය අසාර්ථක වනු ඇත. ඔබ දෙවියන්වහන්සේගේ කැඳවීම ලබමින් ආලේපය කරනු ලැබිය යුතුය. " ඔබ මා පසු පස එන්නේ නම්, ඔබට මුහුණ පෑමට සිදු වන්නේ මෙයටය. " යනුවෙන් යේසුස් වහන්සේ මෙම මිනිසාට පැවසුහ. සේවය හා ලෙසම පරිත්‍යාගයද නායකත්වයේ මිළ තුල අන්තර්ගතය.

**අප ප්‍රේමය දැනගෙන සිටින්නේ ඒ තැනැන්වහන්සේ තමන් ප්‍රාණය අප උදෙසා දුන් හෙයිනි. අප විසින් සහෝදරයන් උදෙසා අපේ ජිවිත දෙන්ට යුතුය.** (1 යොහාන් 3 : 16)

නායකත්ව වටිනාකම තුල හුදේකලා වීමටද සිදුවේ. ප්‍රේරිත පාවුල් මෙසේ ලිව්ය :

**පිගලෙස්ද හමෝගෙනිස්ද ඇතුළුව ආසියාවේ සිටින සියල්ලන් මාගෙන් අහක්ව ගිය බව නුඹ දන්නෙහිය** (2 තිමෝති 1 : 15)

නායකයෙකු බොහෝ විට ප්‍රතික්ෂේප වීම සහ විවේචනය අත් දකියි :

**උන්වහන්සේ (යේසුතුමා) ස්වකීය ස්ථාන වලට ආ සේක. ස්වකීයයෝ උන්වහන්සේ පිලිනොගත්තෝය.** (යොහාන් 1 : 11)

නායකයෙකු භට වද හිංසා අත් විදිමටද සිදුවිය හැක. පාවුල් අත්දුටු භයංකර දේවල් (2 කොරින්ති 11 : 23 - 27) කියවන්න.

නායකයෙකුට බොහෝ වගකීම් ඇත :

> **බාහිර වූ ඒ දේ හැර සියලු සභාවන් ගැන හිතේ බරක් මට ඇත්තේය. (2 කොරින්ති 11 : 28)**

නායකයෙකු විනය සහිත විය යුතු වේ.

> **නුමුත් මාගේ ශරීරය දමනය කර වහල්කමට පමුනුවමි. එසේ කරන්නේ අනුන්ට දේශනා කලාට පසු කොයි ලෙසකින් වත් මාව එපා කරනු නොලබන පිනිසය. (1 කොරින්ති 9 : 27)**

තමන්ගේ අධ්‍යාත්මික කැදවීම හා යෝග්‍යවන පරිදි ජිවත් වීමේ විශාල වගකීමක් නායකයෙකුට ඇත.

> **ඉන් නිසා අපට කරුණාව ලැබුන ලෙසම මේ සේවයත් ලැබී තිබෙන බැවින් අප ක්ලාන්ත නොවී සිටිමුව.**
>
> **ලැජ්ජාවේ රහස් දේවල් එපා කලෙමුව, ප්‍රයෝගයෙන් නොහැසිර දෙවියන්වහන්සේගේ වචනය ගැන වංචා නොකර, සැබෑව ප්‍රකාශ කිරීමෙන් දෙවියන්වහන්සේ ඉදිරියෙහි සියළු මනුෂ්‍යයන්ගේ හෘදය සාක්ෂියට එකගවෙන ලෙස අපේ ගුණ දැක්වීමුව. (2 කොරින්ති 4 : 1 - 2)**
>
> **එබැවින් නුඹලා කැදවනු ලැබූ කැදවීමට ඔබින ලෙස හැසිරෙන මෙන්, ස්වාමින්වහන්සේ නිසා හිරකාරයෙක්ව සිටින මම නුඹලාගෙන් ඉල්ලමි. (එපිස 4 : 1)**

**නිසි ප්‍රමුඛතාවන්:** (ලුක් 9 : 59 - 60)

තමන්වහන්සේ " අනුගමනය " කරන ලෙස දෙවැන්නාට යේසුස් වහන්සේ පැවසුහ. ආදර්ශයක් ලෙසට අනුකරණය කලහොත්, ඔබ උගත ඇති පරිදි " අනුගමනය " කිරීම යන්නෙහි අර්ථය වන්නේ ඉදිරියෙන් යන්නා පිටුපසින් පැමිණීමය. විශ්වාසය සහ කීකරුකම යන දෙකම එහි අඩංගුය.

යේසුස් වහන්සේ තමන් වහන්සේගේ ගෝලයින් දෙලොස්දෙනා කැදවීමේදි, උන්වහන්සේ ඔවුන්ට පැසුවේ පැමිණ අනුව එන ලෙසටය. උන්වහන්සේ කිසිදු ක්‍රියා මාවතක් සදහන් නොකල සේක. අපේක්ෂිත ක්‍රියා සැලැස්ම පිලිබදව තොරතුරු උන්වහන්සේ ඔවුන්ට නොදුන්නාහ. හුදෙක් කැදවීම මත පමණක්ම, සිය පැරණි ජිවන රටාව අතහැර දැමීමට ගෝලයාට සිදුවිය. මේ සදහා කුමන තිරණ, වෙන්වීම් සහ පරිත්‍යාගයන් අවශ්‍යවන්නේදැයි තවමත් කිව නොහැක.

නායකයෙකු යනු තමන් සතුව ඇති සුරක්ෂිත ජිවිතයත්, ලෝකයාගේ ඇස් ඉදිරියෙහි අනාරක්ෂිත ලෙස පෙනෙන ජිවිතයක් වෙනුවෙන් අත හැර දැමීමට සිදුවන අනුගාමිකයෙකි. කැප කිරීම කිසියම් වැඩසටහන් මාලාවක් වෙනුවෙන් නොව, කිසියම් පුද්ගලයෙකු වෙනුවෙන්ය. එම පුද්ගලයා ස්වාමිවූ යේසුස් වහන්සේය. ලුක්ගේ ජේදයට අනුව, අනුගමනය කරන ලෙස මෙම මිනිසාට ලැබුන කැදවීම පිලිබදව ඔහුගේ ප්‍රතිචාරය වුයේ " පළමුව මා වෙනුවෙන් පිඩාව දරන්න. " යනුවෙනි. යේසුස් වහන්සේ අනුගමනය කිරීමට ඔහුට අවශ්‍ය වූ නුමුත්, එය ඔහුගේ ප්‍රමුකතාවය නොවිය.

කිසියම් අයෙකු සිය දෙමාපියන්ගේ අවශ්‍යතාවයන් නොසලකා හැරිය යුතු යැයි යේසුස් වහන්සේ කිසි විටකදිවත් යෝජනා නොකරන සේක. (යොහාන් 19 : 25 - 27) එය මෙම කතාන්දරය තුල අවධාරනය කරනු ලැබ ඇති කරුණකි. ප්‍රථමයෙන් “ සිය පියාණන් මිහිදන් කිරීම ” තමාට අවශ්‍ය බව මෙම පුද්ගලයා පැවසිය. පැරණි තෙස්තමේන්තු යුගයේදි තමන් “ සිය පියාණන් මහිදන් ” කරන තෙක් පසුවන බව පැවසිමෙන්, ඔහුගේ පියාණන් සැබවින්ම මිය ගොස් ඇති බවත් අදහස් නොකරේ.

ඉන් අදහස් වන්නේ තමන් හට සාධාරණ හිමිකම් ඇති අනාගත ප්‍රවේණි උරුමය ලබා ගැනිම සඳහා සිය පියාණන් මියයන තෙක් ඔහු පසුවන බවයි. එහෙයින්, මෙම පුද්ගලයා මෙම නිදහසට කරුණු පාවිච්චි කල විට, ඔහු සිය අනාගත පිය උරුමය යේසුස්වහන්සේගේ කැඳවුමට වඩා ඉදිරියෙන් වන අවශයතාවක් ලෙසින් සැලකිය. තිරණාත්මක මොහොතකදි, තමන්වහන්සේ අනුගමනය කර නායකයෙකු බවට පත්වන ලෙස යේසුස් වහන්සේ කිසියම් පුද්ගලයෙකු කැදවනු ලැබුවහොත්, එම කැදවීම පෙරටුවෙහි අන් කිසිදු දෙයක් තැබිය යුතු නැත.

නිසි ප්‍රමුකතාවන් පිලිබඳ වැදගත්ම වඩාත් විස්තරාත්මක වගයෙන්, වෙනත් ජේදයකදි, යේසුස් වහන්සේ ප්‍රකාශ කල සේක.

> **එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කථා කොට, යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16 : 24)**

අපට කුරුසිය උසුලා ගැනිමට ප්‍රථම තමකම නොහොත් මමත්වය ප්‍රතික්ෂේපය එයට ඉදිරියෙන් පැමිණිය යුතුය. පැරණි සාර්ථකකාම් සහ පාපි ජිවිතය ප්‍රතික්ෂේප කල යුතුය. (මෙම ප්‍රදේශය ආශ්‍රිතව පාවුල්ගේ පාරිශ්‍රමය පිලිබඳව රෝම 7 - 8 කියවන්න). මමත්වය මියගිය පසු, කුරුසිය ඔබගේ ප්‍රමුකතාව බවට පත්විය යුතුය. දේවියන්වහන්සේගේ අභිමතය ඉෂ්ඨකිරිමේදි අදාල වන්නාවු පරිත්‍යාගය, වේදනා, ප්‍රතික්ෂේවිම, නිග්‍රහය, සහ දුෂ්කරතාව පිලිබඳව සංකේතය කුරුසිය වේ. ශුද්ධ වු ලියවිල්ල වෙනුවෙන් ප්‍රාණ පරිත්‍යගි විම මගින් මරණයට කැඳවනු ලැබිම පවා ඇතැම් විට කුරුසිය අදහස තේරුම් විය හැක.

“කුරුසිය උසුලා ගැනිම” ජිවිතයේ පිඩාවන් කෙරෙහි යොමු කිරිමක් නොවේ. මේ සියලු මනුෂ්‍යයින් හට පොදු, ඒවාය. පාපි ලෝකයක ජිවත්විම හේතුවෙන් අප වෙත පැමිණෙන්නාවු ලෙඩ රෝග දුක් පිඩා, පරික්ෂාවන්, කලකිරීම් සහ පරිහානිය යන දේවල්ය. ජිවිතයේ එවන් පිඩාවන් කෙරෙන් ඇදහිලිවන්තයාද බැහැර වන්නේ නැත. ඔහු පාපයෙන් විකෘතිමත් වු ලෝකයක ජිවත් විම හේතුවෙන් රෝග, අනතුරු, ගිනි, සහ ස්භාවික අපදාවන් ඔහු අත්දකියි. එහෙත් මෙවන් පිඩාවන් යනු “කුරුසිය උසුලා ගැනිම” නොවේ. කුරුසිය ඉසිලිම ස්වේච්ජාවෙන් වන්නාක් මිස ජිවිතයේ පිඩාවන් මගින් පනවනු ලද දෙයක් නොවේ. එය දෙවියන්වහන්සේගේ අභිමතය ඉටු කිරිම පිනිස ස්ව අශාවන් ප්‍රතික්ෂේප කිරිම පිනිස වන අකන්ඩ (දෛයිනික) තෝරා ගැනිමකි.

“තම කුරුසිය උසුලමින් මා අනුගමනය නොකරන කිසිවෙකුට, මාගේ ගෝලයෙකු විය නොහැක.” යනුවෙන් යේසුස් වහන්සේ පැවසු සේක. කුරුසිය උසුලා ගැනිම මිනිස් ස්භාවයට ප්‍රසන්නධායක නොවන්නේ එය තමන්වම ප්‍රතික්ෂේප කිරිම හා අදාල වන නිසාය. එය ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ස්වෙච්ජාවෙන් කල යුතුය.

කුරුසිය උසුලා ගැනිම සඳහා, ඔබ ලෞකික දේ ඔබ දෑත මතින් හිස් කර දැමිය යුතුය. ඔබගේ හදවත මුදල් සහ වෙනත් භෞතික දේ මත රැදි ඇත්නම්, කුරුසිය උසුලා ගැනිම සඳහා ඔබගේ දෙයත් පිරි

වැඩිය. තමන්ව ප්‍රතික්ෂේප කර කුරුසිය උසුලා ගැනීමෙන් අනතුරුව, ගත යුතු ඊලග පියවර අනුගමනය කිරීමය. පැරණි ජීවන රාටාව සහ පාපී සම්බන්ධතාවන් ඔබ අතහැර දැමිය යුතුය.

එය ඉබේ සිදුවන තෙක් උපේක්ෂාවෙන් යුතුව බලාසිටීමෙන් ඔබ කිසි දිනෙක නායකයෙකු වන්නේ නැත ඔබ පළමු පියවර තැබිය යුතුය. තමන්වම ප්‍රතික්ෂේප කරන්න, කුරුසිය උසුලා ගන්න, අනතුරුව අනුගමනය කරන්න. මතෙව් හට බදු මේසයෙහිදි පේත්‍රුස්ට සිය දැල් සමගද සිටිය හැකිව තිබිනි. ඔවුන් දෙදෙනාටම සිය ව්‍යාපාරයන්හි අවංකව නියැලෙමින් සිටියදිම අධ්‍යාත්මික අත් දැකීම් බුක්තිවිදිමට නොහැකියාව පැවතිය හැකිව තිබුනා විය හැක. එහෙත්, අධ්‍යාත්මික නායකයින් වීමේ අවශ්‍යතාව ඔවුන් හට වුයේනම්, පැරණි තත්වය අතහැර අළුත් තත්වය තුලට ඔවුන් පිවිසිය යුතු විය. මතෙව් බදු මේස කෙරෙන් ඉවත් වු අතර, පේත්‍රුස් සිය දැල් අතහැර දැමිය.
නායකයෙකු වීම සඳහා සෑම අයෙකුම සිය වර්ථමාන රැකියාව සහ නිවස අතහැරිය යුතු බවත් මින් අදහස් නොකෙරේ. ඉන් අදහස් කෙරෙනුයේ ජීවන ශෛලිය පිලිබඳ වෙනස්කම් අවශ්‍ය කෙරෙන බවයි. ඇතැම් අය සම්බන්ධයෙන් නිවස, රැකියාවන් සහ සිය ආදරණීයයන් බයිබලය වෙනුවෙන් අතහැර දැමීම ඉන් අර්ථවත් වන්නේ විය හැක. යේසුස් වහන්සේ මෙහෙයවන කුමන ස්ථානයකට ඔබ උන්වහන්සේ අනුව යා යුතුය.

නිසි ප්‍රමුකතා යනුවෙන් අර්ථවත් කෙරෙනුයේ, මෙම කැඳවීම පිලිගැනීම සඳහා ඔබ සියල්ල අතහැර දැමිය යුතු බවය.

> **එසේම නුඹලා අතරෙහි තමා සන්තක සියල්ලම අත්නාරින කවරෙකුවත් මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලුක් 14 : 33)**
>
> **අනෙකුත් අයට සේවය කිරීම එක් ප්‍රමුකතාවක් බවට පත් විය යුතුය :**
>
> **එහෙයින් නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම් වෙන්ට කැමතිනම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය,**
>
> **නුඹලා අතරේ යමෙක් ප්‍රධානියා වෙන්ට කැමති නම්, ඔහු නුඹලාගේ දාසයා වන්නේය,**
>
> **එසේම මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව, සේවය කරන්ටද බොහෝ දෙනෙක් උදෙසා මිදිමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටද ආවේයැයි කී සේක. (මතෙව් 20:26-28)**

දෙවියන්වහන්සේගේ රාජ්‍යය ඔබගේ මූලික ප්‍රමුකතාව විය යුතුය:

> **එහෙයින් කුමක් කමුද, කුමක් බොමුද, කුමක් අඳිමුද, කියමින් කනස්සලු නොවෙල්ලා..**
>
> **නුමුත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා, මේ සියල්ලත් නුඹලාට දෙනුලබන්නේය. (මතෙව් 6 : 31, 33)**

**නියත අරමුණු : (ලුක් 9 : 61 - 62)**

ලුක් 9 : 57 - 62 දි සඳහන් තෙවන්නාට අනුගමනය කිරීමට අවශ්‍ය වුයේ වී නුමුත්, එසේ කිරීමට ඔහුට අවශ්‍ය වුයේ තමාගේම කොන්දෙසි අනුවය. ඔහුගේ පවුලේ අය වෙතින් සමුගැනීම සාමන්‍ය දෙයක් වු නමුදු, යේසුස්වහන්සේ ඔහුව කැඳවනු ලැබ තිබිනි. ඔහුගේ නිශ්චිත ජීවිත අරමුණු වුයේ කුමක්ද?

නායකයෙකු වීමට ඔහුට අවශ්‍ය විද නැතහොත් තමාගේම ජීවිත සැලැස්ම අනුගමනය කිරීමටද? ඔහුගේ ජීවිත අරමුණු නිශ්චිත කරනු ලැබ නොතිබුනි. ඔහුගේ පැරණි ජීවිතය සහ යේසුස් වහන්සේ කැඳවීම කල නව ජීවිතය යන විකල්ප දෙක අතර සිරවී, ඔහු පැකිලෙමින් පසුවිය. දේව කැඳවීම ඔහුගේ ඒකාන්ත ජීවන අරමුණ නොවිය. නායකත්වය වෙනුවෙන් වූ ඔබගේ කැපවීම නිශ්චිත විය යුතුය. එය ඔබගේ ජීවිතයේ ඒකාන්ත අරමුණ බවට පත්විය යුතුය.

### ආත්මික නායකත්වය පිලිබඳ සැබෑ වූ පරීක්ෂණය

ඔබගේ නායකත්වය පිලිබඳ සැබෑ වූ පරීක්ෂනය වන්නේ, ඔබගේ අනුගාමිකයින් සමග ඔබ තවදුරටත් රැඳී නොසිටින විට කුමක් සිදුවේද යන්නය. ඔබ ඔවුන්ට උගැන්වූ දේ කෙරෙහි ඔවුන් අකන්ඩව විශ්වාසයෙන් පවතින්නේද? තමන් උගත් දෙය ඔවුන් අනෙකුත් අය හට උගන්වන්නේද? ඔවුන් අතර ඔබ කායික වශයෙන් පෙනී නොසිටියදී අධ්‍යාත්මික වශයෙන් පරිනත වීම අකණ්ඩව පවත්වාගෙන යා හැකි වන්නේද? එසේනම්, අධ්‍යාත්මික නායකත්වය පිලිබඳ පරීක්ෂනය තුලින් ඔබ සමත් වී ඇත

### අවසන් අභියෝගයකි

නායකයෙකු ලෙසින් ඔබගේ සුවිශාල වූ වගකීම නිතරම සිහි තබා ගන්න :

> **ගෝලයෙකු ගුරුවරයාට (නායකයාට) වඩා උතුම් නැත. එහෙත් සැබෑ අයෙකුම ඔහු සම්පූර්ණයෙන් උගන්වනු ලැබූ පසු තම ගුරුවරයා මෙන් වන්නේය. (ලූක් 6:40)**

අනුගාමිකයින් සමග වන්නාවූ ගැටළු වලින් අධෛර්යමත් නොවන්න. යේසුස් වහන්සේ මෙවන් ගැටළු අත්දුටු සේක. අවස්ථාවකදී පිලිනොගන්නා සමාරියානු නගරයත් විනාශ කිරීම සඳහා අහසින් ගිනි කැඳවීමට අවසර පතමින් පේත්‍රුස්, යාකොබ්, සහ යොහාන් ද්වේෂකාරී ආල්පයක් ප්‍රදර්ශනය කලහ. (ලූක් 9:51-55) පේත්‍රුස් ස්වාමින්වහන්සේව තෙවතාවක් ප්‍රතික්ෂේප කලේය. (ලූක් 22:54-62) තමන්හට යාච්ඤා කරන ලෙස උපදෙස් ලැබී තිබිය දී තිදෙනාම ගෙත්සෙමනේ උයනේදී නින්දෙහි පසු වූහ. (ලූක් 22:45-46)

එහෙත්, මෙම අනුගාමිකයින් ස්වල්ප දෙනා වෙනුවෙන් යේසුස් වහන්සේ කාලය සහ ඉගැන්වීම් මගින් කල අයෝජනයෙහි වටිනාකම ඔවුන් සතු විය. ඔවුන්ගේ වැරදි සහ අසමර්ථකම් තිබුන නමුත් තමන් විශ්වාසවත් මනුෂ්‍යයින් බව ඔහු සනාථ කලහ. ඔවුන් මාර්ගයෙන්, ශුද්ධ ලියවිල්ල ලොව සියලු ජාතීන් අතර ව්‍යාප්ත විය. ආත්මික නායකයෙකු වශයෙන් සේවය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු වන අධික වටිනාකම ගෙවීමට ඔබ සූදානම් නම්, එවන් කැපවීමෙන් යුත් අනුගාමිකයින් ඇති කිරීම සැලැස්වීම සඳහා, දෙවියන්වහන්සේ විසින් ඔබවද ප්‍රයෝජනයට යොදා ගැනීමේ හැකියාව තිබේද ?

> "මා අනුව එන්න" මට කැඳවුමක් ඇසුනි ..... එපමණකි.
>
> මිහිතලයේ අගාවන් මිලාන විය,
>
> මාගේ ආත්මය උන්වහන්සේ පසු පස ගියේය.
>
> මම නැගී සිට අනුගමනය කලෙමි..... එපමනකි.

## ස්ව පරීක්ෂණය

1. ප්‍රධාන ජේදය මතකයෙන් ලියන්න

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

2. මෙම පාඩමෙන් සාකච්ඡා කෙරුණු නායකත්වයෙහි මීල පිළිබඳ අංගයන් මොනවාද ?

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

3. ආත්මික නායකත්වය පිළිබඳ යාථා පරීක්ෂණය කුමක්ද ?

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

(මෙම පරික්පණ වලට පිළිතුරු මෙම සංග්‍රහය අවසාන පරිච්ඡේදයේ දැක්වේ.)

## වැඩිදුර අධ්‍යනය සඳහා

1. පහත යොමුකර ඇති දේවල් අධ්‍යනය කර මෙම එක් එක් පුද්ගලයා හට නායකත්වයෙහි සේවය කිරීම වෙනුවෙන් ගෙවීමට සිදු වූ මිලය කුමක්දැයි විමසා බලන්න.

යෝසෙප් : උත්පත්ති 37 - 50

මෝසෙස් : නික්මයාම

හොෂෙයා : හොෂෙයාගේ පොත

එසකියෙල් : එසකියෙල් 3

ජේරිත පාවුල් : ක්‍රියා 9 : 28

2. මෙම කලමණාකරන අධ්‍යනය ඔබ දැන් නිමවා ඇති හෙයින්, "පාරිසරික විශ්ලේෂණය" සහ "අරමුණු සහිත කලමණාකරනය" නම් වූ හාර්වස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවන් ලබා ගන්නා ලෙස අපි ඔබට යෝජනා කරන්නෙමු

පලදායි සේවාවක් සඳහා අවශ්‍ය වන නායකත්වය, සැලසුම් කිරීම, සන්විධානය සඳහා වැඩිමනා වැටහිමක් මෙම පාඨමාලාවන් වෙතින් ඔබට ලැබෙනු ඇත.

## උප ග්‍රන්ථය

බයිබලයෙහි ඇතුලත් සුවිශේෂිත චරිතයන්ගේ ජිවිතය පිලිබඳව අධ්‍යනය කර කළමණාකරන මූලධර්යන් පිලිබඳව තවදුරටත් ඉගෙන ගැනිමේ අවශ්‍යතාව මෙම උප ග්‍රන්ථය මගින් සැලැසේ.

"චරිතප්‍රදානය" ක් යනු යම් අයෙකුගේ ජිවිත වෘතාන්තයයි. බයිබලයෙහි ඇතුලත් කිසියම් සුවිශේෂි පුද්ගලයෙකුගේ ජිවිතය පිලිබඳව ඔබ හදාරණ කල, ඔබ කරන්නේ " චරිත ප්‍රධානය අධ්‍යනය " යකි. බයිබල් චරිතයන් පිලිබඳව ජිවිත ඔබ හදාරන කල, ඔවුන්ගේ අත්දැකිම් තුලින් ඔබට උගත හැක. ශුද්ධ වූ ලියවිල්ල මෙසේ පවසයි.

> **ඒ සියල්ල අදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධවුනේය. ඒවා ලියා තිබෙන්නේ කාළවල කෙලවරට පැමිණ සිටින්නාවූ අපට අවධානය පිනිසය. (1 කොරින්ති 10:11)**

බයිබල් චරිතයන් හි ජිවිත තුල සිදුවු සිද්ධින් වාර්ථා කරනු ලැබ ඇත්තේ ඔබගේ යහපත සඳහාය. නායකත්වය පිලිබඳ සුවිශේෂි අධ්‍යාත්මික ගුරුහරුකම් ඔබට ඉගැන්විමට ඔවුන්ගේ අත්දැකිම් වලට හැකියාව ඇත. නායකයින් වශයෙන් ඔවුන්ගේ අසාර්ථකවිම් නිරික්ෂනය කිරිම මගින්, මගහැරිය යුතු වැරදි පිලිබඳව ඔබට උගත හැක. ඔවුන්ගේ සාර්ථකත්වයන් නිරික්ෂනය කිරිමෙන් ඔබගේ ජිවිතය තුල ධනාත්මක නායකත්ව ගුනාංගයන් ඔබට වර්ධණය කරගත හැක.

චරිත ප්‍රධානය අධ්‍යනයක් කිරිමේදි අනුගමනය කල යුතු වන පියවරයන් 4 ක් මෙලෙසය :

**පළමු පියවර : අධ්‍යනය කල යුතු පුද්ගලයා තොරාගන්න.**

ඔබ විශේෂ රුචියක් දක්වන පුද්ගලයෙකු තෝරා ගැනිමට ඔබට පුලුවන. ( හෙබ්‍රෙව් 11, ගලාති 3 : 7, හෝ ලුක් 4 : 27 හි සපයා ඇති ලැයිස්තු වලින් කිසියම් අයෙකු තෝරා ගැනිමට ඔබට අවශ්‍ය වනවා විය හැක. බයිබලයෙහි ඔබ දැනට කියවමින් සිටින යම් කිසි පොතකින් කිසිවෙකු පිලිබඳ අධ්‍යනය කිරිම උචිතය.

සියළු දෙනා අතරින් ශ්‍රේෂ්ඨතම නායකයන් වන්නේ යේසුස් ක්‍රිස්තුස් තුමන් බව සිහි රදවා ගන්න. නායකයෙකුගේ පරිපූර්ණ නිදර්ශණයක් ලෙසින් පළමුවෙන් උන්වහන්සේගේ ජිවිතය අධ්‍යනය කිරිමට ඔබට අවශ්‍යවනවා විය හැක.

අධ්‍යනය සදහා ඔබ යම් අයෙකු තෝරා ගැනිමේදි, නම් පටලවා නොගැනිමට ප්‍රවේසම් කාරිවන්න, උදාහරණයක් ලෙසින්, සකාරිය නැමැත්තන් 30 පමණද, නාදන්වරු 20, යොනතාන්වරු 15, යුදස්වරු 8, මරියාවන් 7, යාකෝබ්ලා 5, සහ යොහාන්ලා 5 පමණ බයිබලයෙහි වෙති. ඔබ අධ්‍යනය කරන සියලු ජේදයන් ඔබ තෝරාගත් අය පිලිබඳව මිස ඒ නමින්ම යුතු වු වෙනත් පුද්ගලයෙකු පිලිබඳ නොවන බවට සහතික කරගන්න.

ඇතැම් අයට නම් දෙකකට වඩා ඇත. උදාහරණයක් ලෙස, පරණ තෙස්තමේන්තුවෙහි යාකොබ්ගේ නම ඉශ්‍රායෙල් බවටද ආබ්‍රම්ගේ නම ආබ්‍රහම් ලෙසද වෙනස් කර ඇත. නව තෙස්තමේන්තුවෙහි, සාවුල්ගේ නම පාවුල් බවට හරවා ඇත.

**දෙවන පියවර : තොරතුරු රැස් කරන්න.**

ඔබ අධ්‍යනය කරන පුද්ගලයා පිලිබදව බයිබලය වාර්ථා කරන සියල්ලම කියවන්න. බයිබලය පිලිබද ආශ්‍රිත ග්‍රන්ථ ඔබට ඇතොත්, මෙම අමතර තොරතුරු භාවිතයට ගන්න. උදාහරණ වශයෙන්, සැකසුම් පත්‍රයක් ඔබ වෙත ඇතොත් අදාල පුද්ගලයාගේ නම කෙරෙහි යොමු කර බැලීමෙන් බයිබලයෙහි ඔහු/ඇය පිලිබදව ඇති සදහන් පිලිබදව සම්පූර්ණ ලැයිස්තුවක් ලබා ගත හැක.

සවියක් ඔබ වෙත නැතිනම්, අදාල යොමු කිරීම් කෙලින්ම බයිබලයෙන් රැස්කර ගන්න. යම් අයෙකු පිලිබද යොමු කිරීම් බොහෝ විට බයිබල් පොත් වල එක් පොතක් හෝ අනුක්‍රමක පොත් පෙළක් තුල ඇතුලත්ව ඇත. අදාල තැනැත්තා පිලිබද සියළු යොමුවන් ලැයිස්තු ගත කර, ඉන්පසු එක් එක් යොමුව අධ්‍යයනය කරන්න.

**තෙවන පියවර : තොරතුරු විස්තර වශයෙන් වෙන් කරන්න.**

ඔබගේ අධ්‍යයනයේදි ඔබ රැස්කරගත යුතු වන ඇතැම් තොරතුරු පහත සදහන් ලැයිස්තුවෙන් හදුනාගත හැක.

- නාමය සහ නාමයෙහි අර්ථය
- ඥාති හු : දෙමාපියෝ, සහෝදර සහෝදරියෝ, මුතුන්මිත්තෝ, දරුවෝ
- උපත : ස්ථානය, උපතෙහි වැදගත්කම, උපත ආශිත අසාමන්‍ය සිදුවීම්
- ළමා විය සහ මුල් පුහුණුව
- භූගෝලිය පසුබිම : මෙම තැනැත්තාගේ ජිවිතය පිලිබද කථාව සිදුවන්නේ කොතැන්හිද
- මිතුරෝ සහ ආශ්‍රය කල අය, පෞද්ගලික සම්බන්ධතා
- රැකියාව හෝ වෘත්තිය ඔවුන් දැරූ තනතුර හෝ පදවිය කුමක්ද ? ඔවුන් තම දිවි පෙවත සලසා ගත්තේ කෙසේද ?
- ශාරීරික විස්තරය
- ධනාත්මක චරිත ලක්ෂණය සහ නායකගති සම්භාවයන්
- වැදගත් සිදුවීම්

    දෙවියන්වහන්සේ සමග ප්‍රථම හමුවීම

    නව මගට හැරීම

    සේවා සදහා කැදවනු ලැබීම

අදාල තැනැත්තාගේ ජිවිතය තුල විශාලතම අර්බුදය හෝ තිරනාත්මක වෙනස සිදු වු අවස්ථාව

- නායකයෙකු වශයෙන් සාර්ථකත්වය ලද මාර්ග : ඔවුන්ගේ සාර්ථකත්වයට හේතු සාදක වුයේ කුමක්ද?
- නායකයෙකු වශයෙන් අසාර්ථක විමේ ක්‍රියා මාර්ග : ඔවුන්ගේ අසාර්ථකත්වයට පාදක වුයේ කුමක්ද? ප්‍රතිපලය වුයේ කුමක්ද? ඔවුන් ඒ පිලිබදව කලේ මොනවාද
- මරණය : කවදාද?, කොතැන්හිද?, අසාමන්‍ය බාහිර තත්වයන්

**සිව්වන පියවර : තොරතුරු රැස් කරන**

ඔබ ඉගෙන ගන්නා දෙය ආදේශ කරන්න. මෙම තැනැත්තා සම්බන්ධව ඔබ උගන්නා දෙය ඔබගේම ජිවිතය කෙරෙහි ආදේශ කරන්න :

1. නායකයන් වශයෙන් ඔවුන්ගේ ධනාත්මක චරිත ලක්ෂන වුයේ මොනවාද? ඒවා ඔබගේ ජිවිතය තුල වර්ධනය කිරිම සදහා ඔබට උපකාර වන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.

2. ඔවුන්ගේ රිනාත්මක චරිත ලක්ෂන වුයේ මොනවාද ? මෙවායින් කිසිවක් ඔබගේම ජිවිතය තුල ඔබ දකින්නෙහිද? ඒවා මැඩ පැවැත්විම සදහා ඔබට උපකාරි වන මෙන් දෙවියන් වහන්සේ වෙතින් අයදින්න.

3. මෙම තැනැත්තා නායකයෙකු ලෙස සාර්ථක වුයේ කුමන මාර්ගයන් අනුවද ඔබ මෙම සාර්ථකත්වයෙන් මුලධර්මයන් උපයෝගිකර ගන්නේද?

4. මෙම තැනැත්තා නායකයෙකු ලෙස අසාර්ථක වුයේ කුමන අයුරින්ද? මේවා ඔබටද ගැටළු විලස පවතින්නේද ? වෙනස් විම පිනිස ඔබ කරන්නේ කුමක්ද?

5. මෙම තැනැත්තාගේ ජිවිතයෙන් ඔබ ඉගෙනගත් ශ්‍රේෂ්ඨතම මුලධර්මය සාරාංශ කෙරෙන එක් වාක්‍යක් නිර්මාණය කරන්න.

ජිවන චරිතයක් පිලිබද නිදර්ශනයක් පහත දැක්වේ :

**නිදර්ශණය**

**ප්‍රථම පියවර : අධ්‍යණය කල යුතු පුද්ගලයා තෝරා ගන්න.**

සාවුල් රජු

**දෙවන පියවර : අදාල තොරතුරු රැස්කරන්න.**

සාවුල් රජු පිලිබඳ කථාව (1 සාමුවෙල් 9:31) හි ඇත. සාවුල් පිලිබඳ තොරතුරු මෙම ජේදයන්ගෙන් රැස්කර ගන්නා ලදි

**තෙවන පියවර : අදාල තොරතුරු බෙදා වෙන් කරන්න.**

නාමය සහ නාමයේ අර්ථය : සාවුල් අර්ථය "දෙවියන් වෙතින් ඉල්ලන ලද" (1 සාමුවෙල් 9:2)

ඥාතිහු : දෙමාපියෝ, සහෝදර සහෝදරියෝ, මුතුන් මිත්තෝ, දරුවෝ

සාවුල් අබියෙල් කිෂ් ගේ පුත්‍රයාය. අබියෙල් සෙරර්ගේ පුත්‍රයාය. සේරර් බෙකොරාත් ගේද ඔහු අෂිභාගේ පුත්‍රයාද විය. කිෂ් බෙන්යමීය මනුෂයෙක් වූ අතර, ඉතා බලගතෙක් විය. (1 සාමුවෙල් 9:1) සාවුල්ට පුත්‍රයෝ තිදෙනෙක් වූහ. ඔවුන් නම්, යොනතන්, ඉෂ්වී සහ මල්කිෂුවා නම් අයය. මේරාබ් සහ මිකාල් නමින් දියනියන් දෙදෙනෙකුද වූහ. ඔහුගේ භාර්යාව අහිනොවාම් වුවාය. (1 සාමුවෙල් 14:49-50)

උපත : ප්‍රදේශය, උපතෙහි වැදගත් ක්‍රම, උපත ආශ්‍රිත අසාමන්‍ය සිද්ධි : මෙම තොරතුරු බයිබලයේ සඳහන්ව නැත.

ළමා කාලය සහ මුල් පුහුණුව : සිය පියාණන්ගේ කොටළුවන් රැකබලාගත්තේය. (1 සාමුවෙල් 9:3)

භූගෝලික වටපිටාව : යුදා දේශය

මිතුරෝ සහ හිතවත්තු, පෞද්ගලික සම්බන්ධතාවන්

බෙලියල්ගේ පුත්‍රයෝ ඔහු ප්‍රතික්ෂේප කලහ. (1 සාමුවෙල් 10 : 27) ඔහු තම සත්කාරකරු වන තමන්ගේ බාප්පාගේ පුත්‍රයාගේ සේනාපතියා වූ අබ්නේර්ට ඉතා හිතවන්ත විය. (1 සාමවෙල් 14 : 50) දාවිත්, සාවුල්ගේ සහකරුවෙකු බවට පත්විය. මුලදි ඔහු සාවුල්ගේ ප්‍රසාදයට භාජනය වූ නමුත්, පසුව සාවුල් ඔහු කෙරෙහි ඉර්ෂ්‍යා සාගත වුයෙන්, ඔවුන්ගේ සම්බන්ධතාවය බිඳ වැටින. (1 සාමුවෙල් 18 : 6 - 9) සවුල් රජකමට පත්වූ මුල් අවදියේ ඔහුට "දෙවියන්වහන්සේගේ පෙළඹවීම තම හදවත් තුල තිබූ" මිනිසුන් සමුහයක් ඔහු සමග සිටියෝය. ඔහු දෙවියන්වහන්සේගේ මෙහෙය විමෙන් තොරව "ශක්තිමත් සහ අභීත" මිනිසුන් එක්කර ගැනිමට පටන් ගත් විට ඔහුගේ ගැටළු ආරම්භ විය. (1 සාමාවෙල් 10:26, 13 : 2, 14:52)

රැකියාව හෝ වෘත්තිය : ඉශ්‍රායලයේ ප්‍රථම රජු

ශාරීරික විස්තරය : ඔහුගේ උරහිස් සිට ඉහලට වෙනත් මිනිසුන්ට වැඩියෙන් ඔහු උස්ය. (1 සාමුවෙල් 9:2, 10:23) කඩවසම් යන අර්ථයෙන් යුත් " සොබන " ලෙසින් ඔහු විස්තර කරනු ලැබ ඇත. (1 සාමුවෙල් 9:2)

ධනාත්මක නායකත්ව ලක්ෂණ :

- සිය පවුල පිලිබඳ අවධානය යෙදිය : 1 සාමුවෙල් 9 : 5
- " තෝරා ගනු ලැබූ මනුෂ්‍යයාය " : 1 සාමුවෙල් 9 : 2, 10 : 24
- සිය හෘදය වෙනස් කිරිමට ශුද්ධාත්මයාණන් හට ඉඩදුනි : 1 සාමුවෙල් 10 : 6, 11 : 6
- නිහතමානිය ( මළු අතරෙහි සැගවුන ) : 1 සාමුවෙල් 10 : 22
- පළිගැනිම ප්‍රතික්ෂේප කරයි : 1 සාමුවෙල් 11

- නායකත්වය ( මිනිසුන් එක්රොක් කලේය ) : 1 සාමුවෙල් 11
- ශුද්ධාත්මයාණන් විසින් තෝරාගන්නා ලද අයෙකි : 1 සාමුවෙල් 11
- ආරම්භයේදි කීකරුව සිටියේය : 1 සාමුවෙල් 9 : 27
- යහපත්කම සමග බැඳි සිටියේය : 1 සාමුවෙල් 10 : 26, 11 : 7
- දෙවියන්වහන්සේ උදෙසා නිර්භිත විය : 1 සාමුවෙල් 10 : 6
- ආරම්භයේදි නිහතමානිව සිටියේය : 1 සාමුවෙල් 9 : 21

ඍනාත්මක නායක ලක්ෂණ :
- දෙවියන්වහන්සේට කීකරු විමට වඩා අවශයයි පෙනෙන දෙය කලේය : 1 සාමුවෙල් 13 : 8 - 13
- අකීකරු වී අසත්‍ය පවසා, පසුව වරද පිළිගැනිම ප්‍රතික්ෂෙප කලේය : 1 සාමුවෙල් 15
- දෙවියන්වහන්සේගේ ජනතාව දුකට පත් කලේය : 1 සාමුවෙල් 15 : 35
- දෙවියන්වහන්සේට වඩා මිනිසා සිතන දෙය පිලිබඳව වැඩි අවධානයක් යෙදවිය : 1 සාමුවෙල් 15 : 30
- දෙවියන්වහන්සේ ස්පර්ශ කල මිනිසුන් සමුහය වෙනුවට තමන්ට සම්පව සිටිම සඳහා ශක්තිමත් සහ එඩිතර මිනිසුන් තෝරා ගත්තේය : 1 සාමුවෙල් 10 : 26, 14 : 52
- බියට පත් විය : 1 සාමුවෙල් 17 : 11
- බාහිර පෙනුමෙන් විනිශ්චය කලේය : 1 සාමුවෙල් 17 : 33
- මිනිසාගේ යුධ අවි කෙරෙහි විශ්වාසය තැබිය : 1 සාමුවෙල් 17 : 38
- ඊෂ්‍යා සහගතය : 1 සාමුවෙල් 18 : 6 - 9
- නපුරු ආත්මයක් : 1 සාමුවෙල් 18 : 10
- පලි ගැනිමේ හදවත : 1 සාමුවෙල් 18 : 11
- දෙවියන්වහන්සේගේ ආලේපය කල මිනිසුන්ට එරෙහිව කුමන්ත්‍රණය කලේය : 1 සාමුවෙල් 18 : 20 - 30

වැදගත් සිදුවිම් :

- දෙවියන්වහන්සේ සමග ප්‍රථම මුණගැසිම : 1 සාමුවෙල් 9 : 15 - 27
- හැරිම : 1 සාමුවෙල් 10 : 9
- සේවාවට කැඳවිම : 1 සාමුවෙල් 10 : 1

මෙම පුද්ගලයාගේ සුවිශාලතම අර්බුදය හෙවත් ආපසු හැරුන අවස්ථාව : අකීකරු විය. එහෙයින් ඔහු වෙතින් රාජධානිය නැවත ආපසු ගන්නා ලදි. 1 සාමුවෙල් 13

මරණය : කවදාද, කොතැනදිද, අසාමාන්‍ය වටපිටාව. සාවුල් සිය දිවි නසාගත්තේය. ඔහුගේ පුත්‍රයින් තිදෙනා, ඔහුගේ යුධ ඇඳුම් රැගෙන යන්නා, ඔහුගේ සියළුම මිනිසුන් පලස්තිනුවන් සමග සටනකදි ගිල්බෝ කන්දේදි එම දිනයේදිම මිය ගියහ. 1 සාමුවෙල් 31

**සිව්වන පියවර : ඔබ ඉගෙන ගත් දේ ආදේශ කරන්න.**

මගේම ජිවිතය තුලට වර්ධනය කිරිමට මා ප්‍රයන්ත දැරිය යුතු සාවුල්ගේ ජිවිතයේ තිබු ධනාත්මක නායකත්වය.

ස්වාමින්වහන්සේගේ ආත්මය යම් අයෙකු මතට වැඩම කළ විට ඔහු “ අයෙකු ” බවට වෙනස් වන්නේය. 1 සාමුවෙල් 10 : 6 එවන් වු ප්‍රකාර ආලේපයක් මා දෙවියන්වහන්සේ වෙතින් ඉල්විය යුතුය.

**මගේම ජීවිතය කෙරෙන් බැහැර කර තැබිය යුතු වන සාවුල්ගේ ජීවිතයෙහි තිබූ ඍණාත්මක නායකත්ව ගුණාංග :**

**තමන් වහන්සේගේ හදවත පසුපස පැමිණීම දෙවියන්වහන්සේ නායකයින් කෙරෙන් අපේක්ෂා කරන සේක. 1 සාමුවෙල් 13 : 14 පාවුල් මෙම ප්‍රදේශය තුල අසමර්ථවුයේ වී නමුත්, නායකයෙකු වීමට මම කැමැත්තෙමි. අකීකරුකම : දෙවියන්වහන්සේ අණ කරන දෙය කිරීම පසෙක දමා පහසු හෝ අවශ්‍යවන ලෙස මතු පිටින් පෙනෙන දෙය කිරීම. මගේම වැරදි පිලිබඳව අනුන් මත දොස් පැවරීම මා පිලිබඳව දෙවියන්වහන්සේ සිතන ආකාරය පිලිබඳව නොව මිනිසා සිතන දෙය කෙරෙහි වැඩිපුර උනන්දු වීම. සාවුල්ගේ ඍණාත්මක ගුණාංග පිලිබඳ සම්පූර්ණ ලැයිස්තුව නැවත සමාලෝචනය කර විටින් විට මගේම හදවත පරීක්ෂා කර බැලීම මගේ යහපත පිනිස හේතු වනු ඇත.**

සාවුල් හට දේව කැඳවීම වුයේ ජනයාගේ සෙන්පතියා වීමටය :

1 සාමුවෙල් 10:1 එහෙත් එහෙත් ඔහු රජකමෙහි පිහිටුවාලුයේ ජනතාවයි. (1 සාමවෙල් 12:12-15, 10:24) ඉශ්‍රායලයේ රජ විය යුතු වුයේ දෙවියන්වහන්සේය. ජනයාගේ ප්‍රගාංගාව මා දෙවියන්වහන්සේගේ සැලසුම වෙතින් වෙනතක යොමු කරවා නොවිය යුතු අයෙකු බවට පත් කරනු ලැබීමෙන් මා ප්‍රවේසම් විය යුතුය. ප්‍රථමයෙන් දෙවියන්වහන්සේ සාවුල් සමග පැවතිය නුමුදු පසුව සිය රාජධානිය ඔහුට අහිමි විය. සාවුල්ගේ පාපයෙන් පසුව සහ රාජධානිය අහිමි වීම පිලිබඳව අනාගත වාක්‍යයෙන් පසුව වුවද දෙවියන්වහන්සේගේ ආලේපය සාවුල් සමග පැවති බව සැලකිල්ලට ගැනිම වැදගත් (1 සාමුවෙල් 14:47) දෙවියන්වහන්සේ තිලිනයක් සහ කැඳවීම් පශ්චත්තාපයෙන් තොරව පවා ලබා දෙන්නාහ සාවුල් තව දුරටත් දෙවියන්වහන්සේගේ හඬ ශ්‍රවනය කල අතර (1 සාමුවෙල් 15:1) උන්වහන්සේට වන්දනා මානද කල නුමුදු ඔහු සිය පාපය පවසා රාජධානිය අහිමි විය. නායකයෙකු ලෙසින් දෙවියන්වහන්සේ ආලේපකල තැනැත්තෙකු ස්පර්ශ කිරීමේ ඇති භයානකකම දාවිත් හඳුනා ගත්තේය. මෙම අනතුරු ඇඟවීම මම වටහා ගත යුතු වෙමි.

**සාවුල්ගේ ජීවිතය තුලින් උගත් අතිශ්‍ය වැදගත් පාඩම වන්නේ** දෙවියන්වහන්සේට අකීකරු වීමෙහි ප්‍රතිවිපාකයන්ය. එය සාමුවෙල්ගේ ප්‍රකාශයේ අන්තර්ගතව ඇත. “පූජාවට වඩා කීකරු වීමත් බැටළුවන්ගේ තෙලට වඩා ඇහුම්කන් දීමත් හොඳය (1 සාමුවෙල් 15:22) එවන් අකීකරු කමෙහි ප්‍රතිවිපාක සාවුල් සම්බන්ධව දාවිත්ගේ ප්‍රකාශයෙහි සාරාංශ කරනු ලැබ ඇත : “අහෝ බලවතුන් වැටුන හැටි” (2 සාමුවෙල් 1:19)

**සටහන : බයිබලයේ නායකයින් පිලිබඳව හැදෑරීමේ දි නැවත සකසාගෙන ප්‍රයෝජනයට ගත හැකි පිනිස අදර්ශ අකෘති පත්‍ර මින් පසු පිටුවල ඇත.**

## බයිබල් නායකයින් පිලිබඳ චරිතාප්‍රදාන හැදෑරීම

**ප්‍රථම පියවර : හැදෑරිය යුතු තැනැත්තා තෝරා ගන්න.**

"මා හදාරන නායකයා වන්නේ :________________"

**දෙවන පියවර : තොරතුරු රැස්කරන්න.**

මෙම තැනැත්තා පිලිබඳ බයිබලය සඳහාන් කරන දේ පිලිබඳ ලැයිස්තුවක් සකසන්න

**තෙවන පියවර : තොරතුරු විශ්ලේෂණය කරන්න.**

නාමය සහ නාමයෙහි අර්ථය :

ඥාති වර්ගයා : දෙමාපියන්, සොයුරු සොයුරියන්, මුතුන් මිත්තන්, දරුවන්

උපත : ප්‍රදේශය පිහිටීම, උපතෙහි වැදගත්කම, උපත වටා සිදුවූ අසාමන්‍ය සිදු වීම්

ළමා කාලය සහ මුල් කාලය :

භූගෝලිය පිහිටීම :

මිත්‍රයන් සහ සහකරුවෝ, පෞද්ගලික සම්බන්ධතා :

වෘත්තිය හෝ රැකියාව :

මෙම තැනැත්තා පිලිබඳ බයිබලය සඳහාන් කරන දේ පිලිබඳ ලැයිස්තුවක් සකසන්න

කායික විස්තර :

**ධනාත්මක නායකත්ව ලක්ෂණ :**

**ඍණාත්මක නායකත්ව ලක්ෂන :**

**සුවිශේෂි සිදු විම් :**

**දෙවියන්වහන්සේ සමග පළමු හමුවිම :**

**හැරීම :**

**සේවා සඳහා කැඳවිම :**

**විශාලතම පසු බැසිම හෙවත් ආපසු හැරුණ ස්ථානය :**

**මරණය : කවදාදා, කොතැන්හිද, අසාමන්‍ය සිදුවිම**

**සිව්වන පියවර : ඔබ උගත් දෙය ආදේශ කරන්න.**

**“ ____________________පිලිබඳව මා උගත් දෙය මගේම ජිවිතය සඳහා පහත සඳහාන් ආකාරයෙන් ආදේශ කරගත හැක. ”**

## ස්වයං පරීක්ෂණ පිළිබඳ පිළිතුරු

**පළමු පරිච්ඡේදය:**

1. නායකත්වය සඳහා අපේක්ෂාවෙන් යුතුවීම ගෞරවණීය පරමාර්ථයකි. (1 තිමෝති 3:1) නව ඉංග්‍රිසි බයිබලය

2. “සේවා කිරීම” සඳහා වු වෙනත් වචනයකි කළමනාකරණය. සේවාදායකයෝ හෙවත් කළමනාකරුවෝ වෙනත් අයෙකු විසින් ඔවුන් වෙත පවරන ලද කිසියම් දෙයක් සම්බන්දව වගකිම දරයි. මානව, ද්‍රව්‍යමය, සහ අධ්‍යාත්මික සම්පත් පිළිබද නිසි භාවිතා කිරීම මගින් දෙවියන්වහන්සේගේ අරමුණු සහ සැලසුම් පරිපූර්ණත්වයට පත්කිරීමේ ක්‍රියාවලිය කළමනාකරණය යනු වේ. එවන් සැලසුම් සහ අරමුණු සාක්ෂාත් වුයේද නැද්ද යන්න අනුව එම කළමනාකරණය මිනුම් කෙරේ.

3. ශුද්ධවු ලියවිල්ල, මුදල්, සභාව සතු ද්‍රව්‍යමය සම්පත් අධ්‍යාත්මික ත්‍යාග සහ අනෙක් ඇදහිලිවතුන් යන මේවා සම්පත් වේ.

4. විශ්වාසවන්තනම

5. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

6. පළමු පරිච්ඡේදයෙහි දි ඇති සාරාංශ කිරිම සමග ඔබගේ සාරාංශය සසදන්න.

7. ඔබගේ පිළිතුර පළමු පරිච්ඡේදයෙහි දි ඇති සාරාංශ කිරිම සමග සසදන්න.

**දෙවන පරිච්ඡේදය:**

1. උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගතවක්තෘන්ද, සමහරුන් ගුරුවරයන්ද, කොට දුන් සේක. (එපිස 4 : 11)

2. 2 , 1 , 4 , 3 , 5 , 6 , 7

3.
   - වැඩිමහල්ලන්
   - පුජක සහායකයින්
   - නායක පුජකයින්

**තෙවන පරිච්ඡේදය:**

1. නුමුත් ඔබ කුටගොනාගේ අග මෙන් මාගේ අග උස් කල සේක. මම අලුත් තෙලින් ගාගන සිටිමි. (ගිතාවලිය 92 : 10)

2. “ආලේප කිරීම” යන්නෙහි අර්ථය වන්නේ යම් කිසි දෙයක් හෝ කෙනෙකුන් තෙල් ආලේප කිරිම මගින් වෙන්කිරිම හෝ පුජා කිරිමය.

3. තෙල් ශුද්ධාත්මයාණන් සඳහා වන සංකේතයකි. යම් අයෙකුන් තෙල් ආලේපය කිරීම ඔහු මත කිසියම් සුවිශේෂිතවූ අරමුණක් සඳහා ශුද්ධාත්මයාණන් වැඩම කරන බවට සංකේතයකි.

4. සමාජයේ බෙලහීනන් ආලේපනය කිරීම සම්බන්ධතාව පිලිබඳව : පූජකයින් ආලේපය පූජ්‍යත්වය සඳහාද, නායකයින් ආලේපය තත්වය සහා බලය සඳහාද වේ.

5. සභාව වෙනුවෙන් ආලේපය කිරීමෙහි මුලාශ්‍රය දෙවියන්වහන්සේය.

6. ආලේපය කිරීමෙන් දෙවියන්වහන්සේ සමග ඔබගේ තත්වය ස්ථාපිත කර, ඔබට දෙවියන්වහන්සේගේ අරමුණු ඉටුකර මෙහෙයවීම සඳහා ඔබට බුද්ධිය ලබා දී ඔබ අනුසාසනය කරන්නවුන් සමග වන බැදීම් බිඳ දමනු ලැබේ.

7. අධ්‍යාපනය, බුද්ධිමත් කම, හැකියාවන් හෝ පලපුරුද්ධ අනුව දෙවියන්වහන්සේ ආලේප නොකරන සේක. උන්වහන්සේ ආලේප කරන්නේ හදවත් ආකල්පය පදනම සලකමින්ය.

8. ඔබ ආලේපිත මාවතෙහි ගමන් කිරීම වැලැක්වීමට අයහපත් බලකායන් හට අවශ්‍ය වන්නේ, දෙවියන්වහන්සේගේ අරමුණු මුදූන් පමුනුවාලනු ලබන්නේ ආලේපිත සභාවන් විසින් බව ඔවුන් දන්නා නිසාය.

9. ඔබ එලෙස නොකලහොත් ඔබ ඵලදායි නොවනු සහ ඉමහත් අපහසුතාවයන්ට මුහුණ දිය යුතු වනු ඇති නිසාය.

10. මෙම අභ්‍යාසයෙහි, සකච්ඡා කරන ලද ත්‍රිවිධාකාර ආලේපය තුල නොකඩවා ගමන් කිරීම මගිනි.

**සිව්වන පරිච්ජේදය:**

1. මක්නිසාද අපි වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුල මවනු ලැබ දෙවියන්වහන්සේගේ කාර්මාන්තයව සිටිමුව. ඒ යහපත් ක්‍රියා වල අප හැසිරෙන පිනිස දෙවියන්වහන්සේ ඒවා කලින් සුදනම් කල සේක. (එපීස 2 : 10)

2. සහජ හැකියාවන් සුදුසුකම් වන්නේ නැත. ඒවා චරිතය සහ හැසිරීම පිලිබඳ ගුනාංගයන්ය. නායකත්වය සඳහා වූ බයිබලයානුකුල සුදුසුකම් වන්නේ නායකයින් සඳහා අවශ්‍යවන බවට දේව වචනයෙහි විස්තර කර ඇති ගතිගුන සහ හැසිරීම් ස්වභාවයන්ය. ඒවා ශුද්ධවත් ජිවන රටාවක් පිලිබඳ සාධකයන්ය.

3. ධර්ම ප්‍රචාරයෙහි ඵලය යනු දේව ධර්මය පිලිබඳ පණිවුඩය සම්බන්ධයෙන් බලවත් සාක්ෂිකරුවකු වීමයි.

4. හතරවන පරිච්ජේදයෙහි ක්‍රිස්තු - සමාන ගුනාංගයන් පිලිබඳව සපයා ඇති ලැයිස්තුව බලන්න.

5. 9, 7, 8, 5, 6, 2, 4, 3, 1

6. අදාල ජේදය වන්නේ 1 තිමෝති සහ තිතස් 1

7. ඔවුන් නැවත උත්පත්තිය ලබා, ශුද්ධාත්මයාණන් තුල, බෞතිස්මය වී, නායකයෙකු වීම සඳහා දෙවියන්වහන්සේ කෙරෙන් නිශ්චිත කැඳවීමක් සහ ආලේපය වීමක් ඇතිව, අධ්‍යාත්මික වශයෙන් පරිනත වීමය.

**පස්වන පරිච්ජේදය:**

1. ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුල තිබුන සිතම නුඹලා තුලත් තිබේවා. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරන සේක්, දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගෙනම සිටිය යුතුවූ වස්තුවකැයි නොසිතා එය ඉවත්කර දාසයෙකුගේ රූපාකාරය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිනිසේක. ( පිලිප්පි 2 : 5 - 7 )

2. සේවක නායකත්වය

3. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ

4. දාස භාවයෙහි ශක්තිය වන්නේ ඔහු දෙවියන්වහන්සේ වෙනුවෙන් ප්‍රයෝජනයට ගත හැකිවන තත්වය තෙක් කිසියම් තැනැත්තෙකු පහත් කර නිහතමානී කරවනු ලැබීමය.

5. ලෞකික නායකයින් තම අනුගාමිකයින් කෙරෙහි දරණ අතර, ඔවුහු ඒ අය මත සිය අධිකාරිය පනවමින් ප්‍රධානින් සහ ස්වාමින් ලෙස ක්‍රියා කරති.

6. අප සේවය කරන්නන් ක්‍රිස්තුස්තුමන්ගේ ශරීරයට සහ අතහැර දමන ලද සහ මියයමින් සිටින මනුෂ්‍ය සංහතිව වෙනුවෙනි. යාථාර්ථය වන්නේ, අපගේ සේවය ස්වාමින්වහන්සේට වීමයි.

7. ඔබගේ පැහැදිලි කිරීම පස්වන පරිච්ජේදයෙහි දැක්වෙන විමසුම සමග සංසන්ධනය කර බලන්න.

**සයවන පරිච්ජේදය:**

1. නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලාගනිමින්, බලහත්කාරය නිසා දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද,

2. නුඹලාගේ භාරයට දෙන ලද්දවුන් කෙරෙහි අධිපතිකම් කරන්නාක් මෙන් නොව රැළට ආර්ශව සිටිමින්ද, ( 1 පේත්‍රුස් 5 : 2 - 3 )

3. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ

4. යේසුස් ස්වාමින් කෙරෙහි සැබවින්ම විශ්වාස කරන සියල්ලෝම එකම බැටළු රැළෙහි කොටසක් වෙති.

5. ඔබ සාකච්ජා කර ඇති දෙය සයවන පරිච්ජේදයේ සඳහන් වූ විමසුම සමග සසඳා බලන්න.

6. ඔබ සාකච්ජා කර ඇති දෙය සයවන පරිච්ජේදයේ සඳහන් වූ විමසුම සමග සසඳා බලන්න.

සත්වන පරිච්ඡේදය:

1. උන්වහන්සේ (දෙවියන්වහන්සේ) සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගතවක්තෘන්ද, සමහරුන් සුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද, සමහරුන් සභාපාලකයන්ද, සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. එසේ දුන්නේ, ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීමේ වැඩය පිනිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වර්ධනය වීම පිනිසත්ය. (එපිස 4 : 11 - 12)

2. සභාවේ සේවය සඳහා ඇදහිලිවතුන් පරිපූර්ණ කිරීම සඳහා

3. පරිපූර්ණ කිරීම යනුවෙන් අදහස් කෙරෙන්නේ සභාවේ කාර්‍යයන් සඳහා ඇදහිලිවතුන් සූදානම් කිරීම හෝ සම්පාදනය කිරීමය. ඉගැන්වීම, දේශනා කිරීම, ප්‍රදර්ශනය කිරීම, පුහුණු කිරීම සහ සාධාරනයෙහි යෙදවීම ඒ හා අදාල වේ.

4. සභාවෙහි සේවා සඳහා ඇදහිලිවතුන් නිසිසේ " පරිපූර්ණ කල විට " එහි ප්‍රති පල අතර මෙම දේවල් ඇතුලත් වේ :

    - සභාවේ කටයුතු ඉටුවන්නේය : එපිස 4 : 12
    - ක්‍රිස්තුස් වහන්සේගේ සමාජය (ශුද්ධ වු සභාව) දියුණු (වර්ධනය) වන්නේය : එපිස 4 : 12
    - අධ්‍යාත්මික පරිනතභාවය වෙත ජනයාව ලගාවේ. : එපිස 4 : 13 - 15
    - එක්සත්කම ප්‍රටිපල ලෙස ඇතිවේ. : එපිස 4 : 13
    - ජනතාව යේසුස් වහන්සේගේ ස්වරූපයට වෙනස් කරනු ලැබේ: එපිස 4 : 13
    - ජනයා සත්‍ය තුල කිදා බැස දේව ධර්මය තුල ස්ථාවර වන්නේය. :
    - එපිස 4 : 15 - 16
    - ක්‍රිස්තු සමාජය පලදායි අයුරින් ක්‍රියාකරන්නේය. : එපිස 4 : 16

5. ඔබගේ සාකච්ජාව සත්වන පරිච්ඡේදය සමග සංසන්ධනය කරන්න.

අට වන පරිච්ඡේදය:

1. මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගයේ යොමු කරවයි. එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමින්වහන්සේය. (හිතෝපදේශ 16 : 9)

2. බයිබලයානුකුල ප්‍රවේශය වන්නේ ජනතා චන්දය හෝ "බහු පාලනය නොවේ." සභාවේ තීරණ ගැනිම සඳහා දෙවියන්වහන්සේ නායකයින් සාදන සේක.

3. ඔබගේ සාරාංශය අටවන පරිච්ඡේදයෙහි සපයා ඇති තොරතුරු සමග සංසන්ධනය කර බලන්න.

4. තීරණ ගැනිම පිලිබඳ ආකෘතියක් යනු තේරීම් කිරීමේදි අනුගමනය කල යුතු නිදර්ශනයකි.

5. ආකෘතියකින් කෙරෙන්නේ අනුගමනය කිරීම සඳහා ඔබට නිදර්ශනයක් සැපයීමයි.

**නමවන පරිච්ජේදය:**

1. සියලු ධර්ම ග්‍රන්ථ දෙනු ලැබ ඇත්තේ දෙවියන්වහන්සේගේ ආනුභාවය කෙරෙන් වන අතර, ඒවා ඇදහිල්ල සඳහාද තරවටුව සඳහාද නිවරද කිරීම සඳහාද ධාර්මිකත්වය පිලිබඳ උපදේශනය සඳහාද ප්‍රයෝජනවත්ය.
   දෙවියන්වහන්සේගේ මනුෂ්‍යා සම්පූර්ණව සියලු යහපත් ක්‍රියා වලට සුදානම්ව සිටිනු පිනිසය.
   (2 තිමෝති 3 : 16 - 17)

2. ඔබගේ සාරාංශය නවවන පරිච්ජේදයෙහි දි ඇති දෙය සමග සසදන්න.

3. ඔබගේ සාරාංශය නවවන පරිච්ජේදයෙහි දි ඇති දෙය සමග සසදන්න.

4. ඔබගේ හේතු ලේඛනය නවවන පරිච්ජේදයේ දැක්වෙන්න සමග සසදන්න

5. ඔබගේ සාරාංශය නවවන පරිච්ජේදයෙහි දි ඇති දෙය සමග සසදන්න.

6. සාතන්, මාංශය සහ අහංකාරය විසින් පොළඹවනු ලද අධ්‍යාත්මිකව පරිනත නොවු නාමික ක්‍රිස්තියානින් හේතු වෙනි.

7. දෙවියන්වහන්සේගේ වචනයෙහි පදනම්ව අප ශික්ෂණය කර ආරවුල් විසදන කල, සභාවෙහි සේවා සඳහා ජනයා පරිපූර්ණ වි සම්පාදනය වන්නෝය.

**දසවන පරිච්ජේදය:**

1. ගෝලයා ගුරුවරයාට වඩා උතුම් නැත. නුමුත් සම්පූර්ණත්වයට පැමිනි සැම දෙනම තමාගේ ගුරුවරයා මෙන් වන්නෝය. (ලුක් 6 : 40)

2. අනෙකුත් අය පුහුණු කිරීම වැදගත් වගකීමක් වන්නේ ඔබ විසින් පුහුණු කරනු ලබන්නන් ඔබ මෙන්ම වන නිසාය.

3. අප නායකයින් සහ අනුගාමිකයින් පුහුණු කරනුයේ සියළු ජාතින් වෙත යමින්, දේව ධර්මය ඔවුන්ට උගන්වා, බෞතිස්මය ලබා දි, ඉන්පසු තවදුරටත් ඉගැන්වීම මගින් ඔවුන් අධ්‍යාත්මිය පරිනත භාවය වෙත මෙහෙය වනු පිනිසය

4. 
   - දෙවියන්වහන්සේ මත රදා පවතින්න
   - යාච්ඤාවේ කාරණයක් බවට එය පත්කරගන්න
   - මුල් පියවර ගන්න
   - හැකියාව ගැන මිස ගැටළු දෙස නොබලන්න
   - මිල පැහැදිලි කර ගන්න
   - මුලික අවශ්‍යතා සපුරන අය තෝරා ගන්න

5.

- ඇසුරු කිරීම
- උපදේශනය
- ප්‍රදර්ශනය කිරීම
- කැප කිරීම
- සහභාගිත්වය
- දුෂ්ඨිය
- අධික්ෂණය
- පැවරීම

6. එපිස ආකෘතිය

**එකලොස් වන පරිච්ඡේදය:**

1. ධර්මිෂ්ඨයා සත්වරක් වැටුනත් නැගිටින්නේය (හිතෝපදේශ 24 : 16)

2. අසමර්ථතාවය සාර්ථකත්වය බවට පෙරලාගත් නායකයින් පිලිබඳ ලේඛනයක් සඳහා නවවන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

3. සිය ජිවිත අසාර්ථකත්වයෙන් අවසන් වු නායකයින්ගේ ලේඛනයක් සඳහා එකලොස්වන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

4.

- හෙලි කිරීම
- පසුතැවීම
- ආපසු හැරීම
- නැගි සිටීම

5. සම්බන්ධතා පිලිබඳ අසමර්ථතාවය සහ ක්‍රියාවන් සිදු කිරීම හෝ අතපසු කිරීම නිසාය.

**දොලොස් වන පරිච්ඡේදය:**

1. මේ ව්‍යවස්ථා පොත නුඹගේ මුඛයෙන් පහ නොවේවා. එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිනිස රෑ දවල් ඒ ගැන මෙනෙහි කරපන්න. එවිට නුඹේ මාර්ගය සඵලවී නුඹට ශුභ සිද්ධ වන්නේය. (යොෂුවා 1 : 8)

2. දේව රාජ්‍යයෙහිදි, සාර්ථකත්වය යනු දෙවියන්වහන්සේ විසින් දෙන ලද වගකීම් සිමාව තුල යම් කිසි අයෙකුගේ තිලිණ සහ හැකියාවන් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනිම සාර්ථකත්වය යනුවේ.

3. ඔබගේ පැහැදිලි කිරීම දොලොස්වන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව හා සංසන්ධනය කරන්න.

4. ඔබගේ සාරාංශය දොලොස්වන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව සමග සසදන්න.

**දහතුන් වන පරිච්ජේදය:**

1. **එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කථා කොට : යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා.** ( **මතෙව්** 16 : 24 )

2. **නායකත්වය වෙනුවෙන් වන වටිනාකම වැදගත් සාධකයන්** 3 **ක් වන්නේ, නිගමනය කෙරුණ මිළ, උචිත ප්‍රමුඛතා සහ නිශ්චිත අරමුණු ආදියයි.**

3. **නායකත්වය පිලිබඳ සැබෑවු පරික්ෂණය වන්නේ, ඔබ විසින් මෙහෙයවන ලද්දවුන් අතර, ඔබ තවදුරටත්, රැඳි නොසිටින කල කුමක් සිදු වේද යන බවය. ඔබ ඔවුන් හට උගැන්වූ දෙය කෙරේහි ඔවුන් තවදුරටත් විශ්වාසවන්තව රැදෙන්නේද? තමන් උගත් දෙය ඔවුහු වෙනත් අය හට උගන්වන්නහුද? ඔබ කායිකව ඔවුන් අසල රැඳි නොසිටන කල ඔවුන් හට තම අධ්‍යාත්මික පරිනතභාවය ඉදිරියටත් පවත්වාගෙන යා හැකි වන්නේද?**